



★


# දිනමිණ

The Dinamina 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත දිනමින





අද පත්‍රය සමඟ


ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ බිනර අව දසවක ලත් ශනි දින | කාණ්ඩය 111 පත්‍රය 230 පිටු 20 මිල රු.30 web: www.dinamina.lk ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 සැප්තැම්බර් 12 සෙනසුරාදා




## ඉදිරි වසර තුනේදී අවශ්‍ය ඖෂධවලින් 50%ක් දේශීයව නිපදවන්න

ජනපතිගෙන් නිලධාරීන්ට උපදෙස් පිට 06

පෝෂණය නංවන්න

## පාසල් දරුවන්ට දිනකට බිත්තරයක්



අගමැතිගෙන් අධ්‍යාපන ඇමැතිට උපදෙස්

මහින්ද අලුත්ගෙදර

පාසල් ළමයින්ගේ පෝෂණ තත්ත්වය ඉහළ දැමීම සඳහා දෛනිකව බිත්තරයක් ලබාදීම සම්බන්ධයෙන් සොයා බලන ලෙස අගමැති මහින්ද රාජපක්ෂ මහතා අධ්‍යාපන ඇමැතිවරයාට උපදෙස් දී තිබේ. පිට 06

## යහපාලන දූෂණ විරෝධී කමිටුව

# තුන්කෝටියකට වැඩි මහජන මුදල් ගිලලා

### දේශපාලන පළි ගැනීම් සොයන කොමිසමේදී හෙළි වෙයි

රෝෂන් තුෂාර

යහපාලන ආණ්ඩුව 'දූෂණ' සෙවීම සඳහා පිහිටුවූයේ යැයි කියන 'දූෂණ විරෝධී කමිටුව' මහා පරිමාණ 'දූෂණ' සිදු කර රජයේ මුදල් රුපියල් තුන්කෝටි තිස්හත්ලක්ෂ දාහතරදහස් අටසිය හතක් (33714807.59) නාස්ති කර ඇති බව දේශපාලන පළි ගැනීම් පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසම හමුවේ ඊයේ (11) අනාවරණය විය. පිට 06

සේවකයන් 44කට පින් පඩි

දූෂණ මර්ධන කමිටු ලේකම් කාර්යාලය
2015 පෙබරවාරි මස සිට 2017 ජුනි මස දක්වා දරණ ලද වියදම් වාර්තාව

| | 2015 | 2016 | 2017 | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වැටුප් වේතන සහ දීමනා | 8,767,789.62 | 9,450,309.45 | 4,495,980.20 | 22,714,079.27 |
| දුරකථන | 88,322.76 | 245,711.38 | 110,945.60 | 444,979.74 |
| විදුලිය හා ජලය | 804,914.85 | 797,110.70 | 424,558.47 | 2,026,584.02 |
| අතිකාල සහ නිවාඩු දින වැටුප් | 910,990.16 | 785,247.39 | 211,543.18 | 1,907,780.73 |
| වාහන නඩත්තු | 1,041,086.71 | 1,133,784.46 | 473,613.46 | 2,648,484.63 |
| ඉන්ධන | 895,700.00 | 1,252,393.50 | 443,100.00 | 2,591,193.50 |
| ලිපිද්‍රව්‍ය | 322,533.00 | 251,126.00 | 19,485.00 | 593,144.00 |
| වෙනත් වියදම් | 600,945.91 | 150,824.74 | 36,791.05 | 788,561.70 |
| එකතුව | 13,432,283.01 | 14,066,507.62 | 6,216,016.96 | 33,714,807.59 |

## ප්‍රභූ ඝාතන ඇතුළු විවිධ අපරාධවලට

# පාතාල කල්ලි අතේ ගිනි අවි පුපුරන ද්‍රව්‍ය

බුද්ධි තොරතුරු හෙළි කරයි

චන්ද්‍රිකා පෙරේරා

ප්‍රභූ ඝාතන ඇතුළු විවිධ අපරාධ සිදු කිරීමේ අරමුණෙන් පාතල කල්ලි අතර ගිනි අවි, පුපුරන ද්‍රව්‍ය සහ වෙනත් අවි ආයුධ සංසරණය වන බව බුද්ධි තොරතුරු මඟින් තහවුරු කර ගෙන තිබේ. පාතාල කල්ලි විසින් මෙම අවි ආයුධ සඟවා තබාගෙන සිටින බවට ද තොරතුරු හෙළි වී ඇත. පිට 06

## විස්සට එරෙහි වන්න අලි-ටෙලිෆෝන් මිතුරු වෙයි

රෝෂන් තුෂාර

විසි වැනි සංශෝධනය පිළිබඳ ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ගවලදී එක්සත් ජාතික පක්ෂය හා සම්බන්ධ වී කටයුතු කිරීමට සමඟි ජන බලවේගය සැරසෙයි. පිට 06



කොළඹ හෙද විදුහලේ හෙද සිසුන් 298 දෙනෙකු සේවයට කැපවීම හා හිස් වැසුම් පැලඳවීමේ උලෙළ අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී ඊයේ (11) පැවැත්විණි. එහිදී අගමැතිවරයා හෙද සිසුවියකට පදක්කම පැලඳවූ අයුරු. රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ සභාපති, මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි, ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි, රාජ්‍ය ඇමැති ලොහාන් රත්වත්තේ, සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය එස්. එච්. මුණසිංහ, කොළඹ හෙද විදුහලේ විදුහල්පතිනි ඒ. ඩබ්ලිව්. එස්. ඩබ්ලිව්. පියසේන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

*සුලෝචන ගමගේ*

## දිනමිණ ඌව පළාත් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව අද

දිනමිණ ඌව පළාත් ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව අද (12) පෙරවරු 10ට ලේක්හවුස් කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කාරියවසම් සහ දිනමිණ ප්‍රධාන කර්තෘ ගාමිණී ජයලත් මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් බදුල්ල ඌව පළාත් සභා ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

## සජිත් නීතියට පිටින් 'දිවි නැඟුම' මහ පුටුවට එහෙයියෙක් පත් කරලා

රෝෂන් තුෂාර

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා අමාත්‍ය මණ්ඩල තීරණවලට පටහැනිව හා නීති විරෝධීව 'දිවි නැගුම අධ්‍යක්ෂ ජනරාල්' තනතුරට වයසින් වැඩි පුද්ගලයකු පත් කිරීමට කටයුතු කැර ඇතැයි දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසම හමුවේ ඊයේ (11) අනාවරණය විය. පිට 06

## එෆ්සීඅයිඩීය කළ විමර්ශන-තීන්දු බලශූන්‍යයයි

ජනපති කොමිසම දන්වයි

රෝෂන් තුෂාර

යහපාලන ආණ්ඩු සමයේ පිහිටුවූ 'මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය' (FCID) නීත්‍යනුකූලව පිහිටුවා නොමැති බැවින් එම පොලිස් කොට්ඨාසය සිදු කළ විමර්ශන, තීන්දු, තීරණ නීතිය ඉදිරියේ බලශූන්‍ය හා බලරහිත ක්‍රියාවන් බවට පත් වන බව දේශපාලන පළි ගැනීම් පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසම ඊයේ (11) දන්වා සිටියේය. පිට 06

## කංජිපානි යළි බූස්සට

තවත් 3ක් උපවාසය අත්හරී පිට 06

## නිව් ඩයමන්ඩ් නැවේ කපිතාන් නිරෝධායනයට

මහින්ද අලුත්ගෙදර

එම්. ටී. නිව් ඩයමන්ඩ් නෞකාවේ කපිතාන්වරයා ගොඩබිමට රැගෙන ඒමෙන් පසු නිරෝධායනයට යොමු කිරීමට ශ්‍රී ලංකා නාවික හමුදාව පියවර ගෙන ඇත. පිට 06

## රාජිත පාස්කු කොමිසමට



සුභාෂිණී සේනානායක

හිටපු ඇමැති රාජිත සේනාරත්න මහතා ප්‍රකාශයක් ලබාදීමට පාස්කු ප්‍රහාරය සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසමේ පොලිස් ඒකකය වෙත ඊයේ (11) පැමිණියේය. පිට 06

## ප්‍රේමලාල් මන්ත්‍රීවරයාට විපක්ෂය කළ අපහාස හැන්සාඩ් දාන්න එපා

සභානායක, කථානායකගෙන් ඉල්ලයි

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර

මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කිරීමට ප්‍රේමලාල් ජයසේකර මහතාට, අයිතිවාසිකම් නොමැති බව හුවා දක්වමින් විපක්ෂනායක ඇතුළු කණ්ඩායම කළ කරුණු දැක්වීම් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස සභානායක, ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා කථානායකවරයාගෙන් ඉල්ලා සිටියේය. පිට 06

## මධුෂ්ගේ ගෝලයෙක් කුඩුත් සමඟ දැලේ

චන්ද්‍රිකා පෙරේරා, මහින්ද අලුත්ගෙදර

මාකඳුරේ මධුෂ්ගේ සමීපතමයකු වූ 'වැලිහිඳ කළු' සහ පාතාල නායක 'හරක් කටා'ගේ ප්‍රධාන ගෝලයා වූ 'හසන් චින්තක' ඇතුළු තිදෙනකු හෙරොයින් ග්‍රෑම් 30ක් සමඟ පොලීසිය ඊයේ (11) සහ පෙරේදා (10) දිනවලදී අත්අඩංගුවට ගෙන තිබේ. පිට 06

## මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනයට ජාතික සැලැස්මක් හදන්න කමිටුවක්

බුද්ධිකා ඉඹුලාන

මත් ලෝලීන් පුනරුත්ථාපනයට පුළුල් ජාතික සැලැස්මක් සකස් කිරීමට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය කමිටුවක් පත් කර තිබේ. පිට 06

## පාස්කු ප්‍රහාරය වන තුරුත් සහරාන් ඇල්ලුවේ නෑ

හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් පිට 06

## මහජන පෙත්සම් කාරක සභාවට නියෝජිතයන් නම් කරයි

පිට 06

## අධිකරණයේ ගරුත්වය කෙලෙසලා හිටපු මහේස්ත්‍රාත් හේමපාලට කොමිසමෙන් දැඩි අවවාද

පිට 06




## කෝප්-කෝපා සාමාජිකයෝ පත් වෙති

පිට 06

## ඉලංගෛයි තමිල් අරුසු මහ ලේකම් රාජසිංගම් ඉල්ලා අස් වෙයි

ඉලංගෛයි තමිල් අරුසු පක්ෂයේ මහලේකම් තුරෙයි රාජසිංගම් මහතා ඉල්ලා අස් වී තිබේ. ඒ පිළිබඳ පක්ෂ නායකත්වයට දැනුම් දුන් බව රාජසිංගම් මහතා පැවසීය. පක්ෂ මහලේකම් ධූරයෙන් ඉල්ලා අස්වීම ඉලංගෛයි තමිල් අරුසු පක්ෂ නායක මාවෛයි සේනාධිරාජා මහතා වෙත ලිපියක් යොමු කරමින් දැනුම් දුන් බව ඔහු කියා සිටී. පිට 06

# ‘මඟ නැඟුම’ සතු යන්ත්‍ර නඩත්තු කර උපරිම ප්‍රයෝජන ලබා ගත යුතුයි

## රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා



‘මඟ නැඟුම’ ආයතනය සතු පැලියගොඩ ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම සතු යන්ත්‍රෝපකරණ නිසි පරිදි නඩත්තු කර උපරිම ප්‍රයෝජන ලබා ගත යුතු බව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා පවසයි.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව පැවැසුවේ ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති පැලියගොඩ මඟ නැඟුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ ඊයේ (11) නිරීක්ෂණය චාරිකාවකට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

‘මාර්ග කිලෝ මීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ මාර්ග ඉදිකිරීමට විශාල වගකීමක් පැවරී ඇති මඟ නැඟුම ආයතනය, සිය ඉලක්කය සපුරා ගැනීමට නම් නව ප්‍රතිසංවිධානයකින් යුතුව ක්‍රියාත්මක විය යුතුයි. මාර්ග කිලෝ මීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඉදිරි පස්වසරක කාලය ඇතුළත අවසන් කළ යුතුයි. මඟ නැඟුම ආයතනය සියලු දෙනා එක්ව රටේ ජනතාව වෙනුවෙන් ආරක්ෂා කර දිය යුතුයි.

මා රාජ්‍ය ඇමැති ධුරය දරන්නේ තාවකාලිකව. මේ ආයතනයේ ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා සේවය කරන සියලු නිලධාරීන් සාමූහිකව, ඉලක්කයක් ඇතිව කටයුතු කර රටේ ජනතාවට ඉහළම සේවාවක් ලබා දීමට කටයුතු කළ යුතුයි. මාර්ග කිලෝ මීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ජනතාවට දෙන ලද පොරොන්දුවක්. එය සාර්ථකව ඉටු කිරීමට පැලියගොඩ ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සහෝදරත්වයෙන් කටයුතු කළ යුතුයි.‘

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය රංජිත් දිසානායක, මඟ නැඟුම ආයතනයේ සභාපති ක්‍රිෂාන්ත කපුවත්ත මහත්වරුන් ඇතුළු මඟ නැඟුම ආයතනයේ නිලධාරීහු මේ අවස්ථාවට සහභාගි වූහ.

# ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය ‘අපේගම’ පරිශ්‍රයට ගෙන යෑමට පියවර



**අනුර ප්‍රේමලාල්**

ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය බත්තරමුල්ල ‘අපේගම’ පරිශ්‍රයේ ස්ථානගත කිරීම කෙරෙහි මූලික කටයුතු ආරම්භ කෙරේ.

ඒ අනුව එහි මූලිකමය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ඉන්ජිනේරුවරුන් සහ අමාත්‍යාංශ නිලධාරීන් සමඟ එහි දළ සැකැස්ම ගැන මූලික අධ්‍යයනයක රාජ්‍ය ඇමැති ප්‍රසන්න රණවීර මහතා ඉකුත්දා (09) නිරත විය.

එහිදී රාජ්‍ය ඇමැතිවරයා මෙසේ අදහස් දැක්වීය.

‘මගේ බලාපොරොත්තුව ඉතා ඉක්මනින් බත්තරමුල්ල අපේගමට පැමිණීමයි. ඒ වගේම අපේගම පරිශ්‍රය අමාත්‍යාංශය යටතට පත්කර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරනවා. ඊට ප්‍රධාන හේතු වී ඇත්තේ ලක්ෂ 80ක විශාල මාසික කුලියක් ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයට ගෙවන්නට සිදුව තිබීමයි. එවගේම දැන් අමාත්‍යාංශය තිබෙන ස්ථානයට ග්‍රාමීය ශිල්පීන්ට පහසුවෙන් පැමිණීමට නොහැකි වීමත් එක් හේතුවක්.‘

අමාත්‍යාංශයේ ලේකම්වරයාද, මාණ්ඩලික නිලධාරීන්ද, අමාත්‍යාංශයට අයත් ආයතනවල සභාපතිවරුන්ද, එම ආයතනවල නිලධාරීන් සහ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පීන් ඇතුළු නිලධාරීහු මේ අවස්ථාවට සහභාගී වූහ.

# මාතලේ යටවර සෝමාලංකාර නාහිමිගේ ආදාහන පූජෝත්සවය හෙට



මාතලේ ඓතිහාසික ගොඩපළ ශ්‍රී විජයපාල රජමහා විහාරාධිපතිව වැඩ විසූ ශ්‍රී සිද්ධාර්ථ සද්ධානන්ද සෝමලංකාරාභිධාන සියම් මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ මාතලේ මහ දිසාවේ ප්‍රධාන සංඝනායක මාතලේ යටවර සෝමාලංකාර නාහිමි අපවත්වී වදාළහ. උන් වහන්සේගේ ශ්‍රී දේහය පිළිබඳ ආදාහන පූජෝත්සවය හෙට (13) බණ්ඩාරපොල ක්‍රීඩාංගණයේදී සිදු කෙරේ. ඒ වෙනුවෙන් තබන සටහනකි, මේ.

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර යටවර ප්‍රදේශයේ 1949ක් වූ මැයි මස 04 වැනි දින උන් වහන්සේ ජන්මලාභය ලැබූහ. මහනුවර මාස්වෙල විද්‍යාලයෙන් ස්වකීය අධ්‍යාපනය ජීවිතය ඇරැඹූ උන් වහන්සේ හැදුනාව මධ්‍යම මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූහ. වසර 1963 ක්වූ මැයි මස 28 වැනි දින යටවර සෝමාලංකාර නමින් ඓතිහාසික ගොඩපළ විජයපාල රජමහා විහාරාධිපති වැඩ විසූ උඩුගම ශ්‍රී සද්ධානන්ද නාහිමිගේ ආචාරීත්වයෙන් උතුම් වූ පැවිදි දිවියට පත්වූහ. පැවිදිවීමෙන් පසුව මාතලේ සුප්‍රකට පිරිවෙනක් වන මාතලේ විහාර පාර ශ්‍රී ධර්මරාජ මහා පිරිවෙන් සිංහල, පාලි, සංස්කෘත ආදී භාෂාවන්ගෙන් මූලික අධ්‍යාපනය ලබා පසුව සදලංකාවේ ශ්‍රාස්තෝදය මහා පිරිවෙනෙන් උසස් අධ්‍යාපනය ලැබ ප්‍රාචීණ, ප්‍රාරම්භ , මධ්‍යම විභාගවලින් අධ්‍යාපනය ලැබූහ. වසර 1970ක් වූ මැයි මස 28 වැනි දින ඓතිහාසික සෙංකඩගල පුරවරයේදී වාහලනාද නාමයෙන් උපසම්පදා ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් වූහ. උන් වහන්සේ ආයුර්වේද අධ්‍යාපනයට මහත් රුචියක් දැක්වූ අතර මාතලේ පාරම්පරික දේශීය ආයුර්වේද විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා එම විද්‍යාලයේම සංස්කෘත භාෂාව පිළිබඳ ආචාර්යවරයකු ලෙස ද කලක් කටයුතු කළහ.

උන් වහන්සේගේ දක්ෂතාව මෙන්ම කැපවීම බුදුදහමේ චිරස්ථිතියට සහ සමාජයේ යහපැවැත්මට කැප කරමින් ශාසනයට ඉටු විය යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට හැකි සැමවිටම පෙනී සිටියහ. රත්තොට ප්‍රදේශයේ ආගමික , සමාජීයිය, සංස්කෘතික දියුණුව උදෙසා තම පැවිදි ජීවිතය කැප කළ උන් වහන්සේ රත්තොට ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරි වහන්සේ ලෙස දහම් පාසල් අධ්‍යාපනය නඟාසිටුවීමට කලක් කටයුතු කළේය. මෙකී ශාසනික, ආගමික කටයුතු වඩාත් පුළුල්ව කිරීමටත්, එම කටයුතු අගය කිරීමටත් 2007 මාර්තු මස 01 වැනි දින මල්වතු මහාවිහාරියය සානුනායක විංශත්වර්ගික ගරුතර සංඝසභාවේ සමානච්ඡන්දයෙන් අප නාහිමි වෙත “ශ්‍රී සිද්ධාර්ථ සද්ධානන්ද” ගෞරව නාමෝපලක්ෂිතව මාතලේ මහා දිසාවේ ප්‍රධාන සංඝනායක ධුරයට ප්‍රාප්තවීම ප්‍රදේශයට මහත් අභිමානයක් එක් කළේය.

බුද්ධ ශාසනයේ චිරස්ථිතය වෙනුවෙන් කැප කරමින් භික්ෂු ජීවිතය වඩාත් අර්ථවත් ලෙස ගත කළ අප නාහිම්පාණන් වහන්සේ නොසිතූ මොහොතක අපවත්වීම මුළු ශාසනයටම පිරිමැසිය නොහැකි පාඩුවකි. උන් වහන්සේ විසින් ශිෂ්‍ය පුත්‍රයන් වහන්සේලා සසුන් කෙතට දායක කිරීම ප්‍රශංසනීය වේ. අපවත්වී වදාළ නායක මාහිම්පාණන් වහන්සේට උතුම් වූ නිවන් සුව ලැබේවා.

**රෝහණ දිසානායක**
**මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී**

# දිවියෙන් සමුගත් ප්‍රවීණ සංගීතවේදී රංජිත් ඩයස්

**අනුර ප්‍රේමලාල්**



ප්‍රවීණ සංගීතවේදී රංජිත් ඩයස් මහතා අභාවප්‍රාප්ත වී තිබේ. කීබෝඩ් වාදන ශිල්පියකු මෙන්ම සංගීත අධ්‍යක්ෂවරයකු ලෙස ගී නිර්මාණ ක්ෂේත්‍රයට විශිෂ්ට මෙහෙයක් ඉටු කළ ඒ මහතා මිය යන විට 67 වන වියේ පසු විය.

වසර ගණනාවක් මෙරට සංගීත කණ්ඩායම් අතර නමක් දිනා සිටි මවුන්ට් වයිම්ස් සංගීත කණ්ඩායමේ ප්‍රධානියා ලෙස ද ඒ මහතා කටයුතු කළේය. එච්. ආර්. ජෝතිපාල, එම්. එස්. ප්‍රනාන්දු, නිහාල් නෙල්සන් ආදී ශිල්පීන්ගේ කැසට් පට රැසක් රංජිත් ඩයස් මහතාගේ සංගීත අධ්‍යක්ෂණයෙන් පටිගත කර තිබේ. ගායක ගායිකාවන් රැසකටම ඔහු තනු නිර්මාණය කළේය.

ස්වාධීන රූපවාහිනී සේවයේ ආරම්භයේ සිට මධුරසාංග සංගීත වැඩසටහනට මෙන්ම ලක්හඬ ගුවන් විදුලියේ ‘කලාල මියැසිය‘ වැඩසටහන ද රංජිත් ඩයස් මහතාගේ සංගීත අධ්‍යක්ෂණයෙන් ඉදිරිපත් කෙරිණි. ඒ මහතාගේ දේහය මොරටුව, ලක්ෂපතිය, ශ්‍රී මේධානන්ද මාවතේ පිහිටි නිවසේ තැන්පත් කර ඇති අතර අවසන් කටයුතු ඊයේ (11) සවස ගල්කිස්ස නිසල සෙවණ පොදු සුසාන භූමියේදී සිදු කෙරිණි.

# ගුරු-විදුහල්පති ගැටලු විසඳීමට සාකච්ඡාවක් ලබා දෙන්න

## ලංකා ගුරු සේවා සංගමය

**සිතාරා සේනානි**

ගුරු හා විදුහල්පති සේවාවල කලක් පුරා පවතින ගැටලුවලට විසඳුම් ලබා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකිව යුතු නිලධාරීන් සමඟ කඩිනමින් සාකච්ඡා අවස්ථාවක් ලබා දෙන ලෙස ලංකා ගුරු සේවා සංගමය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කර තිබේ.

වසර 23ක් ගුරු හා විදුහල්පති සේවාවල පවතින බරපතළ වැටුප් විෂමතා ඉවත් කිරීමට ගනු ලැබූ ඇමැති මණ්ඩල තීරණ ක්‍රියාත්මක නොවීම, පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා වන පරිදි ගුරුවරුන්ට කොළ පිරවීම්, අනිවාර්ය ව්‍යාපෘති ඇතුළු අමතර වැඩ පැවරීම, පැරණි හා නව ගුරු, විදුහල්පති සේවා ව්‍යවස්ථාවලට අනුව අන්තර්ග්‍රහණයේදී හා උසස්වීම් ලබාදීමේදී පැන නැඟී ඇති ගැටලු, ශ්‍රී ලංකා ගුරු සේවයේ කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළව මොඩියුල ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟී ඇති ගැටලු, ගුරු කාර්ය සාධනය හා වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධ ගැටලු, ජාතික පාසල්/පළාත් පාසල් සඳහා බඳවා ගනු ලබන ගුරුවරුන් ස්ථානගත කිරීමේදී හා ස්ථාන මාරු කිරීමේදී මතුව ඇති ගැටලු, කලාප අධ්‍යාපන කාර්යාල සේවා සම්බන්ධ ගැටලු, විශ්‍රාම යෑමට නියමිත ගුරුවරුන් මුහුණපාන ගැටලු, ගුරුවන්ගේ දරුවන් පාසල්වලට ඇතුළත් කිරීම සම්බන්ධ ගැටලු ඇතුළු ගුරු හා විදුහල්පති සේවාවන්ට මුහුණපෑමට සිදුව ඇති ගැටලු රැසකට විසඳුම් ලබා ගැනීමට මේ සාකච්ඡා අවස්ථාව ඉල්ලා ඇති බව ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ මහතා ‘දිනමිණ‘ට පැවැසීය.

# වකුගඩුවක් දන්දී දිවි රැක ගනිමු

කළුතර උතුර, නො. 509/6, පින්නගොඩ වත්ත , ජාවත්ත පදිංචි දංකොලුවගේ සඳරුවනී අසිංසලා නම් 26 හැවිරිදි තරුණිය වකුගඩුවක් සොයා ගැනීමට පිහිට පතයි.

ඇයට ‘බී‘ පොසිටිව්, ‘බී‘ නෙගටිව්, ‘ඕ‘ පොසිටිව් හෝ ‘ඕ‘ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය බව වෛද්‍ය නිර්දේශය වී ඇත. පරිත්‍යාග කිරීමට කැමැති අයෙක් වේ නම් 077-511 57 91 හෝ 034-20 40 447 දුරකතන අංක අමතා දැනුම් දෙන්නැයි ඉල්ලා සිටියි.

# ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 60 වන සංවත්සරික මහ සභා රැස්වීම 18දා



ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 60 වන සංවත්සරික මහ සභා රැස්වීම 18 වැනිදා ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වේ.

පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලාව උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් බවට පත් කිරීමෙන් අනතුරුව එහි ප්‍රථම උසස් ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානෝත්සවය පසුගියදා (28) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

එදින ඩිප්ලෝමාධාරීන් 103 දෙනෙක් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමා සහතිකපත් ලැබූහ.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති ආචාර්ය නයනා විජයසුන්දර, ලේකම් ලීලාමනී අමරසේකර, අධ්‍යාපන නිලධාරී ආචාර්ය චම්පා අලහකෝන් මහත්මීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

# මුහුදු යෑමට පෙර කාලගුණ අනාවැකි ගැන දැඩිව අවධානය යොමු කරන්න

## ධීවර ඇමැති ධීවර කාර්මිකයන්ට දන්වයි

**බුද්ධිකා ඉඹුලාන**

මේ දිනවල ක්ෂණිකව වෙනස් වන කාලගුණ තත්ත්වය යටතේ මුහුදු යෑමට පෙර කාලගුණ අනාවැකි පිළිබඳව දැඩිව අවධානය යොමු කරන ලෙස ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා ධීවර කාර්මිකයන්ට දන්වා සිටී.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

‘ධීවර යාත්‍රාවක් මුහුදු යෑමට පෙර එම යාත්‍රාවේ කාර්මික තත්ත්වය, ඉන්ධන, ශක්තිමත් බව ගැන සැලකිලිමත්වීම, ආරක්ෂාවට යාත්‍රාවල ජීවිතාරක්ෂක කබා තබාගැනීම, දිනපතා රැකියාවට යෑමට අදහස් කරන මුහුදු ප්‍රදේශය පිළිබඳව දැනුවත් කළ යුතු රජයේ නිලධාරීන් දැනුවත් කර රැකියාවට පිටත්ව යෑම ආදිය කෙරෙහි අවධානය යොමු කරන්න.

බහු දින යාත්‍රා හිමියකු නම් ධීවර රැකියා සඳහා සිය යාත්‍රා පිටත්වීමට ප්‍රථමව යාත්‍රාව සතුව රේඩියෝ යන්ත්‍රයක් තිබීම සහ එය භාවිත කිරීමද අනිවාර්යයයි. එසේම සෑම දිනකට වරක් රේඩියෝ මධ්‍යස්ථානය අමතා තමන් සිටින ප්‍රදේශය පිළිබඳව දැනුවත් කිරීම හදිසි ආපදා ප්‍රශ්නයකදී යාත්‍රාව හා ධීවර කර්මාන්තයේ යෙදෙන අය මුදා ගැනීමට ඉතා වැදගත්.

දිනකට වරක් රේඩියෝ යන්ත්‍ර භාවිත කිරීම අනිවාර්යයයි. එසේ නොකරන බහු දින යාත්‍රාවලට නැවත ගමන් වාර ලබාදීමේදී පරිපාලනමය වශයෙන් පියවර ගැනීමට කටයුතු කරන ලෙස ධීවර අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දුන්නා. එම තත්ත්වය ධීවර කාර්මිකයන්ගේ ගමන් වාරය ලබාදීම ප්‍රමාදවීමට

# සිල් රෙදි බෙදා දීමේ සිද්ධියට අදාළ අභියාචනා පෙත්සම්වල වැඩිදුර විභාගය 16ට කල් තැබේ

**නෙල්කා මැදගෙදර**

සිල් රෙදි බෙදා දීමේ ව්‍යාපෘතියකට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම සතු රුපියල් මිලියන 600ක් වැය කර රජයේ මුදල් වංක ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් තමන්ට වසර තුනක සිර දඬුවම් නියම කළ මහාධිකරණ තීන්දුවට එරෙහිව එම කොමිසමෙහි හිටපු අධ්‍යක්ෂ ජනරාල් අනූෂ පැල්පිට සහ හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා ගොනු කළ අභියාචනා පෙත්සම්වල වැඩිදුර විභාගය මේ මස 16 වැනිදා තෙක් කල් තැබීමට අභියාචනාධිකරණය පෙරේදා (10) තීරණය කළේය.

පෙත්සම සම්බන්ධ ලිඛිත දේශන මේ මස 24 වැනිදා හෝ ඊට පෙර ගොනු කරන ලෙස නියම කෙරිණි.

2015 වසරේ ජනාධිපතිවරණය පැවති සමයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමට අයත් මුදල් රුපියල් මිලියන 600ක් සිල් රෙදි බෙදාදීමේ ව්‍යාපෘතියකට වැය කිරීමෙන් රජයේ මුදල් සාපරාධී සාවද්‍ය පරිහරණය කළ බවට විත්තිකරුවන් දෙදෙනකුට එරෙහිව නීතිපතිවරයා විසින් මහාධිකරණය හමුවෙහි නඩු පවරා තිබිණි.

එහි පළමු වන විත්තිකරු ලෙස විදුලි සංදේශ නියාමන කොමිසමේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් අනූෂ පැල්පිට නම් කර සිටි අතර එහි සභාපති හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග දෙවන විත්තිකරු ලෙස නම් කර සිටියේය.

එම නඩුව විභාග කළ මහාධිකරණ විනිසුරු ගිහාන් කුලතුංග මහතා චෝදනාවලට විත්තිකරුවන් වැරදිකරුවන් බවට තීරණය කළ අතර ඒ වෙනුවෙන් වසර තුනක බරපතළ වැඩ සහිත සිරදඬුවමක්ද දඩ මුදලක් ද ඊට අමතරව වන්දි මුදලක් ද නියම කළේය. මෙකී නඩු තීන්දුව බල රහිත කරන ලෙස ඉල්ලා එම විත්තිකරුවන් විසින් මේ අභියාචන පෙත්සම් ඉදිරිපත් කර තිබේ.

පෙත්සම් මීට පෙර කැඳ වූ අවස්ථාවේදී විත්තිකාර අභියාචකයන් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ෆයිස් මුස්තාපා සහ නීතිඥ කංචන රත්වත්තේ මහත්වරු කරුණු ඉදිරිපත් කළහ.

ඉන් පසුව නීතිපතිවරයා වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ මහතා දින කිහිපයක්ම කරුණු ඉදිරිපත් කළේය.

කුමුදුනී වික්‍රමසිංහ සහ දේවිකා අබේරත්න යන අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල හමුවෙහි මේ පෙත්සම පෙරේදා (10) කැඳවන ලදී.

එහිදී නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ මහතා දීර්ඝ ලෙස මෙසේ කරුණු ඉදිරිපත් කළේය.

‘මේ සිල් රෙදි බෙදාදීමේ ව්‍යාපෘතියට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම සතු මුදල් යොදවා ගැනීම ටී. ආර්. සී. නීතිය හෙවත් එම කොමිසන් සභා පනතට පටහැනියි. මේ මුදල් ගැනීමෙන් ටී. ආර්. සී. නීතිය උල්ලංඝනය කර ඇති නිසා ඒ මත පදනම්ව මහාධිකරණය හමුවෙහි නඩු පැවරීම කර තිබෙනවා. වංකභාවය පිළිබඳ අධිචෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල එම නඩු විභාගයේදී සමත් වුණා.

සිල් රෙදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන විට 2014 වසර වෙනුවෙන් විශේෂ ව්‍යාපෘති සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනවලින් මිලියන හත්සියයකට අධික මුදලක් වැය කර තිබුණා. ඒ සඳහා වැය කළ යුතු රුපියල් මිලියන හයසීය සොයා ගැනීමට දෙවන විත්තිකරුට සිදු වුණා.

ඒ අනුව එම මුදල් විදුලි සංදේශ නියාමන කොමිසමෙන් ගැනීමට තීරණය කර ඇති බව දැනුම් දුන් දෙවන විත්තිකරු එම මුදල්වලින් මිලියන 200ක් 2015 මුල් කාර්තුවේදී ප්‍රතිපූර්ණය කළ යුතු බවට ගණකාධිකාරිවරයාට උපදෙස් දී තිබුණා. ඒ අනුව 2015 මුදල් වර්ෂයට පාර්ලිමේන්තු අනුමැතියෙන් වෙන් කළ මුදල්වලින් රුපියල් මිලියන 600ක් 2014 වසරේ දෙසැම්බර් මස වන විටම වැය කර අවසන්.

ඒ සම්බන්ධව මහාධිකරණ නඩු විභාගයේදී දෙවන විත්තිකරු සාක්කි දුන් අවස්ථාවේදී ප්‍රශ්න කළා. එහෙත් දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කිරීම මිස ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් දීමට දෙවන විත්තිකරු අසමත්ව තිබෙනවා. ටී. ආර්. සී. නීතියට පටහැනිව යමින් මේ මුදල් ගැනීමට නියෝග කළ දෙවන විත්තිකරු ඒ පිළිබඳව නොදන්නා ලෙස කටයුතු කිරීමෙන් වංකභාවය පිළිබඳ චෝදනා ඔප්පු වෙනවා.‘

මේ පෙත්සම් පිළිබඳ වැඩිදුර කරුණු සලකා බැලීම මේ මස 16 වැනිදාට කල් තැබිණි.

ජනාධිපති නීතිඥ ෆයිස් මුස්තාපා, නීතිඥ කංචන රත්වත්තේ සහ නීතිඥ ජනක රත්නතුංග මහත්වරු විත්තිකාර අභියාචකයන් වෙනුවෙන් පෙනී සිටියහ.

# මගෙ දරුවා විඳපු දුක: පණ ඇද ඇද දඟලපු හැටි:

# මට තාමත් මැවී පේනවා

## මව හඬා වැලපෙයි



## ලැයින් කාමරයක අඟහිඟකම් මැද දිවිගෙවූ

## පුංචි කවිනිගේ ජීවිත ඉරණම

**හල්තොට සමූහ - විනිතා මානෙල් ගමගේ**

"කෙළ වැක් කෙරෙන්න ගත්තා. මං පිහදාන්න හදන කොට එයා මගෙ අත අහකට ඇදල දාල, එයාම පිහදා ගත්තා .අපට විෂබීජ බෝවෙයි කියා බයට. මගෙ දරුවා විඳපු දුක. පණ ඇද ඇද දඟලපු හැටි. මගෙ ඇස් දෙකෙන් දැක්කා. කිසිම දරුවෙකුට මෙහෙම දුකක් වෙන්න දෙන්න එපා."

නිව්වැටල් වතුයායාම කම්පාවට පත් කරමින් සමුන් විජයකුමාර් කවිනි නෙත්සරා දියණිය ජීවිතයෙන් සමුගෙන ගියේ කිසිවෙකුත් නොසිතූ නොපැතූ ආකාරයටය. නිව්වැටල් වත්ත දමිළ විද්‍යාලයේ 03 වසර ඉගෙනුම ලබමින් සිටි අට හැවිරිදි කවිනි දියණිය විජයකුමාර් සමන් විජයකුමාර් හා චන්ද්‍රවීර විජයකුමාරි යුවළට සිටි දරුවන් දෙදෙනාගෙන් වැඩිමහල් දියණියයි . නර්තනයට මෙන්ම චිත්‍රවලට එක ලෙස දස්කම් දැක්වූ ඇය පාසලේ කැපී පෙනෙන චරිතයක් බවට පත් වූයේ ඕනෑම වැඩකදී නොබියව ඉදිරියට ආ සිසුවියක් වූ නිසාය. වතුයායේ කාගේත් හුරතලය මැද හැදී වැඩුණු ඇයට සිදු වූ අවාසනාවන්ත ඉරණම කාටත් ගෙන දුන්නේ විශාල කම්පාවකි.

නිව්වැටල්වත්තේ, මුවපට්ටිය ගම්මානයේ පුංචි ලැයිම් කාමරයක අඟහිඟකම් මැද කල්ගෙවූ කවිනි එකම මල්ලීට දැක්වූයේ අසීමිත ආදරයකි. පාසල් ගොස් නිවසට පැමිණි ඇය වැඩියෙන් සිටින්නේ මල්ලි කරපින්නාගෙන ඔහු රැක බලා ගනිමිනි. උදේම නිවසින් පිටව කුලී වැඩ කරන පියා කීයක් හෝ සොයාගෙන හවසට නිවසට පැමිණෙනතුරු කවිනි මල්ලි බලාගෙන අම්මාට උදව් වෙන්නේ තමන්ට කළ හැකි අයුරින් සහාය වෙමිනි. පසුගිය ජූනි මාසයේ 28 වැනිදාද ඇය මල්ලී වඩාගෙන නිවසින් උඩ පාරට වී සිටියේ පුරුද්දට වගේය . කවිනිලාගේ නිවසට එහා පැත්තේ නිවසේ ආරි මාමා රබර් වත්තට ගොස් තිබුණේ පැළවලට දැමීමට ගොම ටිකක් අහුලාගෙන එන්නටය. දහවල් එකට පමණ ඔහු කෑ ගසමින් නිවස දෙසට දුව එනවිට කවිනි මල්ලි වඩාගෙන පාරට වී සිටියේ අම්මා කුස්සියේ වැඩ නිසාය. ආරි මාමාගේ මුහුණ අතපය තුවාල වී ලේ ගලමින් තිබූ අතර ඔහු පසුපස එළවාගෙන ආවේ නරියෙකි. නරියාට බය වුණ කවිනි දුවන්න වූ අතර මල්ලි සමඟ ඇද වැටුණු නිසා නරියාට ඇය අසලට ඒම පහසුවිය. එහෙත් ඇය නරියා සපා කෑ බවට කිසිදු සලකුණක් නොතිබූ අතර ඇය පැවසුවේ නරියා සායේ ගැවුණා කියාය. ඇගේ කකුලේ තුවාලයක් තිබුණත් එය වැටීමෙන් වූ එකක් බව කාගේත් අදහස වී තිබුණි. ආරි මාමා මෙන්ම කවිනි දියණියත් ගල්පාත රෝහලට රැගෙන යාමට ඔවුන් කටයුතු කළේ යුහුසුළුවය . ගල්පාත රෝහලේදී තුවාලවලට බෙහෙත් දමා පවසා ඇත්තේ ගිලන් රථයෙන් ආරි මාමා සමඟ හොරණ රෝහලට යන ලෙසය.

විජයකුමාරි- ළමයගෙ දකුණු කකුලෙ දණහිස්සට හුඟක් පහලින් තුවාල වෙලා තිබුණා. පොඩි ළමයගෙත් ඔළුව තුවාල වෙලා තිබුණා. මං ගල්පාතට ගියාම බෙත්දාල හොරණ යන්න කියා ලියුමක් දුන්නා. ආරි එක්ක ඇම්බියුලන්ස් එකේ යන්න ළමය බය වුණා. අප ත්‍රිවිල් එකේ අරන් ගියා. නරිය කෑවේ නෑ කිව්ව නිසා බොන්න බෙහෙත් දීල එව්වා. ආරිට බේත් විද්දත් තුන්වෙනි බේත් එක විදින්න කලින් අගෝස්තු 17 ආරි මැරුණා. අපේ ළමයට මේ මාසෙ 07 අමාරු වුණා . බඩ රිදෙනවා , කොන්ද රිදෙනවා. හිනෙන් කෑ ගහන්නත් පටන් ගත්තා. අප මෙඩිහෙල්ප් එකට අරගෙන ගියා. පරීක්ෂණ වගයක් කර බොන්න බේත් දීලා ලෙඩක් නෑ කියා හෙට ඉදල ඉස්කෝලෙ යවන්න කිව්වා . මං හරි සතුටු වුණා. මගෙ ළමයට ලෙඩක් නෑ කීව හින්දා. ඊට පස්සෙ ළමය වතුර ළඟට ගේන කොට බය වුණා. ගේන්න දුන්නෙ නෑ. ෆැන් දාන්න දුන්නෙත් නෑ. අප හොරණ ගෙනාවා. ළමය පණ ඇද ඇද දඟල දඟල ඉන්නකොට. ඩොක්ටර් ආවා. මං කකුල් දෙක අල්ලල වැදල කිව්ව මගෙ ළමයව බේරල දෙන්න කියා. බිම පෙරළි පෙරළි අඩල කිව්වා. අපව දාල ගියා යන්න. ළමයට මුල ඉදල බේත් විද්ද නං මෙහෙම වෙන්නෙ නෑ. බේර ගන්න තිබුණා.

ඩැනි ශිවනාදන් - මගෙ මල්ලිගෙ දරුවා නැති වුණේ. ළමය නරිය කනවා අප කවුරුවත් දැක්කෙ නෑ . ආරිව කාල පස්සෙන් පන්නගෙන ඇවිත් තිබුණා . එතකොට තමයි දුව වැටී තියෙන්නේ . බල්ලො බුරන කොට නරිය පහළ ගෙදර පැත්තට දුවල ගාමිණිගෙ කුඩුවෙ හිටපු කුකුළව ඇදල අරන් කන්න පටන් ගත්තා . එතකොට අප ගහල ඌව මැරුවා . ආරිව නරිය කාල එළවගෙන ඇවිත් තිබුණේ මෙහෙ ඉදල මීටර් 200 ක් විතර දුර කටුපොල් කැල්ලෙ බන්ට් එක ළඟ ඉදලයි. ඌ සෙම දදා තමයි ආවේ. අප රුපියල් 750ට වත්තෙ වැඩකරලයි ජීවත් වෙන්නේ . අප ඉගෙන ගෙන නෑ. ඒ වුණාට අපට හරි දුකයි. ළමයව කොළඹ හරි යවන්න තිබුණා. කොහේ යැව්වත් බේත් නෑ කිව්වා. ළමය විඳපු දුක. වමනෙත් එක්ක තමයි මැරුණෙ. දේවාලෙ භරත නාට්‍යයේ පළමුවෙනියට ආවේ අපේ දුව. අනේ මෙහෙම දෙයක් කාටවත් වෙන්න දෙන්න එපා.

කෙසේ හෝ පුංචි කවිනි සඳහටම නෙත් පියාගෙන අවසානය. ඔවුන්ගේ වේදනාවට නොයෙක් දේ පවසති. සමහර විට නරියාගේ සෙම ඇගේ තුවාල වල තැවරෙන්නට බැරි නැත. එසේ නැතිනම් ඇගේ අතක හෝ තැවරී මෙම විනාශය සිදු වුවා විය හැකිය. එම ගම්මානයට නරින්ගෙන් මෙවැනි කරදර සිදු වේ නම් ඒ පිළිබඳව වගකිව යුතු ආයතන අවධානය යොමු කළයුතු කාලය පැමිණ ඇති බව පුංචි කවිනි පවසන්නේ ක්ෂණික පියවර ගත යුතු බැවිනි. ආරි මාමා මෙන්ම සීල් කළ පෙට්ටියකින් නිවසට පැමිණ සුළු මොහොතකින් පුංචි දියණිය මිහිදන් වුයේ මුළු ගම්මානයම කඳුළු සයුරක ගිල්වා තබමිනි .

# රු. ලක්ෂ 60ක දුම්කුඩු අල්ලයි

**නිමල් රාජපක්ෂ**

මාවනැල්ල නයාවල පාර ප්‍රදේශයේ ගබඩා කර තිබූ රුපියල් ලක්ෂ හැටක් වටිනා දුම් කුඩු තොගයක් සමඟා සැකකරුවකු කෑගල්ල සුරාබදු නිලධාරීන් විසින් යුධ හමුදාවේ සහාය ඇතිව පෙරේදා (09) අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් දුම්කුඩු තොගයේ දුම් කුඩු කිලෝ 8576 යි ග්‍රෑම් 800 තිබූ බව සුරාබදු මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් කපිල කුමාරසිංහ මහතා පවසයි.

දුම් කුඩු තොගය බීඩි නිෂ්පාදනය සඳහා බලපත්‍ර ලත් පුද්ගලයකු විසින් මිලදීගෙන ඇති අතර අදාල පුද්ගලයා විසින් අවසර නොලත් ස්ථානයක ගබඩා කර තිබියදී අත්අඩංගුවට ගැනීමට සුරාබදු නිලධාරීන් සමත්වී ඇත.

අදාල බලපත්‍ර ලාභියා ඊයේ (10) අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් වසන්ත දිසානායක මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු දුම්කොළ බදු පනත යටතේ රුපියල් ලක්ෂ දහයක (1,000,000.00/=) සමථ ගාස්තුවක් නියම කොට ඇත.

# දහසය හැවිරිදි සිසුවිය එල්ලී සියදිවි හානි කරගෙන

**මල්වාන සමූහ - මහානාම විතානගේ**

සියඹලාපේ, ගලහිටියාව පාර ප්‍රදේශයේ දහසය හැවිරිදි පාසල් සිසුවියක් සිය නිවසේ කාමරය තුළ සාරි යකින් ගෙල වැල ලාගෙන දිවි නසා ගෙන ඇත. බාල්කයේ සාරියකින් එල්ලී දැරිය ගෙල වැල ලාගෙන සිටි බවද වාර්තාවේ.

සියඹලාපේ, ගලහිටියාව පාර ප්‍රදේශයේ පදිංචිව සිටි හෙයියන්තුඩුව සංඝමිත්තා විද්‍යාලයේ 11 වන වසර පන්තියේ ඉගෙනුම ලැබූ නෙව්මාලි කාවින්ද්‍යා නමැති දහසය හැවිරිදි පාසල් සිසුවියක් මෙසේ දිවි නසා ගෙන ඇත.

ඉකුත් බදාදා (09 වැනිදා) සවස පාසල් සිසුවිය පාසල ඇරී නිවෙසට පැමිණ සිය කාමරය තුළ මෙසේ ගෙල වැල ලාගෙන තිබුණි. මීට හේතුව තවම හෙළි නොවීය.

මේ පිළිබඳව මරණ පරීක්ෂණය බියගම හදිසි මරණ පරීක්ෂක හර්ෂජිත් ගුණසේකර මහතා විසින් සිද්ධිය වූ ස්ථානයේදී පවත්වන ලද අතර පශ්චාත් මරණ පරීක්ෂණය පෙරේදා (10 වැනිදා) රාගම මහ රෝහලේදී සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරී සී. මුතුලිංගම් මහතා විසින් පැවැත්විණි.

සපුගස්කන්ද පොලිසියේ සැරයන් ජයරත්න මහතා විසින් සාක්කි මෙහෙයවීය.

ඉදිරිපත් වූ සාක්කි හා වෛද්‍ය වාර්තාව අනුව මෙය සියදිවි නසා ගැනීමක් බවට මරණ පරීක්ෂකවරයා නිගමනය කරන ලදී.

# රත්කිඳ වන වගා රක්ෂිතයේ ඇවිදීමට ගිය සිසුවකුට වන අලියකු පහර දී මරා දමලා

**සී . ගමගේ - සොරණාතොට සමූහ**

ගිරාදුරුකෝට්ට රත්කිද වන වගාරක්ෂිතයේ ඇවිදීමට ගිය 16 හැවිරිදි පාසල් සිසුවෙකුට වන අලියකු පහර පහර දී මරා දමා සිටියදී පෙරේදා (10) පස්වරුවේ සිසුවාගේ සිරුර රක්ෂිතයෙන් සොයාගත් ගත් බව ගිරාදුරුකෝට්ට පොලිසිය පවසයි .

ගිරාදුරුකෝට්ට පහළ රත්කිද නවෝදා විදුහලේ 10වසරේ ඉගෙනුම ලැබූ පහළ රත්කිද පදිංචිව සිටි තරිඳු ලක්මාල් කීර්ති දසිල්වා (16) නැමති සිසුවා මෙසේ වන අලි පහරට ලක්ව මියගොස් ඇතැයි පොලිසිය කීය .

මෙම සිසුවා පෙරේදා (10) රත්කිද වන වගා රක්ෂිතයේ පයින් ඇවිදීමට ගොස් ඇති බවත් ,සිසුවා නිවසට නොපැමිණි හෙයින් නිවැසියන් මේ සම්බන්ධයෙන් පොලිසියට දැනුම් දී තිබේ .

අනතුරුව ගිරාදුරුකෝට්ට පොලිසියේ නිලධාරීන් ,වනජීවි නිලධාරීන් ප්‍රදේශ වාසින් එක්වී පොලිස් හදිසි ඇමැතුම් අංශයට ලැබුණු තොරතුරක් මත වන අලින් ගැවසෙන රත්කිද වන වගා රක්ශිතයේ සිදු කළ මෙහෙයුම දි සිසුවාගේ මළ සිරුර සොයා ගත් බවද පොලිසිය සඳහන් කළේය . වන අලියකු පහරදීමෙන් සිසුවාගේ හිසට ,සිරුරට බරපතළ ලෙස තුවාල සිදුව තිබිණැයි පොලිසිය පැවසීය .

මෙම සිසුවාගේ මළසිරුර දැනට ගිරාදුරුකෝට්ට රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත.

ගිරාදුරුකෝට්ටේ පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වති .

# ආනවිළුන්දාවට අනවසරයෙන් ඇතුළු වන්න බෑ

## ඇමැති සී. බී. රත්නායක

**චන්ද්‍රිමා කරුණාරත්න**

රැම්සා ගිවිසුම යටතේ තෙත් කලාපයක් බවට පත් කර තිබෙන ආනවිළුන්දාව තෙත් බිම් කලාපයට කිසිවකුටත් අනවසරයෙන් ඇතුළු විය නොහැකි බව වනජීවි හා වන සංරක්ෂණ අමාත්‍ය සී.බී.රත්නායක මහතා පැවැසීය.

ඒ අනුව මෙම තෙත් බිම් කලාපයට අනවසරයෙන් ඇතුළු වී ඉස්සන් කොටු ඉදිකරමින් පරිසරයට හානි කිරීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන බව පෙන්වා දුන් ඒ මහතා ඊට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව තරාතිරම නොබලා නීතිය ක්‍රියාත්මක කරන බව ද සඳහන් කළේය.

ඒ මහතා මේ බව පැවැසුවේ රාජගිරියේ දී ඊයේ (11) සංවිධානය කර තිබූ මාධ්‍ය හමුවකට සහභාගී වෙමිනි.

එහිදී වැඩි දුරටත් අදහස් දක්වමින් ඇමැතිවරයා පෙන්වා දුන්නේ රැම්සා තෙත් බිම් පරිසයේ ඉස්සන් කොටු ඉදිකරමින් පරිසරයට හානි කිරීම සම්බන්ධයෙන් පුද්ගලයන් තිදෙනෙකු මේ වනවිට අත්අඩංගුවට ගෙන තිබෙන බවයි.

# යාපනයේදී ඇල්ලූ හෙරොයින් රස පරීක්ෂකට



**නිමල් රාජපක්ෂ**

යාපනයේ ඉතා රහසිගතව මත්කුඩු ජාවාරම සිදු කළ ස්ථානයක් වටලා රුපියල් හයදහසක් වටිනා හෙරොයින් සහ සැකකරුවකු යාපනය සුරාබදු නිලධාරීන් විසින් පෙරේදා දහවල් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් මත්කුඩු තොගයේ හෙරොයින් මිලි ග්‍රෑම්ස් 320 ක් තිබූ බව සුරාබදු මාධ්‍ය ප්‍රකාශක ,නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් කපිල කුමාරසිංහ මහතා පවසයි.

අත්අඩංගුවට ගත් සැකකරු යාපනය ප්‍රදේශයේම පදිංචි කරුවකු වන අතර යාපනය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මහේස්ත්‍රාත්වරයා සැකකරු මේ මස 22 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස නියම කොට ඇත.හෙරොයින් තොගය රස පරීක්ෂක දෙපාර්තුමේන්තුව වෙත යවන ලදි.

## ශ්‍රීකාන්තගේ ශ්‍රීදූපත




# පැති බැම්මක් නැති සුල්තානාගොඩ වැවට තරුණයා බිලි



**වජිර පූජිත ගුණවර්ධන - තෙලිජ්ජවිල සමූහ**

දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්මේන්තුවට අයත් ඝණ මීටර් හතළිස් හතර දහසක ධාරිතාවකින් යුතු අකුරුගොඩ සුල්තානාගොඩ වැව අසලින් වැටී ඇති සුල්තානාගොඩ - උනැල්ල මාර්ගයේ පෙරේදා (10) රාත්‍රී මිතුරකුගේ නිවසේ පැවති පින්කමකට සහභාගි වී තම නිවෙස බලා සිය යතුරුපැදියෙන් ගමන් කරමින් සිටියදී මාර්ගයෙන් ඉවතට පැන වැවට වැටී මේ අනතුර සිදුව ඇති බවට සැක පහළ කරයි.

මෙසේ මිය ගොස් ඇත්තේ පෞද්ගලික අංශයේ රැකියාවක නියුතු සුල්තානාගොඩ බදුවත්තේ පදිංචි දරුවන් තිදෙනෙක්ගෙන් යුතු පවුලක වැඩිමහල් දරුවා වන ගනේගොඩ විතානගේ ගයාන් චන්දිම නම් 26 හැවිරිදි අවිවාහක තරුණයෙකි.

මේ සුල්තානාගොඩ-උනැල්ල මාර්ගය වැව ආරම්භයේ සිටම ඉවුර දිගේ වැටී ඇත. ඒ ඉවුර කාලාන්තරයක් සෝදායාම නිසා පාර පටුව ඇත. මේ අනතුරටද හේතුව ඒ තත්ත්වය හේතු වී ඇති බවත් පැතිබැම්ම ඉදි නොකළහොත් තවත් මෙවැනි අනතුරු සිදුවිය හැකි බව ප්‍රදේශවාසීහු කියති. කොටවිල පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි

# මන්නාරම් වෙරළට කේරළ ගංජා තොග පිටින් ඩිංගි බෝට්ටුවකින් අදිද්දී අත්අඩංගුවට



**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**

නාවික හමුදාව විසින් මන්නාරම වෙත්තිලකේණී වත්තිරායන් හා ඉලුප්පකඩවෙයි මුහුදු ප්‍රදේශයේ කළ සෝදිසි මෙහෙයුම් දෙකකදී කේරළ ගංජා කිලෝ ග්‍රෑම් 142 ක් සමග සැකකරුවන් දෙදෙනෙකු 10 දා අත් අඩංගුවට ගෙන තිබේ.

මින් එක් අයෙකු මුහුදු මගින් කේරළ ගංජා කිලෝ 43 ග්‍රෑම් 270ක පමණ ප්‍රමාණයක් කුඩා ඩිංගි යාත්‍රාවකින් රැගෙන එමින් සිටි පුද්ගලයකු වන අතර අනෙක් තැනැත්තා කේරළ ගංජා තොගය රැගෙන යෑම සදහා යතුරු පැදියක්ද සහිතව වෙරළේ සිටි පුද්ගලයෙකි.

ඉලුප්පකඩවෙයි ප්‍රදේශයේදී නාවික හමුදාව විසින් තවත් කේරළ ගංජා කිලෝ 98 ග්‍රෑම් 780 ක ප්‍රමාණයක් පදුරක් යට සගවා තිබියදී සොයා ගත් අතර මේවා ගෝනි දෙකක අසුරා තිබුණි.

නාවික හමුදා භාරයට ගන්නා ලද සැකකරුවන් වයස අවුරුදු 32ක් සහ 42ක් වන පේසාලේ සහ වත්තිරායන් යන ප්‍රදේශයන්හි පදිංචිකරුවන් වන අතර, නාවික හමුදා භාරයට ගත් කේරළ ගංජා, සැකකරුවන්, ඩිංගි යාත්‍රාව සහ යතුරු පැදිය ඉදිරි පරීක්ෂණ කටයුතු සඳහා පලෙයි සහ ඉලුප්පුකඩවායි යන පොලිස් ස්ථාන වෙත භාරදීමට කටයුතු කොට තිබේ.

# යක්කලමුල්ල අවටින් අනවසර ගිනි අවි 30ක් අල්ලයි

**අරුණි ප්‍රාර්ථනා ලියනගේ -හිනිඳුම සමූහ**

යක්කලමුල්ල පොලිස් වසමෙන් දින 45ක්තුළ නීති විරෝධී ගිනි අවි 30ක් පමණ සොයා ගැනීමට හැකිවී තිබේ. මෙසේ ගිනිඅවි ළඟ තබාගත් පුද්ගලයන් බොහෝ දෙනකු සතුන් දඩයම් කිරීම සඳහා සහ වෙනත් නීති විරෝධී කටයුතු සඳහා මෙම ගිනි අවි පාවිච්චි කර ඇතැයි පොලිසිය කියයි. මෙරට නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවි සහ විදේශීය රටවල නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවි මෙන්ම කොටන තුවක්කුද මෙසේ අත්අඩංගුවට ගෙන ඇත.මේ අතර ඇමරිකාවේ නිෂ්පාදිත බෝර 12 ගිනි අවියක් සමඟ සැකකරුවකු අක්මීමන විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන අක්මීමණ පොලිසිය වෙත බාරදී ඇත.

යක්කලමුල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දමිත පෙරේරා මහතාගේ උපදෙස්මත වැටලීම් සිදු කර තිබුණි.

# මහනුවරට කුඩු බෙදන 'කුඩු චීනා' අත්අඩංගුවට

**අසේල කුරුළුවංශ**

මහනුවර නගරයේ හා ඒ අවට ගම්මානවල මත් කුඩු බෙදාහරින ප්‍රධාන ජාවාරම්කරුවකු බව කියන කුඩු චීනා නමැත්තා මත්කුඩු ග්රෑම් 13 ක් සමඟ මහනුවර මූලස්ථාන පොලීසියේ දූෂණ මර්දන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඊයේ (10) අත්අඩංගුවට ගනු ලැබ තිබේ.

දූෂණ මර්දන ඒකකයට හා පොලිස් හදිසි ඇමතුම් ඒකකයට ලද තොරතුරකට අනුව හදිසි වැටලීමක් සිදුකොට මහනුවර රෝහල් පටුමගේදී සැකකරු අත්අඩංගුවට ගත්බව පොලීසිය පවසයි.

අත්අඩංගුවට ගත් මත්කුඩු වල වටිනාකම රුපියල් එක්ලක්ෂ පනස් දහසක් පමණ වන බවත් සැකකරු මෙයට පෙරද මත්කුඩු ජාවාරම සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ අයෙකු බවත් මහනුවර කොට්ඨාශභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුදත් මාසිංහ මහතා කීය.

## ගති කාව්‍ය

| | |
|---|---|
| කැලෑ කපන එක වැඩි වී තිබෙන හැඩයි | රටේ |
| තරාතිරම් නැතිව අදිනු දැන් නීතියෙ | ගැටේ |
| වහා පිළියමක් නොයොදා ගියොත් එහෙම | වටේ |
| හත් පොළේම මඩ ගෑවෙයි ඔන්න මෙදා | පොටේ |



ගජමන් නෝනා

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 සැප්තැම්බර් 12 සෙනසුරාදා

## පුංචි දේ ලස්සනයි!

සරල තැනකින් පටන්ගන්නැ'යි ජනාධිපතිවරයා රාජ්‍ය අමාත්‍යවරුන්ට උපදෙසක් දී තිබේ. සරල හා පුංචි තැන්වලින් පටන් ගැනීම ආර්ථික න්‍යායෙකි. ඒ හැරත් ශ්‍රී ලංකාව වැනි රටවලට එම න්‍යාය ඉතා හොඳින් ගළපාගත හැකිය. ඉන්දියාවේ ප්‍රකට ආර්ථික විශේෂඥයන් කිහිප දෙනකුම මෙහි ප්‍රායෝගික වැදගත්කම පෙන්වා දී ඇත. බංග්ලාදේශයේ ග්‍රාමීන් බැංකු ව්‍යාපාරයෙහි පදනම සරල හා පුංචි තැනින් පටන් ගැනීමය. එහි නිර්මාතෘ මහාචාර්ය මොහොමඩ් යුනුස් නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විශේෂඥයෙකි. නොබෙල් ත්‍යාගලාභී තවත් ආර්ථික විශේෂඥයකු වන ආචාර්ය ඊ.එෆ්. ෂූමාකාර් 'පුංචි දේ ලස්සනයි' නමින් පොතක්ද ලියා ඇත.

ආර්ථික විද්‍යාව අන් සියලු විද්‍යා පරයා පෙරමුණ ගෙන සිටී. එය නූතන ලෝකයේ වැදගත්ම විද්‍යාව බවට ද පත්ව තිබේ. රටක ඉදිරි ගමන තීන්දු කරන ප්‍රධාන සාධකය එරට ආර්ථික ප්‍රතිපත්තියයි. රාජ්‍ය නායකයකුගේ සාර්ථකත්වය තීන්දු කරන ප්‍රධාන සාධකය වන්නේ ද ඔහුගේ ආර්ථික ප්‍රතිපත්තිය හා දැක්මයි. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ආර්ථික දැක්ම හා වැඩපිළිවෙළ ඉතා පැහැදිලිය. එය මිනිසුන් වැදගත්කොට සලකන හා දේශීය සම්පත් කෙරෙහි වැඩි විශ්වාසය තබන ප්‍රායෝගික ආර්ථික දර්ශනයකි. ශ්‍රී ලංකාවේ පොඩි මිනිහා ඊට වැඩියෙන් ඇලුම් කරයි. තව ද, එය මේ භූමියේ පිහිටුවා ව්‍යාප්ත කළ හැකි ආර්ථික දර්ශනයකි.

භෞතික සම්පත් ලෝකය පුරා එක සමාන ලෙස ව්‍යාප්ත වී නැත. බොරතෙල් ඇත්තේ එක තැනකය. තිරිඟු ඇත්තේ තව තැනකය. දියමන්ති ඇත්තේ තවත් තැනකය. ඇතැම් ප්‍රදේශ කාන්තාර වෙයි. තව ප්‍රදේශ වැසි වනාන්තර වෙයි. තවත් ප්‍රදේශ මුඩු බිම් ලෙස පවතී. තිබෙන සම්පත් ප්‍රමාණවත් තරමින් පරිභෝජනයට ගත යුතුය. වුවමනාකම් සිහි බුද්ධියෙන් යුක්තව සපුරාගත යුතුය. ප්‍රාදේශීය සම්පත්වලින් ප්‍රාදේශීය වුවමනාකම් සපුරා ගැනීම බුද්ධිමය ජීවන ක්‍රමයක් බව නූතන ආර්ථික විද්‍යාව සඳහන් කරයි. ආනයන සිදු විය යුත්තේ අත්‍යවශ්‍ය කටයුතු සඳහා පමණි. අපේ සම්පත් අපේ වුවමනාකම් සඳහා හොඳටම ප්‍රමාණවත්ය. අවශ්‍ය වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය සංවිධානගත කිරීමය.

ශ්‍රී ලංකාවේ පිහිටීම, භූ - විසමතාව, දේශගුණික රටාව හා පස අගනා ස්වාභාවික සම්පත් ලෙස හඳුන්වනු ලැබේ. පිහිටීමට අනුව විශේෂ සාගර කලාපයක් අපට අයත්ය. දකුණු ආසියාවේ කේන්ද්‍රීය ස්ථානයක රට පිහිටා ඇත. එහෙත් පිහිටීමෙන් නිසි ප්‍රතිලාභ ලබන්නට තවම අපි සමත් වී නැත. රට වටා මුහුදක් පැවැතිය ද පරිභෝජනයට අවශ්‍ය මාළු ටික හෝ සපයා ගන්නට තවම අපි සමත් වී නැත. අපි මෙතෙක් අනුගමනය කර ඇති ආර්ථික උපාය මාර්ග හා ආර්ථික ප්‍රතිපත්ති වැරදි බව පෙනී යයි. රටට ගැළපෙන හා ජනතාවට ඔරොත්තු දෙන වැඩසටහන් අපට අවශ්‍ය වේ. ඒවා මහවැලි ව්‍යාපාරය මෙන් විශාල ව්‍යාපෘති නොවූවාට කමක් නැත. ජනාධිපතිවරයා සරල තැනින් පටන් ගන්න යැයි කියන්නේ ඒ නිසාය.

කිතුල්ගහට, ගම්මිරිස්වලට, අලිවැටට වග කියන රාජ්‍ය අමාත්‍යවරුන් පත් කිරීම අලුත් අත්දැකීමකි. කෙනකු එය හාස්‍යයට ලක් කරන්නටත් පුළුවන. එහෙත් එහි කිසිදු විහිළුවක් නැත. එහි ඇත්තේ යථාර්ථවාදී තෝරාගැනීමකි. අපේ විභව සම්පත් ආවරණය වන අයුරින් රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක විය යුතු අතර, සෑම ක්ෂේත්‍රයක් සඳහා වගකීම් දරන්නකු හා වගකීම් දරන ආයතනයක් පැවැතීම ඉතා වටී. නිදි වර්ජිතව වැඩකරන පුංචි මිනිසුන්ගෙන් ලෝකය වෙනස් කළ හැකිය. එහෙත් ඔවුන් කළමනාකරණ ක්‍රියාවලියකට හසු කර ගත යුතුය. ඒ වෙනුවෙන් වගකීම් හා යුතුකම් ඉටු කරන නායකයකු සිටීම ඉතා වැදගත්ය. ජනාධිපතිවරයා මේ තත්ත්වය හොඳින් වටහාගෙන තිබේ. අමාත්‍යවරුන් ද තම වගකීම් වටහාගත යුතුය.

ජනාධිපතිවරයා මේ වැඩසටහන හා දැක්ම හඳුන්වා දෙන අතර, නිලධාරීන් වෙතින් ද රාජ්‍ය අමාත්‍යවරුන් වෙතින් ද ඉල්ලීමක් කරයි. එනම්: කාර්යක්ෂම ලෙස වැඩ කරන හැටියටය. පුංචි මිනිසුන්ගේ ඉල්ලීම් ලිපි ගොනු තුළ වසර ගණන් පුස් කයි. පුංචි මිනිසාට නිලධාරීන් හමු වීමට අවස්ථාවක් නැත. කරුණු පැහැදිලි කිරීමට ඉඩක් නැත. දේශපාලකයන් දකින්නේ ඡන්ද කාලයට පමණි. මේ සියල්ල වෙනස් විය යුතු කාලය පැමිණ තිබේ. එක්කෝ වැඩ කළ යුතුය; බැරි නම් ඉවත් විය යුතුය. හැම කෙනකු වෙතම පැවරී ඇති වගකීම නිශ්චිතය. ඉන් මඟහැර යෑම කළ නොහැකිය. ඇතැම් ගැමියකුගේ ගැටලුව ඉතා සරලය. ලිපියකින්, උපදේශනයකින් හෝ එක දුරකතන ඇමතුමකින් එය විසඳිය හැකිය. එවන් දෙයක් සඳහා කල්මරන්නේ කුමට ද?

ඉදිරියට එළඹෙන්නේ අභියෝගාත්මක කාලයකි. කොවිඩ් 19 ලෝක වසංගතයේ බලපෑම තවත් වසර දෙකක්වත් පවතින බවට පුරෝකථන ඉදිරිපත් වී ඇත. එය මනුෂ්‍ය ජීවිත කෙරෙහි ප්‍රබල තර්ජනයක් එල්ල කර ඇති සේම දරුණු ලෙස ලෝක ආර්ථිකය පසුබෑමට ලක් කර තිබේ. දියුණු වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටවලට මෙහි බලපෑම තදින් දැනෙන්නට පුළුවන. අප එම අභියෝගයට සූදානම් විය යුතුය. කොවිඩ් 19 වසංගතයට සාර්ථකව මුහුණදීමට ශ්‍රී ලංකාව සමත් වූ බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවා පිළිගෙන ඇත. එහි දෙවන අභියෝගය ද අපට ජය ගත හැකිය. ඒ සඳහා සාමූහික ප්‍රයත්නයක් දැරීම සිදු විය යුත්තකි. එකිනෙක තැනැත්තන් ස්වකීය කාර්යභාරය නොපිරිහෙළා ඉටු කිරීම අනිවාර්යයෙන් සිදු විය යුතුය.


පුංචි යැයි නොසලකා හැරීම වැරදිය. සරල යැයි අත්හැරීමත් වැරදිය. පුංචි තැනින් පටන්ගෙන විශාල ව්‍යාපෘති කරා ගමන් කළ හැකිය. සරල ප්‍රශ්න පළමුව විසඳීම වඩා කාලෝචිතය. සංකීර්ණ ගැඹුරු ප්‍රශ්න විසඳීමට පහසුවක් එයින් ලැබේ.

### දිල්රුගෙ සීවිද

| | |
|---|---|
| නවතනවාලු මරනා එක මසට | හරක් |
| පර පණ නසා නොදමන එක බොහොම | පිනක් |
| කඳ බඩ තිබුණාට මොළයක් නොමැති | පෙළක් |
| දෙකකුල් හරකුන්ට කිම නොකරන්නෙ | යමක් |



# කාලගුණයෙන් හෙල්ලෙන ලෝකය



**නයිල් නදිය පිටාර ගැලීම හේතුවෙන් වසර දහස් ගණනක් පැරැණි ඓතිහාසික පිරමීඩවලටද තර්ජනයක් ඇති වී තිබේ. එලෙස බිය පළ වී ඇත්තේ ගංගාවේ ජල මට්ටම ඉහළ නැඟීමත් සමඟ මෙරෝ සහ නුරි පිරමීඩ ජලයෙන් යට විය හැකි බවටය. මෙරෝ පිරමීඩ පිහිටා ඇත්තේ නයිල් නදී ඉවුරේ සිට අඩි 1650ක් තරම් සමීපයෙනි.**

කොරෝනා වසංගතයෙන් පීඩාවට පත් අමෙරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්තයට ලැව් ගිනි සමඟ ද සටනක යෙදීමට සිදුව තිබේ. අමෙරිකාව ගිනි නිවීමට වෑයම් කරද්දී නයිල් නදිය පිටාර ගලමින් ඇති බැවින් ඉපැරැණි පිරමීඩ රැක ගැනීමට සුඩානය වෙහෙස දරමින් සිටී.

කැලිෆෝනියාවේ, සැන් ෆ්‍රැන්සිස්කෝ බටහිර වෙරළ තීරයට ඉහළ අහස මේ දිනවල දිස්වන්නේ තැඹිලි පැහැයෙනි. එය අඟහරු ලෝකයේ දර්ශනයක් දැයි සිතෙන තරම් බව ඇතැම් අය පවසා තිබිණි. මෙම දරුණු ලැව් ගිනි තත්ත්වය බලපා ඇත්තේ කැලිෆෝනියාවට පමණක් නොවේ. මේ වන විට ඔරිගන් හා වොෂින්ටනය දක්වා ද ඒවා පැතිර තිබේ. ගින්නෙන් නිවාස ගණනාවක් විනාශ වී ඇති අතර, දහස් සංඛ්‍යාත මිනිසුන්ට උන්හිටි තැන් අහිමිව ඇත. හිරු එළිය දැක ගැනීමට නොහැකිය. එය මීදුමෙන් මෙන්ම දුමාරයෙන් ද වැසී ගොසිනි. උදෑසන 8 වන විට ද ඇත්තේ උදෑසන 6.00ට බඳු තත්ත්වයකි. පෙ. ව. 11.00 වන විට ද සැන්ෆ්‍රැන්සිස්කෝහි ඇත්තේ අඳුරකි.

මේ වන විට සති කිහිපයක් මෙම ලැව් ගිනි තත්ත්වය දැකිය හැකිය. ඉන් විනාශ වී ඇති වනාන්තර ප්‍රමාණය අක්කර ලක්ෂ 23ක් වෙතැයි ගණන් බලා ඇත. එමෙන්ම එය ඉකුත් වසරේ දී ලැව් ගිනි හේතුවෙන් විනාශ වූ භූමි ප්‍රමාණයට වඩා විසි ගුණයකි. සැන්ෆ්‍රැන්සිස්කෝ බොක්ක ආශ්‍රිතව ජීවත් වන ජනතාව පවසන පරිදි මෙවැනි තත්ත්වයක් ඔවුන් සිය ජීවිත කාලයේදීම දැක නැත. කැලිෆෝනියාවට ලැව් ගිනි අමුත්තක් නොවුණ ද මෙවර එහි ඇති ප්‍රබලත්වය ඔවුන් පවා මවිතයට පත් කර ඇත.

## කැලිපෝනියාවේ ලැව් ගිනි

කාලගුණ විද්‍යා අංශ අනතුරු අඟවන පරිදි මෙම ආපදා තත්ත්වය ලබන බදාදා වන තෙක් පවතී. නගරයේ සවි කර ඇති වායු ස්වභාවය මැන බැලීමේ උපකරණවල මෙම අගය සලකුණුව ඇත්තේ මධ්‍යස්ථ පරාසයකය. කෙසේ වුවද, කාලගුණ විද්‍යා අංශ පවසන්නේ එම දර්ශක අසම්පූර්ණ බවය. ඒ, වායුගෝලයේ කුඩා අංශු පමණක් එම උපකරණ මඟින් ගණනය කෙරෙන බැවිනි.

දරුණු සුළං තත්ත්වය හමුවේ ලැව් ගිනි නිවා දැමීමට දැඩි සටනක යෙදීමට ගිනි නිවන භටයන්ට සිදුව ඇත. මේ ලැව් ගිනි සමය කැලිෆෝනියානු ඉතිහාසයේ දරුණුතම ලැව් ගිනි ආපදාව බවට දැනටමත් මත පළ වී තිබේ.

නිවාස, යාන වාහන ආදී දේපළ 4000 ක් පමණ ගින්නට හසු වී ඇති අතර, 8 දෙනකු ජීවිතක්ෂයට පත් වී ඇත. බිග් ක්‍රීක් නගරයේ නිවාසවලින් අඩක්ම ගින්නෙන් විනාශ වී තිබේ. ගිනි නිවන භට කණ්ඩායමක නායකයකු වන ටොම් පෝටර් පවසන පරිදි මීට වසර කිහිපයකට පෙර දකුණු සියෙරා ප්‍රදේශයේ ලැව් ගිනි හේතුවෙන් විනාශ වූ ගස් සංඛ්‍යාව මිලියන 150 කි.

අවට ප්‍රදේශවල උෂ්ණත්වය වාර්තාගත අන්දමින් ඉහළ දැමීමට මේ ලැව් ගිනි හේතු වී ඇත. එම අගයන් සටහන් වන්නේ ෆැරන්හයිට් අංශක 108, 120 ආදී වශයෙනි. කැලිෆෝනියාවේ උෂ්ණත්වය ගත වූ තිස් වසර තුළ සෙල්සියස් අංශකයකින් ඉහළ ගොස් ඇති අතර, ඊට බලපා ඇත්තේ ද මේ ලැව් ගිනි ආපදාය. ඉකුත් සඳුදා වොෂින්ටනයේ පමණක් අක්කර 300,000 ක් ගින්නෙන් විනාශ වී ඇත.

කැලිෆෝනියාවේ ලැව් ගිනි ඒ සා විශාල විනාශයක් සිදු කරද්දී සුඩානය ද දරුණු ගංවතුර තත්ත්වයක් හේතුවෙන් පීඩාවට පත්ව සිටී. සිය දෙනකු පමණ ජීවිතක්ෂයට පත්ව ඇති අතර, නිවාස ලක්ෂයක් පමණ ජලයෙන් යට වී හා විනාශ වී තිබේ. අවතැන් වූ සංඛ්‍යාව පන්ලක්ෂයකි. එරට ඉතිහාසයේ මුහුණ දුන් ප්‍රබලම ස්වභාවික ආපදා තත්ත්වයක් යටතේ සුඩාන රජය මාස 3ක හදිසි තත්ත්වයක් හා හදිසි ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් කර තිබේ. එක දිගට ඇදහැලුණු දරුණු වැසි සමඟ නයිල් නදිය පිටාර ගැලීමෙන් අල්-ෂිග්ලා ඔම්ඩර්මාන් නගර ඇතුළු ප්‍රාන්ත 16ක් ජලයෙන් යට වී ඇත. මීට පෙර මෙතරම් ප්‍රබල ගංවතුර ආපදා තත්ත්වයක් එරටට බලපෑවේ 1946 හා 1988 වසරවලදීය. මෙවර තත්ත්වය ඊට වඩා දරුණුය. නිල් නයිල් නදියේ ජල මට්ටම වාර්තාගත අන්දමින් මීටර් 17.58 තෙක් ඉහළ නැඟ තිබිණි. අවතැන්ව සිටින ජනයාගෙන් ඇතමෙක් ප්‍රකාශ කරන්නේ සියල්ල අහිමි වී ඇති බවය. ඇතැම් දෙනා රජයට චෝදනා කරන අතර, ආපදාවේ තරමට තමන් රැක ගැනීමට රජය අපොහොසත්ව ඇතැයි කියා සිටී. හිසට සෙවණක්, ආහාර, ඖෂධ මෙන්ම ළමයින් සඳහා එන්නත් හදිසි අවශ්‍යතා වී ඇති බව ඔවුහු පවසති. තමන්ට උපකාර වීමට කිසිවකුත් ඉදිරිපත්ව නැතැයි ඇතැම් දෙනා චෝදනා කරති. ඉංජිනේරුවකු අල්ජසීරා පුවත් සේවයට කියා තිබුණේ වැසි සමය සෑම වසරකදීම එළැඹෙන නමුත් රජය ඊට සූදානම්ව සිටි බවක් නොපෙනෙන බවය. එහිදී නව භාරකාර රජය අසමත් වී ඇති බව ඔහුගේ අදහසයි.

නයිල් නදිය පිටාර ගැලීම හේතුවෙන් වසර දහස් ගණනක් පැරැණි ඓතිහාසික පිරමීඩවලට ද තර්ජනයක් ඇති වී තිබේ. එලෙස බිය පළ වී ඇත්තේ ගංගාවේ ජල මට්ටම ඉහළ නැඟීමත් සමඟ මෙරෝ සහ නුරි පිරමීඩ ජලයෙන් යට විය හැකි බවටය. මෙරෝ පිරමීඩ පිහිටා ඇත්තේ නයිල් නදී ඉවුරේ සිට අඩි 1650ක් තරම් සමීපයෙනි.



එම පුරාවිද්‍යාත්මක උරුම රැක ගැනීම වෙනුවෙන් ඒ වටා වැලිකොට්ට යෙදීමට පියවර ගෙන තිබේ. මීට පෙර ගංවතුර හේතුවෙන් මෙම පුරාවිද්‍යාත්මක නටබුන්වලට හානි සිදු වී නොමැත.

නූරි පිරමීඩ පිහිටා ඇත්තේ කාර්ටෝම් අගනුවර සිට සැතපුම් 200ක් පමණ දුරිනි. එම පිරමීඩය තුළ ක්‍රි.පූ. 7 වැනි සියවසේදී රට පාලනය කළ තහාර්කා රජුගේ සොහොන් ගැබ පිහිටා ඇත. එම සොහොන් පිහිටා ඇත්තේ පොළොව මට්ටමේ සිට අඩි 22 - 32 භූගතවය. ඉන් ඇතැම් සොහොන්වලට දැනටමත් හානි සිදු වී ඇති බවට වාර්තා තිබේ.

කෙසේ වුවද මෙම පිරමීඩ හමුවේ ඇති එකම අනතුර ගංවතුරම නොවේ. ඉකුත් ජූලි මාසයේ එම ප්‍රදේශවල සංචාරය කළ පුරාවිද්‍යාඥ කණ්ඩායමක් අනාවරණ කළ පරිදි නිධන් හොරු අඩි 55 - 65 තරම් ගැඹුරට උමං හාරා එම වස්තුව මංකොල්ල කෑමට වෑයම් කර ඇත. මෙහිදී ඔවුන් හානි කර ඇත්තේ වසර 2000ක් තරම් පැරැණි ඉදිකිරීම්වලටයි. මෙම කැණීම්වලින් ඔවුන් වෑයම් කර තිබෙන්නේ රත්‍රන් සෙවීමටය. එහිදී බර යන්ත්‍රෝපකරණ පවා භාවිත කර ඇත.

කුෂ් පිරමීඩ පෙදෙස නයිල් නදියේ සිට මීටර් 500ක් තරම් දුරින් පිහිටා ඇත. කාර්ටොම් අගනුවර සිට දුර කි.මී. 200ක් තරම් වේ. මෙම පෙදෙසේ පුරාවිද්‍යාත්මකව වැදගත් නටබුන්ව ගිය ඉදිකිරීම් රාශියකි.

## සමාජ බලපෑම්


මෙවැනි ලැව් ගිනි තත්ත්ව මෙන්ම ගංවතුර ආපදා ඉතිහාසයේ නොවූ විරූ අන්දමින් හානිදායක මෙන්ම ප්‍රබල වීමට දේශගුණික විපර්යාස බලපා ඇති බව විද්‍යාඥයෝ පෙන්වා දෙති. ඉකුත් වසර අග භාගයේ දී මේ අයුරින්ම වැනීසිය ද ජලයෙන් යට විය. ඔස්ට්‍රේලියාවේ දරුණු ලැව් ගිනි මාලාවක් ඇති විය.

ගංගා පිටාර ගැලීමට අමතරව වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යාමෙන් මුහුදු මට්ටම ඉහළ නැඟීම ද සිදු වේ. එය වෙරළාශ්‍රිත පත් බිම් මුහුදු ජලයෙන් යටවීමට බලපායි.

ඔස්ට්‍රේලියාවේ ලැව් ගිනි ද අධ්‍යයනය කරමින් Lancet නම් වෛද්‍ය සඟරාව මෑතදී අනාවරණ කළේ වසර 2000 සිට බලන විට මිනිසුන්, ගිනි ගැනීම් සඳහා නිරාවරණ වීම දෙගුණයකින් ඉහළ ගොස් ඇති බවය. එය සෞඛ්‍යමය තර්ජනයකි. ඊට අමතරව සමාජ හා ආර්ථික බලපෑම් ද තිබේ. මීට පෙර ඇති වූ ස්වභාවික ආපදාවලින් සිදු වූ ජීවිත හා දේපළ හානි පිළිබඳ කර ඇති ගණනය කිරීම්වලින් ද ඒ බව පැහැදිලි වේ.

දැනටමත් විද්‍යාඥයන් පෙන්වා දී ඇති පරිදි ගෝලීය උෂ්ණත්වය ඉහළ නැඟීමේ ප්‍රතිඵල ලෙස ඇතැම් ප්‍රදේශ ලෝක සිතියමෙන් මැකී යාමේ අවදානම පවතී. වසර දහස් ගණනක් ඉපැරැණි, මෙතෙක් කලක් නොයෙක් ස්වාභාවික තත්ත්ව යටතේ සුරැකිව පැවැති පුරාවිද්‍යාත්මක උරුම අනාගත පරම්පරාවන්ට දැක බලා ගැනීමට නොහැකි වන පරිදි වැනසී යාම ද මේ හේතුවෙන් සිදු වේ. මේ කාරණා පිළිබඳ දශක කිහිපයක් තිස්සේ සංවාදයට ලක් වෙමින් තිබුණ ද දැනට අත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳ සතුටු විය නොහැකි බව මෙම අත්දැකීම්වලින් ද පැහැදිලිය. ඒ සියල්ලෙන් පැහැදිලි කෙරෙනුයේ පමා වීමට කාලයක් ඉතිරිව නැති බවය. සැලකිය යුතු සම්මුති, ප්‍රඥප්ති, ගිවිසුම් සංඛ්‍යාවක් සම්මත වී ඇත. ලොව රටවල් සියල්ල පාහේ ඒ කවර හෝ සම්මුතියකින් බැඳී සිටිති. එසේ තිබිය දී වුවද සොබා දහමට එරෙහි මානව ක්‍රියාකාරකම් පාලනය කර ගැනීමට අපොහොසත් වීම යනු අනාගතයේ දී මිල කළ නොහැකි වන්දියක් ගෙවීමට මිනිසාට සිදු වීම බව දැනටමත් පැහැදිලිය.

**ධම්මික සෙනෙවිරත්න**



# අපේ ප්‍රධාන අරමුණ නිර්මාණකරුවන්ට හොඳ වෙළෙඳපොළක් සැකසීමයි





ජාතික ශිල්ප සභාවේ සභාපති
**සුදත් අබේසේකර**

සහජයෙන් ලැබෙන කලා නිපුණතාවක් සතත අභ්‍යාස සහ නිසි හැදෑරීමකින් ප්‍රගුණ කළ පසු දක්ෂ නිර්මාණ ශිල්පීහු බිහි වෙති. හස්ත කලා නිර්මාණ සිය ජීවනෝපාය මාර්ගය බවට පත් කර ගන්නා එබඳු ශිල්පීන්ගේ ආර්ථික මට්ටම ඉහළ නොයෑම ඔවුන් දිගින් දිගට මුහුණදෙන ගැටලුවකි. වර්තමානයෙහි හස්ත කලා නිර්මාණ ශිල්පය වෙත රාජ්‍ය අවධානය තදින්ම යොමු වී ඇති අතර ඒ නිසා ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන් අතරද ඒ කෙරෙහි දැඩි උද්‍යෝගයක් මතු වී තිබේ. මේ පිළිබඳ අදහස් දැක්වීම සඳහා ජාතික ශිල්ප සභාවේ සභාපති **සුදත් අබේසේකර** මහතා එක් විය.



**● හස්ත කලා නිර්මාණ ශිල්පීන් මුහුණ දෙන ගැටලු ලෙස ඔබ හඳුනාගෙන ඇත්තේ මොනවාද ?**

ඔවුන් මුහුණදෙන ප්‍රධානම ගැටලුව නිර්මාණ සඳහා හොඳ වෙළෙඳ පොළක් නොමැතිවීම යි. පසුගිය පාස්කු ප්‍රහාරය හස්ත කලා නිර්මාණ ක්ෂේත්‍රයට තදින්ම බලපෑම් එල්ල කළා. ඉන් අනතුරුව පැමිණි කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම පාහේ බිඳවැටෙන විට එහි අහිතකර බලපෑම වැඩිපුරම එල්ල වුණේ මේ නිර්මාණ ශිල්පීන්ට. ඔවුන් මුහුණ දෙන අනිත් සියලු ගැටලු නිර්මාණය වන්නේ වෙළෙඳ පොළක් නොමැති වීම නිසා අතට මුදල් නොලැබීම හේතුවෙන්.

**● මෙම ගැටලුවලට ඔබ ශිල්ප සභාව මගින් යොදන විසඳුම් මොනවාද?**

අමාත්‍යාංශය ඇතුළු අප සියලු දෙනාම ඒ සඳහා තීරණය කළ කඩිනම්ම විසඳුම ඔවුන්ට වෙළෙඳපොළක් සකස් කර දීම. ඒ සඳහා අප ගත් පළමු ක්‍රියාමාර්ගය සෑම බ්‍රහස්පතින්දා දිනකම දියත උයනෙහි ශිල්ප ශ්‍රී ලංකා නමින් වෙළෙඳ ප්‍රදර්ශනයක් සහ පොළක් පැවැත්වීම. මෙම මස 16,17 දෙදින මෙහි පළමු ප්‍රදර්ශනය සහ පොළ දියත උයනේ දී පැවැත්වෙනවා ශ්‍රී ලාංකික කලා නිර්මාණ ශිල්පීන්ගේ නිර්මාණ මිලදී ගැනීම සඳහා දෙස් විදෙස් ඕනෑම අයකුට සෑම සතියකම බ්‍රහස්පතින්දා එම ස්ථානයට පැමිණීමටත් අවස්ථාව හිමිවෙනවා. මෙහි වෙළෙඳ කුටි 125 කට අධික ප්‍රමාණයක් සූදානම් කර තිබෙනවා. සංචාරක දිනපොත් සඳහාත් මේ දිනය සහ මේ වැඩපිළිවෙළ පිළිබඳ අප සටහනක් තබනවා. එයින් ලංකාවට පැමිණෙන සංචාරකයන්ට එම නිර්මාණ මිලදී ගැනීමට පහසු වෙන් අවස්ථාව ලැබෙනවා. එමගින් හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්නට යම්කිසි අඩිතාලමක් සැකසෙනු ඇතැයි අප අපේක්ෂා කරනවා.

**● වෙළෙඳ කටයුතු සඳහා අගනුවරට පැමිණිය නොහැකි පිට ප්‍රදේශවල ශිල්පීන්ට යම්කිසි සහනයක් උදාවන්නේ නැද්ද?**

ශිල්ප සභාවේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල පිහිටි ස්ථාන ආශ්‍රිතව ඉඩකඩ ඇති තැන් සොයා බලා ඒ තැන්වලත් සෑම බ්‍රහස්පතින්දාවකම මෙවැනි ප්‍රදර්ශනයක් සහ පොළක් පැවැත්වීමේ කටයුතු මේ වන විට සූදානම් කරමින් පවතිනවා. එයට අමතරව එම ස්ථානවල නිරන්තරයෙන්ම නිර්මාණ මිලදී ගත හැකි ආකාරයේ වෙළෙඳ කුටි ඉදි කරන්නත් අපේක්ෂා කරනවා.

**● ප්‍රදර්ශනයට සම්බන්ධ වෙන්නට අපේක්ෂා කරන ශිල්පීන් ඒ සඳහා කළ යුතු මොනවාද?**

මුලින්ම නිර්මාණ ශිල්පියකු ලෙස ශිල්ප සභාවේ ලියාපදිංචි විය යුතුයි. එමගින් ඔවුන්ට වෙළෙඳපොළට සහභාගී වීමට අමතරව තවත් බොහෝ වරප්‍රසාද හිමිවනවා. මූලිකවම ශිල්ප සභාවේ ලියාපදිංචි ශිල්පීන් බලගැන්වීමට අප අපේක්ෂා කරනවා. තමන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දී ගැනීම සහ ප්‍රවාහනය වැනි කටයුතුවලදී එල්ල වන නෛතික ගැටලුවලට බොහෝ ශිල්පීන් මුහුණ දෙනවා. ශිල්ප සභාවේ ලියාපදිංචි ශිල්පීන් සෑම කෙනකුටම අප හැඳුනුම්පතක් ලබා දෙනවා. එම හැඳුනුම්පත හිමි ශිල්පියාට යම්කිසි සීමාවක් යටතේ තමන්ට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම වැනි කටයුතු පහසුවෙන් සිදු කරන්නට අවශ්‍ය කටයුතු සූදානම් කර තිබෙනවා. ශිල්පීන්ට අවශ්‍ය ණය පහසුකම් ලබා ගැනීමේදී ද එම හැඳුනුම්පත ඉදිරිපත් කිරීම මගින් එම කටයුතු පහසුවෙන් කරගත හැකියි.

> **මුලින්ම නිර්මාණ ශිල්පියකු ලෙස ශිල්ප සභාවේ ලියාපදිංචි විය යුතුයි. එමගින් ඔවුන්ට වෙළෙඳපොළට සහභාගී වීමට අමතරව තවත් බොහෝ වරප්‍රසාද හිමිවනවා. මූලිකවම ශිල්ප සභාවේ ලියාපදිංචි ශිල්පීන් බලගැන්වීමට අප අපේක්ෂා කරනවා.**

**● ශිල්ප ගම්මාන සංකල්පය පිළිබඳවත් විස්තර සඳහන් කළොත්,**

දැනටත් ශ්‍රී ලංකාවෙහි විවිධ ප්‍රදේශවල යම් යම් කර්මාන්ත සඳහා වෙන් වූ ගම්මාන තිබෙනවා. ඒ නිසා එම ගම්වල කිසිදු දියුණුවක් දක්නට ලැබෙන්නේ නැහැ. ඉදිරියේදී මෙම ගම්මාන කර්මාන්ත ශාලාවක් ආකාරයට සංවර්ධනය කරන්නට අපි අපේක්ෂා කරනවා. එහිදී නිර්මාණකරණය සඳහා අවශ්‍ය කරන අමුද්‍රව්‍ය ගම්මානය තැනටම සැපයිය හැකි ව්‍යවසායකයන් සහ නිර්මාණ වෙළෙඳපොළ වෙත රැගෙන යා හැකි පිරිස් හඳුනාගෙන අතරමැදි බලපෑම්වලින් තොරව ආරම්භයේ සිට අවසානය දක්වාම ගම්මානය තුළ මේ සියල්ල සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනවා .

**● රට තුළ හස්ත කලා නිර්මාණ සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි සපයා ගන්නට හැකියාව තිබෙනවා ද?**

අවශ්‍ය කරන අමුද්‍රව්‍ය අපේ රට තුළ තිබෙනවා. ගැටලුව වී තිබෙන්නේ ඒවා කළමනාකරණයකින් යුතුව සංසරණය නොවීමයි. ඉදිරියේ දී අමුද්‍රව්‍ය බැංකුවක් සකස් කරන්නට අප සූදානමින් සිටිනවා. දැනට නිර්මාණ ශිල්පියා රැගෙන යන අමුද්‍රව්‍ය ඔහු විසින්ම නිර්මාණයට අවශ්‍ය ආකාරයට පදම් කර ගත යුතුයි. එහි දී නිර්මාණය කරන්නට ගතවන කාලය සහ වෙහෙස වැඩියි. අප සකස් කරන අමුද්‍රව්‍ය බැංකුව හරහා , නිර්මාණ ශිල්පියාට නිර්මාණය කිරීමට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය පදම් කර සකස් කර ඔහුට ලබා ගත හැකි ආකාරයට සූදානම් කරනවා. ලංකාව තුළ සොයාගත නොහැකි අමුද්‍රව්‍ය ආනයනය කිරීමටත් අප කටයුතු සූදානම් කර තිබෙනවා.

**● හස්ත කර්මාන්ත ශිල්පීන් සමග බැඳුණු සමාජීය සමබරතාව පිළිබඳව සඳහන් කළොත්,**

මේ වන විට ලෝකය පුරාම කාර්යාල සංකල්පයෙන් බැහැරව නිවෙසේ සිට වැඩ කිරීමේ සංකල්පය ඉස්මතු වෙමින් තිබෙනවා. ඒ තුළ පවුල යන බැඳීම ශක්තිමත්ව ආරක්ෂා වන අතර මව්පියන් නිවෙසේ රැඳීම මගින් දරුවන්ට අවශ්‍ය සෙනෙහස ආරක්ෂාව අඩුවක් නොමැතිව ලැබෙනවා. හස්ත කලා නිර්මාණ සිදු කිරීම සහ හස්ත කර්මාන්ත මෙම පවුල් බැඳීම ශක්තිමත් කිරීමට ඉවහල් වන රැකියා අවස්ථා බිහි කර තිබෙනවා. නිර්මාණශිල්පීන් නිවෙසේ රැඳී සිටිමින් කටයුතු කිරීම තුළ දරුවන්ගේ ආරක්ෂාව තහවුරු වන අතර ඔවුන්ට අවශ්‍ය රැකවරණය සහ ආදරය නිරන්තරයෙන්ම හිමිවෙනවා. මේ තුළ සමාජයේ ප්‍රගමනයට හිතකර බලපෑමක් එල්ල වෙනවා. වඩාත් මානුෂීය යහපත් සමාජයක් ගොඩ නැඟීම කෙරෙහි මෙමගින් එල්ල වන වක්‍රාකාර බලපෑම සුළුකොට තකන්නට බැහැ.

**දිල්රූ ජයසේකර**

# පුස්තකාල සන්නද්ධ කිරීමේ අවශ්‍යතාව




> **කියවීම තුළින් මිනිස් සිත උත්තේජනයට ලක්වන බව නොරහසකි. අතීතයේ සිට අද දක්වා අපගේ මුතුන්මිත්තන් අපට දායාද කළ අත්දැකීම් උදෙසා පිවිසිය හැක්කේ කියවීම තුළිනි. ලෝකයේ බිහිවී තිබෙන සෑම පොතපතකම ගැබ් වී ඇත්තේ ඒ ඒ යුගයේ මානවයාගේ අත්දැකීම්ය.**

වර්තමාන ලෝකයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණය නම් තොරතුරුවල ශීඝ්‍ර වෙනස් වීමයි. නව තොරතුරු බිහිවීම හා තිබෙන තොරතුරු යල් පැන යෑම ලොව සුලභ ලක්ෂණයක් බවට පත්ව ඇත. මෙලෙස බිහිවන නවතම තොරතුරු ජනතාව කරා රැගෙන යන පොදු ජනතාවගේ කළණ මිතුරා බවට පත්ව තිබෙන්නේ පොතපත යැයි කීම නිවැරදිය. පොත්පත්වල ඇතුළත් මෙම තොරතුරු වෙත ජනතාව පිවිසෙන්නේ කියවීම තුළිනි. ‘නොදන්නවුන් දන්නවුන්ගේ පොත්පත් කියවීමෙන් නොදන්නවුන් දන්නවුන් බවට පත්වේ’ යනු ප්‍රසිද්ධ කියමනකි. මෙලෙස වෙනස් වන ලෝකය පිළිබඳ තොරතුරු ඇතුළත් පොත්පත් වෙත ජනතාවට නිදහසේ පියනැඟීමට වරම් ලබාදෙන පුස්තකාල මිහිපිට ඇති පූජනීය ස්ථාන විශේෂයක් ලෙස නම් කිරීම නිවැරදිය.

කියවීම තුළින් මිනිස් සිත උත්තේජනයට ලක්වන බව නොරහසකි. අතීතයේ සිට අද දක්වා අපගේ මුතුන්මිත්තන් අපට දායාද කළ අත්දැකීම් උදෙසා පිවිසිය හැක්කේ කියවීම තුළිනි. ලෝකයේ බිහිවී තිබෙන සෑම පොතපතකම ගැබ් වී ඇත්තේ ඒ ඒ යුගයේ මානවයාගේ අත්දැකීම්ය.

පොත්පත් හා කියවීම් සංස්කෘතියක් නොතිබෙන්නට අපට මේ අත්දැකීම් වෙත පිවිසීමට වරම් අහිමිවනු ඇත. උදාහරණයක් ලෙස ගතහොත් කුරුණෑගල යුගයේ විසු ජාතක කතා කරුවා සනිටුහන් කළ සදාතනික ධර්මතාවන්ට ජාතික කතා කියවීම තුළින් ප්‍රවිශ්ට විය හැකිය. මැක්සිම් ගෝර්කි, ලියෝ ටෝල්ස්ටෝයි වැනි සාහිත්‍යධරයන්ගේ නිර්මාණ කියවීම තුළින් එදා රුසියානු සමාජයේ රිද්මය හඳුනාගත හැකිය. ලෝකයේ ප්‍රමුඛ පුද්ගලයන්ගේ චරිතාපදාන කියවීම මගින් අපේ චරිතයන් හැඩගස්වාගත හැකිය. විශ්ව ඥානය වෙත පිවිසීමට දොරගුළු විවර වන්නේ කියවීම තුළිනි. කියවීම පදනම් වී ඇත්තේ සාක්ෂරතාව මතය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව සාක්ෂරතාවකින් තොර පුද්ගලයකු යනු ‘ඔහුගේ හෝ ඇයගේ දෛනික ජීවිතය හා සම්බන්ධ කරුණු පිළිබඳ කෙටි සහ සරල විස්තරයක් කියවීමටත්, ලිවීමටත් අවබෝධ කර ගැනීමටත් නොහැකි අයෙකි.’ එබැවින් සාක්ෂරතාව හා කියවීම අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවයකි. කියවීම තුළින් විශ්ව ඥානය වෙත පිවිසීමේ හැකියාව හිමිවන්නේ සාක්ෂරතාව තිබුණහොත් පමණි.

එහෙත් සාක්ෂරතාව ලොව ඇතැම් ජනකොටස්වලට අහිමි වූ වරප්‍රසාදයක් බවට පත්ව ඇත. වර්තමානයේ ලෝකයේ ජනගහනය බිලියන 6.5 කි. මෙයින් මිලියන 774 පමණ වූ වැඩිහිටි ජනගහනයට සාක්ෂරතා හැකියාවක් ඇත්තේම නැත. ලෝකයේ වැඩිහිටි ජනගහනයෙන් පස්දෙනකුගෙන් එක් අයකු නූගත් ලෙස ගණනය කර ඇත. 20 වන ශතවර්ෂයේ සිට 21 වන ශතවර්ෂයට ලොව පා නගන්නේ මෙවන් නූගත් ජනගහනයක් සමඟය. යුනෙස්කෝ සංවිධානය මගින් 2003-2012 කාලය ‘ජාත්‍යන්තර සාක්ෂරතා දශකය’ ලෙස නම් කර තිබුණේ මිහිතලයෙන් නූගත්කම තුරන් කරලීම උදෙසාය. යුනෙස්කෝ සංවිධානයේ වාර්තාවන්ට අනුව ලෝකයේ නූගත් ජනගහනයෙන් 85% එසේත් නැතහොත් මිලියන 650 ජීවත් වන්නේ රටවල් 35 ක වන අතර මේ රටවල සාක්ෂරතාව හැකියාව 30% වඩා අඩුය. මෙම නූගත් ජනගහනයෙන් 2/3 ම කාන්තාවෝය. මෙම රටවල් 35 ජනතාවට සාක්ෂරතා හැකියාව ලබාදීම උදෙසා වැඩසටහන් රැසක් යුනෙස්කෝ සංවිධානය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. සෝවියට් රුසියාවේ ලෙනින් බලයට පත්වූ පසු නගත්කම රටින් තුරන් කරලීම උදෙසා වැඩසටහන් රැසක් සම්පාදනය කළේය. ඔහු නූගත්කම හඳුන්වන ලද්දේ රුසියාවේ තෙවන සතුරා ලෙසය. එදා රුසියාවේ නූගත්කමට එරෙහි සටනේ ප්‍රධාන ශීර්ෂ පාඨයක් වූයේ ‘අකුරු නූගත් මිනිසා අන්ධයෙක් වැනිය. පරාජයත්, දුකත් ඔහු එන තෙක් බලා සිටී යන්නය’ අසහාය නායකයකු වූ වියට්නාමයේ හෝචිමින්ද විප්ලවය අවසානයේ කියා සිටියේ සාගතය, විදෙස් ආක්‍රමණ හා නූගත්කම යන සතුරන් වියට්නාමයෙන් තුරන් කළ යුතු බවය. කියුබාව සිය රටෙන් නූගත්කම දුරු කරලීමේ සටනට අවතීර්ණ වූ අතර ඇල්ෆබෙටාමස් නම් පාඩම් පොතක් ඒ සඳහා උපයෝගී කර ගත්හ. ජර්මනියේ සිටි ආඥාදායක ඇඩොල්ෆ් හිට්ලර් පවා විශ්වාස කළේ සිය රටෙන් නූගත්කම තුරන් කර ජනතාවට පොත්පත් කියවීමේ හැකියාව ලබාදීම තුළින් ඔවුන්ගේ සිත්සතන් වෙනස් කළ හැකි බවයි. ඒ අනුව ඔහු විසින් රචිත ‘මගේ හටනර නැමැති ග්‍රන්ථය තුළින් සිය අදහස් ජනතාව වෙත සන්නිවේදනය කරන ලදී.

## යුනෙස්කෝ ප්‍රතිපත්තිය

මෙහිදී ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය. මෙරට සාක්ෂරතා හැකියාව 94%කි. මෙහිදී අප අවධානය යොමු කළ යුත්තේ නූගත්කමෙන් වෙළී සිටින ඉතිරි 6%ටද සාක්ෂරතාවයක් ලබාදීම පිළිබඳවය. වරප්‍රසාද අහිමි වී ඇති මේ ජනකොටස ඉදිරියට යා යුතු කාලය එළඹ ඇත. මේ කාර්යයේදී පෙරමුණට යා යුතු ආයතන විශේෂයක් ලෙස මහජන පුස්තකාල හැඳින්විය හැකිය. යුනෙස්කෝ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව ‘දැනුම කරා යාමේ ප්‍රාදේශීය දොරටුව’ වන මහජන පුස්තකාල මගින් පුද්ගලයාට හා සමාජ කණ්ඩායම්වලට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ හැකියාව ස්වාධීන තීරණ ගැනීමේ අවස්ථා හා සංස්කෘතික ප්‍රගමනය සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබා දේ. ජාති, ආගම්, ගෝත්‍ර, වර්ණ ආදී භේදයන් පිටුදකිමින් ක්‍රියාත්මක වන මහජන පුස්තකාල ‘පොදු ජන විශ්වවිද්‍යාල’ ලෙස නම් දරා ඇත. ලොව මහා ප්‍රාඥයන් රැසකගේම නිර්මාණයන්හි තිඹිරිගෙය බවට පත්ව ඇත්තේ මහජන පුස්තකාලය ය. මේ වන විට ලෝකය පුරා පිහිටුවා තිබෙන මහජන පුස්තකාල සංඛ්‍යාව 320000 කට ආසන්නය. මෙයින්ද 73% පමණ පිහිටා ඇත්තේ සංවර්ධනය වෙමින් පවතින රටවලය. ලෝකයේ නූගත්කම තුරන් කරන සටනේ පෙරමුණ ගෙන සිටින ආයතන විශේෂය වන්නේද මහජන පුස්තකාලයන්ය. විශේෂයෙන් ආසියා, අප්‍රිකා හා ලතින් අමෙරිකානු රටවල ජනතාවගේ සාක්ෂරතාවය වර්ධනය කරලීම උදෙසා මහජන පුස්තකාල තුළින් වන සේවය ප්‍රශංසනීය ය.

ලෝකයේ අන් රටවල් හා සසඳා බැලීමේදී අප සතුව ඇත්තේ ඉතා උසස් සාක්ෂරතාවයකි. දැනුදු මෙරට බොහෝ පාඨක ප්‍රජාවගේ ක්ෂේම භූමි බවට පත්ව ඇත්තේ මහජන පුස්තකාලයන්ය. මෙරට ඇති මහජන පුස්තකාල සංඛ්‍යාව 1200 කට ආසන්නය.

දේප ව්‍යාප්ත මහජන පුස්තකාල පද්ධතියක් අප සතුව ඇත. සිය සීමිත සම්පත් උපයෝගී කර ගනිමින් අසීමිත පාඨක අවශ්‍යතා ඉටුකරලීමේ කාර්යයට උර දී තිබෙන මෙරට මහජන පුස්තකාල මෙරට නිහඬ සේවා මධ්‍යස්ථාන ලෙස නම් කළ හැකිය. තිස් අවුරුදු ත්‍රස්ත යුද්ධය නිමවී මෙරට උතුරු දකුණු සම්බන්ධය, දළුලමින් පවතී. ජාතීන් අතර තිබූ අවිශ්වාසය, විශ්වාසනීයත්වයක් බවට පත්ව ඇත. මේ තත්ත්වය තවදුරටත් වර්ධනය කරලීමට මෙරට මහජන පුස්තකාල පද්ධතිය උපයෝගී කර ගත හැකිය. මේ සඳහා යහපත් සිතුම් පැතුම්වලින් සමන්විත පොත්පත්වලින් උතුරේ මෙන්ම දකුණේද මහජන පුස්තකාල සන්නද්ධ කළ යුතුය. පොත් යනු ජීවමාන බලවේගයන්ය. වරක් මැක්සිම් ගෝර්කී ප්‍රකාශ කළේ පොත්වලට ආදරය කරන්න. පොත් ඔබගේ ජීවිතය පහසු කරනවා ඇත. අදහස්, හැඟීම් හා සිදුවීම් නැමැති විවිධාකාර කලබල සහිත අවුල් තත්ත්වයක් තුළින් මග සොයා යාමට මිත්‍රයකු මෙන් ඔබට පොත්පත් සහය වෙනවා ඇත. තමාටත් අනුන්ටත් ගෞරව කරන සැටි කියා දෙනවා ඇත. ඔබගේ හදවත මානව භක්තියෙන් හා දයාවෙන් පුරවනු ඇත.’ එවන් හැකියා වන්ගෙන් අනූන පොත් ලෝකය වෙත පාඨක ප්‍රජාව ආකර්ෂණය කරගන්නා ප්‍රජාතාන්ත්‍රික ආයතන විශේෂය වන්නේ මහජන පුස්තකාලයන්ය.

සිය වෘත්තිමය ගැටලුවලට පවා නිසි ලෙස විසඳුම් නොලැබ තිබුණද මෙරට මහජන පුස්තකාල වෘත්තිකයන් උදාසීන වී නොසිට තොරතුරු සාක්ෂරතාව වර්ධනය කරමින් දැනුම් සමාජයක් බිහි කිරීම උදෙසා සිය ඥානය පමණින්, ශක්ති පමණින් ඉටුකරනු ලබන සේවාව අතිවිශිෂ්ටය. මෙරට මහජන පුස්තකාල ව්‍යාපාරය ආරම්භ වී දශක 9කට ආසන්න කාලයක් ගෙවුණ ද පුස්තකාල වෘත්තිකයන් නිසි ලෙස ඇගයීමට ලක්වී නොමැත. මෙරට මහජන පුස්තකාලයාධිපතිවරුන් නිතර ප්‍රකාශ කළේ ‘අපි අසරණ වෙලා වගේ අපට දැනෙනවා යන්නය.’

මෙරට ඉතිහාසය දෙස විමසිලිමත්ව බැලීමේදී පැහැදිලි වන කරුණක් වන්නේ අතීතයේ සිටි බොහෝ පාලකයන් මෙරට ජනතාවගේ ආධ්‍යාත්මික වර්ධනය උදෙසා මහත් පරිශ්‍රමයක් දරා ඇති බවය. විශේෂයෙන් පොත්පත් රචනා කරමින්, පුස්තකාල ආරම්භ කරමින් ජන ජීවිතය යහ මගට ගැනීමට කටයුතු කර තිබේ. දේවානම්පියතිස්ස රජතුමාගේ කාලය තුළ මෙරට පිරිවෙන් සම්ප්‍රදාය මුල්බැස ගත් අතර ඒවා විවිධ වකවානුවල වර්ධනය විය. එදා සිට විවිධ රජවරු මේ සඳහා අනුග්‍රහය දැක්වීය. මෙරට ඉතිහාසයේ අග්‍රගණ්‍ය රජවරයෙකු වූ මහා විජයබාහු රජතුමා සාහිත්‍යකරණයේ නිරත විය. මහාවංශයට අනුව ‘සිංහල කාව්‍යකරණයෙහිලා මහා නුවණැති වූ රජ තෙමේ සිංහල කාව්‍ය රචනයන් අතරෙහි අග්‍ර වූයේය. මහා පරාක්‍රමබාහු රජතුමා ඉතිහාසගත වී ඇත්තේ පොලොන්නරුවේ රාජකීය පුස්තකාල දෙකකුත් රුහුණේ පුස්තකාල 128 කුත් ගොඩ නැංවූ නරපතියා ලෙසිනි. බටහිර ජාතීන්ගේ ආක්‍රමණය සමගම මෙරට පොත්පත් මෙන්ම ග්‍රන්ථකරණය ද විවිධ අභියෝගයන්ට ලක්විය.

## උතුරු දකුණු සබඳතා

1505 -1948 කාලය තුළ මේ ක්ෂේත්‍රයේ යම් යම් සිදුවීම් තිබුණද, වර්ධනයක් දැකිය නොහැකි විය. නිදහසින් පසු මෙරට පුස්තකාල මෙරට තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයට විධිමත් රාජ්‍ය අනුග්‍රහයක් නොතිබුණි. පසුගිය ශතවර්ෂයේ අගභාගයේ පැවැති ත්‍රස්තවාදී උවදුර හේතුවෙන් විශාල පොත්පත් ප්‍රමාණයක් දැයට අහිමි විය. මෙය උතුරු දකුණු සබඳතා වර්ධනය උදෙසා දැඩි බාධාවක් විය. උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි ජනතාව එතෙක් භුක්ති විඳි අයිතිවාසිකමක් වූ නිදහස් අදහස් වෙත පිවිසීමේ අයිතිය ඔවුනට අහිමි විය. එදා පැවැති රජයන් දිවයිනේ පුස්තකාල සංවර්ධනය සඳහා දක්වන ලද්දේ ඉතා අඩු අවධානයකි. 2005 මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති වීමත් සමගම උතුරු නැගෙනහිර පුස්තකාල සංවර්ධනය උදෙසා විවිධ ව්‍යාපෘති ආරම්භ කිරීමට අනුබලය ලබා දුන්නේය. අපි විසින් උතුරු පළාත් පුස්තකාල සංවර්ධන වැඩසටහන 2010.03.01 දින ආරම්භ කළෙමු. උතුරු පළාත් ආණ්ඩුකාර මේජර් ජෙනරාල් චන්ද්‍රසිරි මහතාගේ අධීක්ෂණය යටතේ මෙය සිදු විය. යාපනය, මන්නාරම, මුලතිව්, තුනුක්කායි , මල්ලව් වැනි ප්‍රදේශවල ජනතාවගේ සාක්ෂරතාවය වර්ධනය කරලීම පිණිස විශාල වශයෙන් පොත්පත් පරිත්‍යාග කිරීම සිදුවිය. මෙයට අමතරව නැගෙනහිර පළාතේ පුස්තකාල සංවර්ධනය සඳහා විශාල අනුග්‍රහයක් මහින්ද රාජපක්ෂ මහතා ප්‍රමුඛ රජය ලබා දුන්නේය. එදා පැවති රජය අපේක්ෂා කළේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජනතාවගේ සිතුම් පැතුම් වෙනස් කිරීම සඳහා පොත්පත්වලින් අපිරිමිත මෙහෙයක් කළ හැකි බවය. නිදහසින් පසු මෙරට පුස්තකාල වෘත්තිකයන් සඳහා ජනාධිපති සම්මාන ලබා දීමට කටයුතු කිරීමේ ගෞරවය හිමිවන්නේද මහින්ද රාජපක්ෂ මහතාටය. නිදහසින් පසු මෙරට කිසිම පුස්තකාලයාධිපතිවරයකු රාජ්‍ය නායකයන් අතින් ගෞරවයට ලක් වී නොමැත. ඉතිහාසයේ ප්‍රථම වරට මෙරට පුස්තකාලවේදීන්ට ජනාධිපති සම්මාන හිමි වන්නේ 2014 වර්ෂයේදී ය.

විවිධ යුගයන්හි දී අඩු සැලකිලි ලබමින් සිටි මෙම වෘත්තිකයන්ගේ සේවය රටේ රාජ්‍ය නායකයා ඉදිරිපිට ඇගයීමට ලක් වීම ද සැබවින්ම ආශ්චර්යයකි. 2014.10.21 වන දින පස්වරු 3.30 ට ඒ ආශ්චර්යමත් මොහොත උදා විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සුරතින් මෙරට විශිෂ්ටතම මහජන පුස්තකාල වෘත්තිකයන් ඇගයීමට ලක් විය. නව රජය යටතේ මෙරට පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා ජනාධිපති කාර්ය සාධන බළකායක් පිහිටුවීමේ අවශ්‍යතාවය අපි මේ වන විටත් ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ඉදිරිපත් කර ඇත්තෙමු. සැබවින්ම අපි අපේක්ෂා කරන්නේ මෙරට පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ සේවයේ නියුතු වූවන්ගේ මෙන්ම හා අධ්‍යාපන කටයුතු නිමකර සුදුසු රැකියාවක් අපේක්ෂා කරමින් සිටින විද්‍යාර්ථීන් මුහුණ දී තිබෙන ගැටලුවලට විසඳුමක් ලබාදීමටය. සැබවින්ම ඔවුන් සියල්ලම ඉදිරියේ දී බිහිවන රජයේ සංවර්ධන මාවතේ කොටස්කරුවන් බවට පත් කළ යුතුය. මේ වන විට පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් විශාල සිසුන් ප්‍රමාණයක් රැකියා අපේක්ෂාවෙන් සිටී. විධිමත් සැලසුම් යටතේ මේ වෘත්තීය සුදුසුකම ලබා සිටින විද්‍යාර්ථීන්ට රැකියා ලබාදීමේ හැකියාව තිබෙන බව අමුතුවෙන් කිව යුතු නැත.

රට වටා ඇති ශක්තිමත් කිරීම සහ එම ක්ෂේත්‍රයේ නියුතු වූවන් ඇගයීම කාලීන අවශ්‍යතාවකි.

**එම්.කේ.වීරසිංහ**
**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය**
**පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය කැලණිය**

| ගොවිසෙත | සුපිරි වාසනා | ලග්න වාසනාව | කෝටිපති කප්රුක | සංවර්ධන වාසනාව | ජයෝදා | ශනිදා වාසනාව | සුපර් බෝල් | ජාතික සම්පත | අද කෝටිපති | වාසනා සම්පත | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 - 09 - 08 | 2020 - 09 - 07 | 2020 - 09 - 08 | 2020 - 09 - 06 | 2020 - 07 - 31 | 2020 - 09- 09 | 2020 - 09 - 09 | 2020 - 09- 07 | 2020 - 09-02 | 2020 - 09 - 09 | 2020 - 09 - 07 | 2020 - 07 - 30 |
| දිනුම් වාරය - 2534 | දිනුම් වාරය - 1533 | දිනුම් වාරය - 2916 | දිනුම් වාරය - 621 | දිනුම් වාරය - 354 | දිනුම් වාරය - 1688 | දිනුම් වාරය - 3366 | දිනුම් වාරය - 1208 | දිනුම් වාරය - 1051 | දිනුම් වාරය - 1036 | දිනුම් වාරය - 1611 | දිනුම් වාරය - 013 |
| 13 32 39 68 | 05 20 33 60 | 21 37 45 59 | 05 15 40 45 | 22 23 40 | 07 31 35 43 | 31 34 60 64 | 25 43 48 66 | 6 4 8 3 9 6 | 07 12 39 48 | 10 11 37 57 | 04 12 33 63 |
| අක්ෂරය O | සුපිරි අංකය -01 | ලග්නය-මිථුන විශේෂිත අංක රු 500 තෑග සඳහා-9609 රු 100 තෑග සඳහා-757 | ඉංග්‍රීසි අක්ෂරය- Q | දෛව අංකය - 02 අක්ෂරය- L | අක්ෂරය-A | අක්ෂරය - D | අක්ෂරය - U | අක්ෂරය -K | අක්ෂරය - K රු 500 තෑග සඳහා-2169 රු 100 තෑග සඳහා-786 | අක්ෂරය - Z | අක්ෂරය - U |

# ඉදිරි වසර තුනේදී අවශ්‍ය ඖෂධවලින් 50%ක් දේශීයව නිපදවන්න

## ජනපතිගෙන් නිලධාරීන්ට උපදෙස්

**නුවන් කොඩිකාර**

ඉදිරි තෙවසර තුළ මෙරට ඖෂධ අවශ්‍යතාවෙන් සියයට 50ක් දේශීයව නිෂ්පාදනයට සැලසුම් සකස් කරන් නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

දැනට ආසියානු කලාපයේ වැඩියෙන්ම ඖෂධ ආනයනය කරන රට ශ්‍රී ලංකාව හෙයින් වහාම මේ තත්ත්වය වෙනස් කළ යුතු බව අවධාරණය කළ ජනාධිපතිවරයා, ඊට දායකවීමට මහා පරිමාණ දේශීය ආයෝජකයන් කැමැත්ත පළ කර තිබෙන බව කීවේය.

රාජ්‍ය අංශය දියුණු කරමින් පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් ද ශක්තිමත් කිරීමට රජය බැඳී සිටින බවත්, ඖෂධ නිෂ්පාදනය සඳහා ආයෝජනයට එක්වන් නැයි ජනාධිපති රාජපක්ෂ මහතා ඖෂධ නිෂ්පාදන ආනයන සමාගම් වෙත විවෘත ආරාධනයක් කළේය.

ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් පිළිබඳ ජනාධිපති කාර්යාලයේ පෙරේදා (11) පැවති සාකච්ඡාවේ දී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එසේ පැවැසීය.

විදේශ වෙළෙඳපොළට සහ ජනතාවට අවශ්‍ය ප්‍රමිතියෙන් යුතු ඖෂධ දැරිය හැකි මිලකට ලබාදීම අපේ ඉලක්කයයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ හා ප්‍රමිතීන්ට අනුකූලව සියලු නිෂ්පාදන සිදු කරනවා. මෙරට ඖෂධ අවශ්‍යතාවෙන් සියයට 85ක් දැන් ආනයනය කරනවා. ඒ සඳහා වාර්ෂිකව වැය කෙරෙන මුදල රුපියල් බිලියන 130ක්. මෙරට ඖෂධ අවශ්‍යතාව දේශීයව සපුරා ගැනීමෙන් වාර්ෂිකව රුපියල් බිලියන 60 ක් රටට ඉතිරි කර ගත එැකියි. එම ඉලක්ක ජය ගැනීමට අපට හැකි බව ජනාධිපතිවරයා කියා සිටියේය.

විදෙස් වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් ඖෂධ නිෂ්පාදනය සඳහා අක්කර 400ක ආයෝජන කලාපයක් හම්බන්තොට කර්මාන්ත පුරවරයේ ස්ථාපිත කෙරේ. ඊට එක්වීමට ලෝකයේ ඉහළ පෙළේ ඖෂධ නිෂ්පාදන සමාගම් දැනටමත් ඉදිරිපත්ව සිටී. අප්‍රිකානු සහ අග්නිදිග ආසියානු කලාපයේ ඖෂධ සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර එම වෙළෙඳපළ අවස්ථා අත්කර ගැනීම ද ඉලක්කයකි.

දේශීය අයෝජකයන් සඳහා අයෝජන කලාපයක් අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශයේ අක්කර 100ක භූමි භාගයක ඉදි කෙරේ. මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් 25 දෙනෙක් ඩොලර් මිලියන 300කට වැඩි ආයෝජනයක් කිරීමට සූදානම්ව සිටිති. වත්මන් රජය යටතේ මෙරට ඖෂධ නිෂ්පාදනයේ සුවිශේෂ ප්‍රගතියක් පෙන්නුම් කර තිබේ. මේ වන විට රට තුළ අත්‍යාවශ්‍ය ඖෂධවල හිඟයක් නැති බව ද අනාවරණය කෙරිණි. සෑම මසකටම එක් නව ඖෂධයක් රට තුළ නිෂ්පාදනය ආරම්භ කර ඇත. ඉදිරි වසරේදී සති දෙකකට වරක් නව ඖෂධයක් නිෂ්පාදනය ඉලක්කයි.

# මහජන පෙත්සම් කාරක සභාවට නියෝජිතයන් නම් කරයි

නව වැනි පාර්ලිමේන්තුවේ පළමු වැනි සභාවාරයේ මහජන පෙත්සම් කාරක සභාව සඳහා නියෝජිතයන් නම් කර තිබේ.

ගාමිණී ලොකුගේ, දයාසිරි ජයසේකර, නිමල් ලන්සා, ජානක වක්කුඹුර, එස් වියාලේන්ද්‍රන්, තේනුක විදානගමගේ, ජීවන් තොන්ඩමන්, ඉම්තියාස් බාකීර් මාකාර්, ජගත් පුෂ්ප කුමාර, දිලිප් වෙදආරච්චි, මනූෂ නානායක්කාර, කේ. කාදර් මස්තාන්, අශෝක ප්‍රියන්ත, ජයන්ත කැටගොඩ, තුෂාර ඉඳුනිල් අමරසේන, මුජිබර් රහුමාන්, ගීතා කුමාරසිංහ, කුලසිංහම් තිලීපන්, නිපුණ රණවක, රාජිකා වික්‍රමසිංහ යන මැති ඇමතිවරු එම කාරක සභාවේ සාමාජිකයෝ වෙති.



# දුම්රිය රියැදුරු ගුණරත්න වික්‍රමසිංහ අභාවප්‍රාප්ත වෙයි

නො: 518/13, කරුණා පටුමග, හීන්කෙන්ද, රාගම ලිපිනයේ පදිංචිව සිටි ගුණරත්න වික්‍රමසිංහ මහතා අභාවප්‍රාප්ත විය. මිය යන විට 58 වැනි වියේ පසු වූ ඒ මහතා දුම්රිය දෙපාර්තමේන්තුවේ රියැදුරෙකි. දරුවන් සිව්දෙනෙකුගේ පියෙකු වූ ඒ මහතාගේ දේහය පිළිබඳ අවසන් කටයුතු අද (12) සවස 2.00ට පවුලේ පොදු සුසාන භූමියේදී සිදුකෙරේ.

# කෝප් - කෝපා සාමාජිකයෝ පත් වෙති

**ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර**

නව වැනි පාර්ලිමේන්තුවේ පළමු වැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෙවත් කෝප් කමිටුව හා රාජ්‍ය ගිණුම් කාරක සභාව හෙවත් කෝපා යන කමිටු නියෝජනය කිරීම සඳහා සාමාජිකයන් පත් කර ඇත. ස්ථාවර නියෝග 120හි විධිවිධාන අනුව මෙම සාමාජිකයන් පත්කර ඇති අතර, අදාළ කාරක සාමාජිකයන්ගේ නාම ලේඛනය කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවට ඊයේ (11) දැනුම් දුන්නේය.

ඒ අනුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෙවත් කෝප් කාරක සභාවේ සාමාජිකයන් ලෙස මහින්ද අමරවීර, මහින්දානන්ද අලුත්ගමගේ, රෝහිත අබේගුණවර්ධන, සුසිල් ප්‍රේමජයන්ත්, දිලුම් අමුණුගම, ඉන්දික අනුරුද්ධ, ආචාර්ය සරත් වීරසේකර, ඩී.වී. චානක, ආචාර්ය නාලක ගොඩහේවා, අජිත් නිවාඩ් කබ්රාල්, රවුෆ් හකීම්, අනුර දිසානායක, පාඨලී චම්පික රණවක, ජගත් පුෂ්පකුමාර, ඉරාන් වික්‍රමරත්න, රන්ජන් රාමනායක, නලින් බණ්ඩාර එස්. එම්. මරික්කාර්, ප්‍රේම්නාත් සී. දොලවත්ත, සාණක්කියා රාජපුත්තිරන් රාසමාණික්කම්, මහාචාර්ය චරිත හේරත් යන මැති ඇමතිවරු පත්කර ඇත.

එමෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා සාමාජිකයන් ලෙස උදය ගම්මන්පිල, දුමින්ද දිසානායක, දයාසිරි ජයසේකර, ලසන්ත අලගියවන්න, වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, ශෙහාන් සේමසිංහ, ප්‍රසන්න රණවීර, තිස්ස අත්තනායක, මහාචාර්ය තිස්ස විතාරණ, හරීන් ප්‍රනාන්දු, නිරෝෂන් පෙරේරා, ෆයිසාල් කාසිම්, අශෝක් අබේසිංහ, බුද්ධික පතිරණ, කේ. කාදර් මස්තාන්, සිවඥනම් ශ්‍රීතරන්, වෛද්‍ය උපුල් ගලප්පත්ති, බී.වයි.ජී. රත්නසේකර, වීරසුමන වීරසිංහ, මහාචාර්ය රංජිත් බණ්ඩාර, මොහාමඩ් මුස්ම්මිල්, ආචාර්ය හරිනි අමරසූරිය යන පිරිස නම්කර තිබේ.

# අධිකරණයේ ගරුත්වය කෙලෙසලා හිටපු මහේස්ත්‍රාත් හේමපාලට කොමිසමෙන් දැඩි අවවාද

**රෝෂන් තුෂාර**

සාක්ෂි දීමට අධිකරණ සේවා කොමිසමේ අනුමැතිය අවශ්‍ය බව සඳහන් කර සිටි කඩුවෙල හිටපු මහේස්ත්‍රාත් ධම්මික හේමපාල මහතාට දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසම ඊයේ (11) දැඩි ලෙස අවවාද කළේය.

හිටපු ඇමැති පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක මහතා සමඟ සංවාද කළේ යැයි ප්‍රසිද්ධියට පත් දැනට වැඩ තහනමට ලක්ව ඇති ධම්මික හේමපාල මහතාට මෙසේ අවවාද කළේය. ලංකාවේ ඕනෑම පුද්ගලයකුට තරාතිරම නොබලා නොතිසි නිකුත් කිරීමට කොමිසමට බලය තිබෙනවා. අධිකරණ සේවා කොමිසන් සභාව මේ කොමිසමට අදාළ නැහැ. ඔබ වැඩ තහනමට ලක්ව තිබෙනවා නම් කොමිසමේ අනුමැතියක් අවශ්‍ය මොකටද අධිකරණ ක්‍රියාවලියට අගතියක් නොවී සාක්ෂි විමසන්න අපිට පුළුවන් යැයි ද කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා අවවාද කරමින් සඳහන් කළේය.

# පාස්කු ප්‍රහාරය වන තුරුත් සහරාන් ඇල්ලුවේ නෑ

## හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස්

**සුභාෂිණී සේනානායක**

ත්‍රස්තවාදී කටයුතු වැළැක්වීම සඳහා විශේෂයෙන් ස්ථාපිත කළ පොලිස් ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය සහරාන් හෂීම් අත්අඩංගුවට ගනු ඇතැයි තමන් බලාපොරොත්තු වූ නමුත් පාස්කු ප්‍රහාරය එල්ල වන තෙක්ම ඔවුන් එසේ කිරීමට අපොහොසත් වූ බව හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා පාස්කු ප්‍රහාරය සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසම හමුවේ ඊයේ (11) ප්‍රකාශ කළේය.

එම කොමිසම හමුවේ ඔහු ඊයේ (11) තෙවැනි වරටත් සාක්ෂි ලබා දෙමින් පැවැසුවේ අවේක්ෂණ රාජකාරී සඳහා ජාතික බුද්ධි සේවයේ නිලධාරීන් 22ක් පමණ රාජකාරී සඳහා යොදවා සිටි බවයි.

විටින් විට සහරාන් ඇතුළු ත්‍රස්තවාදීන් සමාජ මාධ්‍ය හරහා කළ ක්‍රියාවන් සම්බන්ධයෙන් දැනුවත් වී සිටියදී පියවර නොගත්තේ මන්දැයි රජයේ ජ්‍යෙෂ්ඨ සොලිසිටර් ජෙනරාල්වරිය සිසිර මෙන්ඩිස් මහතාගෙන් ප්‍රශ්න කළ අතර, ඔහු පැවැසුවේ සහරාන් සම්බන්ධ තොරතුරු පොලිස්පතිවරයා ගොස් තිබූ නිසා ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ විශේෂ කණ්ඩායමක් යොදා ඔහු අත්අඩංගුවට ගනු ඇතැයි තමා බලාපොරොත්තු වූ බවයි.

සහරාන්ට අදාළව සිදු කරන විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරන බවට තමන් දැනුවත්ව සිටියේ ද යන්න නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් ප්‍රශ්න කරමින් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය අසා සිටි අතර තමන් ඒ සම්බන්ධයෙන් දැනුම්වත් වී නොසිටි බව ඒ මහතා කියා සිටියේය.

# කංජිපානි යළි බූස්සට තවත් 3ක් උපවාසය අතහරී

**බුද්ධිකා ඉඹුලාන**

බූස්ස බන්ධනාගාරයේ ආහාර වර්ජනයේ නිරතව සිටිය දී පපුවේ වේදනාවක් ඇතිවීම නිසා සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් නායකයෙක් වන මෙහොමඩ් නජීම් ඉම්රාන් හෙවත් කංජිපානි ඉම්රාන් බූස්ස නාවික හමුදා රෝහලට ඇතුළත් කර පරීක්ෂණයක් සිදු කර තිබේ.

එහිදී ඔහුව ඊ.සී.ජී. පරීක්ෂණයකට යොමු කර ඇති අතර, අධික රුධිර පීඩනය සහ රුධිරයේ සීනි ප්‍රමාණය ද පරීක්ෂා කර ඇති අතර එහිදී අනාවරණය වී ඇත්තේ ඔහුගේ රුධිරයේ සීනි ප්‍රමාණය පමණක් සුළු පහත බැසීමක් සිදු වී ඇති බවයි. වෙනත් බරපතළ රෝගී තත්තවයක් ඔහුට නැති බවට තහවුරු වීමත් සමගම බන්ධනාගාර නිලධාරීන් යළිත් ඔහුව බූස්ස බන්ධනාගාරය වෙත රැගෙන විත් ඇත.

පෙරේදා (10) දිනයේ සිට බූස්ස බන්ධනාගාරයේ විශේෂ ගණයේ සිරකරුවන් 36 දෙනකු ආහාර වර්ජනයක නිරතව සිටී. කංජිපානි ඉම්රාන්, පොඩි ලැසී, වෙලේ සුදා ඇතුළු සිරකරුවන් ඒ අතර වෙයි.

මෙම සිරකරුවන්ගේන් තවත් තිදෙනකු ඊයේ (11) වන විට ආහාර වර්ජනයෙන් ඉවත් වී ඇති බව එම බන්ධනාගාර ආරංචි මාර්ග කියයි.

කොරෝනා සමයේ ඥාතීන් හමුවීමට නොහැකිවීම හේතුවෙන් ලබා දුන් දුරකථන පහසුකම ඉවත් කිරීම, රැඳවූවන් හමුවට එන නීතිඥවරුන් පරීක්ෂා කිරීම, විශේෂ කාර්යය බළකාය සිදු කරන පරීක්ෂාවන්, ආපන ශාලාවෙන් අත්‍යවශ්‍යද්‍රව්‍ය ලබා ගැනීමට මාසයකට ඔවුන්ට ලබා දෙන දීමනාව ප්‍රමාණවත් නොවීම ඇතුළු කරුණු ගණනාවකට විරෝධය පළ කරමින් මෙම රැඳවූවන් ආහාර වර්ජනයේ නිරතව සිටිති.

## 01 වැනි පිටුවෙන්...

### නිව් ඩයමන් නැවේ...

නාවික හමුදා කණ්ඩායමක් කපිතාන්වරයා ගාල්ලට රැගෙන ඒමෙන් අනතුරුව හුදෙකලා මධ්‍යස්ථානයක් වෙත යොමු කළ බව නාවික හමුදා මාධ්‍ය අංශය පැවසීය. කොරෝනා මාර්ගෝපදේශවලට අනුව ඔහු කල්මුණේ සිට ගාල්ලට රැගෙන ඒමේ කටයුතු සිදු කළ අතර ඒ අනුව කපිතාන්වරයා නාවිකයන් රඳවන හුදකලා මධ්‍යස්ථානයේ රඳවා සිටින බවත්, ඒ අතරතුර නෞකාව ගිනි ගැනීමේ සිද්ධියට අදාළ නීතිමය තත්ත්වයන් පිළිබඳ කටයුතු සිදුවන බවත් නාවික හමුදාව ප්‍රකාශ කළේය. කෙසේ වූවද මේ වනවිට නෞකාවේ කාර්ය මණ්ඩලයේ සිටි 23න් දෙනා අතුරින් මියගිය පුද්ගලයා හැර සෙසු සියලුදෙනා මේ වනවිට ගොඩබිමට රැගෙන ඒමට ශ්‍රී ලංකා නාවික හමුදාව පියවර ගෙන ඇත.

### ඉලංගෙයි තමිල් අරුසු...

2014 වසරේ සිට මේ දක්වා පක්ෂ මහ ලේකම්වරයා ලෙස තමා කටයුතු කළ බවත් පෞද්ගලික හේතු මෙන්ම පක්ෂය තුළ හටගෙන ඇති අභ්‍යන්තර අර්බුද හේතුවෙන් මෙසේ ඉල්ලා අස්වීමට තීරණය කළ බවත් තුරෙයි රාජසිංගම් මහතා පක්ෂ නායකත්වයට යොමු කළ ලිපියේ සඳහන් කර තිබේ.

ලිපියේ පිටපතක් දෙමළ සන්ධාන නායක ආර්.සම්බන්ධන් මහතාට ද යොමු කිරීමට රාජසිංගම් මහතා පියවර ගෙන ඇත.

### සජිත් නීතියට පිටින්...

රජයේ ඉහළ තනතුරු සඳහා වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින් බඳවා ගැනීම් නොකිරීමට 2011 වසරේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබෙන බවත්, එම තීරණ කඩ කරමින් 2015 මැයි 19 දී සජිත් ප්‍රේමදාස මහතා විසින් දිවි නැගුම අධ්‍යක්ෂ ජනරාල් තනතුරට වයස අවුරුදු 69 පුද්ගලයකු පත් කළ බවත්, හිටපු දිවි නැගුම අතිරේක අධ්‍යක්ෂ හා වත්මන් සමෘද්ධි අධ්‍යක්ෂ බන්දුල තිලකසිරි මහතා කොමිසම හමුවේ සාක්ෂි දෙමින් අනාවරණය කළේය.

මේ අනුව සජිත් ප්‍රේමදාස මහතා විසින් 69 හැවිරිදි හේවාහැටගේ සුමනපාල මහතා පත් කළ බව තිලකසිරි මහතා පැවසීය.

එම පත් කිරීම සජිත් ප්‍රේමදාස මහතා විසින් කරන්නට යෙදී ඇත්තේ තමන්ට අවැසි දේ කරගැනීමට දැයි කොමිසම මෙහිදී ප්‍රශ්න කළේය. දේශපාලනිකව තමන්ට උවමනා දේ කැර ගැනීමට හැකි පුද්ගලයින් පත් කර එම නීති විරෝධී පත්වීමට වැටුප් ගෙවීම සම්බන්ධයෙන් තොරතුරු කොමිසමට ඉදිරිපත් කරන්නැයි සභාපති විනිසුරුවරයා මෙහිදී දන්වා සිටියේය.

බොරු සාක්ෂි මත නඩු පවරා දේශපාලන පළිගැනීමක් සිදු කළ බවට සඳහන් කරමින් තිලකසිරි මහතා මෙම පැමිණිල්ල ගොනු කර තිබිණි.

කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා ප්‍රමුඛ ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල ඉදිරියේ සාක්ෂි විමසීය.

වැඩිදුර විභාගය ලබන 22 දිනට කල් තැබිණි.

### ප්‍රේමලාල් මන්ත්‍රීවරයාට...

පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මහතා දිවුරුම් දුන් මොහොතේ සිටම ඒ මහතා අවමානයට අපහාසයට ලක් කරමින් විපක්ෂය උත්සාහ දරන්නේ ඒ මහතාගේ පාර්ලිමේන්තු ගමන වැළැක්වීමට බව ද සභානායකවරයා සඳහන් කළේය.

දිනේෂ් ගුණවර්ධන මහතා මේ බව සඳහන් කළේ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මහතා සම්බන්ධයෙන් ඊයේ (11) දිනයේදීත් විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා ඇතුළු කණ්ඩායම දිගින් දිගටම දැක්වූ කරුණු දැක්වීම් සම්බන්ධයෙන් අදහස් දක්වමිනි. එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ සභානායක දිනේෂ් ගුණවර්ධන මහතා සඳහන් කළේ කතානායකවරයා තීන්දුවක් ලබා දී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් දිගින් දිගටම අදහස් දක්වන්නේ නම් ඒ සඳහා විධිමත් ක්‍රමවේද ඇති බවත් ඒවා අනුව කටයුතු කරන ලෙසත්ය. එලෙස සිදු නොකර දිගින් දිගටම දෛනිකව පාර්ලිමේන්තුවේ අනෙකුත් කටයුතු වලට බාධා කරමින් මේ උත්සාහ දරන්නේ ප්‍රේමලාල් ජයසේකර මහතාගේ පාර්ලිමේන්තු ගමන වැළැක්වීමට බවද සභානායකවරයා පැවසීය.

### එෆ්.සී.අයි.ඩීය කළ...

පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පොලිස් ආඥා පනතේ 55 වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා විසින් පිහිටුවා ඇති බවත්, එම පනත ප්‍රකාරව වෙනම අපරාධ කොට්ඨාසයක් පිහිටුවීමේ හැකියාවක් පොලිස්පතිවරයාට නොමැති බවට සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් බන්දුල තිලකසිරි මහතා සාක්ෂි දීමෙන් අනතුරුව කොමිසම එසේ පැවසීය.

සජිත් ප්‍රේමදාස මහතාට අවනත පුද්ගලයෙකු දිවි නැගුම අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම නීති විරෝධී බව ද තිලකසිරි මහතා සඳහන් කළේය.

### මධුෂ්ගේ ගොලයෙක්...

මේ අනුව දකුණේ අපරාධ රැසකට සම්බන්ධ මාකඳුරේ මධුෂ් සිදු කළ විවිධ අපරාධවලට සහය වූ රණවකගේ ධම්මික නුවන් රණවක නොහොත් 'වැලිහිඳ කළු' හෙරොයින් ග්‍රෑම් තුනකට ආසන්න ප්‍රමාණයක් ළඟ තබා ගෙන සිටිය දී විශේෂ කාර්ය බළකාය ඊයේ (11) වැලිගම දී අත්අඩංගුවට ගෙන තිබිණි.

සැකකරු අත්අඩංගුවට ගත් හෙරොයින් සමඟ වැඩි දුර පරීක්ෂණ සඳහා වැලිගම පොලීසියට බාර දී තිබේ.

හරක්කටා හෙවත් චින්තකගේ ගෝලයකු වන හසන් චින්තක හෙරොයින් ග්‍රෑම් පහකට අධික ප්‍රමාණයක් සමඟ වැලිගම පොලීසිය එදිනම අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු අහංගම ප්‍රදේශයේ කළ විශේෂ සෝදිසියකදී අත්අඩංගුවට පත්ව තිබිණි. සිද්ධිය පිළිබඳ වැලිගම පොලීසිය පරීක්ෂණ පවත්වයි. පෙරේදා (10) විශේෂ කාර්ය බළකාය කළ මෙහෙයුමක දී වැලිපැන්න බොන්දුපිටිය හන්දියේදී 39 හැවිරිදි පුද්ගලයකු හෙරොයින් ග්‍රෑම් 22ක් සමඟ අත්අඩංගුවට ගෙන තිබේ. සැකකරු කුරුන්ද පාර බොන්දුපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවකු වන අතර සැකකරු සමඟ අත්අඩංගුවට ගත් හෙරොයින් තොගය වැඩි දුර පරීක්ෂණ සඳහා වැලිපැන්න පොලීසියට බාර දී ඇත.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් තිදෙනා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව පොලීසිය පැවසීය.

### තුන්කෝටියකට වැඩි...

දූෂණ සෙවීම සඳහා පත් වූ දූෂණ විරෝධි කමිටු කාර්යාලය සේවකයන් 44 දෙනෙකුට වැටුප් වේතන ගෙවමින් මාස 29ක් තිස්සේ කර ඇති මහා නාස්තිය හා මහා බොරුව ජනතාව ඉදිරියේ හෙළිදරවු කරන ලෙස දේශපාලන කොමිසම අගමැති කාර්යාල නිලධාරීන්ට ඊයේ (11) දන්වා සිටියේය.

අරලියගහ මන්දිරය තුළ මෙවන් කාර්යාලයක් ක්‍රියාත්මක වුවාද යන්න පවා නොදන්නා හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ හා හිටපු ඇමැති මංගල සමරවීර මහතා පවා මෙම කරුණු දැනගත යුතු බව ද කොමිසම සඳහන් කර සිටියේය.

2015 ජනවාරි 21 දින 'ජාතික විධායක සභාවේ' තීරණයක් පරිදි හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ කැබිනට් සංදේශයක් අනුව පිහිටු වූයේ යැයි කියන දූෂණ විරෝධි කමිටු කාර්යාලයේ නිලධාරීන් 44 දෙනකු සේවය කර ඇති අතර 2015 පෙබරවාරි මස සිට 2017 ජුනි දක්වා රුපියල් 22714079.27ක වැටුප් ගෙවා ඇති බවට සාක්ෂි ඉදිරිපත් විය.

දුරකථන, විදුලිය, අතිකාල, වාහන, ඉන්ධන, ලිපි ද්‍රව්‍ය හා වෙනත් වියදම් වශයෙන් මෙම මුදල් වැය කර ඇති බවත් සාක්ෂි ඉදිරිපත් කළේය.

දූෂණ විරෝධි කමිටු කාර්යාලය නෛතික ආයතනයක් නොවන බවත් එවන් කාර්යාලයක් ක්‍රියාත්මක වුවාද යන්න නොදන්නා බවත් පසුගියදා කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් රනිල් වික්‍රමසිංහ මහතාගේ හා මංගල සමරවීර මහතාගේ සාක්ෂිය කොමිසම මෙහිදී සිහිපත් කළේය.

හිටපු අගමැතිවරයාගේ කැබිනට් සංදේශයේ සඳහන් වන අනුකමිටු වාර්තාව අනුව කාර්යාල කටයුතු මාධ්‍යයේ ප්‍රසිද්ධ කිරීම එක් කාර්යයක් වන බැවින් මෙම මහා දූෂණය මාධ්‍යවල පළ වූවාට වරදක් නැති බවද කොමිසමේ සභාපති විනිසුරු උපාලි අබේරත්න මහතා සඳහන් කළේය.

කොමිසම හමුවේ ඉදිරිපත් වූ සාක්ෂි මත දූෂණ විරෝධි කමිටු කාර්යාලය අනීතික ආයතනයක් බවත්, එවන් අනීතික ආයතනයකට මුදල් වියදම් කර ඇද්ද යන්න සොයා බැලීමට ලේඛන ඉදිරිපත් කරන ලෙසත් අගමැති ලේකම් ගාමිණී සේදර සෙනරත් මහතාට යොමු කළ දැන්වීමක් පරිදි මෙම සාක්ෂි ලේඛන ඉදිරිපත් කළහ.

අගමැති කාර්යාලයේ අතිරේක ලේකම් ගණේෂ් ධර්මවර්ධන හා ප්‍රධාන මූල්‍ය නිලධාරී ඩබ්ලිව්.ඒ.සරත් කුමාර මෙම ලේඛන ඉදිරිපත් කළේය. මෙම සාක්ෂි ලේඛනය පරිදි නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥවරු ද මෙම කාර්යාලයෙන් වැටුප් හා වේතන ලබාගෙන ඇති බව සඳහන් වේ.

බොරු සාක්ෂි මත නඩු පවරා දේශපාලන පළිගැනීමක් කළ බවට සඳහන් කරමින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම් රූපවාහිනී සංස්ථාවේ සභාපති වෛද්‍ය නිහාල් ජයතිලක මහතා පැවරූ පැමිණිල්ල අනුව මෙම සාක්ෂිය කැඳවීය.

### ප්‍රභූ ඝාතන ...

ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති ලෙස පත්වීමත් සමඟ මෙරට සාමාන්‍ය ජන ජීවිතයට හානි වන ආකාරයට ක්‍රියාකාරීව සිටින පාතාල කල්ලි මැඩීම මූලික කර ගනිමින් ආරක්ෂක අංශ සමඟ එක්ව නීති විරෝධී අවි හා පුපුරණ ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම ආරම්භ කළ ද, තව දුරටත් නීති විරෝධී ගිනි අවි සහ අත්බෝම්බ රහසිගත ආකාරයෙන් සඟවාගෙන සිටින බවට තහවුරු වීමත් සමඟ ඒ පිළිබඳ ඔත්තු ලබා දෙන්නන්ට විශාල මුදලක් තෑගි ලෙස ලබා දීමට පොලිස්පතිවරයා තීරණය කර ඇත.

මිනී මැරුම් සහ මත්ද්‍රව්‍ය ජාවාරම දරුණු ගණයේ අපරාධ කල්ලිවල ප්‍රධානම ඉපයුම් මාර්ග වී ඇති අතර, සිය අණසක පවත්වාගෙන යාමට ඉඩ නොදෙන පාතාලයේ මෙන්ම රාජ්‍ය නිලධාරීන් වුවද ඝාතනය කිරීමට මොවුව් පසුබට නොවන බව පසුගිය කාලයේ වාර්තා වූ ඇතැම් අපරාධ අනුව පෙනී යන බව පොලීසිය පවසයි.

ඒ අනුව නීති විරෝධී ගිනි අවි සහ අත්බෝම්බ තව දුරටත් රට පුරා සංසරණය සිදු වන බව පසුගිය කාලයේ වාර්තා වූ අපරාධ සිද්ධි අනුව තහවුරු වන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය.

මෙවැනි තත්ත්වයක් යටතේ නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරීමටත්, මහජනයාට අපරාධ පිළිබඳ බියකින් තොරව ජීවත් වීමටත් හැකි සාමකාමී පරිසරයක් සැකසීම සඳහාත් එවැනි මෙහෙයුම් තව දුරටත් පුළුල් කිරීමට පොලීසිය තීරණය කර ඇත.

මේ අනුව නීති විරෝධී අවි ආයුධ සමඟ සැකකරුවන් අත්අඩංගුවට ගන්නා පොලිස් නිලධාරීන්ට සහ සහාය වන පුද්ගලික ඔත්තුකරුවන්ට දිරි ගැන්වීම සඳහා ලබා දෙන තෑගි මුදල් ප්‍රමාණය තව දුරුටත් වැඩි කිරීමට පොලිස්පතිවරයා තීරණය කර ඇත.

### විස්සට එරෙහි වන්න...

ඒ අනුව ඉදිරි බහුජන ක්‍රියා මාර්ගවලදී එක්සත් ජාතික පක්ෂය බොහෝ දුරට සමගි ජන බලවේගය සමඟ කටයුතු කරනු ඇති බව එම පක්ෂයේ සාමාජික, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී විජේපාල හෙට්ටිආරච්චි මහතා දිනමිණට පැවසීය.

සාධාරණ සමාජයක් උදෙසා ජාතික ව්‍යාපාරය ඔස්සේ එක්සත් ජාතික පාක්ෂිකයන් ඉදිරියේදී ආණ්ඩුවේ 20 වැනි සංශෝධනයට විරෝධය පළ කිරීමට එක් වනු ඇති බව අනුමාන කෙරෙන අතර එයට අදාළ වැඩසටහන් මාලාවක් ද මේ වන විට සමගි ජන බලවේගය සකස් කරමින් පසු වෙයි.

මේ සම්බන්ධයෙන් විමසීමට එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් අකිල විරාජ් කාරියවසම් මහතා දුරකථනයෙන් සම්බන්ධ කරගැනීමට දිනමිණ ගත් උත්සාහය ව්‍යර්ථ විය.

### පාසල් දරුවන්ට...

බේකරි හිමියන්ගේ සංගමය හා බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමය විජේරාම පිහිටි නිල නිවසේ දී හමු වූ අවස්ථාවේ අගමැතිවරයා මේ බව සඳහන් කළේය.

බේකරි නිෂ්පාදන සඳහා බිත්තර මිල බලපාන ආකාරය පිළිබඳ බේකරි නිෂ්පාදකයන්ගේ සංගමය අගමැති මහින්ද රාජපක්ෂ මහතා දැනුවත් කළ අතර බිත්තර නිෂ්පාදනයේ දී වැය වන අධික පිරිවැය සම්බන්ධයෙන් බිත්තර නිෂ්පාදකයෝ එහිදී කරුණු පැහැදිලි කළහ. සියලුම බේකරි නිෂ්පාදන ආයතන සඳහා ස්ථාවර තොග මිලකට බිත්තර ලබාදීමට හැකි බව බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමය මෙම හමුවේ දී පෙන්වා දුන්නේය.

ඒ අනුව පාරිභෝගිකයන්ට සහනයක් සැලසෙන අයුරින් සංගම් දෙක අතර ගිවිසුම් ගත සම්මුතියකට පැමිණෙන්න යැයි අගමැතිවරයා අදාළ නියෝජිත පිරිසට දැන්වූ අතර, කුකුළු පැටවකුගේ මිල රුපියල් 175 - 200 අතර මිලකට පහත හෙළීම පිළිබඳ සහ බිත්තර නිෂ්පාදකයන් සහ බේකරි හිමියන් සඳහා වන ගිවිසුම් ගත එකගතාවකට මැදිහත්වන ලෙස ද විෂය භාර ඇමැතිවරුන්ට මෙම හමුවේ දී උපදෙස් දුන්නේය.

මෙම අවස්ථාවට සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න, පශු සම්පත් ගොවිපළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය ඇමැති ඩී.බී. හේරත් හා අගමැති අතිරේක ලේකම් අමන්දා කරුණාතිලක මහත්ම මහත්මීන් ද බිත්තර නිෂ්පාදකයන් හා බේකරි නිෂ්පාදකයන්ගේ සංගමයේ නිලධාරීන් එක්ව සිටියහ.

## 01 වැනි පිටුවෙන්...

### මතට ඇබ්බැහි වූවන්...

මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් දිනපතා බන්ධනාගාර ගත කෙරෙන ප්‍රමාණය දිනෙන් දින ඉහළයාම හේතුවෙන් බන්ධනාගාර තුළ දැඩි තදබදයක් ඇතිවීමත්, මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වන ප්‍රමාණය ඉහළ යෑමෙන් ඇතිවෙමින් පවතින සමාජ ව්‍යවසනයන් සඳහා විසඳුම් සෙවීමට පුනරුත්ථාපන කටයුතු අරමුණුකර ගත් මූලෝපායික සැලසුම්වලින් යුතු පුළුල් ජාතික සැලස්මක් මෙම කමිටුව මගින් සකස් කෙරෙයි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති විශේෂඥ වෛද්‍යලක්නාත් වෙලගෙදර මහතාගේ සභාපතිත්වයෙන් පත් කර ඇති මෙම කමිටුවට බන්ධනාගාර දෙපාර්තමේන්තුව, පුනරුත්ථාපන කොමසාරිස් කාර්යාංශය, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව, අධිකරණ, ආරක්ෂක, සෞඛ්‍ය, අධ්‍යාපන, තරුණ කටයුතු හා ක්‍රීඩා, නිපුණතා සංවර්ධන අමාත්‍යාංශ, වෘත්තීය අධ්‍යාපන, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා පොලීසිය, දුම්කොළ හා මධ්‍යසාර පිළිබද ජාතික අධිකාරිය, ශ්‍රීලංකා මානසික විද්‍යාඥයන්ගේ විද්‍යාලය, මධ්‍යසාර සහ ඖෂධ පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානය, යන ආයතනවල නියෝජිතයෝ ඇතුළත් වෙති.

### රාජිත...

ප්‍රකාශය ලබා දීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඒ මහතා පැවැසුවේ තමන් ත්‍රස්තවාදය පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කළ බවයි. හිටපු ජනාධිපතිවරයාට පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වෙනවා නේදැයි මෙහිදී මාධ්‍යවේදියකු නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඒ මහතා පැවැසුවේ මම ඇඟිල්ල දික් කරනවා නොවේ. ඔහු දැනුවත්ව සිටි බවට විශ්වාස කළ හැකි තොරතුරු ආරක්ෂක අංශවලින් ප්‍රකාශ කරනවා යැයි කීවේය.

එමෙන්ම මෙහි වගකීම විශේෂයෙන් ආරක්ෂක ඇමැතිවරයා දැරිය යුතු බව ද, හිටපු අගමැතිවරයාටත් ඉන් ගැලවිය නොහැකි බව ද හෙතෙම කීවේය.

## මරණ දැන්වීම්

**බී.ඩී.එස්. ගුණතිලක** (විශ්‍රාමික ගුරු) - නැසීගිය එම්.ඩී.සී. ගුණතිලක මහතාගේ ආදරණීය භාර්යාව වූද, චන්දන, මංගල, ධම්මික, යසස් සහ හේමන්ත යන අයගේ ආදරණීය මෑණියන් වූද, ශ්‍යාමලී, දර්ශිකා, යස්මිත් සහ නිශාන්තගේ ආදරණීය නැන්දනිය අභාවප්‍රාප්ත විය. අවසන් කටයුතු : සැප්තැම්බර් දොළොස්වන දින සවස 2.00ට ගල්කිස්ස පොදු සුසාන භූමියේදී සිදු කෙරේ. ලිපිනය : නො. 73, තුන්වන පටුමග, රත්මලාන. *054391*







# ආණ්ඩුවක පැවැත්ම තීරණය වන්නේ ජනතා අවශ්‍යතා ඉටු කරන ආකාරයටයි

## ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ





**මහින්ද අලුත්ගෙදර සහ නුවන් කොඩිකාර**

වගකිව යුතු රජයක් ලෙස රටේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන ආකාරය මත රජයේ පැවැත්ම තීරණය වන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කරයි.

සෑම දෙයක් සම්බන්ධයෙන්ම ජනතාව විමසිල්ලෙන් බලා සිටින බව පෙන්වා දෙන ඒ මහතා එක් එක් පුද්ගලයාගේ හැකියාවන්ට වඩා සමස්තයක් ලෙස පියවර තබන්නේ ද යන්න අනුව රජයේ සාර්ථකත්වය තීරණය වන බවද තමාට හිමි විෂයයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කොට ප්‍රමුඛතාවට අනුව කටයුතු කළ යුතු බවද පෙන්වා දෙයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති කාර්යාලයේ දී රාජ්‍ය අමාත්‍යවරුන් හමුවේ මේ බව පැවසීය.

එහිදී වැඩිදුරටත් ජනපතිවරයා මෙසේද කීය.

පසුගිය සති කිහිපයේ රාජ්‍ය අමාත්‍යාංශ ගැන අප සාකච්ඡා කළා. මේ සතියේත් එන සතියේත් ඉතිරි අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කරනවා. තව සති තුනකින් හෝ දෙකකින් අපට සියලුම රාජ්‍ය අමාත්‍යාංශ සමාලෝචනය කරන්න පුළුවන්. අප රාජ්‍ය අමාත්‍යාංශ සකස් කර තියෙන්නේ පසුගිය කාලවල හඳුනාගත් ප්‍රශ්න පිළිබඳ අවධානය යොමු කරලා. රාජ්‍ය ඇමැතිවරුන්ගෙන් නිසි ප්‍රයෝජනයක් වැඩක් කරන්න පුළුවන් වෙන විදියට තමයි අප සකස් කර තියෙන්නේ. රාජ්‍ය ඇමැතිවරුන් කැබිනට් එකට එන්නේ නැති වුණත්, සියලුම බලතල දීලා තියෙනවා. පැහැදිලි විෂය පථයක් දීලා තියෙනවා. ඒ එක්කම ලේකම්වරයෙක් ඉන්නවා. අයවැයෙන් අප ප්‍රතිපාදන ලබාදෙනවා ඒ අමාත්‍යවරුන්ට. සමහර පහසුකම් පිළිබඳ ගැටලු ඇති. ඒවා මගේ ලේකම් බලාගෙන යනවා. ඒ ටිකත් විසඳන්න. ඔබටම තේරෙනවා ඇති කොපමණ වැඩ ප්‍රමාණයක් මේ අමාත්‍යාංශවලින් කරන්න පුළුවන් ද කියලා. නීත්‍යානුකූල බලතලත් තියෙනවා. ඇමැතිවරයාත් සමඟ පොදු ප්‍රතිපත්තියක් මත එකඟව ඒ වැඩ කරන්න වගකීම භාරදීලා තියෙනවා.

ඒ බලතල භාවිත කර වැඩ කරන්න. නිලධාරීනුත් යොදාගෙන. ඉතින් මේ වගේ සමාලෝචනවල දී අපට තේරුණා අප හිතුවටත් වඩා විශාල විෂය පථයක් ඔබට ඇති බව. කරන්න මේ අමාත්‍යාංශවල තියෙන බොහෝ දේ බව. බිම් මට්ටමට ගිහිල්ලා තමයි එය සකස් කර තියෙන්නේ. අප මහජනතාවගේ අපේක්ෂා නිසියාකාරව ඉටුකිරීම යුතුකමක්. මෙතැන ඉන්න සමහර අය අලුත්. සමහර අය බොහෝම පැරණි අය. ඒ එක්කම තරුණ අය හුඟාක් ඉන්නවා. අප මේ අවුරුදු 5 කොහොම ද වැඩ කරන්නේ කියන එකෙන් වඩාත්ම ප්‍රයෝජනයක් වෙන්නේ තරුණ, දේශපාලන අනාගතයක් බලාපොරොත්තු වන මන්ත්‍රීවරුන්ට. ජනාධිපතිවරයා වශයෙන් අප පොරොන්දු වුණේ වෙනසක් කරනවා කියලා. මේ තියෙන දේශපාලන සංස්කෘතිය වෙනස් කරනවා කියලා. ඒ වගකීම මට තියෙනවා. මම හිතන්නේ මේ ඉන්න අයට ඒ වගකීමට අමතරව තමන්ගේ දේශපාලන ජීවිතයේ හරිගස්ස ගන්න අවස්ථාව තියෙනවා කියලා. මේ මනාප ක්‍රමයෙන් කවදාවත් පරදින්නේ නැහැ කියලා සමහර අය හිතුවා. නමුත් පහුගිය ඡන්දයෙන් පැහැදිලි වුණා එහෙම සහතිකයක් දෙන්න බැරි බව.

අප කොහොමද ප්‍රතිඵල ගේන්නේ. එදා වගේ නෙමෙයි අද දේශපාලනයේ විශාල වෙනසක් තියෙනවා. ජනතාව බලනවා හැම එකක්ම දිහා විමසිල්ලෙන්. අප කොහොමද රජයක් හැටියට. මිනිසුන්ගේ අවශ්‍යතා සපයන්නේ කියන එක මත තමයි රජයක පැවැත්ම තීරණය වන්නේ. මම හිතන්නේ එක එක පුද්ගලයාගේ හැකියාවන්ට වඩා සමස්තයක් හැටියට අප කොහොමද පියවර තියන්නේ. ඒ අනුව අපේ රජයේ සාර්ථකත්වය තීරණය වෙනවා. ඒ නිසා හැම කෙනෙකුටම විශාල විෂය පථයත් භාරදෙන්නේ නැතුව පොදුවේ ඒ අයට විෂයයන් සරලව ලබාදීලා තියෙනවා. ඒ යටතේ ඉන්න රාජ්‍ය අමාත්‍යවරුන්ට විශේෂයෙන්ම අවධානය යොමු කරපු විෂය පථ දීලා තියෙනවා.

### රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමට මහජන නියෝජිතයන් සහ රාජ්‍ය නිලධාරීන් එක් වන්න ඕනෑ:

සෑම විෂයකම හැම කෙනාටම විශාල වගකීමක් තියෙනවා. ඉතාමත් වැදගත් මේ පස් අවුරුද්දටත් අවුරුද්දෙන් අවුරුද්දට තමන්ට පුළුවන් ප්‍රමාණය ගැන ප්ලෑන් එකක් ලබාදෙන එක. ඒ වගේම ප්‍රමුඛතාව හඳුනාගෙන ඒ ප්‍රමුඛතාවට අනුව වැඩ කරන්න. මම අවුරුදු තිහක් රාජ්‍ය සේවයේ හිටියා. අවුරුදු විස්සක් හමුදාවේ, අවුරුදු දහයක් ආරක්ෂක ලේකම්.

විශේෂයෙන්ම නාගරික සංවර්ධන ක්ෂේත්‍රයේ සැලසුම් සහගතව වැඩකළ නිසයි, මගේ සාර්ථකත්වය තියෙන්නේ. හැම සැලසුමකම තියෙනවා දිර්ඝකාලීනව කරලා ප්‍රතිඵල ලබාගන්න පුළුවන් ඒවා. ඊළඟට තියෙනවා කෙටි කාලීනව ප්‍රතිඵල ගේන්න පුළුවන් සැලසුම්. ඒ මිනිසුන්ට එකපාරටම පෙනෙන දේවල්. කොළඹ නගරය සංවර්ධනය කිරීමේ දී යුද්ධයෙන් පස්සෙ අවුරුදු හතරේ විශාල වෙනසක් අප කළා. ලංකාවට විතරක් නොවෙයි පිටරටටත් ඒක දැනුණා. අප දන්නවා තට්ටු නිවාස හදලා දෙන්න කාලයක් යනවා. මම ආරම්භ කරපු සමහර ව්‍යාපෘතිවල ප්‍රතිඵල ගත්තේ ගිය ආණ්ඩුවෙන්. අපේ කාලයෙත් අප සෑහෙන ප්‍රමාණයක් තට්ටු නිවාස හදලා පැල්පත්වාසීන්ට ලබා දුන්නා. නමුත් එයට කාලයක් ගියා. මෙතැනින් එළිය බැලුවොත් ෂැංග්‍රිලා එකේ ඉඳලා ආයෝජන සියල්ලම ගෙනාවේ අපේ කාලයේ. හැබැයි සමහර ඒවා තියෙනවා ඉක්මනින්ම ලොකු වෙනසක් මිනිසුන්ට පෙන්නන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් තාප්ප ගලවපු එක. අප අවුරුදු ගාණක් යුද්ධ කරලා කටුකම්බි රෝල් දාලා තාප්ප දාලා බැඳලා තිබුණා.

අප ඒවා අයින් කරපු ගමන්ම ලොකු බලපෑමක් ආවා. පෝස්ටර් අලවන එක, බැනර් දාන එක නවත්තපු ගමන්ම ලොකු බලපෑමක් එයිනුත් ඇති කළා. ඒවා එක් දවසින් කරන්න පුළුවන් වැඩ. සමහර අයට මතක ඇති අප දෙදහස් පහේ බලය ගන්නකොට එළියට බහින්න බෑ. හැමතැනම කුණු ගොඩවල්. මගේ නිල නිවාසයේ ඉඳලා එළියට එනකොට යාර සීයක් යන්න ඉස්සෙල්ලා කුණු ගොඩවල් තුනයි. කුණු ඉවත් කිරීම පහසුවෙන් කළහැකි දෙයක්. අප ඒවා කළා. මේ වගේ සරල දේවල්වලින් වෙනසක් කරන්න පුළුවන්. ලොකු කාලයක් ගතවන දේවල් කරන ගමන් ඇවිදීමේ මංතීරු හදන එක, ගස් සිටුවන එක වගේ සරල දේවල් කළාම ජනතාව මානසික වශයෙන් වෙනසක් ඇති වෙනවා. මේ වගේ හුඟක් දේවල් හැම අමාත්‍යාංශයකට කරන්න පුළුවන්. අප කියලා තියෙනවා පුරන් කුඹුරු අස්වද්දන්නට. එයට රාජ්‍ය අමාත්‍යාංශයටත් තියෙනවා. සමහර කුඹුරු තියනවා පුරන් වෙලා. වී වගා කරන්න බෑ. නමුත් දැන් අප අනුමැතිය දුන්නා.ගොවිජන සේවා එකෙන් වෙනත් බෝග වවන්නට.

දක්ෂිණ අධිවේගී මාර්ගය දෙපැත්තේ පුරන් කුඹුරු විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ ඉඩම්වල පොල් වගා කළොත් දැකපු ගමන්ම බලපෑමක් එනවානේ. "ආ මේ ඇමැතිවරයා වැඩක් කරනවා කියලා". දීර්ඝ කාලීන අරමුණක් තියෙනවා අමාත්‍යාංශවලට. නමුත් කෙටි කාලීනව කරන්න පුළුවන් දේවල් හුඟාක් තියෙනවා. අද ජීවන වියදම එළවළු මිල විශාල ප්‍රශ්නයක්. නමුත් මේ එළවළුවලින් අතරමැදියා සියයට සීයක් ලාභ ලබනවා. මේ වගේ එකකට ඩිජිටල් ෆ්ලැට්ෆෝම් එකක් දාලා හරි බෙදාහැරීමේ සිස්ටම් එක හදන්න පුළුවන් නම් අපට ලොකු බලපෑමක් එකපාරටම කරන්න පුළුවන්. එකේ දීර්ඝ කාලීන ඒවත් තියෙනවා. නමුත් කෙටි කාලීනව කරන්න පුළුවන් ඒවා තියෙනවා. පිත්තල, මැටි, බතික් වගේ ඒවට වෙනම අමාත්‍යාංශ හැදුවා. මේ හුඟාක් ඒවායින් කෙටි කාලීනව මිනිසුන්ට පහසුවක් ගෙන දෙන්න පුළුවන්. මේවා විශාල කාලයක් අතරමං කර තිබුණු දේවල්. කවුරුවත් හිතාබලා තිබුණේ නැති ඒවා. මේවායින් ඒ ගම්මාන දියුණු කරන්න පුළුවන්. ඒ ගොල්ලන්ට වෙළෙඳසල් හදලා දෙන්න පුළුවන්. මැටි හොයාගන්න, පිත්තල හොයාගන්න, වේවැල් හොයාගන්න වගේ එදිනෙදා ගැටලුවලට ඉක්මනටම බලපෑමක් ගේන්න පුළුවන්.

### ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීවරයා ගැන මමවත් අගමැතිවත් අධිකරණයට කිසිම බලපෑමක් කළේ නෑ

#### ජනපති

**නුවන් කොඩිකාර**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනයේ අරමුණ 19 වැනි සංශෝධනයෙන් පනවා ඇති බාධක ඉවත් කොට ඉදිරියට යාම බව රාජ්‍ය අමාත්‍යවරුන් සමඟ ජනාධිපති කාර්යාලයේ පැවැති සාකච්ඡාවේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැවැසීය.

"සියල්ල එකවර වෙනස් කරන්න බැහැ. ඊට විශාල කාලයක් ගත වෙනවා. විවිධ අදහස් ඉදිරිපත් කර තිබෙනවා. 19 වැනි සංශෝධනයේ ඇතැම් ලක්ෂණ එසේම තබාගන්න අපට අවශ්‍යයි. මූලික අරමුණ ජනාධිපති ධුර කාලය නොවෙනස්ව පවත්වා ගනිමින් ඉදිරි වැඩ කරගෙන යාමයි ජනාධිපතිවරයා කීය.

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ පොදුජන පෙරමුණේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මහතා ගැන අධිකරණය දුන් තීන්දුව මුල් කොට ගෙන විපක්ෂය සහ එහි හිතවතුන් සමාජ ගත කරමින් තිබෙන අදහස්වලට රාජ්‍ය ඇමැතිවරුන් සමඟ පෙරේදා (10) පැවැති සාකච්ඡාවේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එසේ පිළිතුරු දුන්නේය.

ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීවරයා මුල්කොට ගෙන විපක්ෂය නඟන චෝදනා ගැන අවධානය යොමු කළ ජනාධිපති රාජපක්ෂ මහතා තමා හෝ අගමැතිවරයා හෝ අධිකරණ ක්‍රියාවලියට කිසිදු බලපෑමක් නොකළ බව අවධාරණය කළේය.

බලපෑම් කරනවානම් කළයුතුව තිබුණේ මහාධිකරණයට. එවැන්නක් කිසිවිටෙකත් සිදුවූයේ නැහැ. අධිකරණ තීන්දුව දුන් විනිසුරුවරයා පත් කළේ ව්‍යවස්ථා සභාව. එහි සිටියේ කරු ජයසූරිය, සජිත් ප්‍රේමදාස, තලතා අතුකෝරාළ ඇතුළු පිරිසක්. විපක්ෂයට එක් තීන්දුවක් හොඳයි. අනෙක නරකයි" ජනාධිපතිවරයා විග්‍රහ කළේය. අභියාචනාධිකරණ විනිසුරුවරයා පත් කළේද එකී ව්‍යවස්ථා සභාවම බව පෙන්වා දුන් ජනාධිපති රාජපක්ෂ මහතා විපක්ෂය අසත්‍ය ප්‍රචාරයක නිරතව සිටින බව කීය.

### ගුරු මාරු සහ දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමට දේශපාලනඥයන්ට බෑ

### ජාතික පාසල් දහස දක්වා වැඩි කරනවා පාසල් පද්ධතියේ දියුණුවට දිස්ත්‍රික් අධ්‍යාපන කමිටු

### ඖෂධ ආනයනය විධිමත් කිරීමට තිබෙන ගිවිසුම් සංශෝධනයට පියවර

## ඇතැම් නිලධාරීන් තීරණ ගන්න බයයි:

### මේ තත්ත්වය වෙනස් කළ යුතුයි

#### ජනපති

ගුරු මාරු සහ දරුවන් පාසල්වලට ඇතුළත් කිරීම හැර පාසල් පද්ධතියේ දියුණුවට ඉවහල් වන සෑම කාර්යයකටම හවුල්වීමේ අවස්ථාව දේශපාලනඥයන්ට විවෘතව පවතින බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේය.

එය පොදු යහපත අරමුණු කරගනිමින් මිස දේශපාලන ඇඟිලි ගැසීමක් නොවිය යුතුයැයි සියලු රාජ්‍ය අමාත්‍යවරුන් සමඟ ජනාධිපති කාර්යාලයේ පෙරේදා (10) පැවැති සාකච්ඡාවේ ජනාධිපතිවරයා පැවැසීය.

දිවයිනේ සමස්ත ජාතික පාසල් සංඛ්‍යාව දහස දක්වා වැඩි කිරීමටත්, දැනට පවතින ඇතැම් ජාතික පාසල්වලට ප්‍රමාණවත් පහසුකම් නැතිව එම පාසල් නමට පමණක් ජාතික පාසල් බවට සීමා වී තිබෙන හෙයින් එවැනි පාසල් ද කඩිනමින් සංවර්ධනය කිරීමට තීරණය කෙරිණි.

පාසල් පද්ධතියේ දියුණුව පිණිස දිස්ත්‍රික් අධ්‍යාපන කමිටු පත් කිරීමට ජනාධිපතිවරයා ප්‍රමුඛ රාජ්‍ය ඇමැතිවරු තීරණය කළ අතර අධ්‍යාපන කලාප කාර්යාල සහ කොට්ඨාස කාර්යාල අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට ද එකඟත්වය පළ විය.

දිවයිනේ පාසල්වල විදුහල්පති පුරප්පාඩු පිරවීමට වැඩබලන විදුහල්පතිවරු පත්කිරීම පිළිබඳව ද සොයා බැලිණි. ගුරු ව්‍යවස්ථාව අනුව වසරක් පාසා ගුරු විභාග පැවැත්විය යුතු වුවද විදුහල්පති පුරප්පාඩුවට ප්‍රධාන හේතුව එය විධිමත්ව සිදු නොවීම බවත් පාසල්වල සිටින දක්ෂ සහ පළපුරුදු ගුරුවරුන් වැඩබලන විදුහල්පතිවරු ලෙස පත් කිරීමට ඇති ඉඩකඩ විමසා බැලීමට ද තීරණය විය.

වැසි සමයේ දී නගර ජලයෙන් යටවීමේ ගැටලුව සාකච්ඡාවට ලක් වූ අතර ඒ පිළිබඳ අදහස් පළ කළ ජනාධිපති රාජපක්ෂ මහතා කියා සිටියේ පොඩි වැස්සටත් කොළඹ යටවෙනවා. අප ඊට ස්ථිර විසඳුමක් හඳුන්වා දුන්නා. පසුගිය පස් වසරේ එය ක්‍රියාත්මක වුණේ නැහැ. ගැටලුව දැන් යළි මතුවෙලා. වගකීම් විවිධ ආයතනවලට පැවරී තිබීමත්, විසඳුම් සාර්ථක නොවීමට හේතුවක්. එවැනි දුබලතා මගහැර ගැටලු කඩිනමින් විසඳීමේ අවශ්‍යතාව අවධාරණය කළේය.

ඖෂධ ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු කළ ජනාධිපතිවරයා සහ රාජ්‍ය ඇමැතිවරු ඖෂධ පනත සංශෝධනය කිරීම ගැන සාකච්ඡා කළ අතර ඖෂධ ආනයනය විධිමත් කිරීමට සඳහා ඇති කරගෙන තිබෙන ගිවිසුම් සංශෝධනයට එකඟත්වය පළවිය.

අපේ රටේ අවශ්‍යතාවට පමණක් නොව විදේශීය වෙළෙඳපොළ සඳහාත් ඖෂධ නිෂ්පාදනය කිරීමට අපට පුළුවන්. ඒ සඳහා ආයෝජකයන් ද සූදානමින් සිටිනවා. මේ ඉලක්කය සපුරා ගැනීම රට ලබන විශාල ජයග්‍රහණයක් ලෙස ඉතිහාසයට එක්වේවි යැයි ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා පැවැසීය.

රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කොට සංවර්ධන ක්‍රියාවලියට සක්‍රියව දායක කර ගැනීමේ අවශ්‍යතාව ජනාධිපතිවරයා පැහැදිලි කළේය.

ඇතැම් නිලධාරීන් තීරණ ගැනීමට බයයි. මේ තත්ත්වය වෙනස් කළ යුතුයි. රාජ්‍ය සේවය කාර්යක්ෂම සහ විධිමත් කිරීමට දේශපාලනඥයන් සහ රාජ්‍ය නිලධාරීන් එකඟත්වයෙන් වැඩ කිරීමේ අවශ්‍යතාව ජනාධිපතිවරයා අවධාරණය කළේය. ජනාධිපති ලේකම්, ආචාර්ය පී.බී ජයසුන්දර මහතාද මේ සාකච්ඡාවට එක්ව සිටියේය.

## තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ කමිටු වාර්තාව අගමැතිට පිළිගන්වයි



තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ පංච පුද්ගල කමිටු වාර්තාව අගමැති මහින්ද රාජපක්ෂ මහතා වෙත පිළිගන්වා තිබේ. එම වාර්තාව කමිටු සාමාජිකයන් විසින් පාර්ලිමේන්තුවේ දී අගමැතිවරයා වෙත පිළිගන්වන ලද අතර විදේශ කටයුතු ඇමැතිවරයාගේ උපදෙස් මත පත්කළ මේ පංච පුද්ගල කමිටුවේ සභාපති ලෙස විදේශ කටයුතු අමාත්‍යංශයේ අතිරේක ලේකම් අහමඩ් ජාවිඩ් මහතා කටයුතු කළේය.

කමිටුවේ සෙසු සාමාජිකයන් ලෙස අගමැති අතිරේක ලේකම් ඇන්ටන් පෙරේරා, ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු, මහාචාර්ය සී. එස්. වීරරත්න මහත්වරු සහ චාමින්ද්‍රි සපරමාදු මහත්මිය කටයුතු කළහ.

විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතාගේ උපදෙස් මත වසර 2030 ගෝලීය තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළ ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු සොයා බැලීම පිළිබඳ මේ පංච පුද්ගල කමිටුව පත්කර තිබුණි. විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන, අගමැති අතිරේක ලේකම් චමින්ද කුලරත්න මහත්වරු ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

## මධුර විතානගෙන් හිස් වූ කෝට්ටේ නගර සභා අසුන මධුකා ගුණසේකරට

**අනුර ප්‍රේමලාල්**

ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ නගර සභාවේ නගරාධිපති මධුර විතානගේ මහතා මෙවර පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජයග්‍රහණය කිරීම නිසා සභාවේ පුරප්පාඩු වූ අසුනට මධුකා වීරසිංහ ගුණසේකර මහත්මිය පත්වී තිබේ.

ඒ අනුව අගමැති මහින්ද රාජපක්පක්ෂ මහතා ඉදිරියේ ඉකුත් (08) ඒ මහත්මිය මන්ත්‍රීවරියක් ලෙස දිව්රුම් දුන්නාය. මධුකා වීරසිංහ ගුණසේකර මහත්මිය මෙලෙස අතිරේක ලැයිස්තුවෙන් පත් කර ඇත.

ඇය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කාන්තා සංවිධානයේ විධායක මණ්ඩල සාමාජිකාවකී. පෙරපාසල් ඩිප්ලෝමාධාරිනියක වන ගුණසේකර මහත්මිය පොදුජන පෙරමුණු ප්‍රධාන කාර්යාලයේ හම්බන්තොට දිස්ත්‍රික්ක කාන්තා පෙරපාසල් සම්බන්ධිකාරක ලෙසද කටයුතු කරමින් සිට ඇත.

මෙයට පෙර අම්බලන්තොට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක හා විපක්ෂ නායිකාවක ලෙසද කටයුතු කළ එම මහත්මිය කෝට්ටේ පොදුජන පෙරමුණ කාන්තා බල මණ්ඩලයේ සභාපතිනිය හා කොට්ඨාස නායිකාවද වේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පත් කර තිබෙන ශ්‍රී ලංකා ජාතික කාන්තා කමිටුවේ සාමාජිකාවක ද වන මධුකා ගුණසේකර මහත්මිය ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ හිටපු ප්‍රධාන ලේකම් හිටපු ඇමැතිවරයකුද වන ඩිව් ගුණසේකර මහතාගේ වැඩිමහල් සොහොයුරුගේ දියණියයි. ඇය වීරකැටිය රාජපක්ෂ විද්‍යාලය හා මාතාර සුජාතා බාලිකා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවකී.



# යහපාලන ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම තිබී නෑ

## හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න

**රෝෂන් තුෂාර**

යහපාලන ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම තිබී නොමැති බවත්, ජනවරම ලැබූ කැබිනට් මණ්ඩලය සහ ජනතා නියෝජිතයන් නොවන පිරිස් ද ආණ්ඩුවේ කටයුතුවලට ඇඟිලි ගසා නීති විරෝධීව කටයුතු කර ඇති බවත් දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම පෙරේදා (10) ප්‍රකාශ කළේය.

ජාතික විධායක සභාව නම් දේශපාලන සන්ධානයක තීරණයක් මත හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ කැබිනට් සංදේශයක් ප්‍රකාරව ස්ථාපිත කළ 'දූෂණ විරෝධී කමිටුව' පිළිබඳව හිටපු විදේශ ඇමැති මංගල සමරවීර මහතා ලබා දුන් සාක්ෂිවලට ප්‍රතිචාර දක්වමින් එම කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා එසේ පැවැසීය.

දූෂණ විරෝධී කමිටුව ගැන තමන් නොදන්නා බවත්, එම කමිටුවේ දෙවැනි සාමාජිකයා හෝ අනු කමිටු සභාපතිවරයකු ලෙස තමන් කටයුතු කර නොමැති බවත්, හිටපු අගමැතිවරයා යොමු කළ කැබිනට් පත්‍රිකාව පිළිබඳව තමන් නොදන්නා බවත් මංගල සමරවීර මහතා සාක්ෂි දෙමින් පැවැසීය.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම්, වත්මන් රූපවාහිනී සංස්ථා සභාපති වෛද්‍ය නිහාල් ජයතිලක මහතා දේශපාලන පළිගැනීම් කොමිසම හමුවේ පැවරූ පැමිණිල්ලේ වගඋත්තරකරුවකු ලෙස සාක්ෂි දෙමින් සමරවීර මහතා එසේ පැවැසීය.

හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න, හිටපු අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍රා ජයතිලක සහ හිටපු පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහත්වරුන් ඉදිරියේ සාක්ෂි ලබා දුන්නේය.

නීතිඥ රජිත කොඩිතුවක්කු මහතා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දුන් හිටපු ඇමැති මංගල සමරවීර මහතා මෙසේද පැවැසීය.

'වෛද්‍ය නිහාල් ජයතිලක මහතාගේ පැමිණිල්ලක් ගැන මා දන්නේ නෑ. මට මේ කොමිසමෙන් ලද සිතාසියක් මත අද පෙනී සිටිනවා. පසුගිය අපේ ආණ්ඩුවේ දූෂණ විරෝධී කමිටුවක් තිබුණා කියලා මා දන්නේ මේ සිතාසියෙන් පසුව.

දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයෙක් කියලා මා දන්නේ නෑ. ඒ බව දන්නෙත් දැන්. මම එම කමිටුවේ සාමාජිකයෙක් හෝ එහි අනු කමිටුවක සභාපතිවරයෙක් නොවෙයි. ජාතික විධායක සභාවක් ගැන හෝ එම කමිටුවක් පත් කිරීමට ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවක් ගැන මා දන්නේ නෑ. 1994 සිට මා ඇමැතිකම් කළත් කිසිම දවසක දේශපාලන පළිගැනීමක් කර නෑ.'

පැමිණිල්ලේ නීතිඥ සෙනරත් ජයසුන්දර මහතා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දුන් සමරවීර මහතා මෙසේද පැවැසීය.

'මම 2015දී විදේශ ඇමැති ලෙස කටයුතු කළා. මා කැබිනට් ඇමැතිවරයෙක්. මම කැබිනට් මණ්ඩල රැස්වීම්වලට ලංකාවේ සිටින විට සහභාගි වෙනවා. 2015 ජනවාරි මස 21 වැනි දින කැබිනට් මණ්ඩල රැස්වීමට සහභාගි වුණාද කියලා මට මතක නෑ. මා සිටියාද යන්න පිළිබඳව තොරතුරුවල ඇති. කැබිනට් පත්‍රිකාවක් පිළිබඳව මණ්ඩලය විසින් සාකච්ඡා කරනවා. පසු දින කැබිනට් ප්‍රකාශක ඇමැතිවරයා විසින් වැදගත් කරුණු මාධ්‍යයට කියනවා. කැබිනට් මණ්ඩලයේ ලේකම්වරයෙක් ඉන්නවා. ලේකම්වරයා විසින් අදාළ කරුණු ඊට සම්බන්ධ අමාත්‍යාංශවලට යොමු කරනවා. (2015 ජනවාරි මස 21 වැනි දින කැබිනට් මණ්ඩල සාකච්ඡාවට අදාළ පත්‍රිකා පෙන්වයි.)

මේ පත්‍රිකා තීරණ අනුව මහා පරිමාණ දූෂණ සොයා බැලීම පිළිබඳ එදින සාකච්ඡා වී තිබෙන බව මේ ලේඛනය අනුව මා පිළිගන්නවා. ජාතික විධායක සභාව කියලා එකක් මා දන්නේ නෑ. ඊට මා සහභාගී වෙලා නෑ. 2015 ජනවාරි මස 08 වැනි දින එවකට ජනාධිපතිට අවස්ථාව හිමිවන්නේ මහා පරිමාණ දූෂණ සෙවීමේ කරුණ මත තමයි.

ජාතික විධායක සභාව දේශපාලන ආයතනයක් විය යුතුයි. මා සිතන හැටියට ජාතික විධායක සභාවක් යම් දේශපාලන කණ්ඩායමකට හෝ පක්ෂයකට අයිති විය යුතුයි. එහෙම එකක් පිහිටුවන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පුළුවන්ද බැරිද කියලා කියන්න මා නීතිඥයෙක් නොවෙයි. හැබැයි එහෙම එකක් පක්ෂයකට පිහිටුවිය හැකියි.

මහා පරිමාණ දූෂණ සොයන්න පත් කළ ලේකම් කාර්යාලයකින් මහා පරිමාණ දූෂණ හොයනවා හැර මෙහෙම ලේකම්වරයෙක් මාරු කර දේශපාලන පළිගැනීමක් කිරීම ගැන මා පුදුම වෙනවා. සාමාන්‍ය සම්ප්‍රදාය අනුව කැබිනට් තීරණ අදාළ කැබිනට් ඇමැතිවරුන්ට යොමු කරනවා.

කැබිනට් රැස්වීම සෑම අඟහරුවාදාවකම තිබුණා. ඊට පෙර කැබිනට් පත්‍රිකාව ඇමැතිවරුන්ට ලැබෙනවා. එවකට ආණ්ඩුවේ වගකිවයුතු ඇමැතිවරයෙක් කියලා මා හිතනවා. ආණ්ඩුව පත්වූ මුල් අවධියේ මා ඉන්දියාවට ගියා. ඊට පසුව ජිනීවා නුවරට ගියා. ශ්‍රී ලංකාවට විරුද්ධව බරපතළ කාරණාවක් එල්ලව තිබුණා. මාර්තු මාසයට පෙර මා හුසේන් කුමරු හමුවීමට ගියා. කැබිනට් පත්‍රිකාව මට හෝ මා නැත්නම් වැඩබලන ඇමැතිට ලැබෙනවා. මා ලංකාවට පැමිණි පසු මට අදාළ දේවල් තිබුණා නම් දැනුම් දෙනවා. (කැබිනට් පත්‍රිකාව පෙන්වයි.)

මේ පත් කළ කමිටුවේ දෙවැනියට මාගේ නම ඇතුළත් වෙනවා. නමුත් මා ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතාගේ සභාපතිත්වයෙන් යුත් කිසිදු කමිටුවකට සහභාගි වෙලා නෑ. ඇත්ත වශයෙන් ජනවරම ලැබුණේ මේ දූෂණ හොයන්න.

2015 හෝ 2016 මුල ජනාධිපති මෛත්‍රීපාල මහතා මට නිවෙසට එන්න කියලා තිබුණා. එතැන එවකට නීතිපති හිටියා. ජනාධිපතිවරයා මට කිව්වා මිග් යානා පරීක්ෂණ ඉවරයි. හැබැයි බී වාර්තාවට ලේඛන දෙකක් අඩුයි කියලා. එම සාකච්ඡාවට රවි වෛද්‍යාලංකාර මහතා ද සිටියා. එම ලේඛන සොයන්න මා යුක්රේන් ගියා. එසේ ගොස් එරට නීතිපති හමුව මාසයක් ඇතුළත එම ලේඛන සොයා දුන්නා. ඒ වගේම සිංගප්පූරු ලේඛනද මා සොයා දුන්නා.'

**කොමිසම:**

මොනවාද ලියකියවිලි?

**සාක්ෂිකරු :**

'නඩුවට අදාළ ලියකියවිලි. මා එම ලියවිලි අදාළ නිලධාරීන් විසින් එරටින් ලබා ගත්තා.'

**කොමිසම:**

ලියකියවිලි මොනවාද කියලා ඔබ දන්නේ නැද්ද?

**සාක්ෂිකරු:**

'සමාවෙන්න ස්වාමීනි, ඒ ලියවිලි මොකක්ද කියලා මා සෙව්වේ නෑ. මේ පරීක්ෂණය කළ නිලධාරීන් මා රැගෙන ගියා.'

ඒකට අත්‍යවශ්‍ය ලියවිල්ල කුමක්ද යන්න නීතිපතිවරයා කියලා තිබුණා.

**කොමිසම:**

ඒ කියන්නේ ඔබ යුක්රේනයට යන්නේ මොකක්ද ලියකියවිල්ල කියලා දැනගෙන නොවෙයිද?

**සාක්ෂිකරු:**

'මේක නඩුවට අදාළ ලියවිල්ලක්. ලියවිල්ල විස්තර වශයෙන් මා දන්නේ නෑ. මොකක්ද කියලා මා දන්නෙත් නෑ. දැනගත යුතුත් නෑ. මගේ හැකියාව අනුව එම ලියවිල්ල ලබාදීමට ඉදිරිපත් වුණා පමණයි.'

**කොමිසම:**

ඔබ මේ කැබිනට් පත්‍රිකාව ගැන දන්නේ නෑ කියලා මුලින් කිව්වා.

**සාක්ෂිකරු :**

'මම කිව්වේ මතක නෑ කියලා.'

**කොමිසම :**

අප ජීවත් වෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රටක. සාමූහික වගකීම ගැන ඔබ දන්නවනේ.

**සාක්ෂිකරු:**

'මා කිව්වේ කැබිනට් රැස්වීමේ හිටියේ නෑ කියලා.'

**දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම**

**කොමිසම:**

සිටියත් නොසිටියත් සාමූහික වගකීම තිබෙනවා.

**සාක්ෂිකරු:**

'මා කිව්වේ මේ දූෂණ විරෝධී කමිටුවට සහභාගී වී නෑ කියලා.'

**කොමිසම:**

නමුත් ඔබ මේ කැබිනට් සංදේශය ගැන දැන ගත යුතුයි නේද?

**සාක්ෂිකරු :**

'මා කිව්වේ මට මතක නෑ කියලා.'

**කොමිසම :**

අග්‍රාමාත්‍ය ලේකම් මේක නිකුත් කරලා. ඔබට ලැබිය යුතුයි නේද? ඔබ දක්ෂ ඇමැතිවරයෙක් නිසා නේද අගමැතිවරයා විදේශ ඇමැතිකම දුන්නේ?

**සාක්ෂිකරු :**

'ඒකට මා පිළිතුරු දිය යුතු නෑ.'

**කොමිසම :**

ජාතික විධායක සභාව කියන්නේ මොකක්ද කියලා සෙව්වේ නැද්ද?

**සාක්ෂිකරු :**

'ඒක දේශපාලන සංවිධානයක්. හැබැයි දූෂණ විරෝධී කාර්යාලයක්. ඒ කියන්නේ දෙකක්. ඒක පටලවා ගන්න හොඳ නෑ.'

**කොමිසම :**

කැබිනට් මණ්ඩලය මේ තීරණය ගෙන තිබෙන්නේ ජාතික විධායක සභාවේ අනුමැතිය පරිදි නේද?

**සාක්ෂිකරු :**

'කැබිනට් ලේකම්වරයාගෙන් ඇසිය යුතුයි ජාතික විධායක සභාව නම දැම්මේ ඇයි කියලා.'

**කොමිසම:**

නීති විරෝධී බවක් ගැබ්ව තිබෙනවා කියලා ඔබට පේනවාද?

**සාක්ෂිකරු :**

'හුගාක් රජයන් ක්‍රියාත්මක කරන්නේ තමන්ගේ දේශපාලන මණ්ඩල කරුණු තමයි. ඒක මෙතැනට ගෙන ඒම තමයි ප්‍රශ්නේ.'

**කොමිසම :**

ඒ කියන්නේ නොගැලපීමක් තිබෙනවා නේද?

**සාක්ෂිකරු :**

'එහෙම ගැනීම අදාළ නෑ.'

**කොමිසම :**

අපේ ප්‍රශ්නේ කැබිනට් මණ්ඩලයට උඩින් විධායක සභාවක් ආවේ කොහොමද කියලා. කැබිනට් මණ්ඩල තීරණ ගැන අපේ ප්‍රශ්නයක් නෑ.

**සාක්ෂිකරු :**

'විධායක සභාව දේශපාලනික ආයතනයක්. ඒ මත දූෂණ විරෝධී කමිටුව නීත්‍යානුකූලව පිහිටුවා තිබෙනවා.'

**නීතිඥවරයා :**

මේ ජාතික විධායක සභාව පිහිටවූ කමිටුවේ දේශපාලන සන්ධානවලට අයත් නොවන අයත් සිටියා නේද?

**සාක්ෂිකරු :**

'සම්බන්දන්, සුමන්තිරන්, අනුර කුමාර සන්ධානයේ නෑ. සරත් ෆොන්සේකා, මලික් සමරවික්‍රම පාර්ලිමේන්තුවේ නෑ. මේක කැබිනට් පත්‍රිකාවට එන එකක් නොවෙයි. මේ කට්ටිය දේශපාලනික වශයෙන් හමුවූ පිරිසක්. දේශපාලන උපායමාර්ග සාකච්ඡා කිරීමට රැස්වුණා පමණයි. මේ කැබිනට් පත්‍රිකාව පිළිබඳව මා දැන ගත යුතුව තිබුණත් දැනගෙන සිටියේ නෑ.'

**කොමිසම:**

ඔබ අනු කමිටු සභාපතිවරයෙක්.

**සාක්ෂිකරු :**

'මා කිසිම අනුකමිටුවකට සහභාගී වී නෑ.'

**නීතිඥවරයා :**

පහළොස් දෙනකුගේ දූෂණ වංචා සොයන්න මේ කමිටුව පත් කර තිබෙනවා.

**සාක්ෂිකරු :**

'මේ කමිටුවේ මා ඇතුළු පහළොව ගැන දන්නෙත් දැන්. සෑම ආණ්ඩුවක්ම පත් වන්නේ පෙර ආණ්ඩුවල දූෂිතයන්ට දඬුවම් දෙන්න. 1994, 2005, 2015දී මේ දූෂණ ගැන කතා කරනවා. සෑම ආණ්ඩුවක්ම දූෂණ ගැන කතා කර කර ඒ දේම කරගෙන යනවා. දැන්වත් මීට වඩා තද නීති සෑදිය යුතුයි. මා කියන්නේ දැන්වත් දේශපාලනඥයන් වශයෙන් අප කරන දූෂණ නැවැත්විය යුතුයි. ඒ නිසා මා ඔය කමිටුවලට ගියේ නෑ.'

**කොමිසම :**

දූෂණ ගැන වැඩිපුරම කතා කළේ 2015දී නේද?

**සාක්ෂිකරු:**

'නෑ. 1994 සිට කතා කරනවා.'

**නීතිඥවරයා :**

ඔබ මේ කැබිනට් පත්‍රිකාව ගැන දන්නේ නෑ. එෆ්. සී. අයි. ඩී. ය ගැන දන්නේනෑ. දූෂණ විරෝධී කමිටුව ගැන දන්නේ නෑ.

**සාක්ෂිකරු :**

'නෑ. මේ ලේඛන මා ප්‍රථම වතාවටයි දකින්නේ. දූෂණ විරෝධී කමිටුව ගැන අද වනතුරු දන්නේ නෑ.'

**කොමිසම :**

එතකොට සාමූහික වගකීමක් තිබී නෑ.

**සාක්ෂිකරු :**

'මා හිතන්නේ වැරැදි දෙයක් කළා නම් වගකිව යුතුයි.'

**කොමිසම :**

සාමූහික වගකීමක් කියන්නේ නොදැන සිටීමක්. සාමූහික වගකීම කඩ කිරීමක්.

**සාක්ෂිකරු :**

'ඒක ඔබතුමාගේ මතය. මා මෙය කියන්නේ වගකීමෙන් ගැලවෙන්න නොවෙයි.'

**කොමිසම :**

යහපාලන ආණ්ඩුවේ සාමාන්‍ය දෙයක්ද මේක?

**සාක්ෂිකරු :**

'සාමාන්‍යයෙනුත් වෙනවා. පක්ෂ දෙකේම මෙය තිබෙනවා.'

**නීතිඥවරයා :**

දූෂණ විරෝධී කමිටුවේ අනු කමිටු සභාපති ධුරයක් ඔබ දරනවා.

**සාක්ෂිකරු :**

'නමුත් මා එක රැස්වීමක්වත් තබා නෑ.'

**නීතිඥවරයා :**

පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය කළ පරීක්ෂණ ඔබ දන්නවාද?

**සාක්ෂිකරු :**

'දන්නවා. මා මුලින් කියූ කාරණයට විතරයි සම්බන්ධ වුණේ. මිග් ගනුදෙනු කාරණයට එෆ්. සී. අයි. ඩී. එක මුලින් පරීක්ෂණ හොඳට කළා.'

**කොමිසම :**

දූෂණ විරෝධී කමිටුවේ මහජන නියෝජිතයන් නොවන පුද්ගලයන් ඉන්නවා.

**සාක්ෂිකරු :**

'ඉන්නවා. සාමාන්‍යයෙන් කෙරෙන්නේ එහෙමයි.'

**කොමිසම :**

එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ රටේ නීතියට අදාළ නෑ නේද? ජනතාව බලය දෙන්නේ ජනතා නියෝජිතයන්ට.

**සාක්ෂිකරු:**

'ඔබතුමාලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීතිය දන්නවා. එහෙත් දේශපාලනයේ ප්‍රායෝගිකත්වය මේක තමයි.'

**කොමිසම:**

ඒක නීත්‍යානුකූල නෑ.

**සාක්ෂිකරු :**

'මේ කොමිසම වුණත් ඒ ජනවරම අනුව ස්ථාපිත කළ එකක් කියලා මා හිතනවා.'

**නීතිඥවරයා:**

ක්ෂණික ප්‍රතිචාර කමිටුව ගැන දන්නවාද?

**සාක්ෂිකරු :**

'මා ඒක ඇහුවෙත් පළමු වතාවට.'

**නීතිඥවරයා :**

මේක රැස්වූයේ අරලියගහ මැදුරේ.

**සාක්ෂිකරු:**

'මේක නොවෙයි මා ජනමාධ්‍ය ඇමැති කාලේ නම් එහෙම එකක් පිහිටවූවා. අනුර කුමාරගේ සභාපතිත්වයෙන් යුත් කමිටුව ගැන අද තමයි පළමු වතාවට දැනගත්තේ.'

**කොමිසම:**

සාමාන්‍යයෙන් විදේශ ගමන් තහනම් පනවන්න මේ කමිටුවට පුළුවන්ද?

**සාක්ෂිකරු :**

'ස්වාමීනි, ඒක කරන්න පුළුවන් අධිකරණ ක්‍රියාවලියක් හරහා.'

**කොමිසම:**

නමුත් ඔබේ ආණ්ඩුවේ ඒක කළේ කමිටුවකින් නේද? ඒක දේශපාලනීකරණය වෙලා. අනුර කුමාර මහතාත් ඒ කමිටුවල සාමාජිකයෙක්.

**සාක්ෂිකරු :**

'ඒක ඒ විදිහට පෙන්වන්න හැදුවත් මේ අය ජනවරමට සහාය දුන් අය.'

**කොමිසම:**

නමුත් උසාවි නියෝග නැතුව යම් යම් දේ කර තිබෙනවා. ඒක තමයි අප ඔබතුමන්ලා ගෙනත් සොයා බලන්නේ.

**සාක්ෂිකරු :**

'සෑමදාම දේශපාලනීකරණය තිබුණා. මාත් අද එම දේශපාලනීකරණයේ වින්දිතයෙක් වෙලා.'

**කොමිසම:**

නමුත් මේක නේද ඔබ දකින එකම කැබිනට් පත්‍රිකාව. මීට පෙර එහෙම කැබිනට් පත්‍රිකා මෙහෙම ක්‍රියා කර නෑ නේද?

**සාක්ෂිකරු:**

'ඒ තිබුණු ආණ්ඩුව අපේ ආණ්ඩුව තරම් මෝඩ නැතුව ඇති. අද ගේන විස්සෙනුත් වෙන්නේ මේක තමයි.'

**කොමිසම:**

ඒ ගැන අප වෙනත් කොමිසමක කතා කරමු.

**නීතිඥවරයා:**

මේ නිහාල් ජයතිලක ලේකම්වරයා ගැන දන්නවාද?

**සාක්ෂිකරු :**

'මා නම දැන ගත්තා ඒ කාලේ. හැබැයි අද තමයි හඳුනාගත්තේ. මා නම් සෑමදාම කියන්නේ නිලධාරීන්ට මෙහෙම කරන්න එපා කියලා.

මහා පරිමාණ දූෂණ කැබිනට් පත්‍රිකාවක් දැම්මේ හාල් මැස්සන් අල්ලන්න නොවෙයි. මෝරු අල්ලන්න. නමුත් රාජකාරී කර හාල් මැස්සන් තමයි අල්ලලා තිබෙන්නේ. කැබිනට් පත්‍රිකාව අනුව මේක නොගැලපෙන ක්‍රියාවක්. නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේවාට උපදෙස් ගත්තාට කමක් නෑ. නමුත් කමිටු සාමාජිකයන් ලෙස නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රජයේ නිලධාරීන් මේ කමිටුවලට පත් කිරීම වැරැදි ක්‍රියාවක්.'

වගඋත්තරකාර හිටපු ඇමැති මලික් සමරවික්‍රම මහතා ද සාක්ෂි ලබා දුන්නේය.

# සවුදි තානාපති කාර්යාලය මෙරට ඇති කිරීමෙන් වහබ්වාදී බලය ස්ථාපිත වුණා

## ● ගලගොඩඅත්තේ ඥානසාර හිමි

**සුභාෂිණී සේනානායක**

සවුදි තානාපති කාර්යාලය මෙරට ස්ථාපිත කිරීමෙන් වහබ්වාදී බලය මෙරට ස්ථාපිත වූ බව ගලගොඩඅත්තේ ඥානසාර හිමි පෙරේදා (10) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති විමර්ශන කොමිසම හමුවේ අනාවරණය කළහ.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් උන් වහන්සේ මෙසේ ද කීහ.

'ජමියතුල් උලමා සංවිධානයේ බලය මෙරට සිටි සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් වන සූෆිවරුන් අත තිබුණා. එම කාලයේ ගැටුම් සිදු වූයේ අවම වශයෙන්. උලමා සංවිධානයේ බලය වහබ්වාදීන් අතට පත් වීමෙන් පසුව අන්තවාදීන් වර්ධනය වීම ආරම්භ වුණා.'

මේ කොමිසමේ කැඳවීමකට අනුව මීට ඉහතදී ගලගොඩඅත්තේ ඥානසාර හිමි විසින් ලබා දුන් සාක්ෂියෙන් මුස්ලිම් සංවිධාන සහ ආයතන කිහිපයකටම අගතියක් සිදුව ඇති හෙයින් උන් වහන්සේගෙන් හරස් ප්‍රශ්න විමසීමට අවස්ථාව ලබා දෙන ලෙස එම සංවිධාන විසින් කොමිසමෙන් කළ ඉල්ලීමට අනුව එම අවස්ථාව ලබා දෙන බව කොමිසම තීරණය කිරීමෙන් පසුව එම සංවිධානවල නීතිඥවරයා ඉදිරිපත් කළ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් උන් වහන්සේ මේ බව කියා සිටියහ.

ඒ අනුව පෙරේදා (10) දින තෙවන දිනයටත් ඥානසාර හිමි හරස් ප්‍රශ්න සඳහා කැඳවා තිබුණි.

මේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් උන් වහන්සේ මෙසේ කීහ.

'මෙරට වහබ්වාදයේ ප්‍රධාන මතධාරී කණ්ඩායම් හතරක් ජමියතුල් උලමා සංවිධානය නියෝජනය කරනවා. හලාල් සංකල්පය මුස්ලිම්වරුන්ට විශේෂ වුවත් ඒ හරහා දත් බුරුසුවටත් හලාල් ලාංඡනය යොදා ගනිමින් කොහේවත් සිටින උලමාවරුන් මෙරට බෙදීමක් ඇති කළා. අපටත් පුළුවන් පිරිත් පැන්වලට ධර්ම චක්‍ර ලාංඡනය යොදා වැඩි මුදල් අය කර විකුණන්න. කතෝලික අයත් කුරුස ලාංඡනය ගැහුවත්, දෙමළ අය ත්‍රිශූලය ගැහුවත් මොකද වෙන්නේ.

2007දී අලව් මවුලානා ආණ්ඩුකාරවරයා වහබ් වැඩපිළිවෙළ ජාතික ආරක්ෂාවට තර්ජනයක් බව පැවැසුවා. ඒ වේලාවේ මේ උලමා කොහේද හිටියේ. කොමිසමට පින්සිද්ධ වෙන්න සහරාන් ගැන නොදැන සිටි කරුණු පවා දැන ගත්තා.'

ජමියතුල් උලමා සංවිධානය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා -

ජමියතුල් උලමා සංවිධානය සහ සූෆි මුස්ලිම්වරුන් විරුද්ධ ස්ථාවරයක් ගත් බව පැවැසුවා. එය නිවැරදි ද?

**පාස්කු කොමිසම**

**ඥානසාර හිමි -**

'ඔව්. ජමියතුල් උලමා සංවිධානය දීර්ඝ කාලයක් බලය තිබුණේ සාම්ප්‍රදායික මුස්ලිම් සූෆි වියතුන්ගේ අතේ. ඒ බලය ගිලිහිලා වර්තමාන උලමාවරුන් අතට පත්ව තිබෙනවා. ඒකයි අප දන්න සත්‍ය.'

**නීතිඥවරයා -**

ලංකාවේ සූෆි ප්‍රජාව කෙතරම්ද?

**ඥානසාර හිමි -**

'අපේ රටේ මහ සංස්කෘතිය සමඟ බිහි වූ ටී. බී. ජයා, බාකීර් මාකර්ලා වැනි අය අතේ උලමා බලය තිබුණා. සෞදි අරාබියේ තානාපති කාර්යාලය මෙරට පිහිටුවීමෙන් පසු වහබ්වාදය ඇති වීම ආරම්භ වුණා. රියාද්වල මුද්‍රණ කළ වහබ්වාදී පොත්පත් මෙරටට ආවේ සුළඟ හරහා ද?'

**නීතිඥවරයා** - ඔබ මේවා වගකීමෙන්ද කියන්නේ.

**ඥානසාර හිමි -**

'ඔව්. කාත්තන්කුඩියේ දැන් වෙන්නේ මොකක්ද කියා තව පැයකින් මට කියන්න පුළුවන්. රටට ආදරය කරන මුස්ලිම්වරුන් අපට තොරතුරු දෙනවා. සුනාමි කාලයේ විශාල ප්‍රමාණයක් මුස්ලිම් ප්‍රජාව නැති වුණා. ඒ අවස්ථාවේ සිංහල ප්‍රජාව ඔවුන්ට පිහිට වුණා. එහිදී ආහාරවල ඔවුන් හලාල් බැලුවේ නෑ. අප එකට කාපු පිරිසක්. 2007 වනතුරු උලමා කණ්ඩායමක් සිටිය බව දන්නේ නෑ. හලාල් වගේ වැඩසටහන් ගෙනත් බෝම්බ අතහැරියා වගේ පාරිභෝගික භාණ්ඩවලට අතහැරියා. අප එදාත් සාකච්ඡා කළාම අතහරිනවා කියලා මාස 3න් ඒ වැඩසටහන ක්‍රියාත්මක කළා. එදා මුස්ලිම්වරුන්ට මුදල් බෙදුවේ නෑ. ෂරියා බැංකු තිබුණේ නෑ. මුස්ලිම් පල්ලියට ගිහින් කුරානය හැදෑරූ දරුවන්ට විවිධ පාට වර්ණ ගන්වලා මද්‍රසා ගොඩනගලා ඔවුන් සිරකරුවන් කර තිබෙනවා. පල්ලි පල්ලි අතර සිද්ධි 15, 20ක් හරහා පුද්ගලයන් 20, 30ක් මැරිලා තිබෙනවා. නීති විද්‍යාලයේ ප්‍රශ්න ඇති වුණා. ෂරියා නීතිය ක්‍රියාත්මක කර උසාවිවලට පවා ගියා. අටලුගම සිද්ධිය සමාජයේ බෙදුම්වාදයට ගෙන ගියා. මුස්ලිම් කාන්තාවන් කාති තීන්දුවට එරෙහි වුණා. මේවාට සාම්ප්‍රදායික මවුලවිවරුන් මත පළ කළා. සාරි පොටෙන් මුහුණ වහපු කාන්තාව ගෝනි බිල්ලෝ බවට නිකාබය සහ බුර්කාව පත් කළා. බුදු පිළිම කැඩුවා. සෞදියට බුදු පිළිමයක් ගෙන යන්න බෑ. අප මේ ගැනයි අවධානය යොමු කළේ. මුස්ලිම් සමාජය එකට බැඳ තබන්නයි අප මේ කළේ.'

**නීතිඥවරයා -**

තබ්ලික් සංවිධානය සිටියාම මොකද වෙන්නේ.

**ඥානසාර හිමි -**

'තබ්ලික් ජමාත් තමයි තලෙයිබාන් බුදු පිළිම කැඩුවේ.

**නීතිඥවරයා -**

තබ්ලික් ජමාත් සහ තලෙයිබාන් අය සමානයි කියලද කියන්නේ.

**ඥානසාර හිමි -**

'මේක පාන් පිටි වගේ. විවිධ කෑම හදනවා.'

**නීතිඥවරයා -**

තබ්ලික් ජමාත් සංවිධානය කියන්නේ ධර්මය ප්‍රචාරය කරන සංවිධානයක්.

**ඥානසාර හිමි -**

'තබ්ලික් ජමාත් අයෙක් තමයි කිංග්ස්බරි හෝටලයට බෝම්බය තිබ්බේ.'

**නීතිඥවරයා -**

කොහොම දන්නේ.

**ඥානසාර හිමි-**

'බුද්ධි අංශ ඒ බව අනාවරණය කළා. මම මාධ්‍යයෙන් දුටුවා.'

**නීතිඥවරයා -**

අසත්‍ය ප්‍රකාශ කරන බවට යෝජනා කරනවා.

**ඥානසාර හිමි -**

'නීතිඥවරුන් මිනීමරුවන් වෙනුවෙනුත් පෙනී සිටිනවා. ඔබතුමත් නීතිඥයෙක්. ඒක ඔබතුමාගේ කාර්යය. ජමියතුල් උලමා සංවිධානයේ සභාපතිවරයා දවටගහ පල්ලියට යන්නේ නෑ සොහොන් තිබෙන නිසා. පුරාණයේ පිළිම වන්දනාව තහනම් කියා වගන්තියක් තිබෙනවා. ඊයේ කොමිසමේ පටිගත කිරීම සිදු කර අත්අඩංගුවට ගත් මවුලවිවරයා නිකුත් කළ හඬ පටයේ තිබුණා නබිතුමා සමරන්න එපා කියලා. උලමා සභාව නබිතුමාගේ උපන් දිනයට සුබ පතන්නේ නෑ. රටේ ජනාධිපතිවරයා, අගමැතිවරයා සුබ පතනවා. අප අරගල කළ නිසා පසුගිය දිනයේ සුබ පතා තිබුණා. පල්ලිවල ජාතික කොඩිය ඔසවන්නේ නෑ. දැන් ජාතික කොඩිය පල්ලිවල ලෙළ දෙනවා. මේක සිංහල බෞද්ධ රටක්. බෝම්බ පුපුරවන්න අපට ඉඩ දෙන්න බෑ. අපේ දරුවන්ගේ හිස් ගෙඩි මත හෙණ ගෙඩි පුපුරන්න දෙන්න බෑ. නබිතුමා ජීවත්ව ඉන්න කාලේ සහීස් අල්බුහාරී ග්‍රන්ථයේ අන් දෙකක් අනාගතයේ මතු වෙන බවත් ප්‍රවේශම් වෙන ලෙසත් කියා තිබෙනවා. ඒවා තමයි මේ සිදු වෙමින් තිබෙන්නේ.'

**නීතිඥවරයා -**

හලාල් සංකල්පය මුස්ලිම්වරුන්ට විශේෂ වූ දෙයක් නේද?

**ඥානසාර හිමි -**

'ඒක මුස්ලිම්වරුන්ගේ අයිතියක්. ක්‍රියාවලියේ ප්‍රශ්නයක් තිබෙන්නේ. දත් බුරුසුවට මොකටද හලාල්.'

**නීතිඥවරයා -**

පාස්කු ප්‍රහාරයට පසු මුහුණ ආවරණය ඉවත් කරන ලෙස ජමියතුල් උලමා සංවිධානය දැනුම් දුන්නා.

**ඥානසාර හිමි -**

'උලමා සංවිධානය කියන්නේ කවුද? මේ රටේ තිබෙන්නේ එක නීතියයි. ඒකට කවුරුත් යටයි. 2009 ඔය සංවිධානයම මුහුණු වහන්න කියා දැන්වූවා. මේ තියෙන්නේ ඒ ලේඛනය. වහන්නත් කියන්නේ ඒ අය. ගලවන්න කියන්නේත් ඒ අය. අපටත් අයිතියක් තිබෙනවා අප ඉදිරියෙන් ඉන්න අය හඳුනාගන්න. ලංකාවේ කාන්තාවන් මැදපෙරදිග ගිහිල්ලා අසූදාහක් විතර මුස්ලිම් වෙලා ඉන්නවා කියලා දැන ගන්න තිබෙනවා. ඒ අය බුර්කාවට හිර කළාම අපට හොයා ගන්න බෑ.'

# අහස සිඹින කොළඹ හැදෙන මොකක්ද මේ අල්ටෙයාර්

රාත්‍රී අහසේ දිස් වන තාරකා අතරින් ආලෝකය වැඩිම තුන් වැනි තාරකාව අල්ටෙයාර් (*Altair*) මතට නැඟී මම ශ්‍රී පාදස්ථානය නැරඹුවෙමි. මනරම් කඳු පෙළ අතරින් පෙරී එන සුදු වලාවන්ගෙන් ඊට බාධාවක් වූයේ නැත. ශ්‍රී පාදස්ථානය නරඹා වටපිට බැලූ මා හට දිස් වූයේ කොළඹ නගරයේ සිත් ඇද බැඳ ගන්නා දර්ශන පෙළකි. ගිනි පෙට්ටි මෙන් දිස්වන ගොඩනැඟිලි මතින් ඉදිරියට ඇදී එන නෙළුම් කුලුන මා හට අත දිග හැර අල්ලා ගන්නට තරම් ළං වී ඇත. එක් පැත්තකින් මහා සාගරය ද, තවත් පැත්තකින් බේරේ වැව ද, බේරේ වැව මැද පිහිටා ඇති ගංගාරාම විහාරයේ සීමා මාලකය ද ශ්‍රී පාදස්ථානය මෙන් මසිත වශීකෘත කළේය.

*Altair* (අල්ටෙයාර්) යනු තාරකාවක් බව සැබෑවකි. එය තාරකා මණ්ඩලයේ ආලෝකය වැඩිම තාරකාවකි. නමුත් එම තාරකාව අහසින් බැස ශ්‍රී ලංකාවේ උසම නිවුන් කුලුන බවට පත් වී තිබේ. නමුත් මෙහි විශේෂත්වය වන්නේ එක් කුලුනක් අනෙක් කුලුන දිශාවට ඇලවී ඉදි වී තිබීමයි. දකුණු ආසියාවේ ඉදි කර ඇති මෙවැනි පළමු නිවාස ව්‍යාපෘතිය මෙය වීම විශේෂත්වයකි.

අල්ටෙයාර් මහල් නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ගිවිසුම් අස්සන් කරනු ලැබූයේ 2011 වසරේ දී ය. එහි ඉදි කිරීම් කටයුතු ආරම්භ කරනු ලැබුවේ 2012 දීය. 2017 වසර වන විට මෙහි ඉදි කිරීම් සියල්ල අවසාන කිරීමට සැලසුම් කළ ද එහි ඉදිකිරීම් අවසාන අදියරට ළඟා වී ඇත්තේ 2020දීය. 97%ක පමණ වැඩ කටයුතු අවසන් වී ඇති අතර ලබන වසරේ ජනවාරි මස වන විට මෙම නිවුන් මහල් නිවාස ව්‍යාපෘතිය විවෘත කිරීමට බලාපොරොත්තු වන බව ඉන්ඩෝෂන් ඩිවෙලොපර්ස් *(Indocean Developers)* සමාගමේ අධ්‍යක්ෂ ප්‍රදීප් මොරායස් මහතා පැවසීය.

මෙම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු කරනු ලබන්නේ ඩුබායි හි ඉදිකිරීම් සමාගමක් වන ශපූර්ජි පලංජි *(Shapoorji Palanji)* නමැති සමාගමකටය. එය ඉන්දියානු සමාගමක් වන අතර එහි අන්තර්ජාතික ශාඛා පිහිටා ඇත්තේ ඩුබායිහිය.

කොළඹ 02, සර් ජේම්ස් පීරිස් මාවතේ ගංගාරාම විහාරයට මුහුණලා නවලෝක රෝහලට යාබදව අක්කර දෙකක භූමි භාගයක වර්ග අඩි මිලියන 1.5ක මෙම අසිරිමත් කුලුනු ද්විත්වය ඉදි කර තිබේ. මීටර් 240ක උසකින් යුක්ත වන මෙම ගොඩනැගිල්ල ලංකාවේ උසම ගොඩනැඟිල්ලයි. මෙහි අධි සුඛෝපභෝගී නිවාස 404කින් සමන්විතය. එක් නිවාසයක නිදන කාමර 2ක්, 3ක් සහ 4ක් වශයෙන් ද ඊට යාබද නාන කාමර මෙන්ම සියලු පහසුකම් සහිත මුළුතැන්ගෙයකින් ද යුක්තය. නිවාස ඇතුළත සවි කර ඇත්තේ විද්‍යුත් ජනෙල් තිරය. නාන කාමර ඉදි කර ඇත්තේ පිටත සිත් ඇද ගන්නාසුළු වටාපිටාවකට මුහුණලා වීදුරු යොදා ගනිමිනි. එක් එක් නිවාසවල සඳලුතල පිහිටා ඇත්තේ එකිනෙක නිවාසයන්ට කිසිදු හිරිහැරයක් ඇති නොවන පරිදි නව තාක්ෂණික ක්‍රමවේදයක් යොදා ගනිමිනි. එමෙන්ම සෑම නිවාසයකටම හොඳින් හිරු එළිය ලැබීමත්, පිරිසුදු වාතාශ්‍රය ලැබෙන ආකාරයෙන් ඉදි කර තිබීමත් මෙම මහල් නිවාස ව්‍යාපෘති නිර්මාණය කර තිබීමත් විශේෂිතය. එක් කුලුනක් අනෙක් කුලුන දිශාවට අංශක 13ක ඇලවීමක් මෙහි දක්නට ලැබේ. එක් කුලුනක් මහල් 68කින් සමන්විත වන අතර අනෙක් කුලුන මහල් 63කින් සමන්විත වේ. 63වන මහලේ සිට තවත් මහල් 3ක් වෙනස් ආකාරයකට සම්බන්ධ වී තිබේ. පළමු කුලුනෙහි 38වන මහල හරහා ඇලවුණු කුලුනට සම්බන්ධ විය හැකිය. කුලුනු ද්විත්වයම නැරඹූ විට පෙනී ගියේ මෙම නිවාස සංකීර්ණය අනෙක් නිවාස සංකීර්ණයන්ට වඩා වෙනස් වන්නේ එහි වැඩිපුර ඉඩකඩ යොදාගෙන ඇත්තේ පිරිසුදු වාතාශ්‍රය ලබා ගැනීම සඳහා වීමයි. එය ප්‍රමාණයෙන් බැලුව හොත් සියයට 45කි. ඉඩ ඇහිරීමක් සිරවීමක් මෙහි දක්නට නොලැබේ. 68 වැනි මහලෙහි පිහිටා ඇති ආකාශ උද්‍යානයෙහි ඇති නාන තටාකය සමඟ නාන තටාක 4කින් මෙය සමන්විත වේ. එහි සිට පහළ බැලූ විට සෑම අතකින්ම දර්ශනය වන්නේ මනරම් දසුන්ය. එක් පැත්තකින් මහා සාගරය ද, අනෙක් පැත්තෙන් බේරේ වැව ද, අනෙක් සෑම පැත්තකින්ම කොළඹ නගරයේ ගොඩනැඟිලි ඇතුළු මනරම් දසුන් දැකගත හැකිය. මෙහි ඇති තවත් විශේෂත්වයක් වන්නේ සෑම නිවාසයක්ම කුමක් හෝ සොඳුරු දසුනකට මුහුණලා ඉදි කිරීමය.

මෙම මනස්කාන්ත නිර්මාණයේ නිර්මාතෘ, ලෝක ප්‍රසිද්ධ වාස්තු විශේෂඥ මෝශේ සාෆ්ඩී *(Moshe Safdie)*. *Moshe Safdie* යනු ලොව වඩාත්ම පිළිගැනීමට ලක්ව සිටින විශිෂ්ට ගනයේ වාස්තු විද්‍යාඥයෙකි. එමෙන්ම අධ්‍යාපනඥයෙක්, සෛද්ධාන්තිකයෙක්, ලේඛකයෙක් මෙන්ම ව්‍යවසායකයෙක් ද ලෙස ඔහු ලොව පුරා ප්‍රකට වේ. ඔහු ඊශ්‍රායල් සහ කැනේඩියානු සම්භවයක් ඇති ජාතිකයෙකි.

(*Indocean Developers*)
**සමාගමේ අධ්‍යක්ෂ**
**ප්‍රදීප් මොරායස්**

සාෆ්ඩිගේ නිර්මාණ අන් අයගෙන් සුවිශේෂ වීමට හේතු වන්නේ ඔහුගේ විස්තීර්ණව මානුෂීය වන නිර්මාණ කලාවයි. සාෆ්ඩී ඔහුගේ වාස්තු ශිල්පය යටි ව්‍යාපෘතියකට අනන්‍යව, එයට ගැළපෙන පරිදි සිදු කිරීමට උනන්දු වන අතර එහිදී එම ස්ථානයේ භූගෝලීය, සමාජීය හා සංස්කෘතික මූලයන්ගේ බලපෑම ද නොඅඩුව සැලකිල්ලට ගනී. ඉන් ගොඩනැගෙන්නේ මානුෂීය අවශ්‍යතාවයන්ට හා අභිප්‍රායන්ට අනුබල දෙන නිර්මාණයකි.

සාෆ්ඩීගේ නවතම සාර්ථකත්වය වනාහී සිංගප්පූරුවේ ඉදිවුණ *Mara Bay Sands* ඒකාබද්ධ නිවාඩු නිකේතනයයි. එය බොහෝ විට ලොව වඩාත් මිල අධිකම ස්වායත්ත ඒකාබද්ධ නිවාඩු නිකේතනය විය යුතුය. එමෙන්ම සාෆ්ඩී විවිධ පරාසයන්හි ව්‍යාපෘති විශාල ප්‍රමාණයක හිමිකරුවකු වන අතර එයට සංස්කෘතික අධ්‍යාපනික හා සිවිල් ආයතන ද, අසල්වාසී වන නිවාස සංකීර්ණ සහ පොදු විනෝද උද්‍යාන ද, නාගරික සාප්පු සංකීර්ණ, ගුවන් තොටුපළවල් ද, පවතින ප්‍රජාවන් සඳහා සැලසුම්කරණයක් ද ඇතුළුව සම්පූර්ණයෙන්ම ගොඩනැංවුණ නවීන නගරයන් ද ඇතුළත්ය. ඔහුගේ නිර්මාණ අන්තර්ජාතිකව පිළිගැනීමට ප්‍රධානම හේතු වන්නේ ඒවායේ වක්‍ර, භූගෝලීය රටාවන් කවුළු භාවිතය සහ විවෘත හා හරිත අවකාශයන් ස්ථානගත කිරීම පිළිබඳ ඔහුගේ ශක්‍යතාවයයි. ඔහු තම සැලසුම් ගොඩනංවන්නේ අර්ථවත් මෙන්ම මිනිස් අවශ්‍යතාවන්ට ඔබින අන්දමේ අවකාශයක් ඉදිකරනු පිණිස වන අතර ඒ ප්‍රජාවන්ගේ අවධානය දේශීය භූගෝලීය හා සංස්කෘතිකාංගයන්ට යොමු වන ලෙසය.

වාස්තු විශේෂඥ *Moshe Safdie* පවසන පරිද් අල්ටෙයාර් යනු තවත් එක් ගොඩනැඟිල්ලක් ඉදිකරීමක් නොව කල් පවතින ස්මාරකයක නිමැවුමකි. *Altair* සුවිශේෂ වනුයේ එය නිර්භීත වූ ගමනක් සඳහා අවස්ථාවක් වන බැවිනි. අල්ටෙයාර්හි එක් කුලුනක් අනෙක් කුලුනට හේත්තු වන පරිදි සාදා ඇත්තේ සූර්ය කිරණ විනිවිද යෑමටත් කොළඹ සමුද්‍රාසන්න දේශගුණයෙන් ප්‍රයෝජන ලබා ගැනීම උදෙසාය. අල්ටෙයාර් විශේෂිත වන්නේ එහි බාහිර ව්‍යුහය නිසාය. එය විශාල ජනේල සහ විවෘත වීම් සඳහා පාරගම්‍ය පෘෂ්ඨයක් සහිත කූඩයක් වැනිය. එයින් සඳලුතල සඳහා ප්‍රවේශයන් ගොඩනැංවෙන අතර, කලාත්මක වූ ජ්‍යාමිතියකින් යුක්තව මෙම දැවැන්ත ගොඩනැගිල්ල කොළඹ අහසේ විශේෂිතව දෘෂ්‍යමාන වීමට හේතු වේ.

අල්ටෙයාර් සඳහා ලාක්ෂණික වූ විශේෂාංග කිහිපයකි; එය මනරම් බේරේ වැව් තීරයට මුහුණලා තිබීමෙන් නගරයේ දැකුම්කළු දර්ශනයන් නැරඹීමට හැකිය.

63වැනි මහලේ වූ ආකාශ උද්‍යානයේ සිට පිටත බලන විට එය සූර්යයාගේත්, ආකාශයේත්, නගරයේත් සුන්දරත්වය කැටි වූ ස්වර්ගීය දර්ශනයක්ම වන්නේය. අල්ටෙයාර්හි උද්‍යෝගය වඩවන සුළු රුව කියාපාන්නේ බැබිලෝනියාවේ එල්ලෙන උයනෙහි දුටු අසිරියමය.

**චතුමී පිටිපන**

**‘අල්ටෙයාර්’ විශේෂිත වන්නේ එහි බාහිර ව්‍යූහය නිසාය. එය විශාල ජනේල සහ විවෘත වීම් සඳහා පාරගම්‍ය පෘෂ්ඨයක් සහිත කූඩයක් වැනිය. එයින් සඳලුතල සඳහා ප්‍රවේශයන් ගොඩනැංවෙන අතර, කලාත්මක වූ ජ්‍යාමිතියකින් යුක්තව මෙම දැවැන්ත ගොඩනැගිල්ල කොළඹ අහසේ විශේෂිතව දෘශ්‍යමාන වීමට හේතු වේ.**




ඡායාරූප - රොෂාන් පිටිපන

# රට බෙදන බලවේගවලට එරෙහිව ආරුමුගම් තොණ්ඩමන් නැඟී සිටියා



## හිටපු ඇමැති ආරුමුගම් තොණ්ඩමන් අභාවය පිළිබඳ ශෝක යෝජනාව ඉදිරිපත් කරමින් අගමැති කියයි

## පාර්ලිමේන්තුව

**ස්වර්ණා විජේකෝන් සහ නුවන් කොඩිකාර**

රට බෙදන බලවේගවලට එරෙහි වූ ආරුමුගම් තොණ්ඩමන් මහතා සෑමවිටම ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමට ආණ්ඩුවට සහාය දැක් වූ නායකයෙක් යැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේ දී ඊයේ (11) පැවැසීය.

අගමැතිවරයා මේ බව සඳහන් කෙළේ හිටපු ඇමැති ආරුමුගම් තොණ්ඩමන් මහතාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනා විවාදයට එක් වෙමිනි.

වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා සෙංකෝලය තැන්පත් කිරීමෙන් අනතුරුව කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (11) පෙරවරු 10.30 ට පාර්ලිමේන්තුව රැස්විය. කතානායක නිවේදන, ලිපි ලේඛන වාර්තා ආදිය ඉදිරිපත් කිරීමෙන් පසුව ආරුමුගම් තොණ්ඩමන් මහතාගේ අභාවය පිළිබඳව ශෝක යෝජනා විවාදය ආරම්භ විය.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා වැඩිදුරටත් මෙසේ ද පැවැසීය.

වතු ජනතාවගේ කම්කරු සටන් නියමුවා ලෙස ආරුමුගම් තොණ්ඩමන් මහතා අවසන් මොහොතේදීත් වතු ජනතාව වෙනුවෙන් තැබූ බලාපොරොත්තු ඉටු කිරීමට ආණ්ඩුවක් ලෙස බැඳී සිටිනවා.

සෞම්‍යමූර්ති රාමනාතන් ආරුමුගම් තොණ්ඩමන් මහතා ගැන සිහිපත් කිරීමේදී සෞම්‍යමූර්ති තොණ්ඩමන් මැතිතුමාගේ පටන් ශ්‍රී ලාංකේය දේශපාලනයට තොණ්ඩමන් පරපුර දැක් වූ දායකත්වය මාගේ සිහියට නැගෙනවා. ඒ නිසා ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමාගේ අභාවය මුළු මහත් වතු ජනතාවට සේම පෞද්ගලිකව මටත් ද දැඩි සංවේගයක් ඇති කළ සිදු වීමක්. එතුමා අභාවප්‍රාප්ත වීමට පැය කිහිපයකට පෙරත් මා හමු වුණා. එම හමුවේදීත් එතුමා සාකච්ඡා කළේ වතු ජනතාවගේ දියුණුව සහ ඔවුන්ගේ දුෂ්කරතාවයන් මඟහරවා ගැනීම සම්බන්ධවයි.

1964 මැයි 29 වැනි දින ඉන්දියාවේ උපත ලැබුවත් තම සීයාගේ අඩිපාරේ යමින් අරුමුගම් තොණ්ඩමන් මැතිතුමා 1985 දී ලංකා කම්කරු කොංග්‍රසයෙන් ක්‍රියාකාරී දේශපාලනයට ප්‍රවිෂ්ට වුණා. 1994 වර්ෂයේ පැවති මහ මැතිවරණයෙන් නුවර එළිය දිස්ත්‍රික්කයෙන් පළමුවරට පාර්ලිමේන්තුවට තේරීපත් වූ එතුමා වසර 26ක කාලයක් අඛණ්ඩව නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරීපත් වීමට තරම් භාග්‍යවන්ත වුණා.

1999 වර්ෂයේ ලංකා කම්කරු කොංග්‍රසයේ නායක සෞම්‍යමූර්ති තොණ්ඩමන් මහතාගේ අභාවයෙන් පසුව එම පක්ෂයේ නායකත්වයට පත් වන ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමා වතු කම්කරුවන්ගේ සටන් නියමුවා ලෙස ඔවුන්ගේ වැටුප් වැඩි කිරීම වෙනුවෙන් නිරන්තර අරගලයක යෙදුණු නායකයෙක්. විශේෂයෙන්ම ඉන්දියානු සම්භවයක් ඇති වතු කම්කරුවන් ලක්ෂ තුනකට අධික පිරිසකට පුරවැසි අයිතිය ලබාදීමට ඔහු කළ සේවය අති විශාලයි.

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම වෙනුවෙන් දිවිහිමියෙන් කැප වූ ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමා වතු ජනතාව අතර ත්‍රස්ත්‍රවාදී මති මතාන්තර වලට ඉඩක් තැබුවේ නැහැ. තිස් වසරක යුධ ගිනි නිවා දැමීමේ මානුෂීය මෙහෙයුමට ඉන් ලැබුණු පිටුබලය අතිමහත්. සෑම විටම ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමා රට බෙදන බලවේගවලට එරෙහිව ක්‍රියා කළා පමණක් නොව සෑම විටම ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ක්‍රියාවලියට ආණ්ඩුවට සහාය දෙනු ලැබුවා. රටට සාමය උදා කිරීමට එතුමාගේ එම ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණය තීරණාත්මක ලෙස බලපෑ බව මා මේ මොහොතේ සිහිපත් කළ යුතුයි.

ඇමැතිධූර ලැබූ සෑම අවස්ථාවකම වතු ජනතාව වෙනුවෙන් සේවය කිරීමට පළමු තැන දුන් ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමා වතු ජනතාවගේ ජීවිතය හා බැඳි ප්‍රායෝගික අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සටන් කළා. වැටුප් අරගල වලදී පමණක් නොව වතු නිවාස ඉදි කිරීම, හෙද රැකියා අවස්ථා ලබා ගැනීම, රෝහල්, මහා මාර්ග, විදුලිය මෙන්ම පාසල් සහ විශ්වවිද්‍යාලයක් ලබා ගැනීම දක්වා වතු ජනතාව වෙනුවෙන් වෙන් වූ දේශපාලන දැක්මක් එතුමාට තිබුණා.

ඒ වගේම ආරුමුගම් තොණ්ඩමන් මහතා රටට ආදරය කළ හොඳ පුරවැසියෙක්. ජාති ,ආගම්, කුල භේද නොසලකා කටයුතු කළ එතුමා සැමවිටම ආගමික සහජීවන අගය කළා. දුෂ්කරතා හමුවේ දී ද අපව අත් හැර නොගිය එතුමා දේශපාලනයේ දී විශ්වාසවන්ත මිත්‍රයෙක්.

අවසන් මොහොතේදීත් වතු ජනතාව වෙනුවෙන් එතුමාට තිබූ බලාපොරොත්තු ඉටු කිරීමට ආණ්ඩුවක් ලෙස අප බැඳී සිටින බව මා මේ මොහොතේදීත් සිහිපත් කරන්න කැමතියි. එතුමාගේ පුත් ජීවන් තොණ්ඩමන් මහතා සිය පියාගේ අඩි පාරේ යමින් වතු ජනතාවටත්, රටටත්, සේවය කරනු ඇතැයි මම තරයේ විශ්වාස කරනවා.

**විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා-**

ආරුමුගම් තොණ්ඩමන් මහතා මා දීර්ඝ කාලයක සිට දැන හඳුනන නායකයෙක්. මගේ පියා පවා කිට්ටුවෙන් ඇසුරු කළ තොණ්ඩමන් පරම්පරාව මේ රටේ දෙමළ ජනතාව වෙනුවෙන් සුවිශේෂී වැඩ කොටසක් කළා. තමන්ට යම් කාර්යයක් පැවැරුණ ද ඒ කාර්යය නිසි පරිදි කිරීමට එතුමන් සෑම මොහොතකම කටයුතු කළා. අපි නොසිතපු වේලාව මොලොව හැර ගියත් එතුමන් කළ සේවාව ජනතා හිත්වලින් නම් කිසි දා මැකෙන්නේ නැහැ. එතුමන්ගේ අභාවයත් සමඟ ඔහු කරගෙන ගිය වැඩ කොටස ඉදිරියට කරගෙන යන්න එතුමන්ගේ පුත්නුවන් වන ජීවන් තොණ්ඩමන් මහතාට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම තොණ්ඩමන් මහතාගේ පවුලේ සැමට මගෙත්, අපේ පක්ෂයෙත් ශෝකය පළකර සිටිනවා.

**සභානායක, විදෙස් සබඳතා ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා-**

ආරුමුගම් තොණ්ඩමන් මහතාගේ අභාවය සමස්ත රටටම සිදු වුණු විශාල පාඩුවක්. එතුමන් සෑම මොහොතකම තමන්ගේ වතු ජනතාව වෙනුවෙන් පෙනී සිටිමින් ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කරන්න කටයුතු කළා. සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම කතා කිරීමට හැකිවීම එතුමා ලැබූ තවත් දක්ෂතාවයක්. අපේ රටේ පොදු ජනතාවගේ අයිතීන් රාශියක් නීති පොතට ගෙන ඒමට එතුමා කැප වුණා. එතුමා නතර කළ වැඩ කොටස ඉදිරියට ගෙන යන්න එතුමන්ගේ පුතනුවන් වන ජීවන් තොණ්ඩමන් මහතාට ශක්තිය ලැබේවායි අපි ප්‍රාර්ථනා කරනවා.

**විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතා-**

මම දෙවතාවක් වැවිලි ඇමැතිවරයා ලෙස වැඩ කරද්දී තමන්ගේ ජාතීන් වෙනුවෙන් ඔහු අයිතීන් දිනාගන්න සටන් කළා. තිස් අවුරුදු යුද්ධය කාලයේ ඔහුටත් ඊට එක්වෙන්න කියලා විවිධ බලපෑම් එල්ල වුණත් ඊට නොබියව මුහුණ දෙමින් ඊට එරෙහිව නැගී සිටියා. අපේ ආණ්ඩුව කාලේ වතු කම්කරු ජනතාවට ඉඩම් ලබාදුන්නම එතුමන් දුරකතනයෙන් කතා කරලා ස්තූතිය පුද කළා. මගේ ශෝකය එතුමන්ගේ පවුලේ සියලු දෙනාට පුදකර සිටිනවා.

**කම්කරු ඇමැති නිමල් සිරිපාලද සිල්වා මහතා-**

තොණ්ඩමන් මහතා සමග මම දශක කිහිපයක් මේ පාර්ලිමෙන්තුවේ එකට සේවය කරලා තිබෙනවා. එතුමා ඉන්දීය ජාතිකයෙක් වුවත් කිසි දිනෙක සිංහ ජාතියට, භූමියට විරුද්ධව වචනයක්වත් භාවිතා කළේ නැහැ. ෆෙඩර් රාජ්‍යයක් ඕනේ කියලා යෝජනාවක් ගෙන ඇවිත් එයට තොණ්ඩමන් මහත්වරුන් සම්බන්ධ කරගන්න උත්සහ කළාම ඔවුන් ඊට එකඟතාවය පළ නොකරමින් ඒකීය රටක් වෙනුවෙන් පෙනී සිටියා. ත්‍රස්තවාදය වතු ජනතාව අතරට නොගියේ ආරුමුගම් තොණ්ඩමන් මහතාගේ තිබුණ විචක්ෂණ බුද්ධිය නිසායි. ජාතික සමඟිය හා ජාතික ඒකාබද්ධතාවයට ගරු කළ නායකයෙක්. තමන්ගේ නායකයාට අවනත නොවී, අකුල් ඇඳින සමාජයක තොණ්ඩමන් මහතා නායකත්වයට ගරු කරමින් ඒ නායකත්වය ආරක්ෂා කර ගන්න කටයුතු කළා. ජීවන් මහතාගේ පවුලේ සියලු දෙනාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශෝකය පළ කර සිටිනවා.

**නුවරඑළිය දිස්ත්‍රික් මන්ත්‍රී එස්.බී දිසානායක මහතා (ශ්‍රී.පො.පෙ)-**

ෆෙඩරල් විරෝධී, රට බෙදන යෝජනාවලට විරෝධී, ඒකීය රටක් ප්‍රාර්ථනා කරපු නායකයෙක් තමයි ආරුමුගම් තොණ්ඩමන් මහතා. ඇතැම් අය විවිධ දේ සඳහා හවුල් කරගන්න උත්සහ ගනිද්දි දුර දකින නායකයෙක් ලෙස තොණ්ඩමන් මහතා ඉන් දුරස්ව සිටියා. එතුමා සෑම මොහොතකම උත්සාහ කළේ තමන්ගේ ජනතාවට සේවය කිරීමටයි. අද එතුමන්ගේ පුතනුවන් වන ජීවන් තොණ්ඩමන් සිය පියාගේ කාර්ය භාර්යය අතට අරගෙන ගමනක් ආරම්භ කරලා තිබෙනවා. මම විශ්වාස කරනවා ආරුමුගම් මහතා වගේම ජීවන් තොණ්ඩමන් මහතාත් කඳුරට බබලවන්න කටයුතු කරාවි කියලා.

**මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රී රාහුෆ් හකීම් මහතා (ස.ජ.බ)-**

ආරුමුගම් තොණ්ඩමන් මහතා ප්‍රභූ පවුලකින් පැවත ආ පුද්ගලයෙක්. එතුමන්ගේ එම පරම්පරාව වතු ජනතාව වෙනුවෙන් සුවිශේෂී සේවයක් කරලා තිබෙනවා. මම සහ එතුමා එකම අවුරුද්දේ තමයි පාර්ලිමේන්තුවට පිවිසියේ. එදා සිට වසර විසි පහකට ආසන්න කාලයක් අඛණ්ඩව පාර්ලිමේන්තුව නියෝජනය කරන්න එතුමන්ට හැකි වුණා. වෘත්තීය සංගම් ක්‍රියාකාරිත්වයේදී ඔහු ඉතා දක්ෂ ලෙස එය කළමනාකරණය කර ගන්න සමත් වුණා. ඒ මගින් ඔහු ජයග්‍රහණයක් අත්කර ගත්තා.

නියෝජ්‍ය කතානායක රංජිත් සියඹලාපිටිය මහතා මුලසුනට පැමි- ණියේය.

**දෙමළ ජනතාව වෙනුවෙන් සුවිශේෂී වැඩ කොටසක් කළා**



**විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස**

**වැවිලි කර්මාන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා-**

ශ්‍රී ලාංකීය දේශපාලන ඉතිහාසේයේ නොමැකෙන පවුලක් ලෙස තොණ්ඩමන් පවුල හඳුන්වාදිය හැකියි. තොණ්ඩමන් මහතා කුමන ක්ෂේත්‍රයක් නියෝජනය කළත් ඒ සියල්ල ඉතා ක්‍රමවත්ව හා විධිමත්ව සිදු කළා. එතුමා ඇසුරු කිරීමෙන් දේශපාලන වශයෙන් බොහෝ අද්දැකීම් ලබාගන්න අපට පුළුවන්කම ලැබුණා. තොණ්ඩමන් පවුල හින්දු භක්තිකයන් වුණත් මහා සංඝරත්තනය අතරත් විශාල කීර්තියක් අත්පත් කර ගන්න සමත් වී සිටිනවා. සිය පියාණන්ගෙන් ගිලිහිණු ධජය අතට අරන් ඉදිරියට යන්න අපි සමග එකතු වෙලා ඉන්න ජීවන් තොණ්ඩමන් මහතාට අපට ලබාදිය හැක සෑම සහයෝගයක්ම ලබාදෙන්න අපි සූදානම් බව කිව යුතුයි

**යාපන දිස්ත්‍රික් මන්ත්‍රී එස්. ශ්‍රීධරන් මහතා. (දෙ.ජා.ස)-**

අවුරුදු 200 කට වඩා ඉතිහාසයක් තොණ්ඩමන් පරම්පරාවට තිබෙනවා. ඔවුන් කඳුරටට නායකත්වය දෙන්න පටන් ගත්ත දවසේ සිට අද දක්වා එම පළාත්වලට සුවිශේෂී වැඩ කොටසක් කරලා තිබෙනවා. සෞම්‍යමුත්තු තොණ්ඩමන් මහතා සිදුකර ගෙන ආ වැඩ කොටස බාරගත්ත ආරුමුගම් තොණ්ඩමන් මහතා මිය යන තෙක් දේශපාලන නායකයෙක් ලෙස ඉහළ වැඩ කොටසක් කළා.

**නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන් මහතා මුලසුනට පැමිණියේය.**

**ධීවර ඇමැති ඩග්ලස් දේවානන්ද මහතා-**

තොණ්ඩමන් මහතාගේ අවුරුද 55 ක ජීවිතයෙන් අවුරුදු 26 ක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සිය වතු ජනතාව වෙනුවෙන් සේවය කළා. එතුමන් පාර්ලිමේන්තුව නියෝජනය කාලය පුරා විවිධ ඇමැතිධූර දරමින් ඒ හරහා විශාල වැඩ කොටසක් කරන්න සමත් වුණා. සෑම මොහොතකම සිනා වෙලා සියලු දෙනත් එක්ක සහෝදරත්වයෙන් තමයි කටයුතු කළේ. තව විශාල වැඩ කොටසක් සිදුකරන්න කාලය තිබියදී එතුමන් සමු ගැනීම වතුකර ජනතාවට දරාගන්න බැරි බව අප දන්නවා. එහෙත් අද එතුමන්ගේ පුතා පාර්ලිමේන්තුවට පිවිසිලා සිටිනවා. එය එතුමන් වෙනුවෙන් සිදුකරන මහත් ගෞරවයක් ලෙසයි මා දකින්නේ.

**වතුකර ජනතාවට දරාගන්න බැරි පාඩුවක්**

**ධීවර ඇමැති ඩග්ලස් දේවානන්ද**



**යාපනය දිස්ත්‍රික් මන්ත්‍රී ගජේන්ද්‍ර කුමාර පොන්නම්බලන් මහතා (දෙ.ජා.ජ.පෙ)-**

තොණ්ඩමන් මහතා වතු කම්කරු ජනතාව ගැන විතරක් නෙවෙයි උතුරු නැගෙනහිර ජනතාව වෙනුවෙන් පවා කතා කළ නායකයෙක්. ඔහුගෙන් දෙමළ ජනතාව වෙනුවෙන් කුමන උපකාරය ඉල්ලා සිටියත්, ඔහුට කරන්න පුළුවන් හැකි උපරිමයෙන් කර දී තිබෙනවා. මෙතන කතා කළ සමහරු උත්සහ කළා තොණ්ඩමන්ලා දෙමළ ජනතා අරගලයට සහය දුන්නේ නැහැ කියලා පෙන්වන්න. එහෙත් එය නොවෙයි සත්‍යතාවය. ඔහු කිසිම අවස්ථාවක දෙමළ ජනතා අරගලයට එරෙහි වුණේත් නැහැ. විරෝධය පාල නැහැ. අද තොණ්ඩමන් මහතාගේ පුතා පියාගේ අඩි පාරේ යමින් දෙමළ ජනතාව වෙනුවෙන් සේවය කරයි කියා මා විශ්වාස කරනවා.

**වනජීවී ඇමැති සී.බී රත්නායක මහතා-**

තොණ්ඩමන් මහතාගේ පවුල වෙනුවෙන් ශෝකය පළ කරන මොහොතේ ඒ සඳහා මටත් අවස්ථා ලබාදීම ගැන ස්තූතිය පුදකර සිටිනවා. තමන්ගේ ජනතාව විවිධ අරගලවලට, රට බෙදෙන පැතිවලට යන්න නොදී ඒකීය රටක් ලෙස තියා ගන්න සමත් වුණා. අපි ඔහුට ආරු කිව්වා, තොණ්ඩි කිව්වා. තම්බි කියලත් කතා කළා. ඉතා මහත්මා ගති වලින් හෙබි මානව හිතවාදියා රට වෙනුවෙන් තීන්දු තීරණ ගත්ත මිසක් කවදාවත් පෞද්ගලික අවශ්‍යතාවයන් වෙනුවෙන් තීන්දු තීරණ ගත්තේ නැහැ. අවස්ථාවාදී දේශපාලනයට වඩා භූමියේ ජනතාව වෙනුවෙන් වැඩ කළ නායකයෙක් ලෙස තොණ්ඩමන් මහතා හඳුන්වා දෙන්න පුළුවන්කම තිබෙනවා.

**බලශක්ති ඇමැති උදය ගම්මන්පිල මහතා-**

ජීවන් තොණ්ඩමන් මහතා අති විශාල මනාප සංඛ්‍යාවක් අරන් පාර්ලිමේන්තුවට පැමිණීමෙන් තොණ්ඩමන් පවුලට ජනතාව අතර තිබෙන ගෞරවය පිළිබිඹු වෙනවා. ත්‍රස්තවාදය උතුරු නැගෙනහිර වෙලා ගනිද්දි එය කඳුරටට ඒමට ඉඩ නොදී තමන්ගේ ජනතාව ආරක්ෂා කර ගැනීමට සෞම්‍යමූර්ති තොණ්ඩමන් සහ ආරුමුගන් තොණ්ඩමන් මහත්වරුන් කටයුතු කළා. තොණ්ඩමන් මැතිණියටත්, පවුලේ සැමටත් මගේ ශෝකය පළකර සිටිනවා.

**කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා මුලසුනට පැමිණියේය.**

**සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ වතු ආශ්‍රිත භෝග වගා,තේ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති කනක හේරත් මහතා-**

1994 වර්ෂයේදී දේශපාලන ගමන ආරම්භ කළ තොණ්ඩමන් මහතා 2000 වසර වෙන කොට තමන්ගේ වතු කම්කරුවන්ගේ වැටුප ඉහළ දමාගන්න කටයුතු කළා. ඒ වගේම ඉන්දීය ජාතිකයන්ට පුරවැසි භාවය ලබා දෙද්දී ඒ සියලු ජනතාවට පුරවැසි භාවය ලබා දීමට මැදිහත් වුණා. මහින්ද රාජපක්ෂ පාලන කාලයේදී වතු ජනතාවට නව නිවෙසක් ලබාදීමේ වැඩසටහනේ දී එතුමන් තමන්ගේ ජනතාව වෙනුවෙන් පෙනී සිටිමින් ජයග්‍රහණ රැසක් අත්කර ගත්තා. උතුරු නැගෙනහිර පළාත් ත්‍රස්තවාදයට නැඹුරු වෙද්දි කඳුරට ඉන් ගලවා ගන්න තොණ්ඩමන් මහතා කටයුතු කළා. අපේ සමරගමුව ප්‍රදේශ ජනතාව වෙනුවෙන් පවා එතුමා සේවය කළා. ශෝකයට පත් සියලුම ඥාතීන්ට මාගේ ශෝකයත්, මාගේ පවුලේ ශෝකයත්, කෑගල් දිස්ත්‍රික්කයේ ජනතාවගේත් ශෝකය පළ කර සිටිනවා.

**යාපන දිස්ත්‍රික් මන්ත්‍රී එම්. ඒ. සුමන්දිරම් මහතා. (දෙ.ජා.ස)-**

මම මන්ත්‍රීවරයකු වෙන්න පෙර තොණ්ඩමන් මහතාගේ නඩු සම්බන්ධයෙන් පෙනී සිටියා. ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට පැමිණීමෙන් පසුව අපි ආරුමුගම් තොණ්ඩමන් හිටපු ඇමැතිවරයගේ ගෝලයෝ රැසක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ප්‍රභාකරන් හසුවෙන්න දවස් දෙකකට කලින් අපේ ප්‍රදේශයේ ප්‍රශ්නයක් ඇති වුණ වේලාවේ තොණ්ඩමන් මහත්මයා මා අසල සිටිය පොලිස් නිලධාරියට කතා කළා. පොලිස් නිලධාරිය කිව්වා මම ඉන්නවා කියලා. ඔහු දුරකතනය මට දුන්නා. තොණ්ඩමන් මහත්මයා කිව්වා ඔබ ඔතන ඉන්නව නම් බයක් නැහැ. මොකද ඔබ අපේ ජනතා වආරක්ෂා කරනවා කියලා මම දන්නවා කියලා. එතුමා වියෝ වුණත් අද එතුමන්ගේ ඉතිරි වැඩ කොටස ඉදිරියට ගෙන යන්න ජීවන් තොණ්ඩමන් පුතා පැමිණිලා තිබෙනවා. එම නිසා මම ජීවන්ගෙන් ඉල්ලා සිටිනවා තාත්තගේ වැඩ කොටස ඉදිරියට අරන් ගිහින් පියාගේ නම බබලවන්න කටයුතු කරන්න කියලා.

**ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ඉසුර දොඩන්ගොඩ මහතා මුලසුනට පැමිණියේය.**

**කුරුණෑග දිස්ත්‍රික් මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතා. (ශ්‍රී .පො.පෙ)-**

කිට්ටුවෙන් ඇසුරු කළා. මේ සභාවේ කතා කළ සෑම පුද්ගලයෙක්ම තොණ්ඩම් මහත්මයාගේ පරම්පරාව ගැන කතා කළා. සෞම්‍යමූර්ති තොණ්ඩම් මහත්මයා මගේ සමරු පොතේ පවා අස්සන පවා යොදා තිබෙනවා. තොණ්ඩම් මහතා තමන්ගේ ජනතාව වෙනුවෙන් සහන රැසක් වගේම ප්‍රජාවගේ අයිතීන් වෙනුවෙන් සටන් කරලා තිබෙනවා.

**සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මහතා-**

වතු කරයේ ජනතාව ගැන මතක් වෙන සෑම අවස්ථාවක මතක් වන නමක් තමයි තොණ්ඩමන් නාමය. ඒ තරම් වතුකර ජනතාව අතර ඔවුන් කීර්තියක් අත්කර ගෙන තිබෙනවා. සෞම්‍යමූර්ති තොණ්ඩමන් මහතා කරගෙන ගිය වැඩ කොටස ඉදිරියට ගෙන යමින් ආරුමුගම් තොණ්ඩම් මහතා වැඩ කළා සේම එතුමන්ගේ පුතනුවන් වන ජීවන් තොණ්ඩමන් මහතාත් පියාගේ වැඩ කොටස ඉදිරියට ගෙනයා වි කියා අපි විශ්වාසය කරනවා.

**කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී නලින් බණ්ඩාර ජයමහ මහතා (ස.ජ.බ)-**

තොණ්ඩමන් පරපුර කවදාවත් මේ රටේ ත්‍රස්තවාදයට උඩගෙඩි දුන්නේ නැහැ. ඔවුන්ගේ පළාත්වලට ත්‍රස්තවාදයට ඇතුළ් වෙන්න ඉඩ දුන්නේ නැහැ. ඒ ත්‍රස්තවාදය උඩ රට පළාතට ගියා නම් එය මර්දනය කරන්න පහසු වෙන්නේ නැහැ. එය වලක්වා ගන්න එතුමන්ලා කළ කාර්ය භාර්යයට අපගේ ගෞරවය හැමදාම තිබෙනවා.

**බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය ඇමැති දයාසිර ජයසේකර මහතා-**


තොණ්ඩමන් මහතා සෑම අවස්ථාවකම බැලුවේ වතුකරයේ ජනතාව නගාසිටුවන්නේ කොහොමද කියලා. ඒ වගේම වතුකරයේ ජනතාවගේ වැටුප වැඩි කරගන්න, එදිනෙදා ජන ජීවිතය නගා සිටුවන්න අවශ්‍ය සැලසුම් රැසක් ක්‍රියාත්මක කළා. ත්‍රස්තවාදය තමන්ගේ පළාතට ඒම වලක්වා ගන්න තොණ්ඩමන් මහතා හැම මොහොතෙම ක්‍රියා කළා. එතුමන්ගේ අභාවයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයාගේ සහ පක්ෂයේ ශෝකය පළකර සිටිනවා.

**කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා. (ස.ජ.බ)-**

තොණ්ඩමන් මහතා පාසලේ පළමු ශ්‍රේණියේ සිට හඳුනාගෙනයි සිටියේ. එතුමන් ඉත නිහතමානි නායකයෙක්. ඒ වගේ තමන්ගේ ජනතාව වෙනුවෙන් ඕනෑම කැප කිරීමක් කරන්න සූදානමින් තමයි සිටියේ. අද වන විට ජීවන් තොණ්ඩමන් මහතා පාර්ලිමේන්තුවට පිවිසිලා තිබෙනවා. අපි හිතනවා ජීවන් තොණ්ඩමන් මහතා පියා ගෙන ගිය වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යමින් වතු ජනතාව ආරක්ෂා කර ගනිවි කියලා.

**බදුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී චාමර සම්පත් දසනායක මහතා (ශ්‍රී. පො.පෙ)-**

**ජනතාවට ඉහළ වැඩ කොටසක් කළ දේශපාලන නායකයෙක්**



**යාපන දිස්ත්‍රික් මන්ත්‍රී එස්. ශ්‍රීධරන්**

ජාතීන් අතර සුහදතාවය වර්ධනය කරන්න තොණ්ඩමන් පරපුර සුවිශේෂී වැඩ කොටසක් කළා. මම වැවිලි කර්මාන්ත ඇමැතිවරයා ලෙස කටයුතු කරපු වේලාවේ වෘත්තීය සමිති නායකයෙක් විදියටයි ඔහු හැම විටම වාඩි වුණේ. නිදහසින් පස්සේ බිහි වුණ නායකයන් අතර ජාතීන් අතර සමඟිය වර්ධනය කරන්න සෞම්‍යමූර්ති තොණ්ඩමන් මහතා වගේම ඔහුගේ මුණුපුරා වන ආරුමුගම් තොණ්ඩමන් මහතාත් කටයුතු කළා. ආරුමුගම් තොණ්ඩම් මහතා හරියට ප්‍රාදේශීය රජෙක් වගේ තමයි කටයුතු කළේ. මම මගේ ශෝකය එම පවුලට පුදකර සිටිනවා.

**මඩකලපුව දිස්ත්‍රික් මන්ත්‍රී සෙල්වම් අඩෙක්කලෙයිනාදන් මහතා. (දෙ.ජා.ස)-**

කඳුකර ජනතාවගේ ප්‍රශ්නවලට පෙනී සිටින නායකයෙක් ලෙසයි අප හඳුනාගෙන සිටින්නේ. එතුමන් මිය ගියා කිව්වාම මට එය අදහාගන්න බැරුව ගියා. ඉතා සෞම්‍ය සම්පන්න පුද්ගයෙක් මිය ගියා කියලා හිතා ගන්න බැරි වුණා. ඒ වගේම එතුමන් කඳුරට ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් අරගල කරලා ජයග්‍රහණ රැසක් අත්කර ගන්න සමත් වුණා.

**මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රී ගුණතිලක රාජපක්ෂ මහතා.(ශ්‍රී.පො.පෙ)-**

තොණ්ඩමන් හිටපු ඇමැතිවරයා දෙමළ ජනතාව වෙනුවෙන් විතරක් නෙවෙයි සිංහල ජනතාව වෙනුවෙනුත් සේවය කළ නායකයෙක්. එතුමා සිය සියාගේ අඩි පාරේ යමින් එතුමන් කල සේ කන්ද උඩරට ආරක්ෂා කරන්න කටයුතු කළා. අපි විශ්වාස කරනවා ජීවන් තොණ්ඩමන් මහතා සීයා, තාත්තා වගේම ඔබත් වතුකරයේ ජනතාව ආරක්ෂා කරන්න කටයුතු කරාවි කියලා.

**කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ප්‍රේමලාල් සී .දොළවත්ත මහතා. (ශ්‍රී.පො.පෙ)-**

ආරුමුගම් තොණ්ඩම් මහත්මයා 1994 වසරේදි ආරම්භ කළ දේශපාලන ගමන තුළ එතුමන් මිය යන තෙක් අඛණ්ඩව පාර්ලිමේන්තුව නියෝජනය කළා. වතුකරයේ ජනතාවගේ වැටුප් වැඩි කරන්න, නිවාස හදල දෙන්න, දෛනික ජීවිතය නගාසිටුවන්න අරගල කළා. අද ඇතැම් දමිළ නායකයන් නිජ බිම වෙනුවෙන් ඔප්පු හොයද්දි තොණ්ඩමන් මහතා එවැනි තැනකට නොවැටී ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගන්න පියවර ගත්තා.

**වන්නි දිස්ත්‍රික් මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතා(ස.ජ.බ)-**

තොණ්ඩමන් මහතා මිය ගියා කිව්වම අපිට එය විශ්වාස කරන්න බැරි වුණා. එතුමන් මිය ගියේ කෙටි ආයුෂ කාලයක් ඉදලයි. එතුමා හොඳ මනුෂ්‍යයෙක් වගේම වෘත්තීය නායකයෙක් ලෙස ජනතාවත් එක්ක හොඳ බැඳීමක් තිබුණා. ආරුමුගම් තොණ්ඩමන් මහතාව විවේචනය කළාට එතුමන් කවදාවත් තව කෙනෙක් විවේචනය කරනවා අපි අහලා නැහැ. එතුමාගේ අභිම් වීමේ හිඩස පුරවන්න පුළුවන් කියා මම හිතන්නේ නැහැ.

**මාතලේ දිස්ත්‍රික් මන්ත්‍රී ප්‍රමිත ආර්.. තෙන්නකෝන් මහතා ( පො ජ පෙ)-**

තොන්ඩමන් මැතිතුමා සිදුකළ සටන පිළිබඳව යම් සිහිපත් කිරීමක් අපි සිදුකළ යුතුයි.බ්‍රිතාන්‍ය පාලන සමයේදී මේ ජනතාව ලංකාවට ගෙනාවා. මේ අය මුලින්ම ගෙනාවේ මන්නාරම. ඉන් පසුව ඔවුන් මන්නාරමේ සිට බදුල්ලට, නුවරඑළියට , ආදි ප්‍රදේශ වලට පයින්ම පැමිණියා. තොන්ඩමන් පවුල කියන්නේ වතු ජනතාව වෙනුවෙන් එදා සිටම හඬ නැගූ පවුලක් කියා කිව්වොත් නිවැරදියි. තොන්ඩමන් සාධකය මේ රටේ දේශපාලනයේ තීරණාත්මක සාධකයක්. උතුරේ දෙමළ ජනතාවගෙන් යම් පිරිසක් වෙනම රටක් ඉල්ලද්දි වතුකරයේ ජනතාව ජීවත්වීම වෙනුවෙන් වැඩපිළිවෙළක් ඉල්ලා සිටියා. දෙමළ ජනතාව වෙනුවෙන් , වතුකරයේ ජනතාව වෙනුවෙන් තොන්ඩමන් මහතා විශාල හඬක් නැගුවා.

**නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. රාමේෂ්වරම් මහතා(පොජපෙ)-**

වතුකරයේ ජනතාව වෙනුවෙන් අති විශාල සේවාවක් තොන්ඩමන් මහතා විසින් ඉටු කළා. වතු ජනතාවගේ ලැයිම් කාමර වෙනුවෙන් ඔවුන්ට වෙනම නිවාස ලබාදීම වෙනුවෙන් එතුමා මැදිහත් වුණා. එම වැඩපිළිවෙළ මුලින්ම ආරම්භ කළේ තොන්ඩමන් මහතා විසින්. ඒ වගේම වතුකරයේ උගත් දූ දරුවන් වෙනුවෙන් රැකියා ලබාදීම වෙනුවෙන්ද එතුමා මැදිහත් වුණා. ඒ වගේම වතු කම්කරුවන් වෙනුවෙන් රුපියල් දහසක දෛනික වැටුපක් ලබාදීම වෙනුවෙන් එතුමා සාකච්ඡා කළා. ඒ පිළිබඳව සාකච්ඡා කර පැමිණීමෙන් පසුවයි එතුමා එදින රාත්‍රියේදී මිය ගියේ. මිය ගිය පියාගේ නාමයෙන් ජීවන් තොන්ඩමන් මහතා වතු ජනතාවට සේවය කරාවි කියා අපි විශ්වාස කරනවා. තොන්ඩමන් මහතා වතුකරයේ දෙමළ ජනතාවට පමණක් නෙවෙයි, සිංහල ජනතාව වෙනුවෙන් සේවය කළා. විශේෂයෙන්ම අපේ පළාත් වල සිටින සිංහල මිනිසුන්, පන්සල් , කෝවිල් ආදි හැම ආගමික ස්ථානයක් වෙනුවෙන් සේවය කළා. වතුකරයේ දෙමළ ජනතාවගේ නිවාස සිහිනය ඉටුකිරීම වෙනුවෙන් ඉන්දිය මහ කොමසාරිස්වරයා සමග සාකච්ඡා කරලයි මිය ගියේ. තොන්ඩමන් මැතිතුමා කිසිම දවසක මහින්ද රාජපක්ෂ මහතා අතහැර දමා ගියේ නැහැ.

ඉතිරි කොටස සඳුදා පත්‍රයේ පළවේ.

# පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ගොඩනැඟීම කඩිනම් කළ යුතුයි

## නැඟෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත්

පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක් ගොඩනැඟීම කඩිනම් කළ යුතුයැයි නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය පැවසුවාය.

පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ගොඩනැඟීම සම්බන්ධව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ ද සඳහන්ව ඇති බවත් එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇති කරුණු යථාර්ථයක් කිරීමට සියලු දෙනා එකට එකතු වී කටයුතු කළ යුතු බවත් ඇය ප්‍රකාශ කළාය.

ඇය මේ බව පැවැසුවේ කන්තලේ ගොවිජනපද ව්‍යාපාරයේ දැයට හිතැති ගොවිතැන ව්‍යාපෘතිය යටතේ අක්කර 100ක කාබනික වී වගාවෙන් අලුත් සහල් මංගල්‍යයට සහ වෙළෙඳ ප්‍රදර්ශනයට පසුගියදා (09) එක් වෙමිනි.

එහි දී වැඩිදුරටත් ආණ්ඩුකාරිනිය මෙසේද කීවාය.

මගේ ප්‍රධාන ඉලක්කය තිබුණේ දැයට හිතැති ගොවිතැන රටේ ගොවියන්ට හඳුන්වා දීමටයි. තවද අපේ පළාතේ ගොවියන් ඒ වෙනුවෙන් යොමුවීමටත් පෙර අපේ නිලධාරීන්ට දැයට හිතැති ගොවිතැන ගැන විශ්වාසයක් ඇති කිරීමටත් සිතුවා. අපේ නිලධාරීන් දැයට හිතැති ගොවිතැන ගැන වස විස නැති කාබනික පොහොර ගැන ඉතා ලොකු විශ්වාසයකින් ඉන්නවා කියා අද මට හිතුණා.

අලුත් සහල් මංගල්‍යයත් අපේ කන්තලේ ගොවි ජනතාවට අලුත් දෙයක් නොවෙයි. නමුත් අද මේ අලුත් සහල් මංගල්‍යය විශේෂිතයි.මොකද ඒ අලුත් සහල් මංගල්‍යය අපේ පරම්පරා ගණනාවකට පෙර සිදුකළ ආකාරයේ අලුත් සහල් මංගල්‍යයක්. වස විස නැති පරිසරයකටවත් පරිසරයේ කිසිම සතෙකුටවත් හානියක් නොවී වගා කරපු වී වලින් තමයි අද අලුත් සහල් මංගල්‍යය කළේ. මගේ යුතුකම වශයෙන් මම කරන්නේ ඔබට නැවත ඔබගේම පරම්පරාවෙන් ගෙනා ඒ හොඳ ගොවිතැන නැවත මතක් කිරීමක් පමණයි.



මේ රසායනික පොහොර අපේ රටට අහම්බෙන් ආපු දෙයක් නොවෙයි. අප ඉල්ලලා ලැබුණු දෙයකුත් නොවෙයි. දෙවන ලෝක යුද්ධයෙන් පසු තමයි බටහිර රටවල් මේ රසායනික පොහොර නිෂ්පාදනය පටන් ගත්තේ කාරණා දෙකක් නිසයි. දෙවන ලෝක යුද්ධයෙන් පසුව ආහාර අහේනියක් මුළු ලෝකයේම තිබුණා. ඒ නිසා ඒ අයට අවශ්‍ය වුණා ඉක්මනට ආහාර නිෂ්පාදනය කරන්න. ඒ කියන්නේ අපට හිතකාමීව දැයට හිතකාමී පරිසරයට හිතකාමී විදිහට නොවෙයි. ඉක්මනට ආහාර නිෂ්පාදනය කරන්න ක්‍රමවේදයක් හොයා ගත්තා. ඊට අමතරව ඒ බලවත් රටවල් අතර හැමදාමත් බල පොරයක් තිබෙනවා. ඒ බල පොරය තිබුණේ අමෙරිකාව සහ රුසියාව අතර අමෙරිකානු රජයත් රුසියානු රජයත් හිටියේ සම්පූර්ණයෙන්ම වෙනස් මතවාද දෙකකයි. ඒ තම තමන්ගේ මතවාදය ප්‍රචලිත කළොත් තමයි ලෝකෙ බලවත්ම රට බවට පත්වෙන්නේ.

මේ අය අනෙක් රටවල්වලට වාණිජමය ගොවිතැන පුරුදු කළා. ඒ අය එයට කිව්වේ හරිත විප්ලවය කියලයි. ඒ විප්ලවයේ කිසිම හරිතභාවයක් නෑ. මොකද ඒ විප්ලවය හරහා තමයි රසායනික පොහොර සඳහා යන්ත්‍ර උපකරණ ඒ රටවල්වලට පුරුදු කළේ.

රටවල් ඔක්කොම ලොකු යුද්ධයෙන් පීඩා විඳලා හිටපු හින්දා මේ හැම රටටම මුදල් අවශ්‍යතාව තිබුණා . අදටත් අප ආදරයෙන් පිළි අරන් තියෙන ලෝක ආහාර සංවිධානය වගේ සංවිධාන ලෝක යුද්ධයෙන් පසුව තමයි ඇති කළේ. ඒ සංවිධාන තමයි අපේ මේ රටවල්වලට ක්‍රමවේද ඇතුළු කළේ. යන්ත්‍ර උපකරණ යොදාගෙන කාෂිකර්මය කිරීම සහ රසායනික කෘෂිකර්මය. මේ පොහොර අපේ රටට ආවේ අපේ අවශ්‍යතාවකට නෙමෙයි.

අපට තිබුණේ බටහිර ගැති මානසිකත්වයක්. අප බටහිරට යටත් වෙලා හිටිය කාලයක් තිබුණා.

අප විතරක් නෙමෙයි ලෝකයේ බොහෝ රටවල් මේ ක්‍රමවේදය භාර ගත්තා. ඉක්මනින් ආහාර නිෂ්පාදනය කිරීමට නමුත් හුගක් රටවල් අද වෙන කොට මෙයින් සිදු වූ හානිය තේරුම් අරගෙන රසායනික පොහොරවලින් තමන්ගේ පස විනාශ වන බව තේරුම් අරගෙන මිනිස්සු ලෙඩ්ඩු වෙන බව තේරුම් අරගෙන සිටිනවා. එමගින් අනාගත පරම්පරාව විනාශ වන බව තේරුම් අරගෙන ක්‍රම ක්‍රමයෙන් මේ ක්‍රමවේදවලින් ඈත් වී තිබෙනවා. අපේ රට හැකි ඉක්මනින් රසායනික පොහොරවලින් ඈත් වෙන්න අවශ්‍යයි. අප සෞභාග්‍යවත් දේශයක් ගැන කතා කරනවා.

දෙවැනි අග්බෝ රජු වැනි රජවරුන් මේ කන්තලේ වැව වගේ විශාල වැව් හැදුවා. මේවා අපේ මිතුන් මිත්තන් හදපු දේවල්, මේ වගේ වැවක් හදන්න පුළුවන් රජවරු හිටියා නම් අවුරුදු 1000කට 2000කට ඉස්සර ඒ වැව මගින් රටක් ස්වයංපෝෂිත කරන්න පුළුවන් වුණු ජාතියක් නම් අප අද බය වෙන්නේ ඇයි?

නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් තුසිත පී. වනිගසිංහ, දැයට හිතැති ගොවිතැන ව්‍යාපෘතියේ උපදේශක ආචාර්ය කීර්ති වික්‍රමසිංහ, ආණ්ඩුකාර ලේකම් එල්.පී. මදනායක, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් අසංක අබේවර්ධන මහත්වරු ඇතුළු පළාත් කෘෂිකර්ම ලේකම්, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ සහ නිලධාරිහු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# VTA සහ Bellos Lanka පෞද්ගලික සමාගම අවබෝධතා ගිවිසුමකට එළැඹේ

**චන්දිමා කරුණාරත්න**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සහ Bellos Lanka පෞද්ගලික සමාගම අවබෝධතා ගිවිසුමකට එළැඹේ.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ රට පුරා පවතින පුහුණු මධ්‍යස්ථානවලින් වසරකට 2000කට ආසන්න පිරිසක් ආධුනික රූපලාවන්‍ය ශිල්පීන් වේ. ඔවුන් සඳහා පුහුණු ද්‍රව්‍ය නොමිලේ ලබාදීම, නවීන තාක්ෂණය සමඟ වෙනස් වන කේෂලාවන්‍ය ක්ෂේත්‍රයේ නව දැනුම VTA උපදේශක උපදේශිකාවන් වෙත ලබා දෙමින් ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම ඇතුළු එකගතා රැසකට මේ ගිවිසුම හරහා සිදු කෙරේ.

මේ අවබෝධතා ගිවිසුමට එළැඹීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරි දමිත වික්‍රමසිංහ මහතා සමඟ Bellos Lanka පෞද්ගලික සමාගමේ සභාපති, කළමණාකාර අධ්‍යක්ෂ චතුර පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේදී පසුගියදා (09) සිදු කෙරිණි.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ උප සභාපති සංජය ජයමාන්න, අධ්‍යක්ෂ ජනරාල් චුලාන්ගනි පෙරේරා, සහකාර අධ්‍යක්ෂවරු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු මෙන්ම Bellos ආයතනයේ අධ්‍යක්ෂ අලෙව්, ප්‍රවර්ධන හා මානව සම්පත් ඩිල්ෂාඩ් පෙරේරා මහත්ම මහත්මීහු මේ අවස්ථාවට එක්ව සිටියහ.


වාසනා සම්පත
வாசனா சம்பத Vasana Sampatha
එදත් අදත් සුරයා

නිල ප්‍රතිඵල

| | |
|---|---|
| දිනුම් වාරය | 1612 |
| දිනය | 2020.09.10 |

J 08 10 59 66

| ත්‍යාගය | ත්‍යාග රටාව | ත්‍යාග මුදල | ජයග්‍රාහකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 ත්‍යාගය | අංක 4 පමණක් ගැළපේ නම් | 1,000,000/- | 01 |
| 02 ත්‍යාගය | අංක 3ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000/- | 05 |
| 03 ත්‍යාගය | අංක 3ක් පමණක් ගැළපේ නම් | 2,000/- | 68 |
| 04 ත්‍යාගය | අංක 2ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500/- | 149 |
| 05 ත්‍යාගය | අංක 2ක් පමණක් ගැළපේ නම් | 100/- | 3,936 |
| 06 ත්‍යාගය | අංක 1ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 60/- | 2,297 |
| 07 ත්‍යාගය | අංක 1ක් පමණක් ගැළපේ නම් | 20/- | 58,067 |
| 08 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20/- | 9,613 |

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල
රු. 3,595,520.00

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය
රු. 23,451,987.40

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
32, දේශමාන්‍ය N.W.J. මුදලිගේ මාවත, කොළඹ 01.
රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් ඇදීන ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි.


# සිරගත වීම් අවම කෙරෙන සමාජ පරිවර්තනයකට අදිටන් කරගනිමු

## රාජ්‍ය ඇමැතිනී බන්ධනාගාර සිරකරු දින පණිවිඩයෙන් කියයි

ජාතික සිරකරු දිනය අදට (12) යෙදී තිබේ. සිරකරුවෝද මනුෂ්‍යයෝය යන්න හුදු වැකියකට සීමාවී ඇති මෙවැනි කාලසීමාවක සිරකරු සුබසාධනය අරමුණු කරගත් ජාතික සිරකරු දිනය සැමරීමද හුදු සැමරුමකට සීමා නොකොට එය අපරාධ අඩු කෙරෙන,සිරගතවීම් අඩු කෙරෙන නව සමාජ පරිවර්තනයක් කරා ගමන් කිරීමට අදිටන් කෙරෙන දිනයක් බවට පත්කර ගැනීමට ඔබ සැමට මම ආරාධනා කරමි. මානව ඉතිහාසය ආරම්භයේ පටන්ම මිනිසා අපරාධකාරී චර්යාවන්ට යොමු වූ, ප්‍රචණ්ඩත්වයට යොමුවූ අවස්ථා පිළිබඳ අපි අසා දැන ඇත්තෙමු. අද වනවිට මෙකී තත්ත්වයන් විවිධ මුහුණුවර ගනිමින් සමාජ ව්‍යසනයක් ලෙස ක්‍රියාත්මකවීම දැවැන්ත ආර්ථික, සමාජයීය, සංස්කෘතික පරිහානියකට හේතු වී ඇත. අතිවිශාල මානව සහ භෞතික සම්පත් ප්‍රමාණයක් පිරිවැයක් ලෙස අපරාධ මැඩපැවැත්වීම උදෙසා වැය කරනු ලබන අතර එය මානව උන්නතිය උදෙසා ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන්වලට යෙදවිය හැකි විශාල ධනස්කන්ධයක් බව සිහිපත් කරමි.

අපරාධ සිදුවන්නේ බොහෝ විට සමාජයේ වරදින්ය යන්න පොදු පිළිගැනීම වන අතර මිනිසා අපරාධවලට යොමු කෙරෙන මූලික කරුණු කීපයක් අපට හඳුනාගත හැකිය. ඒ අතරින් ජීවවිද්‍යාත්මක, ආර්ථික ගැටලු, සමාජයීය පෙළඹවීම්, දේශපාලන බලපෑම්, විවිධ මානසික තත්ත්වයන් හේතුවෙන් මිනිසා අපරාධ චර්යාවන්ට යොමුවීම සුලබ අතර පොදුවේ සමාජයක් ලෙස මේ සඳහා වගකීමට අපට සිදුවී තිබේ. එමෙන්ම ඕනෑම අපරාධයක් එක් පුද්ගලයකුට හෝ කණ්ඩාමකට පමණක් එරෙහිව සිදුවන්නක් නොව එය සමස්ත සමාජයටම එරෙහිව සිදුවන්නක් ලෙස සාමාන්‍ය පිළිගැනීමයි. එබැවින් එවැනි අපරාධවලට සම්බන්ධවන්නන්ට විවිධ දඩුවම් ක්‍රම මගින් සමාජයෙන් වෙන් කිරීම නැතහොත් පුනරුත්ථාපනය හෝ වන්දි ගෙවීමක් සඳහා නීතියට යොමු කරයි. සිරකරුවන් ලෙස බන්ධනාගාර ගතවන පුද්ගලයන්ට මූලික වශයෙන් දඬුවම් දෙකකට මුහුණදීමට සිදුව තිබේ. ඉන් පළමු වැන්න නෛතික දඬුවමයි. දෙවැන්න සදාචාරමය වරදක් වෙනුවෙන් අවිධිමත් ලෙස සමාජය විසින් පනවන දඬුවමක් වන සමාජ ගර්හාවයි. මෙයින් සමාජය විසින් පනවන දඬුවම නිසා බන්ධනාගාරයෙන් නිදහස්ව පැමිණෙන රැඳවියන් නැවත නැවත සිරගතවීම් බහුලව දැකිය හැකි අතර එවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට නම් සිරකරුවන් ලෙස සිටින පුද්ගලයන් නිදහස්ව පැමිණි පසු සමාජයේ කොටස්කරුවන් ලෙස නැවත පිළිගෙන එවැනි අපරාධ ක්‍රියා සඳහා යොමුවීමට ඇති අවස්ථා අවම කිරීමට කටයුතු කිරීම බව සිහිපත් කරමි. විවිධ අපරාධ ක්‍රියා හේතුවෙන් දෛනිකව බන්ධනාගාර ගතවන ප්‍රමාණය දිනෙන් දින ඉහළ යමින් පවතින අතර එය මේ වන විට බන්ධනාගාර පද්ධතියට දරාගත නොහැකි තත්ත්වයකට පත්වෙමින් තිබේ. එම තත්ත්වයෙන් බන්ධනාගාර රැඳවියන්ගේ සුබසාධනය, ඔවුන්ගේ මූලික පහසුකම් සැපයීම පිළිබඳ අභියෝගයකට මුහුණදීමට සිදුවන අතර එම තත්ත්වය මගහරවා ගැනීමට නම් දෛනිකව සිරගතවන ප්‍රමාණය අවම කරගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එබැවින් පොදුවේ රටක් ලෙස, සමාජයක් ලෙස සහ පුරවැසියකු ලෙස සමාජයේ අපරාධ චර්යා අවම කෙරෙන ආකාරයේ පරිසරයක් ගොඩගැනීමට පොදු සමාජ පරිවර්තනයක් කරා ගමන් කිරීමට අද සිට අදිටන් කරගන්නා ලෙස මම ආරාධනා කරමි.

**විශේෂඥ වෛද්‍ය**
**සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ**
**බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා**
**සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී**


2020-09-10 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 715,436
ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 30,156,290.00
රු. 2,000,000.00 ත්‍යාග 01 රු. 1,000,000.00 ත්‍යාග 03 රු. 100,000.00 ත්‍යාග 29
www.nlb.lk
NLB NATIONAL LOTTERIES

දිනුම් වාරය - 4241 නිල ප්‍රතිඵල
මහජන සම්පත
දිනය: 2020-09-10
ජයග්‍රාහී අක්ෂරය C ජයග්‍රාහී අංක 6 4 8 6 5 9

ත්‍යාග රටාව - අග සිට මුලට

| ත්‍යාගය | රටාව | ත්‍යාග මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | 6 4 8 6 5 9 | රු. 2,000,000/- | 01 |
| 2 වැනි ත්‍යාගය | 4 8 6 5 9 | රු. 100,000/- | 11 |
| 3 වැනි ත්‍යාගය | 8 6 5 9 | රු. 10,000/- | 112 |
| 4 වැනි ත්‍යාගය | 6 5 9 | රු. 1,000/- | 1,070 |
| 5 වැනි ත්‍යාගය | 5 9 | රු. 100/- | 10,672 |
| 6 වැනි ත්‍යාගය | 9 | රු. 20/- | 105,453 |

ත්‍යාග රටාව - මුල සිට අගට

| ත්‍යාගය | රටාව | ත්‍යාග මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | 6 4 8 6 5 | රු. 10,000/- | 08 |
| 8 වැනි ත්‍යාගය | 6 4 8 6 | රු. 1,000/- | 106 |
| 9 වැනි ත්‍යාගය | 6 4 8 | රු. 100/- | 1,092 |
| 10 වැනි ත්‍යාගය | 6 4 | රු. 50/- | 10,572 |
| 11 වැනි ත්‍යාගය | C | රු. 20/- | 42,209 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු.10,134,240.00
රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් ඇදීන දින සිට මාස 06ක කාලසීමාවකට පමණි.
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.34,940,093.00
ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය
ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

ට්‍රිපල් ජැක්පොට් Mega POWER මෙගා පවර් மெகா பவர்
දිනුම් වාරය 608
නිල ප්‍රතිඵල
දිනය: 2020.09.10
ඔබ දිනවන ඔබේ විශ්වාසය
ඉංග්‍රීසි අකුර S සුපිරි අංකය 22 ජයග්‍රාහී අංක 11 16 23 40

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල රු. | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 වන ත්‍යාගය | අංක 4 ක් පමණක් ගැළපේ නම් | 1,000,000.00 | 01 |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000.00 | 05 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් පමණක් ගැළපේ නම් | 1,000.00 | 156 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500.00 | 325 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් පමණක් ගැළපේ නම් | 100.00 | 8,621 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 40.00 | 5,640 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් පමණක් ගැළපේ නම් | 20.00 | 140,453 |
| 8 වන ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20.00 | 25,786 |

ලංකාවේ විශාලම සුපිරි ත්‍යාගය
මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 234,102,244.75
මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,937,211.60
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 14,328,690.80
දිනා ඇති මුළු මුදල රු.6,230,980.00
- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් ඇදීන ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.
ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

ගොවි සෙත
නිල ප්‍රතිඵල
දිනුම් වාරය 2536 දිනුම් ඇදීන ලද දිනය 2020.09.10
ඉංග්‍රීසි අක්ෂරය L ජයග්‍රාහී අංක 19 20 27 59

| | සංයෝගය | තෑගි මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 1,000,000.00 | 01 |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි | රු. 100,000.00 | 08 |
| 3 ත්‍යාගය | අංක 3 ක් පමණක් නිවැරදි | රු. 2,000.00 | 178 |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි | රු. 1,000.00 | 392 |
| 5 ත්‍යාගය | අංක 2 ක් පමණක් නිවැරදි | රු. 100.00 | 10157 |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි | රු. 40.00 | 6616 |
| 7 ත්‍යාගය | අංක 1 ක් පමණක් නිවැරදි | රු. 20.00 | 165696 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි | රු. 20.00 | 30448 |

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 213,496
මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 7,751,220.00
ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 64,581,256.40
ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් ඇදීන ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 සහ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

නිල ප්‍රතිඵල

දරු දිරි සම්පත
தரு திரி சம்பத DARU DIRI SAMPATHA
දිනය 2020/09/10
දිනුම් වාරය 018
ඉංග්‍රීසි අකුර D ජයග්‍රාහී අංක 04 24 35 56

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000/- බැගින් | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 50,000/- බැගින් | 03 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 1,000/- බැගින් | 94 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 500/- බැගින් | 174 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100/- බැගින් | 4,183 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 40/- බැගින් | 2,307 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20/- බැගින් | 57,297 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20/- බැගින් | 8,563 |

විශේෂිත අංක

| | | | |
|---|---|---|---|
| 1 ත්‍යාගය | 1 8 9 3 | රු. 1,000.00 | 31 |
| 2 ත්‍යාගය | 8 9 3 | රු. 500.00 | 248 |
| 3 ත්‍යාගය | 9 3 | රු. 50.00 | 2,611 |

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 2,444,330/-
මීළඟ සුපිරි ත්‍යාගය රු. 6,534,273.80
රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් ඇදීන දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.
ජාතික ලොතරැයි මණ්ඩලය

# මංගල බුදු දහමට එරෙහි විදෙස් බලවේගවල නියෝජිතයෙක්

## සිංගප්පූරුවේ ක්විංලිංග් විහාරයේ අනුශාසක යටමලගල සුමනසාර හිමි

මංගල සමරවීර බුදු දහමට එරෙහි ජාත්‍යන්තර බලවේගවල ප්‍රබල නියෝජිතයෙක්යැයි සිංගප්පූරුවේ ක්විංලිංග් විහාරයේ අනුශාසක යටමලගල සුමනසාර හිමියෝ පවසති.

පසුගිය කාලයේදි ඇමැතිධුර දරද්දී මෙන්ම වර්තමානයේ තනතුරු නොමැතිවිටදී පවා ඔහු තම සුපුරුදු කොන්ත්‍රාත්තුව ඉටුකරමින් සිටින බවද උන් වහන්සේ පැවසූහ.

වැඩිදුරටත් සුමනසාර හිමියෝ මෙසේද කීහ.

මහ සංඝයා වහන්සේගෙන් බුදු රජාණන් වහන්සේ පවා අපේක්ෂා නොකළ ගුණාංග මංගල සමරවීර මහතා අද අපේක්ෂා කරනවා. මේ නිසා ඔහු කිසිම පදනමකින් තොරව මහ සංඝයාට නිර්දය ලෙස පහර ගසනවා. ඔහු පවසන පරිදි චීවරධාරින් රටට හානි කරයි.චීවරධාරින් යනු චීවරය දරා සිටින්නා කියන තේරුම දෙන්නක්. එතකොට මහනායක හාමුදුරුවන්ගේ සිට සාමණේර හිමි දක්වාම චීවරය දරා සිටිනවා.එහෙනම් ඔහු චෝදනා කරන්නේ මේ සියලු දෙනාටමයි.

මෙහි හඬ ඔහුගේ වුවත් මේ පිටුපස දැවැන්ත බලවේගයක් සිටින බව පෙනෙනවා. මේ කුමන්ත්‍රණකාරීන් ගේ අපේක්ෂාව වන්නේ මේ රටින් බුදුදහම තුරන් කිරීමයි. එහි මූලික කාර්ය භික්ෂූන්ට ඇති සමාජ බලය නැති කිරීමයි.ඒ සඳහා තමයි මංගල සමරවීරලා මේ සුදානම් වන්නේ. මහ සංඝරත්නය රටේ සාමාන්‍ය ජනතාව අතරෙන් කලකිරවීමට ඔහු උත්සාහ දරන බවක් පෙනෙනවා.ඔහු මේ කුමන්ත්‍රණයේ හේවිසි වයන්නෙක් පමණයි. මේ කුමන්ත්‍රණ පෙරහරේ සැබෑ අයිතිකරුවන් ඔහු පිටුපස සිටිනවා. ඒ නිසා මේ කුමන්ත්‍රණය අප හඳුනාගත යුතුයි. කලක් පෙරහර සංස්කෘතියට පහර දෙන්න හැදුවෙත් මෙවන් කණ්ඩායමක්.කවුරු මොනවා කීවත් මේ රටේ මහ සංඝයා වහන්සේට ඇති උරුමය උදුරා ගැනීමට මංගලලා දහසක් ආවත් කළ නොහැකි බව සුමනසාර හිමියෝ පැවසූහ.

මහ සඟරුවනට අවවාද දෙන්න නොගොස් ජීවිතයේ ඉතිරි ටික බණක් දහමක් අසාගෙන ගත කිරීමට දේශපාලනයෙන්ද ඉවත් වී සිටින මංගල කටයුතු කළොත් එය ඔහුගේ මතු දිවියටත් හොඳ යයිද උන් වහනසේ ප්‍රකාශ කළහ.

# රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ සහ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතර සාකච්ඡාවක්



**උපාලි කරුණාරත්න සහ නිමල් රාජපක්ෂ**

ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා සහ කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතර විශේෂ සාකච්ඡාවක් ඊයේ (10) අගරදගුරු නිල නිවසේදී පැවැත්විණි. 2019 පාස්කු ඉරිදා දින සිදුවූ බෝම්බ ප්‍රහාරයෙන් මිය ගිය අය සහ ආබාධිතවූවන්ගේ නිවාස කඩිනමින් ඉදිකිරීම සම්බන්ධයෙන් මෙහිදි රාජ්‍ය ඇමැතිවරයා සහ කාදිනල් හිමිපාණෝ සාකච්ඡා කළහ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ උපදෙස් මත අදාළ නිවාස වැඩසටහනේ සියලු ප්‍රමාද මග හරිමින් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමු කෙරිණි.

# රාජ්‍ය නිලධාරීන් ආදර්ශයක් වෙමින් නියමිත වේලාවට වැඩ ආරම්භ කළ යුතුයි

## ආරක්ෂක ලේකම් මේජර් ජනරාල් කමල් ගුණරත්න

**උපාලි කරුණාරත්න**

රාජ්‍ය නිලධාරීන් රටටම ආදර්ශයක් වෙමින් නියමිත වේලාවට වැඩ ආරම්භ කළ යුතු බව ආරක්ෂක ලේකම් මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා පැවසීය.

ආරම්භක වෙලාව පෙරවරු 8.30 නම් එය 8.30ම විය යුතු බව සඳහන් කළ ලේකම්වරයා යමක් කිරීමට, ආරම්භ කිරීමට වෙලාවක් තිබෙනවා නම් එය ඒ ආකාරයෙන් කළ යුතු බව කීය.

මේ වන විට සෞභාග්‍යයේ දැක්ම රටේ ක්‍රියාත්මක වන බවද කී කමල් ගුණරත්න මහතා ජාතික ආරක්ෂාවට මුල් තැනක් ලබා දී තිබෙන බවත් ජාතික ආරක්ෂාවක් නැති රටකට, හරි හැටි ජාතික ආරක්ෂාවක් සපයන්න බැරි රජයකට ඉදිරි ගමනක් නැති බවත් ප්‍රකාශ කළේය. එවිට රටේ ජනතාවටද ඉදිරි ගමනක් නැති බව කීය. ආරක්ෂක ලේකම්වරයා එසේ ප්‍රකාශ කළේ පෙරේදා (10) කොළඹදී පැවැති සමුළුවකට සහභාගි වෙමිනි.

# සිරකරුවන්ට පොදු සමාව දීමේ නව ක්‍රමවේදයක් සකස් කිරීමට යයි

**බුද්ධිකා ඉඹුලාන**

සිරකරුවන්ට පොදු සමාව දීමේ නව ක්‍රමවේදයක් සැකසීමට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යංශයේ අවධානය යොමු වී තිබේ.

මේ සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පාදනයට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් හිටපු බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයකු වන ,එම රාජ්‍ය අමාත්‍යංශ අතිරේක ලේකම් (විශේෂ ව්‍යාපෘති) නිශාන් ධනසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් පත් කර ඇත.

පසුගියදා බන්ධනාගාර කීපයක නිරීක්ෂණ චාරිකාවකට එක්වූ ඇමැතිනියට සිරකරුවන් තමන්ට පොදු සමාව යටතේ නිදහස ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදයේ පවතින ගැටලු සහගත තත්ත්වයන් පිළිබඳ කරුණු පැහැදිලි කළ අතර ඒවාද සැලකිල්ලට ගෙන මෙසේ සිරකරුවන්ට පොදු සමාව යටතේ නිදහස් කිරීමේ නව ක්‍රමවේදයක් සැකසීම පිළිබඳ අවධානය යොමු කර ඇත.

සිරකරුවන්ට පොදු සමාව ලබාදීමේ දැනට පවතින ක්‍රමවේදයේ පවතින ඇතැම් අඩුපාඩු නිසා වසර 10-15 සිරදඬුවම් විඳින සිරකරුවන්ටද නිදහස ලබා ගැනීමේ දුෂ්කරතා මතුවී ඇති බවත් මේ ක්‍රමවේද දැනට වසර ගණනාවක් පැරණි නිසා ඒ නිර්නායක වත්මනට නොගැළපෙන බවත් මෙහිදී රැඳවූවන් රාජ්‍ය ඇමැතිනිය වෙත කරුණු පෙන්වා දී තිබේ.

මේ සම්බන්ධනයෙන් අවධානය යොමු කළ රාජ්‍ය ඇමැතිනිය ඒ සම්බන්ධනයෙන් කටයුතු කිරීම ට කමිටුවක් පත් කර ඇති අතර ,දැනට පවතින ක්‍රමවේදය සමාලෝචනය කර නව ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කරන ලෙස කමිටුවට උපදෙස් දී ඇත.

## රුසියානු සරසවි තුනක වෛද්‍ය උපාධි අවලංගු කිරීම:

# රුසියානු රාජ්‍ය ශිෂ්‍යත්වවලට බලපෑමක් නොවේවි

**මහින්ද අලුත්ගෙදර**

## කොළඹ රුසියානු මධ්‍යස්ථානය

රුසියානු සරසවි තුනක වෛද්‍ය උපාධි පිළිගැනීම අවලංගු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ගත් තීරණය හේතුවෙන් ශ්‍රී ලාංකික පුරවැසියන්ට පිරිනමන රුසියානු රාජ්‍ය ශිෂ්‍යත්ව සඳහා බලපෑමක් ඇති නොවෙතැයි බලාපොරොත්තු වන බව කොළඹ පිහිටි රුසියානු මධ්‍යස්ථානය පවසයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පූර්ව දැනුම්දීමකින් තොරව රුසියානු රාජ්‍ය විශ්වවිද්‍යාල තුනක්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අනුමත ලැයිස්තුවෙන් ඉවත් කිරීම පිළිබඳව රුසියානු පාර්ශ්වයේ අවධානය යොමුකර තිබෙන බවද මධ්‍යස්ථානය කියයි.

ඒ අනුව මෙරට වෛද්‍ය සභාව විසින් රුසියාවේ ජනතා මිත්‍රත්ව විශ්වවිද්‍යාලය (පැට්රික් ලුමුම්බා විශ්ව විද්‍යාලය), පිරොගොව් රුසියානු ජාතික පර්යේෂණ වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ ටීවර් රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අනුමත ලැයිස්තුවෙන් ඉවත් කර ඇත.

කොළඹ පිහිටි රුසියානු මධ්‍යස්ථානය පෙන්වා දෙන්නේ එම විශ්වවිද්‍යාල ත්‍රිත්වයේ නිලධාරීන් පසුගිය වසර කිහිපය පුරා විටින් විට ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිලධාරීන් හමු වූ බවත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට ගෙවිය යුතු සාමාජික මුදල් ගෙවීම් නිසි ආකාරයට සිදුවූ බවත්ය.

# දිනයක් නම් කර තිබීමම සියදිවි හානි කරගැනීමට හේතුවක් විය හැකියි

**මානෙල් පුෂ්ප කුමාරි**

## වෛද්‍ය ජයමාල් ද සිල්වා

ශ්‍රී ලංකාවේ සියදිවි හානිකර ගැනීම බොහෝ දුරට අඩු වී ඇති බවත් සියදිවි හානි කරගැනීමේ දිනයක් නම්කර තිබීම සියදිවි හානි කර ගැනීමට හේතුවක් විය හැකි බවත් වෛද්‍ය ජයමාල් ද සිල්වා මහතා පැවසීය.

ලෝක සිය දිවිනසා ගැනීම වැළැක්වීමේ දිනය පෙරේදාට (10) යෙදී තිබුණ අතර ඒ පිළිබඳ විශේෂ සාකච්ඡාවක් කොළඹ 07, හෝර්ටන් පෙදෙසේ පිහිටි ශ්‍රී ලංකා සුමිත්‍රයෝ ආයතනයේ දී පෙරේදා (10) සිදු කළ අවස්ථාවේ දී වෛද්‍යවරයා මේ බව අවධාරණය කළේය.

මේ සම්බන්ධයෙන් වසර 1997 දී ජනාධිපති කාර්ය සාධක බළකායෙන් දුන් නිර්දේශවලට අනුව යමින් විද්‍යාත්මක ක්‍රම වෙනස් කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකිවිය. යටිතල සාධක ආමන්ත්‍රණය කරන්නේ නම් ඒ තුළ මේ හානිය වළක්වාගත හැකියි. එදා ඒ ලබාදුන් නිර්දේශ ඉතාමත් හොඳයි. නමුත් දැන් ඉන් එහාට ගිය ක්‍රමවේද අවශ්‍ය වන බවත් වෛද්‍යවරයා මෙහිදී වැඩිදුරටත් සඳහන් කළේය.

කොවිඩ් -19න් වෛද්‍යවරයෙක් හැටියට මට බොහෝ පෞද්ගලික අත්දැකීම් ලැබුණා. ළඟ ඉන්න මනුෂ්‍යයාට උදව් කරන්න පුරුදු වීමත් මනුෂ්‍යයෝ වශයෙන් සලකන්න, උදව් කරන්න පුරුදු වීමත් සිදු වූ බවත් වෛද්‍ය ජයමාල් ද සිල්වා මහතා කියා සිටියේය.

කොවිඩ් -19න් පසු මෙරට රූපවාහිනී නාලිකාවල ඉන්දියාවේ බාල වර්ගයේ සිනමා නාට්‍ය බහුල වශයෙන් දකින්න ලැබෙනවා. ඒ නාලිකාවල ප්‍රධානීන්ගෙන් ඒකට හේතු ලෙස විමසූ විට ඔවුන් පවසන්නේ ඒවා ඉතා අඩු මිලකට ලබා ගත හැකි වන බවයි.

වෛද්‍ය ශෙහාන් පෙරේරා සහ වෛද්‍ය උදේන ආටිගල මහත්වරු මෙහිදී මේ පිළිබඳ අදහස් දැක්වූහ.

## ඇමැති මහින්දානන්දට එරෙහිව නීතිපතිවරයා පවරා ඇති නඩුව:

# ලක්ෂ 39ක මුදල පියවා ඇති බව කීවත් අහන ප්‍රශ්නවලට පමණක් උත්තර දෙන්නැයි පරීක්ෂණ නිලධාරීන් කීවා

## වෘත්තීය සමිතියේ ලේකම් මාරිමුත්තු ක්‍රිෂ්ණමූර්ති කොළඹ මහාධිකරණය හමුවේ කියයි

**කුමුදු හෙට්ටිආරච්චි**

ශ්‍රී ලංකා නිදහස් කම්කරු කොංග්‍රසය යන වෘත්තීය සමිතියේ සභාපතිවරයාව සිට ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා අවස්ථා තුනකින් ලබාගත් රුපියල් ලක්ෂ 39ක ණය මුදල නිසි ලෙස පියවා ඇති බවට අදාළ ලේඛන ද සමග පරීක්ෂණ නිලධාරීන්ට කරුණු පැහැදිලි කළ ද ඒවා අදාළ නොවන බවත් අහන ප්‍රශ්නවලට පමණක් උත්තර දෙන ලෙසත් පරීක්ෂණ නිලධාරීන් තමාට පවසා සිටි බව ශ්‍රී ලංකා නිදහස් කම්කරු කොංග්‍රසය යන වෘත්තීය සමිතියේ ලේකම් මාරිමුත්තු ක්‍රිෂ්ණමූර්ති මහතා කොළඹ මහාධිකරණය හමුවේ සාක්කි දෙමින් ඊයේ (11) පැවසීය.

ශ්‍රී ලංකා නිදහස් කම්කරු කොංග්‍රසය යන වෘත්තීය සමිතියෙන් රුපියල් 39 ලක්ෂයක් ලබාගෙන එම මුදල් සාවද්‍ය ලෙස පරිහරණය කළ බවට ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතාට එරෙහිව නීතිපතිවරයා පවරා ඇති නඩුවේදී විත්තිය විසින් අසන ලද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සමිතියේ ලේකම්වරයා ඒ බව පැවසීය.

කොළඹ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳි මහතා හමුවේ මේ නඩුව විභාගයට ගැනේ.

මේ නඩුවේ පැමිණිලිකරු වන වසන්ත සමරසිංහ තමන් ජේ.වී.පී. සාමාජිකයෙක් ලෙස හඳුනන බවත්, ඔහු ජේ.වී.පී. වෘත්තීය සමිතිය භාරව සිටින සාමාජිකයෙක් බවත් එසේ සිටියදී ඔහු මේ නඩුවට පාදක සිද්ධිය ගැන පැමිණිල්ල ඉදිරිපත් කළ බවත් ඊයේ (11) පවසා සිටි මාරිමුත්තු ක්‍රිෂ්ණමූර්ති මහතා ඔහුගේ වෘත්තීය සමිතිය අප සමිතියත් සමග සාමාජිකයන් බඳවා ගැනීමේදී තරගකාරීත්වයක් තිබූ බවත් පැවසීය.

මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ නලින් ලද්දුවහෙට්ටි මහතා විත්තිය වෙනුවෙන් ඇසූ හරස් ප්‍රශ්න හමුවේ තවදුරටත් පිළිතුරු දෙමින් සාක්කිකරු පවසා සිටියේ තම වෘත්තීය සමිතියේ සිදුවන කිසිදු ගනුදෙනුවක් සම්බන්ධව වසන්ත සමරසිංහ නොදැන සිටි බවයි.

වසන්ත සමරසිංහ තම වෘත්තීය සමිතිය හා තරගයක් ඇති කරගෙන සිටි තවත් වෘත්තීය සමිතියක ප්‍රධානියකු මිස තම වෘත්තීය සමිතියේ තීරණ හෝ සමිති රැස්වීම් වාර්තා සම්බන්ධව ඔහු කිසිවක් දැන නොසිටි පුද්ගලයකු බව ද මාරිමුත්තු ක්‍රිෂ්ණමූර්ති මහතා ඊයේ (11) පැවසීය.

2014 මාර්තු 31 වැනිදා මහින්දානන්ද අලුත්ගමගේ මහතා තම වෘත්තීය සමිතියේ සභාපති ලෙස රුපියල් දසලක්ෂයක මුදලක් ගත්ත ද එය පියවා ඇති බවත් ඊට පසු අවස්ථා දෙකකදී ගත් ලක්ෂ 15 හා ලක්ෂ 14ක මුදල් සියල්ල නිසි ලෙස පියවා ඇති බවත් තමා ණයට දුන් මුදල් සියල්ල ලැබී ඇති බවත් බැංකු ගිණුම් වාර්තා වවුචර්පත් පරීක්ෂා කරමින් සාක්කිකරු පැවසීය.

මේ ගිණුම් වාර්තා කම්කරු කොමසාරිස්වරයා වෙත ද ඉදිරිපත් කර ඇති බවත්, මේ ණය මුදල් ලබා දුන් ආකාරය එම විගණන වාර්තාවලද සඳහන් වන බවත් විත්තියේ හරස් ප්‍රශ්න හමුවේ පිළිතුරු දෙමින් සාක්කිකරු පැවසීය.

මහින්දානන්ද අලුත්ගමගේ මහතාගෙන් සමිති සාමාජික මුදල අය නොකළේ නිලධාරී මණ්ඩලයෙන් සාමාජික මුදල් අය කිරීමක් සිදු නොකළ නිසා බවත් ඔහුට දුන් ණය මුදල වෙනුවෙන් කිසිදු පොලියක් අය නොකළේ වෘත්තීය සමිතිය පවත්වාගෙන යන ගොඩනැගිල්ලට ඔහු කිසිදු මුදලක් අය නොකිරීම හා ඔහුට අයත් වාහන ලබාදී තිබූ නිසා සමිති විධායක කමිටුව ගත් තීරණයක් මත බව නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ මහතාගේ නැවත ප්‍රශ්න හමුවේ පිළිතුරු දෙමින් මාරිමුත්තු ක්‍රිෂ්ණමූර්ති මහතා පැවසීය.

මේ සිද්ධියට පාදක වන වකවානුවේ මහින්දානන්ද අලුත්ගමගේ මහතාගේ රියදුරු ලෙස සේවය කළ වසන්ත රාජපක්ෂ මහතා ද ඊයේ (11) සාක්කි ලබා දුනි.

වැඩිදුර සාක්කි විභාගය ලබන ඔක්තෝබර් 14 වැනිදාට කල් තැබුණි.

නීතිඥ බුද්ධික චන්ද්‍රසේකර, ජනක රත්නතුංග, කාංචන රත්වත්තේ මහත්වරුන් සමග ජනාධිපති නීතිඥ නලීන් ලද්දුවහෙට්ටි මහතා අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවෙන් පෙනී සිටියහ.

නීතිපතිවරයා වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ මහතා පෙනී සිටි.

# ආණ්ඩුවේ 20න් ජාතික විගණන කොමිසම වැඩකට නැති ලියවිල්ලක් වෙනවා

## සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂ ද සිල්වා

**ශිවන්ති ප්‍රනාන්දු**







ආණ්ඩුවේ 20 වැනි සංශෝධනයෙන් රටේ ආර්ථිකයට සෘණාත්මක බලපෑමක් වන බවත් එමගින් ජාතික විගණන කොමිසම සම්පූර්ණයෙන් වැඩකට නැති ලියවිල්ලක් වන බවත් සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂ ද සිල්වා මහතා ඊයේ (11) පැවසීය.

පක්ෂ කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමින් ඇමැතිවරයා මේ බව පැවසූ අතර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී විජේපාල හෙට්ටිආරච්චි මහතාද ඊට සහභාගි විය.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීවරයා එහිදී මෙසේද ප්‍රකාශ කළේය.

ආණ්ඩුව මතයක් නිර්මාණය කරනවා 19 වැනි ව්‍යවස්ථාවෙන් යන ශීඝ්‍ර ගමන අඩපණ වෙනවා. ඒ නිසයි දහ නවයේ අහිතකර දේ 20 වැනි සංශෝධනයෙන් අයින් කරන්නේ කියා. ප්‍රසම්පාදන, විගණන කොමිසම් අහෝසි කිරීමෙන් ආණ්ඩුව කියන්න හදන්නේ මොකක්ද? ජී.එල්. පීරිස් ඇමැතිවරයා ජනාධිපතිවරයාගේ මුක්තිය ගැන කියන කාරණාවලින් කියන්නේ ජනාධිපතිවරයාට රටේ සෞභාග්‍ය වෙනුවෙන් ගෙනියන්න වැඩ තියෙනවා. ඒ නිසා ජනතාවගෙන් එන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් ගැන වැය කරන්න වෙලාවක් නෑ කියලා. මම කල්පනා කළා මේක විහිළුවක්ද කියලා, අප්‍රේල් 01 වැනිදාද කියලාත් හිතුවා. ඒ කියන්නේ ජනතාවට ඇති අයිතිය ගැන ජනාධිපතිට වගකීමක් නෑ. අප ජනතාවාදී විපක්ෂයක් හැටියට ජනතාව වෙනුවෙන් පෙනී ඉන්නේ. දැන් ප්‍රසම්පාදන කොමිසම පිළිබඳ අපට සහතිකයක් දෙන්න බෑ. ඒකත් පිළිගන්න ඕනෑ. 2015 ඉඳන් 2019 දක්වා ඔවුන්ගේ ක්‍රියාකලාපය පිළිබඳ අපට අතිශයින් සන්තෝෂ වෙන්න බෑ. ඒක පිළිගන්න ඕනෑ. ඔවුන්ගේ වගකීම ඔවුන් හරියට ඉෂ්ඨ කළාද කියලා ඇහුවොත් කියන්න වෙන්නේ ඒක හරියට කළේ නෑ. ඒවායේ ගැසට් කිරීම් ගැන ගැටලු තිබුණා. ඔවුන්ගේ කාර්යභාරය මොකක්ද? රජයේ ආයතන ප්‍රසම්පාදන රෙගුලාසි හරිහැටි මොනවාද කියන එක පිළිබඳ ගැටලු සහගත තත්ත්වයක් තිබුණා. ඒක පිළිගන්න අතරේ ඒකට පිළියම 20 අහෝසි කරන එක නෙමෙයි. ඒකට කළයුතුව තිබුණේ කොමිසම ශක්තිමත් කරන එක. මම දැක්කා විගණන නිලධාරීන් මහානායක ස්වාමීන් වහන්සේ බැහැ දකින්න ගිහින්. ඔවුන් ඉදිරිපත් කළ ලියවිල්ලෙන් මේකට මැදිහත් වෙලා මේ පාපකර්මය නවත්වන්න කියනවා. එක පැත්තකින් ප්‍රසම්පාදන කොමිසම අහෝසි කරන ගමන් අනෙක් පැත්තෙන් විගණන කොමිසම අහෝසි කරනවා. බලන්න වෙලා තියෙන දේ. සමාලෝචන, අධීක්ෂණය, නිර්දේශ දෙන්න හිටි මේ කොමිෂන් සභා අහෝසි කළාම විගණනයට අවස්ථාවක් හරිහැටි නැහැ. ව්‍යවස්ථාදායක සභාව වෙනුවට ඒක අහෝසි වී පත් වෙන පාර්ලිමේන්තු කොමිසමට ඒ බලය නෑ. මේ වෙද්දී නිර්දේශ නිකුත් කරන්න තියෙන අවස්ථාව නැති වෙලා නිරීක්ෂණ විතරක් ලබාදීමට විතරයි පාර්ලිමේන්තු සභාවට හැකි වෙන්නේ. මේක අහසට පොළොව වගේ වෙනස් තත්ත්වයක්. ආණ්ඩුව කියන්න උත්සාහ කරනවා මේවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කරන්න කියලා. ඉන්දිකාකර වට නැතිව කොමිෂන් සභාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කරන්න කියලා. එහෙම නම් ඇයි ඒවයින් නිර්දේශ කිරීමේ බලය උදුර ගත්තේ? මේවායේ පරස්පරයක් තියෙනවා. පේන්නේ නැද්ද ජනතාවට කියන්නේ එකක්, කරන්නේ එකක් කියා? වරදක් වුණාම අධිභාරයක් ගැනීමේ හැකියාව තියෙනවා විගණන කොමිසමට. මේකෙන් ජාතික විගණන කොමිසම සම්පූර්ණයෙන් වැඩක් නැති ලියවිල්ලක් වෙනවා. ප්‍රසම්පාදන කොමිසම නැතිව රජයේ ආයතනවල වැඩ කිසිවක් හොයන්න, බලන්න, අධීක්ෂණය කරන්න බෑ. විගණකාධිපතිවරයා සමග පාර්ලිමේන්තුවේ කෝප්, කෝපා කමිටු රැස් වුණේ. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති කොච්චර දේ කළාද මේ හරහා? විගණකාධිපතිවරයා බය නෑ ආණ්ඩුවට විරුද්ධව කතා කරන්න. ජනාධිපතිවරයාට බෑ උසස්වීම් නවත්තන්න. විපක්ෂයේ මන්ත්‍රීවරයකුට රජයේ ආයතන ගැන විගණනය කරන්න බෑ කියා දැන් කියනවා. අපේ ඇමැතිවරයෙක් පත් කරන්නයි කියා ඔවුන් කියනවා. ඒක ජනතාවාදීද? මේ නිසා සංවර්ධනය මුවාවෙන් දූෂණය වැඩි වෙයි? තොරතුරු දැන ගැනීමේ පනත තිබ්බට කොමිසමට පත්වීම් කරන්නේ ජනාධිපතිවරයා. මේ නිසා මාධ්‍යයට තිබුණ ඉඩ තියෙයිද? 'එමර්ජන්සි පවර්' ගැන ප්‍රශ්න අහන්න පුළුවන්ද? ගල් අඟුරු ගේන්න හදනවා, සංස්ථාවල විගණනය කිරීම විගණකාධිපතිට තහනම් කර තියෙනවා. විදුලිබල මණ්ඩලයේ කොම්පැනි ගැන කතිකාවක් තියෙනවා. මේ තොරතුරු බොහොමයක් අහන්න අයිතිය ලබාදීලා තිබුණා මීට කලින්. මේ වෙන දේවල් ගැන අපට සතුටු නෑ. විගණන, ප්‍රසම්පාදන කොමිසම් ඉවත් කිරීම, ජනාධිපතිවරයාගේ මුක්තිය ඉවත් කිරීම හරහා රට සංවර්ධනය වෙනවාට වඩා එය රටේ ආර්ථිකයට සෘණාත්මකව බලපානවා. රටේ ආර්ථිකයට දේශීය වගේම විදේශීය ආයෝජකයන් අවශ්‍යයි. රටේ යහපාලනය ගැන හොඳ තත්ත්වයක් රටට අවශ්‍ය වෙනවා.

**හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී විජේපාල හෙට්ටිආරච්චි මහතා-**

විසි වැනි සංශෝධනයෙන් ඇති වන දරුණු බේදවාචකය වෙන්නේ ආණ්ඩුව පහුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී ජනතාව 3න් දෙක ඉල්ලුවේ රටේ ආර්ථිකය හදන්න, කොවිඩ්-19 පල විපාකවලින් රට ගොඩගන්න, රුපියල් පන්දාහේ ප්‍රශ්නය විසඳන්න මිසක් පොලිස්පතිවරයා, විගණකාධිපතිවරයා, නීතිපතිවරයා, ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයන් පත් කරන්න නෙමෙයි. ගිය ආණ්ඩුව යම් යම් අපහසුතාවන්ට පත් වුණත් යම් යම් ගැටලු අතරේ අප ප්‍රශ්න විසඳුවා. ප්‍රජාතන්ත්‍රවාදය ගෙනාවා. බොහෝ ජයග්‍රහණය කළා. මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයාගේ අඩුපාඩු තිබුණත් සෝභිත හිමියන්ගේ සංකල්පනා හැටියට ඔහු කටයුතු කළා. සහරාන්ගේ ප්‍රශ්නය ඔප්පු වෙනතුරු වෙන කෙනෙක් පත් කරන්න ආණ්ඩුවට බෑ. මේක තමයි 19 ව්‍යවස්ථාවේ හොඳ ලක්ෂණය. මරණ දඬුවම නියම වූ අයටත් පාර්ලිමේන්තු එන්න ඉඩ ලැබෙන්නේ මේ තත්ත්වය ඇතුළේ. වියත් මගේ අය දැන් ආණ්ඩුවට එරෙහිව කටයුතු කරනවා. පළාත් සභා අහෝසි කිරීම මේ ව්‍යවස්ථාවේ අරමුණක්ද? පළාත් සභා ස්ථාපිත කළේ රටේ ජාතික ප්‍රශ්නයට විසඳුම හැටියට. බලය විමධ්‍යගත කරන්න. ලෝකෙම එක පිළිගන්නවා. බහු ආගම්, ජාතීන්, සංස්කෘතීන් ක්‍රියාත්මක කරන රටක් මේක. නිදහසින් පස්සේ 1959දී 50ට පනහා බලය දෙමින් බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම, ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම අවසානයේදී රට දරුණු බේදවාචකයට පත් වුණා. පස්සේ 1983 කළු ජූලිය ආවා. එදා රට දෙකොන පත්තු වුණ විලක්කුවක් වගේ වුණා. අපේ අසල්වැසි රටවල් එක්ක ගනුදෙනු කරද්දි ජේ.ආර්. මේ ගිවිසුම අත්සන් කළේ බලය බෙදීමේ සංකල්පයක් හැටියට. එහෙමයි පළාත් සභා නිර්මාණය වුණේ. ප්‍රාදේශීය වශයෙන් සෞඛ්‍ය, අධ්‍යාපන, මහාමාර්ග ගැන පළාත් සභා නියෝජිතයන්ට අයිතිය තියෙනවා. පළාත් සභාවල නැති අය එය සුදු අලියෙක් කියනවා. ඒක ඒ ක්‍රමයේ වැරැද්දක් නෙමෙයි. පුද්ගලයාගේ හැටියටයි එහෙම වෙන්නේ. එහෙම එක එක්කෙනාට ඕනෑ විදිහට මේක නැති කරන්න බෑ. එදා රට බෙදනවා කියලා සෝභිත හාමුදුරුවෝ ගිනි තියාගන්න හැදුවා. වර්ධරාජා පෙරුමාල් වෙනත් රාජ්‍යයක් නම් කළාම පළාත් සභා විසිරුවා ගැටලු විසඳුවා.

ඡායාරූප – ගයාන් පුෂ්පික

# ගැමි ජන සුවය නැංවීමට ජංගම රසායනාගාර ගමට

## රට වටා මිලියන දහසක නව සෞඛ්‍ය ව්‍යාපෘති

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති 100කට අධික ප්‍රමාණයක් මේ වසරේ දෙසැම්බර් අවසානයට පෙර ජනතා අයිතියට පත් කිරීමට රජය තීරණය කර ඇත. මේ ව්‍යාපෘති සඳහා වැය කරන මුදල රුපියල් මිලියන 1,100කි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය මඟින් පළාත් නවය පුරා ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ඉදිරි සැලසුම් විමසා බැලීමේ සාකච්ඡාවක් පළාත් පාලන හා පළාත් සභා රාජ්‍ය අමාත්‍යාංශයේදී පැවැත්විණි. පළාත් පාලන හා පළාත් සභා රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ව්‍යාපෘති) එම්. එම්. නජිමුඩීන් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ මෙම විශේෂ සාකච්ඡාවට, ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ සෞඛ්‍ය විශේෂඥ, විශේෂඥ වෛද්‍ය දීපිකා ආටිගල මහත්මිය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෛද්‍ය ජයසුන්දර බණ්ඩාර මහතා, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් මෙන්ම පළාත් සෞඛ්‍ය ලේකම්වරුද එක්ව සිටියහ.

රටේ සියලු පළාත්වල කුඩා රෝහල්වලට බලපාන පොදු ගැටලුවක් වන වෛද්‍ය හා හෙද කාර්ය මණ්ඩල හිඟය පිළිබඳද මෙහිදී සාකච්ඡාවට ගැනිණි. මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර සහකාර





නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට කටයුතු කරන්නේ නම් මේ ගැටලුව යම් පමණකට හෝ මඟහරවා ගැනීමට හැකි බව පළාත් සෞඛ්‍ය බලධාරීහු මෙහිදී පෙන්වා දුන්හ. ඉදිරියේදී නිල වශයෙන් මෙම ඉල්ලීම සෞඛ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමටද මෙහිදී යෝජනා විය. තවද මේ ගැටලුව විසඳීම සඳහා සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය මෙන්ම සෙසු සෞඛ්‍ය බලධාරීන් සිය විශේෂ අවධානය යොමුකරන බවද එහිදී අවධාරණය කෙරිණි.

සෑම දිස්ත්‍රික්කයකම තෝරාගත් රෝහල්වල රසායනාගාර සියලු පහසුකම් සහිතව වැඩිදියුණු කිරීමේ කටයුතු මේ වන විට සිදුවන අතර ඉන් අනතුරුව රසායනාගාර පහසුකම නැති අවට රෝහලවලින් ගෙනෙන සාම්පල පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ද සැකසේ. ජනතාව රෝහලට කැඳවීම වෙනුවට ගමට ගොස් ජංගම රසායනාගාර සාම්පල එකතු කිරීමේ සේවාව මඟින් සාම්පල ලබාගැනීමේ ක්‍රමය දිරිමත් කෙරේ.

ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා ක්‍රියාත්මක සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ඉදිරි සැලසුම් මින් ඉදිරියට එසැණින් යාවත්කාලීන වන පරිගණක ගත තොරතුරු පද්ධතියකට ඇතුළත් කෙරෙන අතර, ඉන් පසු සෞඛ්‍ය බලධාරීන්ට පමණක් නොව ජනාධිපතිවරයාට පවා ඕනෑම මොහොතක මේ කටයුතුවල ප්‍රගතිය හා ඉදිරි සැලසුම් එසැණින් විමසා බලා අවශ්‍ය උපදෙස් සැපයීමේ වැඩි අවස්ථාවක් සැලසේ. එසේම මේ වසර අවසන් වීමට පෙර පළාත් නවයේ සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති 100කට අධික සංඛ්‍යාවක් නිමකර ජනතා අයිතියට පත්කිරීමේ ඉලක්ක ලබාදීමද සිදුවිය.

දිස්ත්‍රික්ක විසිපහම නියෝජනය වන පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට කැබ් රථ ලබා දීම සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට යතුරු පැදි 807ක් ලබා දීමේ සියලු කටයුතු පසුගිය අගෝස්තු 30 වැනිදා වන විට අවසන් කර තිබෙන අතර, යතුරුපැදි සියල්ල සෞඛ්‍ය අමාත්‍යාංශයට අගෝස්තු 30 වැනිදා වන විට භාර දුන් බවද මේ සාකච්ඡාවේදී අනාවරණ විය.

# ප්‍රවාහනයෙන් ලාභ උපයන්න

## උපදේශන කමිටුව රැස් වෙයි

**නිමල් රාජපක්ෂ**

ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යංශය යටතේ තිබෙන සෑම ආයතනයක්ම ලාභ ලබන ආයනතනයක් බවට පත් කිරීමට රජය තීරණය කර ඇත. ඒ සඳහා මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන ඉදිරි සැලැස්මක් සකස් කරන බව ප්‍රවාහන රාජ්‍ය ඇමති දිලුම් අමුණුගම මහතා පවසයි. ඇමැතිවරයා මේ අදහස් පළ කළේ පසුගියදා ප්‍රවාහන ආමාත්‍යාංශයේ පැවැති උපදේශන සභාවේ මංගල රැස්වීම ඇමතූ අවස්ථාවේදීය.

උපදේශන මණ්ඩලයේ සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අමල් කුමාරගේ මහතා පත් විය. සුජීව සේරසිංහ, අතුලද සිල්වා, සංජීව කරුණාරත්න, මලින්ද රාජසිංහ, සහන්ද සිල්වා, රුක්ෂාන් සුරේන්ද්‍ර, ඩී. කේ. කුමාරසිංහ, රෝහණ හේරත්, ප්‍රසාද් ගමගේ යන මහත්වරු සහ අමාත්‍යංශ ලේකම් ඩී. අල්විස් මහතා මේ මණ්ඩලයේ සෙසු සාමාජිකයෝ වෙති.

මෙහිදී අදහස් දැක්වූ දිලුම් අමුණුගම මහතා:

"ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යංශයේ විවිධ අංශ දියුණු කිරීම ගැන මුල සිටම ජනාධිපතිතුමාගේද අවධානය යොමු වුණා. ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යංශයට උපදේශන මණ්ඩලයක් පත්කිරීමට මැතිවරණයෙන් පසුව තීන්දුවක් ගත්තෙත් එය දියුණු කිරීමේ අරමුණ ඇතිව. ඒ අදහස මේ වනවිට ඉෂ්ඨ කොට තිබෙනවා. මෙහිදී සෑම අංශයක් කෙරෙහිම අවධානය යොමු කොට සියලුම අංශ ලාභ ලබන තත්ත්වයට පත්කරන්න සැලසුම් සකස් කරනවා.

රාජ්‍ය අමාත්‍යංශය සතු විෂයන් සොයා බලා ඒවා ඒකාබද්ධව කරගෙන යන ආකාරය හා එක් එක් ආයතන වෙනම දියුණු කරගෙන යන අයුරු පිළිබඳ සැලසුම් හැදීමටත් ක්‍රියාත්මක කිරීමටත් ඉදිරියේදී කටයුතු කරනවා. ප්‍රවාහන ක්ෂේත්‍රයට දීර්ඝ කාලීන ලෙස බලපාන කරුණු සම්බන්ධයෙන්ද තීන්දු තිරණ ගන්නවා.

ඉඩම්, අබලි ද්‍රව්‍ය, ගොඩනැගිලි මේ කිසිවක් විකුණන්නේ නැහැ. නමුත් මේ සියල්ල කෙරෙහි අවධානය යොමු කොට මුදල් උපයා ගන්න ක්‍රියාමාර්ග හදනවා. කලින් ඇමැතිවරයා කරගෙන ගිය හොඳ වැඩ සියල්ල ක්‍රියාවට නංවනවා. කොයි ආණ්ඩුව හෝ හොඳ දෙයක් කරගෙන ගිහින් තිබෙනවා නම් එය කරගෙන යනවා. මෝටර් රථ දෙපාර්තුමේන්තුවේ ගැටලු රැසක් තිබුණා. නමුත් මේ වනවිට රියදුරු බලපත් ලබාගැනීමේදී ඇති වූ අධික ප්‍රමාදය පැය දෙකකට සීමා කිරීමට හැකි වී තිබෙනවා" යැයිද දිලුම් අමුණුගම මහතා මෙහිදී ප්‍රකාශ කළේය.



# අවුවෙන් සුළඟෙන් නිපදවන විදුලිය සියයට 80 දක්වා වැඩි කෙරේ

**චන්දිමා කරුණාරත්න**

වසර 2030දී ජාතික විදුලිබල පද්ධතියේ පුනර්ජනනීය බලශක්ති දායකත්වය 80% දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය සියලු කටයුතු දියත් කරන බව බව සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපාති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතා පැවැසීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව වසර 2030 වනවිට ජාතික විදුලිබල පද්ධතියේ පුනර්ජනනීය බලශක්ති දායකත්වය 80% ක් දක්වා නංවාලීමට කටයුතු කෙරේ.

2030 වසර වනවිට පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට ගතයුතු පියවර සොයා බැලීමට පත් කළ දස පුද්ගල විද්වත් කමිටුව එම අමාත්‍යාංශයේදී පෙරේදා (10) අමාත්‍යවරයා හමු වූ අවස්ථාවේදී අමාත්‍යවරයා මේ බව අවධාරණය කළේ ය.

එහිදී අදහස් දැක්වූ කමිටු සාමාජිකයන් පවසා සිටියේ පුනර්ජනනීය ප්‍රභවයන් නිරන්තරයෙන් ඒකාකාරී නොවන බැවින්, ඒ පිළිබඳ විශේෂ අවධානයකින් යුතුව කටයුතු කළ යුතු බවයි. එසේම ලංකාවේ පවත්නා පුනර්ජනනීය ප්‍රභවයන්, වර්ධනය වන විදුලි ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත්ද යන්න පිළිබඳත් විශේෂ අවධානයක් යොමු කළ යුතු බව ඔවුහු පැවැසූහ.

මේ වනවිට ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයේ දිශානතිය පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු වී ඇති බවත්, ඒ අනුව යමින් ඉදිරි සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට නම්, රාජ්‍ය අංශයට සමගාමීව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපාරිකයන් මෙන්ම ආයෝජකයන් දිරිගැන්විය හැකි ක්‍රමෝපායන් පිළිබඳ සොයා බලන්නැයිද අමාත්‍යවරයා අවධාරණය කළේය.

එසේම සෞභාග්‍යයේ දැක්ම කරා රට යන ගමනේ මංපෙත් පුනර්ජනනීය බලශක්තියෙන් හෙළිපෙහෙළි කිරීමට ගත යුතු සියලු පියවර ගතයුතු බවත්, ඒ වෙනුවෙන් ගත වන කාලය, වැය වන මුදල කොපමණ වුවත්, සියල්ල හමුවේ නොසැලී තීන්දු තීරණ ගැනීමට තමා පසුබට නොවන බවත් සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතා එහිදී වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

එම අවස්ථාවට විදුලිබල අමාත්‍යාංශ ලේකම් වසන්තා පෙරේරා, රාජ්‍ය ලේකම් හේමන්ත සමරකෝන් යන මහත්ම මහත්මීහු ඇතුළු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු කිහිප දෙනෙක්ද සහභාගී වූහ.

# නඩු තීන්දු කල්මැරීමේ වැරැද්ද වහා විසඳන්න

## ලංකා වෙළෙඳ කාර්මික හා පොදු කම්කරු සංගමයේ ප්‍රධාන ලේකම්

**අනුර ප්‍රේමලාල්**

කම්කරු නඩු කඩිනමින් අවසන් කර ගැනීමට හැකි වන අයුරින් ක්‍රමවේදයක් සකසන ලෙස, ලංකා වෙළෙඳ කාර්මික හා පොදු කම්කරු සංගමයේ ප්‍රධාන ලේකම් සිල්වෙස්ටර් ජයකොඩි මහතා වත්මන් කම්කරු ඇමැති නිමල් සිරිපාල මහතාගෙන් ඉල්ලා සිටියි. මේ ඉල්ලීම ඇමැතිවරයා වෙත යොමු කරන ලේකම්වරයා එම නඩු ප්‍රමාදයෙන් සිදුවන දුෂ්කරතා ගැන තව දුරටත් සිය අදහස් දක්වන්නේ මෙලෙසය.

කම්කරු ආරවුලකට විසඳුම් ලබා ගැනීමට වසර දහතුනක් පමණ ගතවීම ගැන කාගෙත් අවධානය යොමුවිය යුතුය. සමහර අවස්ථාවල එම නඩු සේවක ජයග්‍රහණය ලබා අවසන් වේ. ඒ ගැන සතුටු විය හැකිවුවත්, නඩුව අවසන් වන තෙක් සේවකයන් විඳි දුක් කන්දරාවට වගකීමට කිසිවකු නැත. එබැවින් කම්කරු නඩු කඩිනමින් විසඳාගත හැකි ක්‍රමවේදයක් සකස් කිරීම ඉතා වැදගත්ය.

දීර්ඝ කාලීන නඩුවලින් පසු සේවකයන් ජයග්‍රහණය කළද ඔවුන් විඳි දුක් කරදරවලට පහත නඩුව කදිම නිදසුනක්ය.

2007 දෙසැම්බර් මස 28 වැනි දින ඒකල, ජා-ඇල, රිචඩ් පීරිස් කර්මාන්තශාලාවේ CMU ශාඛා ලේකම්වරයා සේවයෙන් පහ කිරීම හේතුකොටගෙන වැඩ වර්ජනයක් ආරම්භ විය. එම කාලවකවානුව තුළදී සමාගම සමඟ ඇතිවූ ආරවුලට නායකත්වය දෙනු ලැබුවේ එවකට සිටි

### නඩු අවසන් වෙද්දී ඇතැම් කම්කරුවන් මිය ගිහින්!

ප්‍රධාන ලේකම් බාලා තම්පෝ මහතාය. තම්පෝ මහතා විසින් කම්කරු ඇමැති සහ කම්කරු කොමසාරිස් සමග පවත්වන ලද සාකච්ඡාවලින් ආරවුල විසඳීමට නොහැකි වූ අතර ශාඛා ලේකම්ගේ වැඩනැවැත්වීම පිළිබඳ විරෝධය දක්වමින් ආරම්භ කරන ලද වැඩ වර්ජනය අතරතුර, මේ ගැටලුව 2008 ජූලි මස 7 වැනි දින කාර්මික ආරවුල් පනත යටතේ බේරුම්කරණයකට යොමු කරන ලදී.

මේ තත්ත්වය යටතේ 2008 ජූලි මස 29 වැනි දින වැඩ වර්ජනය අත්හිටුවා සේවකයන් සේවයට වාර්තා කළද එහිදී සියලුම සේවකයන්ට වැඩ ලබා නොදීම හේතුවෙන් තවත් ආරවුලක් ඇති විය.

කම්කරු දෙපාර්තමේන්තුවේ සාකච්ඡා ගණනාවක් පවත්වන ලද නමුත් කිසිදු විසඳුමකට එළැඹීමට සමාගම එකඟ නොවීය. එවකට කම්කරු ඇමැතිවරයා වශයෙන් සිටි ආතාවුද සෙනෙවිරත්න මහතා කම්කරු සම්බන්ධතා කොමසාරිස් වශයෙන් සිටි, ඩී. එම්. එස්. දිසානායක මහතා සහ කම්කරු අමාත්‍යංශ ලේකම් මහින්ද මඩිහහේවා මහතාද විවිධ යෝජනා මඟින් විසඳුමක් ඇති කිරීමට දරන ලද සියලු උත්සාහයන් අසාර්ථක විය.

ඒ අනුව එම වැඩ වර්ජනයට සහභාගී වී සිටි 161 දෙනෙකුගේ සේවය ප්‍රතික්ෂේප කිරීමේ ආරවුලද කම්කරු ආරවුල් පනත යටතේ විනිශ්චයකට යොමු කරන ලදී.

ශාඛා ලේකම් සේවයෙන් පහ කිරීම හා 161 දෙනෙකුට සේවයේ ප්‍රතික්ෂේප කිරීම යන ආරවුල් දෙකම එකම විනිශ්චයකරුවකුට යොමු කිරීමට එරෙහිව සමාගම විසින් අභියාචනාධිකරණයෙන් රිට් ආඥාවක් ඉල්ලා සිටින ලදී. මෙරට පවතින නීති අනුව විවිධ අධිකරණ ක්‍රියාමාර්ග තුළ නඩු කල්ගතවීමෙන් බරපතළ අසාධාරණයට මුහුණ පාන්නේ වැඩ කරන ජනතාව බව ඔප්පු කිරීමට මෙම ආරවුලද කිදිම නිදසුනකි. එම අධිකරණ ක්‍රියාවලිය අවසානයේ දී, 2013 සැප්තැම්බර් මස වෙනත් බේරුම්කරුවකු, මෙම සේවකයන් 161 දෙනාගේ සේවය අහිමි කිරීම පිළිබඳ විභාග කිරීමට පත් කරන ලදී. 2011 දෙසැම්බර් 9 වැනි දින වන විට ශාඛා ලේකම්ගේ සේවයෙන් පහ කිරීම් විභාගය අනුව එම සේවයෙන් පහකිරීම යුක්ති සහගත නොවන බවට බේරුම්කරු විසින් තීරණය කර, නැවත සේවය ස්ථාපිත කරන ලෙසට දී තිබූ නඩු තීන්දුවට එරෙහිව සමාගම අභියාචනාධිකරණයට ඉල්ලුම් පතක් ඉදිරිපත් කර තිබුණි.

මේ අතර 161 ට රැකියාව ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ නඩු විභාගය 2013 ඔක්තෝබර් ආරම්භ වී 2018 අගෝස්තු මාසය දක්වා වසර 5ක් නඩු වාර 56 ක් පැවතුණි. එම නඩු විභාගයේ තීන්දුව 2020 අගෝස්තු මස ප්‍රකාශයට පත් කරන ලදී. එම තීන්දුවට අනුව සේවකයන් සේවයෙන් පහ කිරීම අසාධාරණ බවට තීරණය කර ඇති අතර ඒවන විට ඉතිරිව සිටි159 දෙනාට නැවත රැකියාව ලබාදී, ඔවුන් අවසන් වරට ලබමින් සිටි මාසික මූලික වැටුප අනුව ගණන් බලා හිඟ වැටුප් සහිතව ලබාදිය යුතු බවට නියෝග කර ඇත. එසේම එම හිඟ වැටුප් මත ඔවුන්ට හිමි සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, පාරිභෝගික දීමනා ආදී ආදී ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ හිමි යුතු බවට ද නියෝග කර ඇත. මෙම සියලුම හිඟ වැටුප් සහ අදාළ මුදල් එම නියෝගය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට මාස තුනක් ඇතුළත කම්කරු කාර්යාලය තැන්පත් කළ යුතු බවටද වැඩිදුරටත් නියෝගය සඳහන් වේ. මේ වනවිට සාමාජිකයන් දෙදෙනකු ජීවිතයෙන් සමුගෙන ඇති අතර තවත් සාමාජිකයන් ජීවිතයේ නොවිඳි දුක් කම්කටොළු විඳ ඇත. එබැවින් ඇතැම් නඩු මෙලෙස සේවකයන්ට වාසි වන ලෙස විසඳුනද ඒවාට ගත වන කාලය දෙස බලන විට සේවකයන්ට මහත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවේ. එබැවින් මෙකී අඩුපාඩු නැවත නොවන ලෙසට අවශ්‍ය පියවර ගනිමින්, කම්කරු නඩු ඉක්මනින් විසඳන ක්‍රියාදාමයක් ඇති කිරීමට කම්කරු අමාත්‍යාංශය කඩිනම් පියවර ගත යුතු බව ලංකා වෙළෙඳ කාර්මික හා පොදු කම්කරු සංගමය පවසයි.

# 'රැම්සා' විනාශය: 'සියැටි සිටි' ආයතනය බදු කොන්දේසි කඩ කරලා

## සිමෙන්ති සංස්ථාවේ සභාපති ගාමිණී ඒකනායක

**අමෝදා ජයමහ**

පරිසරය ආරක්ෂා කිරීමට වගකිව යුතු පුද්ගයන් සිය වගකීම් පැහැර හැරීම සම්බන්ධව අප විධිමත් පරීක්ෂණයක් කර ඔවුන්ට එරෙහිව නීතිමය පියවර තරාතිරම නො බලා ගන්නා බව සිමෙන්ති සංස්ථාවේ සභාපති ගාමිණී ඒකනායක මහතා පැවසුවේය.

පුත්තලම් දිස්ත්‍රික්කයේ ආනවිළුන්දාවේ අගෝස්තු 25,26 රැම්සා තෙත් බිම් එළි පෙහෙළි කිරීම සහ සිදු වන පරිසර විනාශයන් සිදුවීම නතර කිරීම සඳහා සැප්තැම්බර් මස (14) වැනි දින වනාතවිල්ළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් ගෙන්වා සාකච්ඡා කර සැලසුම්සහගත වැඩපිළිවෙලක් සකසන බවද ඒ මහතා පැවසුවේය.

රජයේ ඉඩම්වල පදිංචිව සිටින පිරිස් අනවසර පදිංචිකරුවන් ලෙස අපි සලකන බව හා මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිල්ලක් ගොනු කර ඉන්පසු මෙම පදිංචිකරුවන් සතුව බලපත්‍රයක් තිබේද? නැද්ද? යන කරුණ සලකා බලමින් බලපත්‍ර නැති පිරිස් එම ප්‍රදේශයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බවද ගාමිණී ඒකනායක මහතා පවසා සිටියේ ය.

එමෙන්ම පරිසර හානී සිදුවීම් පිළිබඳ දැනුවත් කිරීමට විශේෂ හදිසි දුරකථන ඇමතුමක් සැකසීමට ඔක්තෝබර් මස (05) වැනිදා වන විට නැතිනම් බොහෝ විට සැප්තැම්බර් මස (25) වැනි දා වන විට කටයුතු කරන බව මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති එස්. සමරසිංහ මහතා පැවසුවේ ය.

පුත්තලම ආනවිළුන්දාවේ අගෝස්තු 25, 26 රැම්සා තෙත් බිම් එළි පෙහෙළි කිරීම පිළිබඳ ඊයේ (10) දින මධ්‍යම පරිසර අධිකාරියේ පැවති මාධ්‍ය හමුවකට සහභාගීවෙමින් සභාපතිවරුන් මේ අදහස් පැවසූහ.

වැඩිදුර අදහස් දැක්වූ සිමෙන්ති සංස්ථාවේ සභාපති ගාමිණී ඒකනායක මහතා මෙසේ කීවේය.

මෙම අපරාධය හොර රහසේ සිදු වූ දෙයක් නොවෙයි. එය එළිපිට සිදු වූ විනාශයක්.

මේ වන විට මෙහි ගෙවල් සදාගෙන ස්ථිර පදිංචිකරුවන් ලෙස සිටින පවුල් පන්සීයක් පමණ සිටිනවා. ඒ වගේම තවත් පිරිස් ඉඩම් අත්පත් කරගනිමින් ඇතුළු වෙන්න උත්සාහ දරමින් සිටිනවා. මෙහි අයිතිය තිබෙන්නේ සිමෙන්ති සංස්ථාව සතුවයි. අක්කර පන්දහස් එකසිය ගණනක අයිතියක් අපට මෙම භූමිය තුළ තිබෙනවා. අපේ අයිතිය අප සියැටි සිටි ආයතනයට බදු අකාරයෙන් ලබා දී තිබෙනවා. 1996/08/26 වැනි දා 485 යන බදු ගිවිසුම යටතේ මේ අක්කර පන්දහස් ගණනක ඉඩම ලබා දුන්නා. මෙම බදු දීම ලබා දුන්නේ, සිමෙන්ති නිෂ්පාදනයට අවශ්‍ය හුණුගල් ලබා ගැනීමට පමණයි. එමෙන්ම මෙම බදු ගිවිසුම මඟින් බදු ගැණුම්කරුවන් ලෙස මේ ඉඩමට අනවසරයෙන් කාට හෝ ඇතුළු වීමට, පදිංචිවීමට නොහැකි බව අප දන්වා තිබෙනවා. ඔවුන්ට එම කොන්දේසි ආරක්ෂා කිරීමට වගකීමක් තිබුණා. ඒත් ඔවුන් එය පැහැර හැර තිබෙනවා. එමෙන්ම මෙම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන් මෙන්ම අනෙකුත් වගකිව යුතු නිලධාරීන් ඔවුන්ගේ වගකීම් පැහැර හැර තිබෙනවා.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි පරිසරය ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීම ලෙස වගන්තියක්ද සඳහන්. මෙම ඉඩම අවුරුදු පනහකට බදු දී තිබෙනවා. අවුරුදු පනහෙන් තිහක් මේ වන විට අවසන්. බදු වසර කාලය අවසන් වෙනවාත් සමගම අපට කාන්තර භූමියක් අවශ්‍ය වන්නේ නෑ. එමෙන්ම හන්තාන රක්ෂිතය තුළ සිදුවන වන විනාශය, පුත්තලම පල්ලිවාසිතුරෙයි ප්‍රෙද්ශවල සිදුවන වන විනාශය පිළිබඳ මම දැනුවත් නෑ. මේ සියලු කරුණු සම්බන්ධව අනිවාර්යෙන් සොයා බලා කටයුතු කරනවා. මේ ආකාරයෙන් පරිසර විනාශයන් සිදු වීමට පරිසරය සම්බන්ධ නීතිරීතිවල දුර්වලතා හේතු වන බවත් මනාව අවධාරණය වෙනවා."



### 'නිදහසේ හුස්මෙන්' පරිසරය රකිනවා

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති එස්. සමරසිංහ

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති එස්. සමරසිංහ මහතා කතා කරමින් මෙසේ කීවේ ය.

2019 වර්ෂය අවසානයේ පැවති ජනාධිපතිවරණයෙන් පත් වූ ගෝඨාභය රාජපක්ෂ මහතා පත් වූ පසු පරිසරය පිළිබඳ විශේෂ අවධානයක් ලබා දෙමින් කටයුතු කරනවා. ලංකාවේ දේශපාලන ඉතිහාසය ගත් කළ මේ ආණ්ඩුව පත්වූ පසු සුවිශේෂී වටිනාකමක් පරිසරයට ලබා දෙමින් පරිසරය ආරක්ෂා කර ගැනීමට කටයුතු කරනවා. ජානාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා 'නිදහසේ හුස්ම' නමින් ජනාධිපතාවරණයට සමගාමීව ව්‍යාපෘතියක් සකසා තමන්ගේ දේශපාලන රැස්වීම්වලට සහභාගී වන සෑම වාහනයකින් නිකුත් කරන්නා වූ විෂ වායු අවශෝෂණය කර ගත හැකි ගස් විසිනව දහසක් රෝපණය කෙරුණා. ඒ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීම නිසාවෙන් ජාත්‍යන්තර සම්මානයක් පවා හිමි වුණා.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලය දැන් වගකීමෙන් යුතුව කටයුතු කරන බව පවසන්න පුළුවන්.ජලජීවි වගා සංවර්ධන අධිකාරියේ නිරීක්ෂණයට අනුව මෙම තෙත් භූමිය තුළ ඉස්සන් වගාව ඇති කරන පොකුණු පනහකට වැඩි ප්‍රමාණයක් අඛණ්ඩව හෝ විටින් විට ක්‍රියාත්මක වෙලා තියෙනවා. මෙම පොකුණු සඳහා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 2018 වර්ෂයෙන් පසුව බලපත්‍ර නිකුත් කර නෑ. එමෙන්ම ඉස්සන් කොටුව ශුද්ධ කිරීමට අදාළව ඩෝසර් රියැදුරුට කොන්ත්‍රාත්තුව වර්ණකුලසූරිය නිශාන්ත ප්‍රනාන්දු නැමැති අයකු විසින් ලබා දී ඇති අතර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති ජගත් සමන්තගේ ඉල්ලීම මත මෙම ඉඩම ඩෝසර් කළ බව කොන්ත්‍රාත්තුව ලබා දුන් අයගේ ප්‍රකාශයෙන් අනාවරණය වී තිබෙනවා. මෙම හිටපු සභාපතිවරයා අක්කර එකේ ඉස්සන් කොටු පහක්ද, අක්කර දෙකේ ඉස්සන් කොටු දෙකක්ද, අක්කර තුනේ ඉස්සන් කොටු එකක්ද 2015 වසරේ සිට පවත්වාගෙන යෑම සදහා ජලජීවී වගා අධිකාරියෙන් වාර්ෂික බලපත්‍ර ලබාගෙන තිබෙනවා.

පුත්තලම දිස්ත්‍රික්කයේ පළමු පරිසර හානිය ලෙස, 2001 වර්ෂයේ රැම්සා තෙත් බිමක් ලෙස නම් කරන ලද මෙම ආනවිළුන්දාවේ වන විනාශය හඳුන්වා දෙන්න පුළුවන්. ආනවිළුන්දාව රැම්සා තෙත් බිමක් ලෙස නම් කිරීමට ප්‍රථම රක්ෂිතයක් ලෙස නම් කර තිබුණා. දේශපාලනඥයන් සහ විවිධ තරාතිරම්වල පුද්ගලයන් විසින් සිය පුද්ගලික අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා මෙම පරිසර පද්ධති වගකීම් විරහිත ලෙස විනාශ කර දමන බවක් පෙනෙන්ට තිබෙනවා. ඒ වගේම සංවර්ධන කටයුතු වැනි මිනිස් ක්‍රියාකාරකම් නිසාද මෙම පරිසර පද්ධති වේගයෙන් මේ වන විට විනාශ වෙමින් පවතිනවා. කෙසේ වෙතත් පරිසරයට අහිතකර බලපෑම් වන ලෙස සිදුවන මේ විනාශයන් නවතා දැමීමට අප තරාතිරම නොබලා අවශ්‍ය පියවර ගන්නවා.

ඡායාරූපය - දුෂ්මන්ත මායාදුන්න

■ ප්‍රසන්න සිල්වා - දිඹුලාගල සමූහ

# දිඹුලාගල විජයබාපුර යාය 06 ට වන අලි තර්ජන උග්‍රයි



දිඹුලාගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ විජයබාපුර යාය 06 පදිංචි ජනතාව වන අලි කරදරය නිසා දැඩි අසීරුතාවකට පත්වී සිටිති. මේ දිනවල සවස් කාලයේ ගම් වදින වනඅලි ගෙවල් බිඳීමටද පටන්ගෙන ඇති බව ප්‍රදේශවාසීහු පවසති.

විජබාපුර මහවැලි කොට්ඨාසයේ, යාය 06, ඩී 05 සහ ඩී 06 බෙදුම් ඇළ ගොවි සංවිධානයේ සභාපති එස්.එම්. රංජිත් මහතා තම ගම්මානයේ පදිංචිකරුවන් මුහුණ දී සිටින අලි ප්‍රශ්නය මෙසේ පැහැදිලි කළේය.

"විජයබාපුර ජනාවාස ඇති කළේ පිඹුරත්තෑව ජලාශය යටතේයි. මහවැලිය එන්නට කලින් 1971 වර්ෂයේ සිට මෙම ගම්මානවල ජනතාව පදිංචිවෙලා හිටියා. නමුත් ඒ කාලේ මේ වගේ වන අලි කරදර තිබුණේ නැහැ. මේ කරදරය පටන්ගෙන දැන් අවුරුදු දහයක් විතර ඇති.

අපේ ගම්මානය කෙළවර වෙන්නේ මාදුරුඔයෙන්. ඔයට එන අලි එතනින් කුඹුරු යායට ගොඩ වෙලා ගමට එනවා. කුඹුරු වපුරලා තියෙන කාලයේ ගොවීන් රෑ නිදිවරාගෙන කුඹුරුවල ඉන්න නිසා අලියට ගමට එන්න බැහැ. නමුත් අස්වැන්න නෙළුව ගමන් ගොවියෝ කුඹුරෙන් ගෙදරට එනවා. අලිත් අපි පස්සෙන්ම ගමට එනවා. මේ දවස්වල විජයබාපුර කොට්ඨාසයේ නිවාස වලට හානි කරන අලි දෙතුන් දෙනෙක් ඉන්නවා. උන් අල්ලා වෙනත් ප්‍රදේශයකට ගෙනයා යුතුයි."

පොලොන්නරුව, හංසයාපාලම යාය 06 හි පදිංචි ඕ.එල්.ඩබ්. ලියනගේ මහත්මිය -

"අපි 2009 අවුරුද්ද වන තුරු අවුරුදු තිහක් කොටින්ගෙන් දුක් වින්දා. අසූව සහ අනූව වර්ෂවලදී කොටි ත්‍රස්තයෝ මේ කැලේ මැදින් ඇවිත් මාදුරුඔයෙන් ගොඩවෙලා අපේ ගම්වල මිනිස්සු මැරුවා. උන්ගෙන් ජීවිත රැකගන්න අපි ඒ කාලේ දහදුක් වින්දා. ඒ කාලේ කොටි ආව කැලෙන් දැන් අලි ගම් වදිනවා. අපිට කන්න තියෙන වී ටික වගේම දරු පැටව් ටික රැක ගන්න මහ ලොකු සටනක් කරන්න සිදු වෙලා."

අරලගංවිල, දම්මින්න සිට වැලිකන්ද බොරවැව දක්වා කිලෝමීටර් 30 දිවෙන විදුලි වැටක් ඇත. මෙම විදුලි වැට බිඳගෙන ගම්වදින අලි නිවාස කඩා බිද දමන බව ගොවීහු කියති. සිවිල් ආරක්ෂක බළකායේ සෙබළුන් අලි වැට සකසමින් බොහෝ වෙහෙස මහන්සි වන ආකාරයත් දැකගත හැකිය. මෙම විදුලි වැටේ පැටලී මේ වන විට අලි දෙදෙනකුට ජීවිතය අහිමි වී ඇති බවද ගොවීහු පවසති.

විජයබාපුර,යාය 06 අංක 129 හි පදිංචි කේ.එම්.ජී.ජී.එච් .කුමාර මහතා -

"මගේ වී කඩේට අලි පහර දීලා වී කෑවා. මට ලොකු අලාභයක් වුණා. නමුත් ජීවිත බේරාගන්න පුළුවන් වීම ගැන සතුටු වෙනවා. දැනට අපේ විදුලි වැට සිවිල් ආරක්ෂක බළකාය විසින් හොඳින් නඩත්තු වෙනවා. නමුත් විදුලි වැට ගහලා මෙල්ල කරන්න බැරි අලි ඉන්නවා. උන් වැට කඩාගෙන ගමට පනිනවා . මේ දවස්වල හැන්දෑවේ හය වෙනකොට ගමේ අලි ඇවිදිනවා. මහවැලි ඇළවල් වහලා තිබෙන නිසා මේ දවස්වල ගොඩාක් දෙනෙක් නාන්න යන්නේ ගමේ කෙළවර තිබෙන කුඩා ඔයට. අලි එන නිසා නාන එකත් ජීවිත අවධානමෙන් කළ යුතුව තිබෙනවා."

මෙම ගමනට අපට මග පෙන්වූ එස්.එල්. හේරත් මහතා -

"වල් අලි ගමට පැමිණීම වැලැක්වීමට කළ යුතු හොඳම විසඳුම වන්නේ විදුලි වැටට පිටින් මාදුරුඔය ඉවුර දිගේ දෙහි වැනි වගාවක් ඇති කිරීමයි. ඒ වගේම විදුලි වැටට සමාන්තරව මී මැසි පාලනය කළා නම් අලි පැමිණීම වළක්වා ගන්න පුළුවන්. වසර පහක පමණ කාලයක් සිවිල් ආරක්ෂක බළකාය සහ ගොවි සංවිධාන එකතු වෙලා මෙම වගාව නඩත්තු කළා නම් ආයෙත් අලියට එන්න බැරි වෙනවා. මෙයින් ආර්ථික වාසියකුත් ලැබෙනවා. අලින්ගේ වගේම මිනිසුන්ගේ ජීවිතත් ආරක්ෂා වෙනවා.ගොවියාත් අලියාත් පරිසරයත් ආරක්ෂා කරගෙන ඉදිරියට යන්න පුළුවන් වැඩ පිළිවෙළකට අප යායුතුව තිබෙනවා."



දිනමිණ

# දිසත

දස අත ම එක තැන

■ කළුතර අතිරේක

## පැවිදි දිවිය සහ ජන්ම දිනය සමරා පින්කම්

වාද්දුව දෙල්දුව ගණේවත්ත පුරාණ විහාරස්ථ අධිකාරී කිලගම නන්දසාර හිමිගේ පැවිදි දිවියට වසර 29ක් ගත වීම නිමිත්තෙන් සහ 37 වන ජන්ම දිනයට සමගාමීව එම විහාරයේ ඉකුත් 10 දා ඇරඹුණු පින්කම් මාලාව ඉරිදා (13) තෙක් පැවැත්වේ.

මෙම පින්කම් අතර සම්බුද්ධ පූජා දෙවියන් සඳහා දේවදානයක්ද දෙවොල්මඩුවක්ද පැවැත්වෙන අතර 13 දින උදෑසන කුල දරුවන් සිවු දෙනකු සසුන්ගත කිරීම සහ මරණයට කැපවූ ගවයන්ට අභයදානය දීමක්ද සිදුකෙරේ. මෙම පින්කම් කිතලගම නන්දසාර හිමිගේ අනුශාසනා පරිදි දහම් පාසල් ආචාර්ය මණ්ඩලය, සිසු සිසුවියන් සහ දායක සභාව විසින් සංවිධානය කරනු ලැබේ.

■ දමන සමූහ - කේ.ඒ.මෛත්‍රීපාල





## හිඟුරාන උත්තර ජයමහා විහාරයට ධර්මාසනයක්

ඓතිහාසික කන්ද උඩරට මහනුවර දිස්ත්‍රික්කයේ සිට නැගෙනහිර පළාතේ දිගාමඬුලු පුරවරයේ හිඟුරාන උත්තර ජයමහා විහාරස්ථානය වෙත රුපියල් ලක්ෂ දෙකකට වඩා වටිනාකමකින් යුත් ධර්මාසනයක් පූජා කිරීමේ පින්කමක් හිඟුරාණ උත්තර ජයමහා විහාරස්ථානයේදී සිදු කෙරිණි. විහාරස්ථානයේ ධර්ම ශාලාවට අඩුපාඩුවක්ව පැවති ධර්මාසනයක් පූජා කළ මහනුවර දිස්ත්‍රික්කයේ කුලුගම්මන ගම්මානයේ සීතා විජේසේකර මහත්මිය සහ ආනන්ද විජේසේකර මහතා ඇතුළු එයට දායකත්වය දැරූ සියලුදෙනා වෙත පූජා කරන ලද ධර්මාසනයේ සිට විහාරාධිපති හිඟුරාණේ සිරිධම්ම හිමියෝ මෙය පූජා කිරීමේ ආනිශංස පිළිබඳ විශේෂ ධර්ම දේශනාවක් සිදු කළහ.



## සාම විනිසුරු පදවි ලබයි

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල කළමනාකරුවකු වන ඩී.ඩී. කුලරත්න මහතා මුළු දිවයිනට සමාදාන විනිශ්චයකාරවරයකු ලෙසට හෝමාගම දිසා අධිකරණ විනිසුරු මහී විජේවීර මහතා ඉදිරියේදී ප්‍රතිඥා දුනි.

ඒ මහතා බෙලිඅත්ත ගලගම ඉහළාවත්ත උපන්නකු වන අතර වර්තමානයේදී කොළඹ කොට්ටාව කටුකුරුන්ද ප්‍රදේශයේ පදිංචි වී සිටී.

ඔහු ගලගම හීන්දැළිය කනිෂ්ඨ විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබා දික්වැල්ල උතුර මහ විද්‍යාලයට ඇතුළත්ව අ.පො.ස. (සා.පෙළ) සමත්ව අ.පො.ස. (උ.පෙළ) හැදෑරීම සඳහා බෙලිඅත්ත මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් වී ඇත.

පසුව බෙලිඅත්ත කාර්මික විද්‍යාලයෙන් සිවිල් ඉංජිනේරු විද්‍යාව හදාරමින් සිටින අතරතුර 1995 වර්ෂයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ රැකියාව ලැබී ඇත. පසුකාලීනව වැඩිදුර අධ්‍යාපනය හැදෑරීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරන උපාධි පාඨමාලාව හදාරා ව්‍යාපාර කළමනාකරණ ව්‍යවසායකතිත්වපති පශ්චාත් උපාධිය ලබා ගැනීමට ඔහු සමත් වී තිබේ.

■ නිමල් විජයතුංග - ඇහැළියගොඩ විශේෂ

## මඤ්ඤොක්කා වගාවට උනන්දුවක්

මීට මාස කිහිපයකට ඉහතදී රුපියල් 60- 70 අතර මිල ගණන්වලට අලෙවි වූ මඤ්ඤොක්කා කිලෝවක මිල මේ වනවිට ඇතැම් තැනෙක රුපියල් 130 දක්වා ඉහළ ගොස් ඇති අතර ගැමි ජනතාව වෙනදාටත් වඩා උනන්දුවකින් මෙම අල වගා කිරීමට පෙලඹී සිටින බවක් පෙනී යයි. මඤ්ඤොක්කා මිල මෙතරම් ඉහළ යෑමට එක්තරා හේතුවක්වී ඇත්තේ බොහෝ ගම්බද පෙදෙස්වල මඤ්ඤොක්කා වගාවන් ඌරන් විසින් තොර තෝංචියක් නොමැතිව වනසා දමන නිසා සැළකිය යුතු තරම් ගොවීන් සංඛ්‍යාවක් මඤ්ඤොක්කා වගාව අතහැර දමා ඇති නිසායයි ද කියැවේ.

■ ආර්.එම්.විජේරත්න - හාලිඇල සමූහ



## අන්තුඩුවාවෙල - කහටගොල්ල මාර්ගය සංවර්ධනයට

දශක ගණනාවක සිට දැඩි ලෙස අබලන්ව පැවැති හාලිඇළ, අන්තුඩුවාවෙල කහටගොල්ල මාර්ගය කාපට් කොට සංවර්ධනය කිරීමේ කටයුතු මේ දිනවල ක්‍රියාත්මක වෙමින් පවතී.

හාලිඇළ- ක්වීන්ස් ටවුන් මාර්ගයේ සිට අන්තුඩුවාවෙල, කහටගොල්ල, ක්වීන්ස්ටවුන් වත්ත පහළ කොටස හරහා දිවෙන මෙම මාර්ගය බදුල්ල - කන්දේගෙදර ප්‍රධාන මාර්ගයට යාවන කීරියගොල්ල - ක්වීන්ස්ටවුන් මාර්ගය දක්වා කාපට් කොට සංවර්ධනය කෙරේ.

හාලිඇළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මෙම මාර්ගය සංවර්ධනය කිරීමෙන් හාලිඇල අන්තුඩුවාවෙල හා අවට ගම් කොටස් රාශියක පවුල් පන්සියයකට පමණ සෘජුවම ප්‍රවාහන හා ගමනාගමන පහසුකම් සැළසෙන අතර බදුල්ල - කන්දේගෙදර මාර්ගයේ හාලිඇල - කීරියගොල්ල අතර කොටසට විකල්ප මාර්ගයක් ලෙසද මෙම මාර්ගය භාවිතා කළ හැකිවීම අමතර වාසියකි.

මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය මත අයිරෝඩ් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පෞද්ගලික ඉදිකිරීම් සමාගමක් මඟින් මේ වන විට මෙහි සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතී.

■ ධම්දාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක

## සිසුවියගෙන් විදුහලට ප්‍රොජෙක්ටරයක්



අම්බලන්ගොඩ දේවානන්ද විදුහලේ පරිගණක ඒකකයට විශාල අඩු අඩුපාඩුවක්ව පැවති ප්‍රොජෙක්ටරයක් පරිත්‍යාග කිරීමට අම්බලන්ගොඩ දේවානන්ද විදුහලේ දීප්තිමත් ශිෂ්‍යාවක වන සෙත්මි දිනෝද්‍යා ජයසේකර සමත් විය.

ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයකු වන මේ දරුවාගේ පියා පැවසුවේ අපි ඉගෙන ගත් පාසල දේවානන්දයයි.. අපිට කළ නොහැකි වූ දෙයක් දරුවා කිරීම ගැන මහත් සේ සතුටු වන බවයි.

තමා විසින් එකතු කරගත් මුදලින් කළ කටයුත්තේ වටිනාකම මුදලින් මැනිය නොහැකි බව විදුහල්පති පේදුරුහේවා ජනක මහතා පැවසීය.

ආදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන සංවිධායක රුවන් ප්‍රීති කුමාර ලේකම් හිරාන් කනගරත්න යන මහත්වරුද මේ අවස්ථාවට එක්ව සිටියහ.



## 'රත්නපුර දිස්ත්‍රික් මාර්ග පද්ධතිය' එළි දකී

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ ඩබ්ලිව්.පී.සමන්තිලක මහතා විසින් සම්පාදිත 2019 වර්ෂයට යාවත්කාලීන කරන ලද තොරතුරු ඇතුළත් "රත්නපුර දිස්ත්‍රික් මාර්ග පද්ධතිය" කෘතිය එළි දැක්වීම සබරගමුව පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතාගේ ප්‍රධානත්වයෙන් සබරගමු පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී සිදු විය.

මෙම කෘතියේ රත්නපුර දිස්ත්‍රික්කයේ ජාතික මහා මාර්ග පද්ධතිය, පළාත් මාර්ග පද්ධතිය හා පළාත් පාලන මාර්ග පද්ධතිය පිළිබඳ තොරතුරු,ඒවායේ ස්වභාවය හා මාර්ග පද්ධතිය සංවර්ධනය සඳහා ප්‍රාග්ධන ආයෝජනයන් පිළිබඳ තොරතුරු ඇතුළත්වේ.

මෙම අවස්ථාවට ආණ්ඩුකාර ලේකම් ප්‍රභාත් උදාකර,පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් චාමර බමුණුආරච්චි යන මහත්වරුන් එක්ව සිටියහ.

■ සී .ගමගේ - සොරණාතොට සමූහ

## අපිරිසුදු පරිසරය පවත්වා ගෙන ගියාට 4කට නඩු

මැසි මදුරුවන් බෝවන ආකාරයෙන් අහිතකර පරිසරයක් පවත්වා ගෙන ගිය ඌව පරණගම ලකීලෑන්ඩ් වත්තේ පුද්ගලයන් සිව් දෙනකුට එරෙහිව අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කළ බව ඌව පරණගම පොලිසිය පවසයි.

ඌවපරනගම ලකීලෑන්ඩ් වත්ත, අලගොල්ල, හිව්ගෝලන්, කෝට්ටගොඩ ප්‍රදේශ වල පදිංචි සිව් දෙනකුට එරෙහිව මෙසේ නඩු පැවරීමට කටයුතු කරනු ඇතැයි පොලිසිය සඳහන් කළේය .

මොවුන් මැසි මදුරුවන් බෝවන ආකාරයෙන් අහිතකර පරිසරයක් පවත්වා ගෙන ගොස් ඇති බවත්, ඒ අනුව මොවුන්ට එරෙහිව මෙලෙස අධිකරණයේ නඩු පැවරීමට කටයුතු සිදු කළ බව පොලිසිය පැවසීය.

ඌව පළාත භාර නියෝජ්‍ය පොලිස්පති කේ.වී.ඩී.ඒ.ජේ.කරවිට, බණ්ඩාරවෙල පොලිස් අධිකාරි අතුල ද සිල්වා, සහකාර පොලිස් අධිකාරි 11 ඩී.බී.එච්. කලණසිරි යන මහත්වරුන්ගේ උපදෙස් මත ඌව පරණගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බුද්ධික ඒකනායක මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

■ තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ

## ආදාහනාගාරයේ හොල්මන්: මුරකරු සහායකයකු පතයි

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවට අයත් මාපලාන රටලංකාව වත්තේ පිහිටි ආදාහනාගාරයේ රාත්‍රී කාලයට හොල්මන් ඇතැයි එහි තනිව රාජකාරී කිරීමට නොහැකි බව පවසා ආදාහනාගාර ක්‍රියාකරු එහි සේවය සඳහා සහායකයකු ලබාදෙන ලෙස ඉල්ලා තිබේ.

පසුගිය දිනක ආදාහනයක් පිණිස පැමිණි මියගිය පුද්ගලයකුගේ නෑදෑයන් පිටත්ව යාමෙන් පසුව ආදාහනාගාර ක්‍රියාකරු තනිවම ආදාහනාගාරය තුළ මළ සිරුරේ ඉතිරි කොටස ආදාහනය කරමින් සිට තිබේ .එම අවස්ථාවේ ආදාහනාගාරය තුළින් කිසියම් ශබ්දයක් ඇසුණ බවත්, ඒ පිළිබඳ සොයා බැලීමට ඔහු ආදාහනාගාරයට ගොස් ඇති බවත් කියති. එහෙත් ආදාහනාගාරය තුළ කිසිවකුත් දක්නට නොලැබීම නිසා ආපසු යාමට හැරෙනවාත් සමගම ඔහුගේ මුහුණට වැරෙන් වැදුණ පහරක් නිසා හෙතෙම බිමට ඇද වැටී තිබේ. තමන් මද වේලාවකට පසු නැගිට ආදාහනයේ ඉතිරි වැඩකටයුතු අවසන් කිරීමට කටයුතු කළත් තවමත් අත් පාවල රිදුමක් තිබෙන බවද හෙතෙම පවසයි. මෙම ස්ථානයේ අද්භූත බලවේග ක්‍රියාත්මක වන්නේ යැයි සැක කරන බැවින් ආදාහනාගාරයේ කටයුතු සඳහා සහායකයකු ලබාදන ලෙසත්, රාත්‍රී කාලය පුරා පිරිත් දේශන ප්‍රචාරය කිරීමට ගුවන් විදුලි යන්ත්‍රයක් ලබා දෙන ලෙසත් ආදාහනාගාර ක්‍රියාකරු කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති ආනන්ද වීරසිංහ මහතාගෙන් ඉල්ලා තිබේ.

■ ඇම්.පී චන්ද්‍රපාල - තංගල්ල විශේෂ

## ගිනි අවි සමඟ සැකකරුවන් අධිකරණවලට

තංගල්ල පොලිස් අධිකාරි කොට්ඨාසයට අයත් තංගල්ල, වලස්මුල්ල, හම්බන්තොට යන පොලිස් වසම් තුළ පසුගිය දිනවල කරන ලද සෝදිසි කිරීම් වලදී ගිනි අවි නිෂ්පාදනය කරන අවි කම්හලක් ඇතුලු නිවෙස්වල සඟවා තිබු මෙරට නිපදවන ගල්කටස් තුවක්කු, බෙහෙත් කොටන තුවක්කු සමග විදේශීය රටක නිෂ්පාදනය කරන ලද ගිනි අවියක්ද සමග පුද්ගලයන් තිදෙනකුද පොලිස් අත්අඩංගුවට ගෙන ඇත.

වලස්මුල්ල පොලිස් වසමට අයත් වලස්මුල්ල අන්නාසි වත්ත ප්‍රදේශයේ ගිනි අවි කම්හලක් පවත්වා ගෙන යන බවට තංගල්ල විශේෂ කාර්යබළකා කඳවුරේ නිලධාරීන්ට ලැබුණු තොරතුරකට, අන්නාසිවත්ත ගිනිඅවි නිපදවන කම්හල වටලා ගල් කටස් වර්ගයේ ගිනි අවි දෙකක් සමග 65 හැවිරිදි පුද්ගලයකු පොලිස් අත්අඩංගුවට ගෙන ඇත.

මෙහිදී ගිනිඅවි වලට යොදන ජීව උණ්ඩ සොයා ගෙන ඇත. තංගල්ල යායවත්ත ප්‍රදේශයේ නිවෙසක් සෝදිසි කිරීමේදි ගිනි අවි දෙකක් සමග කඩු දෙකක් ළඟ තබා ගෙන සිටි පනස් පස් හැවිරිදි පුද්ගලයකු අත්අඩංගුවට ගෙන තිබේ. විදේශීය රටක නිෂ්පාදනය කරන ලද ගිනි අවියක් සමග මෙරට නිෂ්පාදනය කරන ලද ගිනි අවියක් සමග පුද්ගලයකු හම්බන්තොට කැලියපුර ප්‍රදේශයේදී කතරගම පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගත් සැකකරුවන් තංගල්ල ,වලස්මුල්ල ,හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණ වලට ඉදිරිපත් කරනු ලැබිය.

■ බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ



# අනුරපුරේ පුද්ගලයන් වැඩියෙන්ම මිය යන්නේ නියුමෝනියාවෙන්

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිය යන රෝගීන්ගෙන් වැඩිම පිරිසක් මිය යන්නේ වකුගඩු රෝගයෙන් නොව නියුමෝනියාව රෝගයට ගොදුරු වීමෙන් බව ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරි හේමා වීරකෝන් මහත්මිය අනාවරණය කළාය.

මේ වන විට ශ්‍රී ලංකාවේ බෝ වන රෝග පරදා බෝ නොවන රෝගවල ඉහළ යෑමක් පවතින බවත් එලෙසම අපගේ මරණවලින් සීයට අසූතුනක ආසන්න ප්‍රමාණයට ප්‍රධාන හේතුවන්නේ බෝ නොවන රෝග වන හෘදයාබාධ, පිළිකා, අංශභාගය, දියවැඩියාව හා කාලීනව පවතින ශ්වසන රෝග බව වෛද්‍යවරිය අනාවරණය කළාය.

අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් 2019 වසරේ රෝහල් ගතවූ රෝගීන්ගෙන් ප්‍රධාන මරණකාරකය එසේ නැතහොත් ප්‍රධාන වශයෙන් රෝගීන් මිය ගොස් ඇත්තේ නියුමෝනියා අසාධනයෙන් බව සංඛ්‍යා ලේඛන වාර්තා සඳහන් කරන බවත් නියුමෝනියාව රෝගයෙන් පසුගිය වසරේ පමණක් පුද්ගලයන් 409 දෙනකු මියගොස් ඇති බව ඒ මහත්මිය පැවසුවාය.

ඊට අමතරව දෙවනුව හෘදයාබාධවලින් 274 දෙනකු තෙවනුව වකුගඩු රෝගයෙන් 258 දෙනකු හා සිව්වනුවට රුධිරයට විෂබීජ අසාදනය වීම හේතුවෙන් මරණ 249ක් සිදුව ඇති බව ඈ අනාවරණය කළාය. 2018 වසරේදී ප්‍රධාන වශයෙන් රෝගීන් මිය ගොස් ඇත්තේ රුධිරයට විෂබීජ අසාදන එකතු වීමෙනි. එම ප්‍රමාණය 380කි. දෙවනුව නියුමෝනියා අසාදනය වීම හේතුවෙන් 322ගේ මරණ සිදු වී ඇති බවත් ඈ අනාවරණය කළාය. රෝහල් ගත වන රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා සෞඛ්‍ය අංශ විශාල වැය බරක් දරණ අතර අසාදනවලට ප්‍රතිකාර සිදු කිරීමට ඉතා ඉහළ මිල ගණන්වල ප්‍රතිජීවක ඖෂධ භාවිත කරන බවද ඈ පැවසීය.



■ විපුල එස්. කුමාරතුංග- රඹුක්කනඋතුර සමූහ

## මහ වැස්සෙන් පැසුණු ගොයමට හානි

මේ දිනවල ඇදහැළෙන වර්ෂාව හේතුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ පැසුණු ගොයමට හානි පැමිණ තිබෙනු දක්නට ලැබිණි. මේ දිනවල පවතින මෝසම් වර්ෂාවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන, මාවනැල්ල, අරණායක ඇතුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස රැසක වී ගොවිතැනට හානි පමුණුවා තිබේ.

දිස්ත්‍රික්කයේ කුඹුරු රැසක ගොයම් කපා අස්වනු නෙළා ගැනීමට ගොවීන් රැසක් සමත් වුවද, ගොවීන් සුළු පිරිසකට සිය අස්වනු කපා ගැනීමට නොහැකි වීමෙන් පැසුණු ගොයම මෙන්ම අඩක් පැසුණු ගොයම වර්ෂාව මෙන්ම සුළං තත්ත්වය හේතුවෙන් ඇතැම් යායවල්වල ගොයම් ගස් සම්පූර්ණයෙන්ම බිම ඇද වැටී තිබෙනු දක්නට ලැබේ.

■ ශ්‍යාමලී නිශාන්ති - කළුතර අතිරේක සමූහ

## ප්‍රගතිශීලි වෘත්තීය එකමුතුව සඳහා නව නිල මඬුල්ලක්

ප්‍රගතිශීලි වෘත්තීය එකමුතුවේ විධායක කමිටුව පසුගියදා (02) දින ශ්‍රී ලංකා විද්වත් වෘත්තිකවේදීන්ගේ සංගම් සංවිධාන කමිටු ශාලාවේ රැස්වී එම ප්‍රගතිශීලි වෘත්තීය එකමුතුව සඳහා නව නිලධාරි මණ්ඩලයක් පත්කර ගන්නා ලදී. ඒ අනුව සභාපති ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය හිලරි සිල්වා මහතා ද ජාතික සංවිධායක ලෙස ගාමිණී ගුණසේකර මහතාද ලේකම් ලෙස යුගාන් කුලසේකර මහතාද භාණ්ඩාගාරික ලෙස චවිත් ගමගේ මහතාද උපදේශක මණ්ඩලය සඳහා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මහතාද මහාචාර්ය සිරිමල් ප්‍රේමකුමාර මහතාද මහාචාර්ය සුරතිස්ස දිසානායක මහතාද ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ ඩී. කලන්සූරිය මහතාද ජ්‍යෙෂ්ඨ නීතිඥ තිස්ස යාපා මහතා යන මහත්වරුද පත්කර ගත්හ.

# දසත
දස අත ම එක තැන

■ එච්.එම්. රංජිත් කරුණාවීර - මාපාකඩවැව සමූහ





## හේන්ගොවිතැන තහනම් කිරීමෙන් ඇල්දෙණිය ගම්මානයේ වැසියෝ දුකේ

රිදීමාලියද්ද මොරාන ජලාශ ව්‍යාපෘතියේ ඇල්දෙණිය ගම්මානයේ හේන්ගොවිතැන නිලධාරීන් විසින් තහනම් කිරීම හේතුවෙන් ගම්වාසීහු පීඩාවට පත්ව සිටිති.

රිදීමාලියද්ද මොරාන ජලාශ ව්‍යාපෘතියේ ජලාශයට යටවන බිම් ප්‍රදේශවල ජීවත් වූ ජනතාව වෙනුවෙන් ලබා දීමට නියමිත කුඹුරු ඉඩම් පවතින රිදීමාලියද්ද, ඇල්දෙණිය ගම්මානයේ දැනට පදිංචිව සිටින ජනතාවට ස්ථිර පදිංචිව සිටි භූමියේ වගා කටයුතු තහනම් කිරීම හේතුවෙන් මහත් අසරණ භාවයකට පත්ව ඇති බවට රිදීමාලියද්ද, ඇල්දෙණිය ගම්වාසීහු චෝදනා කරති.

ජලාශයට යටවන කොටසේ පදිංචිව සිටි පිරිස් සඳහා ඇල්දෙණිය ගම්මානයේ ඉඩම්, කුඹුරු ලෙස සංවර්ධනය කර දෙන බවත් ඇල්දෙණිය ගම්මානයේ මෙතෙක් ස්ථිර පදිංචියේ සිටි පිරිසට එයින් අසාධාරණයක් සිදු වන බවත් ගම්වාසීන් වැඩිදුරටත් පවසති.





ඇල්දෙණිය ගම්මානයේ පවුල් 50කට අධික ප්‍රමාණයකට මෙම ගැටලුව උදාවී ඇති අතර ජලාශ ව්‍යාපෘතියේ අතුරු වාරි ඇළ කිහිපයක් ඇල්දෙණිය ගම්මානය හරහා ගමන් කරන බවත් ඒ සඳහා ගම්වාසීන් ස්ථිර පදිංචියේ සිටි ඉඩම් යටවන බවත්, ඒ වෙනුවෙන් වන්දියක් ලබාදෙන බවට නිලධාරීන් නොපවසන බවත් ගම්වාසීන් චෝදනා නඟන්නේ.

මොරාන ජලාශ ව්‍යාපෘති නිලධාරීන් ඒ සම්බන්ධයෙන් ගන්නා ස්ථිර විසඳුමක් පිළිබඳ ගම්වාසීන් මෙතෙක් දැනුවත් කර නොමැති බවත් වගා කිරීම් සියල්ල නවතා දැමීමට පමණක් උපදෙස් දී ඇති බවත් ගම්වාසීහු පවසති. ඒ හේතුවෙන් ගම්වාසී පවුල් 50කට අධික ප්‍රමාණයක් පීඩාවට පත්ව සිටින බව ඔවුහු පවසති.

මෙම ගැටලුව සම්බන්ධයෙන් රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් හේමන්ත දිසානායක මහතාගෙන් විමසූ අවස්ථාවේ ඒ මහතා කියා සිටියේ මෙවන් අදහසකි,

"ඇල්දෙණිය ඉඩම් ගැටලු සම්බන්ධයෙන් මේ දිනවල අපි වාර්තා ලබාගනිමින් ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් ඉන්නේ. අනවසර පදිංචිකරුවන් රැසක් ඉන්නවා. ඒ ඉඩම්වල, සමහරු අක්කර 10-15 අල්ගෙන හේන්වගා කරනවා. ව්‍යාපෘතියෙන් වන්දි හම්බවෙයි කියලා සමහරු වැඩියෙන් ඉඩම් අල්ලගෙන ඉන්නවා. ගැටලුව සහිත කොටසේ පදිංචිකරුවන් 27ක් ඉන්නවා. අපේ නිලධාරීන් මාර්ගයෙන් තොරතුරු එක් රැස් කරමින් ඉන්නවා මේ වෙනකොට. වැඩියෙන් ඉඩම් අල්ලගෙන හේන් වගා කරන කරලා තියෙන නිසාත්, වැවට ඉඩම් යටවූ අය සඳහා කුඹුරු ඉඩම් ඔය කියන ඇල්දෙණිය ගම්මානයෙන් දියයුතුව තියෙන නිසාත්, ඉඩම් මැනීම් කටයුතුවලට ගැටලු එන නිසා තමයි වගා කටයුතු තාවකාලිකව නතර කරන්න කියලා ඇත්තේ. අපි මේ සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කරමින් ඉන්නවා."

■ සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

## සම්බාහන මැඳුරක් මුවාවෙන් ගණිකා නිවෙසක් පවත්වලා

සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන මුවාවෙන් මුදලක කාන්තාවන් අලෙවි කළ මාතලේ බලකඩුව ප්‍රදේශයේ ගනිකා නිවාසටක් වටලා කාන්තාවක් හා එහි කළමණාකරු ලෙස සේවය කළ පුද්ගලයා සැකපිට අත්අඩංගුවට ගත් බව මාතලේ පොලිසිය කියයි. අදාළ නිවෙස කුලී පදනම මත ලබාගෙන සම්භාහන මධ්‍යස්ථානයක් පවත්වන මුවාවෙන් මෙම ගණිකා නිවාසය පවත්වාගෙන ගොස් ඇති එහි කළමනාරු ලෙස කටයුතු කළ පුද්ගලයා සන්තකයේ තිබී ගංජා මිලිග්‍රෑම් 890ක් පමණද අත්අඩංගුවට ගෙන ඇත. මාතලේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අනුරුද්ධ බණ්ඩාරනායක මහතාගේ උපදේස් පරිදි මාතලේ කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුගත් බණ්ඩාර මහතාගේ මෙහෙය වීමෙන් නිලධාරීන් මෙම වැටලීම සිදු කර ඇත.

■ ඩී.එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## බෙහෙත් කොටන තුවක්කු දෙකක් අත්අඩංගුවට

කුඩාඔය සහ මහකලුගොල්ල ප්‍රදේශවල පෙරේදා (09) පොලීසිය මඟින් සිදු කළ වැටලීම්වලදී බෙහෙත් කොටන තුවක්කු දෙකක් ළඟ තබාගෙන සිටි පුද්ගලයන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන ඇත.

මහකලුගොල්ල කරඹේගොඩ ප්‍රදේශයේදී අවුරුදු 26 වයසැති පුද්ගලයකු සහ කුඩාඔය ව තෙළුල්ල ප්‍රදේශයේදී අවුරුදු 56 වයසැති පුද්ගලයෙකුද බෙහෙත් කොටන තුවක්කු ළඟ තබාගෙන සිටියදී මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් සහ නඩු භාණ්ඩ සියඹලාණ්ඩුව සහ වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණවලට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

■ බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## කේරළ ගංජා සමඟ තරුණයෝ දෙදෙනෙක් අසු වෙති

මතට ඇබ්බැහිවි කේරළ ගංජා සන්තකයේ තබාගෙන සිටි තරුණයන් දෙදෙනකු කේරළ ගංජා දෙකක් සමඟ අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ඒකක එකෙහි ස්ථානාධිපතිවරයා ඇතුළු නිලධාරීන් පිරිසක් විසින් පෙරේදා (09) සවස අත්අඩංගුවට ගෙන තිබේ.

අනුරාධපුර පොලිස්වසමේ ශ්‍රාවස්තිපුර ප්‍රදේශයේ සිදු කළ වැටලීමකදී සැකකරුවන් දෙදෙනා පොලිස් අත්අඩංගුවට පත්වී තිබේ. සැකකරුවන් දෙදෙනා ගංජා සන්තකයේ තබාගෙන සිටින බවට පොලිස් නිලධාරින්ට ලැබුණු තොරතුරකට අනුව වැටලීම සිදු කර අත්අඩංගුවට ගෙන තිබුණු අතර ඔවුන්ගේ කලිසම් සාක්කු පරීක්ෂා කිරීමේදී ග්‍රෑම් දෙක හා ග්‍රෑම් හතර යන බරින් යුතු කේරළ ගංජා පැකට් දෙකක් තිබූ බව පොලිසිය පවසයි.

■ ජී.අයි.ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ

## ආනපල්ලම නිවෙසකට වන අලි ප්‍රහාරයක්



වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ආනපල්ලම පහේ කණුව ප්‍රදේශයට ඉකුත්දා (10) අලුයම කඩාවැදුණු අලියකු නිවෙසකට කළ පහරදීමක් හේතුවෙන් එම නිවෙසට දැඩි අලාභහානි සිදු වී තිබේ.

මෙම පහරදීම හේතුවෙන් නිවෙසේ බිත්ති දෙකකට දැඩි අලාභහානි සිදු වී අති අතර නිවෙසේ තිබූ ගෘහ උපකරණ හා විදුලි උපකරණ ඇතුළු භාණ්ඩ රැසකට අලාභහානි සිදුවී තිබේ. මීට මාස දෙකකට පමණ පෙර මෙම නිවෙසේ හිමිකරු ත්‍රිරෝද රථයක් හා ලොරි රථයක් ගැටීමෙන් සිදුවී අනතුරකින් මියගිය අතර දරුවන් දෙදෙනා හා බිරිය ජීවත් වූයේ මෙම නිවෙසේය.

මෙම වන අලි පහරදීම සිදු වන අවස්ථාවේ නිවෙසේ දරුදෙදෙනා හා ඔවුන්ගේ මව සිට නැත. වන අලි පහරදීම සම්බන්ධයෙන් සොයා බැලීමට ග්‍රාම නිලධාරි ඇතුළු නිලධාරීන් පැමිණ සිටි අතර දරුදෙදෙනාටත් තමන්ටත් ජීවත්වන්නට නිවෙසක් ඉදිකර දෙන්නට උදව් කරන්නැයි දරුවන්ගේ මව වන මෙල්බා විමුක්තිකා කියා සිටියාය.



■ අජිත් කුමාර - මාකඳුර සමූහ

## හඳුගල තරුණ සේවා පාලමේ වැඩ අතරමඟ

කිරමආර ඔය හරහා කැකිරිඹබඩ, මඩොල්ආර ආදී ප්‍රාද්ශවලට ගමන් කිරීමට ඇති හඳුගල තරුණ සේවා පාලමේ වැඩ අතරමඟ නතර කර තැබීම නිසා ප්‍රදේශවාසී ජනතාව දැඩි අපහසුතාවට පත්ව සිටිති.

2017 වර්ෂයේ ඇති වූ ජල ගැල්මෙන් එම ස්ථානයේ තිබූ පාලම විනාශ වී තිබිණි. අනතුරුව 2018 ජුනි මාසයේ දී නව පාලමක් ඉදි කිරීමට මුල්ගල තබා මේ වන විට පාලමේ කටයුතු 50%කටත් වඩා අවසන් කර ඇත. දැනට කිරමආර ඔය හරහා ගමන් කිරීමට තාවකාලිකව ඉදි කරන ලද පාලම ද සුළු ගංවතුරකදී පවා යට වන අතර මේ වන විට එය ඉතා අබලන් තත්ත්වයට පත්ව ඇත. තේ, පොල්, කුරුඳු, ගම්මිරිස් ආදී ආර්ථික භෝග බහුලව වගා කරනු ලබන විශාල පවුල් ප්‍රමාණයකට ගමනාගමන කටයුතුවලට සෙත සලසාලන මෙම පාලම කඩිනමින් සකස් කර දෙන ලෙස ප්‍රදේශවාසී ජනතාව ඉල්ලා සිටිති.









# මහමුදුල්ලා - මුස්ටෆිසුර්
## ශ්‍රී ලංකාවට එරෙහිව කැඳවති

තරග 3කින් සමන්විත ටෙස්ට් තරගාවලියක් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට නියමිත බංග්ලාදේශ මූලික සංචිතය නම් කිරීමට එරට ක්‍රිකට් ආයතනය කටයුතු කර තිබේ.

විසිහත් දෙනකුගෙන් සමන්විත මේ සංචිතයේ නායකයා ලෙස මොමිනුල් හක් නම් කර ඇති අතර, ඊට තුන් ඉරියව් ක්‍රීඩක 34 හැවිරිදි මහමුදුල්ලා සහ වේග පන්දු යවන ක්‍රීඩක මුස්ටෆිසුර් රහ්මාන් එක් කර තිබීම විශේෂත්වයකි.

බංග්ලාදේශ ක්‍රිකට් ආයතනය සමගින් පැවැති ටෙස්ට් තරග කොන්ත්‍රාත්තුවෙන් ඉවත් වීමට මහමුදුල්ලා පසුගිය කාලයේ දී තීරණය කර තිබීමෙන් ඔහු එරට ටෙස්ට් ක්‍රීඩක කොන්ත්‍රාත් ලැයිස්තුවට ඇතුළත් නොවීය. එමෙන්ම මුස්ටෆිසුර්ට ද එම කොන්ත්‍රාත්තුව හිමි නොවී තිබියදී මේ සංචිතයට ඇතුළත් කර තිබේ.

මේ සංචිතයට වේග පන්දු යවන්නන් 9 දෙනෙකු සහ දඟ පන්දු යවන්නන් 4 දෙනෙකු ඇතුළත් වන අතර, මේ ක්‍රීඩකයන් 27 දෙනා ඉදිරියේදී 20 දක්වා අඩු කරනු ඇත.

බංග්ලාදේශ කණ්ඩායම මේ මස 27 වැනිදා මෙරට පැමිණීමට සැලසුම් කර ඇති අතර, මෙහිදී තුන්දින පුහුණු තරග 2ක් ක්‍රීඩා කරනු ඇත.

කෙසේ වෙතත් බංග්ලාදේශ ක්‍රිකට් ආයතනයට මේ සංචාරයට එක් වන ක්‍රීඩකයන් සඳහා වීසා ලබා ගැනීමට එරට රජයේ අවසරය තවමත් හිමිව නැතැයි වාර්තා වේ.

ක්‍රීඩකයන් 20 දෙනකු ශ්‍රී ලංකාවට රැගෙන ඒමෙන් පසු පැවැත්වෙන පුහුණු තරගවලින් අනතුරුව ක්‍රීඩකයන් 17 දෙනකුගෙන් යුත් සංචිතයක් නම් කරන බවත්, ඉතිරි තිදෙනා යළි බංග්ලාදේශය බලා පිටත් කර යවන බවත් බංග්ලාදේශ ක්‍රිකට් තේරීම් කමිටු ප්‍රධානී මින්හාජුල් අබෙඩින් පවසයි.

"මෙය මූලික සංචිතයක් පමණක් වන අතර, අප මේ සියලු ක්‍රීඩකයන් සඳහා වීසා බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරමින් සිටිනවා. ඒත් සංචාරයට පෙර නේවාසික කඳවුර සඳහා හෝටලයට පිවිසෙන විට එය ක්‍රීඩකයන් 20 දක්වා අඩු කරනවා. ශ්‍රී ලංකාවට ගොස් පුහුණු තරගවලින් පසු 17 දෙනෙකුගෙන් යුත් ටෙස්ට් සංචිතය තෝරා ගන්නා අතර, අනෙක් ක්‍රීඩකයන් තිදෙනා නැවත ඩකා වෙත යවනවා."

අබෙඩින් පැවැසීය.

ලෝක ටෙස්ට් ශූරතාවලියට ඇතුළත් දෙරට අතර, මේ ටෙස්ට් තරගාවලිය ඔක්තෝබර් 24 වැනිදා මහනුවරදී ආරම්භ වීමට නියමිතය.

**බංග්ලාදේශ මූලික සංචිතය** - මොමිනුල් හක් (නායක), ටමීම් ඉක්බාල්, සද්මන් ඉස්ලාම්, සයිෆ් හසන්, ඉම්රුල් කයිස්, සෞම්‍යා සර්කාර්, මුෂ්ෆිකුර් රහීම්, මොහොමඩ් මිතුන්, ලිටන් දාස්, නස්මුල් හසන් ෂැන්ටෝ, මොසැඩෙක් හුසේන්, මහමුදුල්ලා, යසිර් අලි, නුරුල් හසන්, මෙහෙදි හසන් මිරාජ්, තයිජුල් ඉස්ලාම්, සංජමුල් ඉස්ලාම්, නයීම් හසන්, මුස්ටෆිසුර් රහ්මාන්, රුබෙල් හුසේන්, ෂෆියුල් ඉස්ලාම්, ටස්කින් අහමඩ්, අල් අමීන් හුසේන්, සයිෆුදින්, එබදත් හුසේන්, අබු ජයද්, හසන් මහමුද්.



මහමුදුල්ලා

මුස්ටෆිසුර්

# සැරසිලි - සන්දර්ශන නැති
## ජාතික මහා ක්‍රීඩා උලෙළ දෙසැම්බරයේ
## කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී



### මිලියන 5ක ඉතිරිය ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානයට

**ප්‍රින්ස් ගුණසේකර**

හතළිස්හය වැනි ජාතික මහා ක්‍රීඩා උලෙළ මේ වසරේ දෙසැම්බර් මාසයේ කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට තීරණය වෙයි.

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතාවලට මුල් තැන දෙමින් දැවැන්ත සැරසිලි හා උත්සවාකාරයෙන් තොරව මෙවර ජාතික මහා ක්‍රීඩා උලෙළ චාම් ආකාරයෙන් පැවැත්වේ. එමගින් ඉතිරි වන මුදල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීමට යොදා ගැනීමට ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා උපදෙස් දී ඇතැයි ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් අමල් එදිරිසූරිය මහතා 'දිනමිණ'ට පැවැසීය.

මේ ක්‍රමවේදය යටතේ රුපියල් මිලියන 5ක පමණ මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වනු ඇතැයි ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විශ්වාසය පළ කළේය. "සෑම වසරකම සිදුව තියෙන්නේ ජාතික මහා ක්‍රීඩා උලෙළට වෙන් වන සියලු මුදල් වැය කිරීමයි. නමුත් මෙවර අප යම් මුදලක් ඉතිරි කර ගෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනමනවා. අනවශ්‍ය සන්දර්ශන සැරසිලිවලට වැය වන මුදල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දියුණුව වෙනුවෙන් යොදවන ලෙස ඇමැතිතුමා උපදෙස් දී තිබෙනවා" අමල් එදිරිසූරිය මහතා පැවැසීය.

ජාත්‍යන්තරය ජය ගත හැකි දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන, එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ විශිෂ්ට පුහුණුව උදෙසා ජාත්‍යන්තර ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කිරීමේ අරමුණ ඇතිව මේ ශිෂ්‍යත්ව ක්‍රමය ක්‍රියාත්මක වේ. කොරෝනා වසංගත තත්ත්වය හමුවේ මෙවර ජාතික මහා ක්‍රීඩා උලෙළ සහ එයට සමගාමීව පැවැත්වෙන සියලු ක්‍රීඩා තරග සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව පැවැත්වීමටත්, ක්‍රීඩා ඉසව්වල ගුණාත්මක භාවයට මුල් තැනක් දෙමින්, ජාත්‍යන්තර තාක්ෂණ ක්‍රමවේදයන්ට අනුව තරග පැවැත්වීමටත් තීරණය වී ඇත.

ජාතික මහා ක්‍රීඩා උලෙළට සමගාමීව පැවැත්වෙන මැරතන්, පාපැදි සහ තරග ඇවිදීම ලබන ඔක්තෝබර් මස 10 සහ 11 යන දිනයන්හිදී කතරගම නගරය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වෙන අතර, එයට සෑම පළාතක්ම නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී වේ.

ජාතික මහා ක්‍රීඩා උලෙළේ දිස්ත්‍රික් තරග හා පළාත් ක්‍රීඩා තරග දැන් ක්‍රියාත්මකව පවතින අතර, පළාත් මට්ටමේ තරග ඔක්තෝබර් 31 වැනි දිනට පෙර අවසන් කිරීමට උපදෙස්දී ඇත.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් එකිනෙකා ස්පර්ශ නොවන කැරම්, බැඩ්මින්ටන්, ක්‍රිකට්, ටෙනිස්, කායවර්ධන හා බර ඉසිලීම වැනි තරග කොරෝනා තර්ජනය තිබියදීම ආරම්භ කිරීමට දිස්ත්‍රික් හා පළාත් ක්‍රීඩා ප්‍රධානීහු එකඟත්වය පළ කිරීමෙන් එම ක්‍රීඩා තරග අවසන් අදියරේ පවතී.

මේ අතර, දිස්ත්‍රික් හා පළාත් තරග ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව පැවැත්වීමට සිදුව ඇති හෙයින් වෙනත් වසරවලදී ලබාදෙන ප්‍රතිපාදනවලට අමතරව වැඩි මුදලක් ලබාදෙන ලෙස පළාත් අධ්‍යක්ෂවරු කළ ඉල්ලීම්වලට යහපත් ප්‍රතිචාරයක් දැක්වීමට ද අවධානය යොමුව පවතී.

ජාතික මහා ක්‍රීඩා උලෙළේ මුල් අදියරේ ප්‍රාදේශීය ලේකම් මට්ටමේ තරග සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය රුපියල් ලක්ෂයක් නිදහස් කරන අතර, දෙවැනි අදියරේ දිස්ත්‍රික් තරග සඳහා රුපියල් ලක්ෂ දෙකක්, තෙවැනි අදියරේ පළාත් මට්ටමේ තරග සඳහා රුපියල් ලක්ෂ තුන බැගින් නිදහස් කෙරේ. මෙවර එම මුදල වැඩි නොවන අතර, අමතරව ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් වෙනම මුදලක් පිරිනැමීම සිදු වනු ඇත.

## සීපීඑල් කිරුළ ට්‍රිනිබෑගෝට

බටහිර ඉන්දීය කොදෙව්හිදී පැවැති 8 වැනි කැරිබියන් ප්‍රිමියර් ලීග් විස්සයි20 ක්‍රිකට් තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට කිරන් පොලාඩ්ගේ නායකත්වයෙන් යුත් ට්‍රිනිබෑගෝ නයිට් රයිඩර්ස් කණ්ඩායම සමත් විය. ට්‍රිනිබෑගෝ පිල හමුවේ අවසන් තරගයේදී සාන්ත ලුසියා සූක්ස් පිල කඩුලු 8කින් පරාජයට පත් විය.

මෙවර තරගාවලියේ අපරාජිත කණ්ඩායම වූ ට්‍රිනිබෑගෝ පිල ශූරතාව දිනා ගත් සිව් වැනි අවස්ථාව මෙයයි. 2018 වසරේ තෙවැනි වරට ශූරතාව දිනා ගත් ට්‍රිනිබෑගෝ අවසන් පූර්ව වටයෙන් ඉවතට විසි විය. ඉන් පෙර 2015 සහ 2017 වසරවල ශූරතා ද ඔවුන් සතු වූහ.

## දකුණු අප්‍රිකානු ක්‍රිකට් ආයතනයේ කටයුතු අත්හිටුවයි

දකුණු අප්‍රිකානු ක්‍රිකට් ආයතනයේ කටයුතු අත්හිටුවීමට එරට ක්‍රීඩා සම්මේලනය සහ ඔලිම්පික් කමිටුව කටයුතු කර තිබේ. ක්‍රිකට් ආයතනයේ සිදුව ඇතැයි කියන අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම සඳහා මේ පියවර ගෙන ඇති අතර, සියලු පරිපාලන කටයුතුවලින් ඉවත් වන ලෙස ක්‍රිකට් ආයතනයේ නිලධාරීන්ට ලිඛිතව දන්වා ඇති ඔලිම්පික් කමිටුව එහි පරිපාලන කටයුතු භාර ගෙන ඇතැයි ද සඳහන් වෙයි.

'බරපතළ විෂමාචාර ක්‍රියා' හෙළි කළ අධිකරණ වාර්තාවක පදනම මත දකුණු අප්‍රිකානු ක්‍රිකට් ආයතනයේ හිටපු ප්‍රධාන විධායක නිලධාරී තබාං මොරෝවගේ සේවය අත්හිටුවීමත් සමග එහි අර්බුදය උග්‍ර විය. එරට ක්‍රිකට් ආයතනයේ ගුණාත්මකභාවය සහ පාලන ගැටලු ඉවත් කිරීම වෙනුවෙන් මේ පියවර ගත් බව ඔලිම්පික් කමිටුවේ වැඩබලන ප්‍රධාන විධායක රවී ගෝවේන්දර් කියයි.

කෙසේ වෙතත් අයිසීසී නීති අනුව රටක ක්‍රිකට් ආයතනයක කටයුතු සඳහා රජයේ මැදිහත්වීමක් විය නොහැකි අතර, මෙලෙස කටයුතු අත්හිටුවීමට රජය තීරණය කිරීම අයිසීසී නීතියට පටහැණි ක්‍රියාවක් වෙයි. මේ හේතුවෙන් දකුණු අප්‍රිකානු ක්‍රිකට් කණ්ඩායමට ජාත්‍යන්තර තරග තහනමක් පැනවීමේ අවධානමක් ද මතුව තිබේ.

# සෙරීනා හැඬවූ ඇසරෙන්කා හෙට නයෝමි සමඟ අවසන් සටනේ



ලොව වැඩිම ග්‍රෑන්ඩ් ස්ලෑම් කේවල ශූරතා දිනා ගැනීමේ වාර්තාව සම කිරීමේ අරමුණින් නිව්යෝක් නුවරදී අමෙරිකානු විවෘත තරගාවලියට එක් වූ ප්‍රවීණ ක්‍රීඩිකා සෙරීනා විලියම්ස්ගේ ගමන නතර කිරීමට බෙලරූස් ක්‍රීඩිකා වික්ටෝරියා ඇසරෙන්කා සමත් වූවාය.

ඊයේ පැවැති තරගාවලියේ අවසන් පූර්ව තරගයෙන් ලෝක ශ්‍රේණිගත කිරීම්වල තෙවැනි ස්ථානයේ පසු වන සෙරීනා වට 2-1කින් පරාජය කිරීමට ශ්‍රේණිගත කිරීම්වල 27 වැනි තැන සිටින ඇසරෙන්කාට හැකි විය. අවසන් මහ තරගයක උණුසුම ගත් මේ තරගයේ පළමු වටය 6-1ක් ලෙස පහසුවෙන් ජය ගැනීමට සෙරීනාට හැකි වුවත් අනෙක් වට 2ක 6-3ක් සහ 6-3ක් ලෙස ජය ගනිමින් ඇසරෙන්කා අවසන් තරගයේ ස්ථානය වෙන් කර ගත්තාය. මේ තරගයේදී සෙරීනා පාදයේ ආබාධයකට ලක් වූ අතර, තරගයෙන් අනතුරුව ඇය පැවැසුවේ ආබාධය මේ තරගයේ ප්‍රතිඵලයට හේතුවක් නොවූ බවයි.

ග්‍රෑන්ඩ් ස්ලෑම් කේවල ශූරතා 24ක් සමග ඔස්ට්‍රේලියානු හිටපු ක්‍රීඩිකා මාග්‍රට් කෝට්ගේ ලොව වැඩිම ශූරතා සංඛ්‍යාවට හිමිකම් කියන අතර, සෙරීනා සතුව ඇති ශූරතා සංඛ්‍යාව 23කි.

අනෙක් අවසන් පූර්ව තරගයෙන් අමෙරිකා ක්‍රීඩිකා ජෙනිෆර් බ්‍රැඩි පරාජය කිරීමට ජපානයෝ නයෝමී ඔසාකා සමත් වූයේ වට 2-1ක් ලෙසිනි. ඉතා තියුණු මුහුණුවරක් ගත් තරගයේ පළමු වටය 6-7ක් ලෙස නයෝමි ජයගත් අතර, දෙවැනි වටය බ්‍රැඩි ජය ගත්තේ 6-3ක් ලෙසිනි. තීරණාත්මක තෙවැනි වටය 6-3ක් ලෙස ජය ගැනීමට නයෝමි සමත් වූවාය.

මේ තරගාවලියේ කාන්තා කේවල අවසන් මහ තරගය ඇසරෙන්කා සහ නයෝමි අතර, හෙට (13) පැවැත්වෙයි.

31 හැවිරිදි ඇසරෙන්කා මේ තරගාවලි ඉතිහාසයේ අවසන් තරගයට පිවිසි තෙවැනි අවස්ථාව මෙය වන අතර, මින් පෙර අවස්ථා දෙකේදීම ඇය සෙරීනා හමුවේ පරාජයට පත් වූවාය. ලෝක ශ්‍රේණිගත කිරීම්වල සිව් වැනි ස්ථානයේ පසු වන 22 හැවිරිදි නයෝමි අවසන් තරගයට පිවිසි දෙවැනි අවස්ථාව මෙය වන අතර, 2018දී ශූරතාව දිනාගත් ක්‍රීඩිකාවයි.

ඇසරෙන්කා

නයෝමි

OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
SINCE 1978 42nd
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel

## 42 වන ඔබ්සවර් - මොබිටෙල්
### වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ..........

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: ..........

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

පාසල : ..........

ඔබේ නම : ..........

ලිපිනය : ..........

ජංගම දුරකථන අංකය : ..........

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

| | | | |
|---|---|---|---|
| **ප්‍රථම ත්‍යාගය** | : Mobitel 4G Wi-Fi router | **දෙවන ත්‍යාගය** | : රු. 2,500/- |
| **තෙවන ත්‍යාගය** | : රු. 1,500/- | **හතරවන ත්‍යාගය** | : රු. 1,000/- |

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-09-12 **අංකය** 27




## ක්‍රීඩාවෙන් පෙරට එන කොළොන්න ජාතික පාසල







ඇඹිලිපිටිය කොළොන්න ජාතික පාසල එම කලාපයේ ක්‍රීඩාවෙන් දස්කම් දක්වමින් ඉදිරියට එන පාසලකි. මේ වසරේ මුල් භාගයේ මාතර, කඹුරුපිටියේ පැවැති පාසල් බොක්සිං තරගාවලියේදී රිදී පදක්කම් දෙකක් සහ ලෝකඩ පදක්කම් 6ක් දිනා කණ්ඩායම් 50ක් අතරින් 6 වැනි තැනට පත් වූ එම විදුහල ක්‍රීඩාවේ තවත් පියවරක් ඉදිරියට තබමින් බාලිකා ක්‍රිකට් අරඹා තිබේ.

රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රිකට් ක්‍රීඩිකාවක ලෙස කලක් දස්කම් පෑ එම විදුහලේ කාන්තා ක්‍රිකට් භාර ආචාරිනී තිළිණි මනම්පේරි මෙණෙවියගේ උත්සාහයෙන් ද, පළමු මට්ටමේ ක්‍රිකට් පුහුණුකරු සහතිකලාභියකු වන විදුහල්පති පරාක්‍රම කරුණානායක මහතාගේ උනන්දුවෙන් ද විදුහලේ බාලිකා ක්‍රිකට් ක්‍රීඩාව ව්‍යාප්ත කිරීමට කටයුතු යොදා තිබේ. ඊ.එල්.චතුර ජීවන්, අනුරාධ මීගොඩගේ සහ ධනුෂිකා පිටගම්පොළ මහත්ම මහත්මීන් ද එම පාසලේ ක්‍රීඩා භාරව කටයුතු කරති. ක්‍රීඩා පුහුණුකරු ලෙස හර්ෂ වනිගසූරිය ලෙස කටයුතු කරයි. තිළිණි මනම්පේරි මෙණෙවියගේ මෙහෙයවීමෙන් පසුගියදා එහි ක්‍රිකට් වැඩමුළුවක් පැවැත්විණි. පළාත් පුහුණුකරු චමින්ද කොඩිකාර සහ දිස්ත්‍රික් පුහුණුකරු අබු රිෂාන් මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් පැවැති එම වැඩමුළුවේ අවස්ථා කිහිපයකි මේ.

2020 සැප්තැම්බර් 12 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ The Dinamina

# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ පාලනය වන අලකොල සහ මිඩ්ලන්ඩ් වතුයායන්වල දැව ගස් 529 ක් කපා ඉවත් කර විකිණීම සඳහා මුද්‍ර, තැබූ මිල ගණන් පහත ටෙන්ඩර් අංක යටතේ කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | වතුයාය | ක්ෂේත්‍ර අංකය | ඩිවිෂන් | ගස් වර්ගය | ගස් අංකය | ගස් ගණන | ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| SLSPC/PL/Tb/T-128/2020 | මිඩ්ලන්ඩ් | A | බඹරගල | ඉයුකැලිප්ටස් | 01 සිට 16 දක්වා<br>18 සිට 26 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-129/2020 | මිඩ්ලන්ඩ් | A | බඹරගල | ඉයුකැලිප්ටස් | 27 සිට 35 දක්වා<br>37 සිට 47 දක්වා<br>49 සිට 53 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-130/2020 | මිඩ්ලන්ඩ් | A | බඹරගල | ඉයුකැලිප්ටස් | 55 සිට 64 දක්වා<br>66 සිට 69 දක්වා<br>71 සිට 81 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-131/2020 | මිඩ්ලන්ඩ් | A | බඹරගල | ඉයුකැලිප්ටස් | 82 සිට 87 දක්වා<br>89 සිට 99 දක්වා<br>101 සිට 108 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-132/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් | 01 සිට 25 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-133/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් | 28 සිට 32 දක්වා<br>34,35, 37, 38, 39, 40,<br>41 සිට 59 දක්වා | 31 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-134/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් | 61 සිට 75 දක්වා<br>77, 79, 80, 82 සහ<br>84 සිට 89 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-135/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් | 90 සිට 114 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-136/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් / රෙඩ්ගම් | 115 සිට 121 දක්වා<br>123, 125 සිට 132 දක්වා<br>සහ 134 සිට 142 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-137/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් / රෙඩ්ගම් | 143 සිට 149 දක්වා<br>151 සිට 155 දක්වා<br>157 සිට 169 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-138/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් / රෙඩ්ගම් | 170 සිට 178 දක්වා<br>180, 181, 182 සහ<br>187 සිට 190 දක්වා<br>197 සිට 203 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-139/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් / රෙඩ්ගම් | 205 සිට 213 දක්වා<br>215 සිට 219 දක්වා<br>221, 222, 224 සිට<br>229 දක්වා සහ<br>232, 235, 236 | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-140/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් / රෙඩ්ගම් | 238 සිට 241 දක්වා<br>243 සිට 255 දක්වා<br>256 සිට 263 දක්වා | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-141/2020 | මිඩ්ලන්ඩ් | B | බඹරගල | ඉයුකැලිප්ටස් / රෙඩ්ගම් | 264, 265, 267 සිට<br>273 දක්වා සහ 275<br>සිට 281 දක්වා<br>283, 285, 286, 288<br>සිට 297 දක්වා | 29 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-142/2020 | අලකොල | 8SD | ඉහළ කොටස | ඉයුකැලිප්ටස් | 96, 97, 98, 99, 100, 101,<br>102, 103, 104, 106, 107,<br>108, 109, 110, 111, 112,<br>113, 114, 115, 116 | 20 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-143/2020 | අලකොල | 8SD | ඉහළ කොටස | ඉයුකැලිප්ටස් | 117, 118, 119, 120, 121,<br>122, 123, 124, 125, 126,<br>127, 128, 129, 130, 133,<br>134, 135, 137, 138, 139 | 20 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-144/2020 | අලකොල | 17 SD | රත්නතැන්න | ඉයුකැලිප්ටස් | 1, 6, 8, 10, 12, 21, 33, 34,<br>35, 38, 40, 43, 44, 46, 47,<br>55, 57, 66 | 27 | රු. 100,000.00 |
| | | 18 SD | | | 7, 9, 12, 13, 15 | | |
| | | 19 SD | | | 5, 11, 14 | | |
| SLSPC/PL/Tb/T-145/2020 | අලකොල | 06 | වටකැලේ | ඉයුකැලිප්ටස් | 53, 55, 56, 60, 62, 71, 72,<br>73, 74, 77, 78, 84, 87, 90,<br>93, 94, 95, 97, 100, 101 | 20 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-146/2020 | අලකොල | 06 | වටකැලේ | ඉයුකැලිප්ටස් | 108, 112, 115, 116, 118,<br>121, 122, 124, 125, 126,<br>127, 128, 130, 131, 132,<br>133, 136, 137, 138, 139,<br>140, 141, 142, 144, 145 | 25 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-147/2020 | අලකොල | 8 SD | ඉහළ | ඉයුකැලිප්ටස් | 180, 182 සිට 197 දක්වා | 17 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-148/2020 | අලකොල | 8 SD | ඉහළ | ඉයුකැලිප්ටස් | 01 සිට 11 දක්වා<br>15 සිට 17 දක්වා<br>20, 21, 24, 26, 27, 28 | 20 | රු. 100,000.00 |
| SLSPC/PL/Tb/T-149/2020 | අලකොල | 8 SD | ඉහළ | ඉයුකැලිප්ටස් | 30 සිට 34 දක්වා<br>36 සිට 38 දක්වා<br>40 සිට 51 දක්වා | 20 | රු. 100,000.00 |

මිල ගණන් සඳහා වූ කොන්දේසි සහ මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා වූ පෝරම ඇතුළත් ටෙන්ඩර් ලියවිලි රාජ්‍ය වැවිලි සංස්ථාවේ කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් හෝ ගල්පිහිල්ල වතුයායේ පිහිටි ප්‍රාදේශීය කාර්යාලයෙන් රු. 2000/- ක මුදලක් ගෙවා **2020.09.28 දින ප.ව. 3.00 දක්වා** මිලදී ගත හැකිය.

එම ලියවිලි රාජ්‍ය වැවිලි සංස්ථාවේ කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට **2020.09.29 දින පෙ.ව. 10.30 ට පෙර බහාලිය යුතු අතර, එදිනම පෙ.ව. 11.00** ට ප්‍රධාන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

2020.09.28 දින ප.ව. 3.00 ට පසු කිසිදු හේතුවක් නිසා ටෙන්ඩර්පත් නිකුත් නොකරන අතර, යම්කිසි මිල ගණනක් හෝ මිල ගණන් කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ප්‍රසම්පාදන මණ්ඩලය සතු වන අතර, එය අවසාන තීරණයද වේ.

**සභාපති,**
**ප්‍රසම්පාදන මණ්ඩලය,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක 21, මීරානියා පාර, කොළඹ 12.**
**දිනය 2020.09.09** **විමසීම් : 0115-235749**

Uva Wellassa University

## "ජාතික සංවර්ධනයේ සාඩම්බර දායකයකු වන්න"

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සම්පත් ක්ෂේත්‍ර ඉලක්ක කොට ඊට වැඩි වටිනාකමක් ලබා දෙන නව ප්‍රවණතා නිර්මාණය කරයි. මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික පාඨමාලා පළමු උපාධි, ආයතනික පුහුණු සහ වැඩිදුර අධ්‍යාපන ධාරා ඔස්සේ සේවා යෝජකයින්ගේ නිෂ්පාදනවල අගයන් පුළුල් කරන කාර්යක්ෂම උපාධිධාරී පරපුරක් බිහි කරනු ඇත. ජාතික සංවර්ධනයට සහභාගී වන සාඩම්බර දයකයකු වීමට ඔබට කරන ඇරයුමයි.

## ප්‍රසම්පාදන දැන්වීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් විශ්වවිද්‍යාලය සඳහා පහත සේවා සැපයීමට සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍රයට අනුව මිල ගණන් කැඳවනු ලැබේ.

| අංකය | විස්තරය | ටෙන්ඩර් අංකය | ලංසු ඇපකරය |
|---|---|---|---|
| 01 | ශ්‍රමසේවා සැපයීම | යූඩබ්යූ/ජීජ් /05/එම් පීඑස්/2020-2021 | රු. 425,000.00 |

ඉල්ලුම්කරුවන් පෙ.ව 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුළ ටෙන්ඩර්පත්‍ර මිලදී ගැනීම සඳහා ලිඛිත අයදුම්පත සමග එක් ටෙන්ඩර්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු.10,000.00 ක මුදලක් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබා ගත් රිසිට්පත හෝ විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 3114820 ට ලැබෙන සේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) වෙත ඉදිරිපත් කිරීමෙන් 2020-09-14 දින සිට 2020-10-02 දින දක්වා අවශ්‍ය ටෙන්ඩර්පත්‍ර ලබා ගත හැකිය. ටෙන්ඩර්පත් http://www.uwu.ac.lk/procurement/ යන විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මගින්ද ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මගින් ටෙන්ඩර්පත් ලබාගන්නා ඉල්ලුම්කරුවන්, **"ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය"** නමින් නිකුත් කළ රු.10,000.00 ක් වටිනා ආපසු නොගෙවන බැංකු තැන්පතුවක් විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 3114820 ට ලැබෙන සේ මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත ටෙන්ඩර්පත් සමග අමුණා එවිය යුතුය. ටෙන්ඩර්පත් මිලදී ගැනීමට පෙර ඉල්ලුම්කරුවන් හට නොමිලයේ ටෙන්ඩර්පත් පරීක්ෂා කළ හැකිය.

මිල ගණන් ඉදිරිපත් කිරීම 2020.10.05 වෙනි දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර සිදු කළ යුතු අතර, මිල ගණන් 2020 ඔක්තෝබර් මස 05 වන දින ප.ව. 2.30 පසු වූ වහාම විවෘත කරනු ලැබේ. විවෘත කිරීමේ අවස්ථාවට ඉල්ලුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට (බලයලත් ලිපියක් සමඟ) සහභාගි විය හැක. ටෙන්ඩර්පත්‍රය බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ ටෙන්ඩර් අංකය සඳහන් කළ යුතු අතර, මිල ගණන් ඉදිරිපත් කිරීම ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් මෙම ලිපිනයට ගෙනවිත් ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

වැඩි විස්තර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) 055-2226470 දුරකථන අංකයෙන් ලබා ගත හැකිය.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල.**
**2020.09.12**

# සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

# සිවිල් ගුවන් සේවා අධිකාරිය

## 196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම

මගීන්, නැව් භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය සඳහා කුලී මෙහෙයුම් සහ විධිමත් ප්‍රවාහන සේවාවක් (International -Charter Operation/Regular Operation)රට තුළ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා පනත (Act No. 14 of 2010) හා ඊට අදාළ රෙගුලාසි හා කොන්දේසි වලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය සහ බලපත්‍රය ලබා ගැනීම සඳහා කඳාන, හල්පෙ මාවත, අංක 33/1 හි පිහිටි ස්පාර්ක් එයාර් (SPARK AIR)විසින් 2020 සැප්තැම්බර් මස 08 දතමින් ඉල්ලුම් පත්‍රයක් 2020 සැප්තැම්බර් මස 09 වන දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ව්‍යාපාරික නාමය ලෙස ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනය නමින් හඳුන්වන ආයතනය වෙළඳ නාමය වශයෙන් ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනය යන නම භාවිත කරයි. අයදුම්පතට අනුව ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනයේ (SPARK AIR (PRIVATE) LIMITED) අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය.

**කපිතාන් රොබට් එල්. ස්පිට්ල්**
**කපිතාන් මොහොමඩ් රම්සි රහීම්**
**කපිතාන් සමින් අත්තනායක**
**කපිතාන් අශාන් ද අල්විස්**
**සුරන්ජන් ද සිල්වා මහතා**

ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනයේ (SPARK AIR (PRIVATE) LIMITED) එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම සහ කළමනාකාරීත්වය සඳහා කපිතාන් මොහොමඩ් රම්සි රහීම් මහතා නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නො.152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක, සිවිල් ගුවන් සේවා අධිකාරියේ 4 වන මහලෙ හි පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර, ඕනෑම වැඩකරන දිනෙක කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂාකර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate) ඇතුළු අනෙකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, සිවිල් ගුවන් සේවා පනත, ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරුපද්‍රිතවූත් ආරක්ෂිතවූත් කාර්යක්ෂමවූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවල 2020 ඔක්තෝම්බර් මස 20 වන දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10 කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කර ගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසි වලට අනුකූලව මා වෙත සංදේශනය කළ හැකිය. අන්තර්ගත සියලු ප්‍රකාශන වල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය. එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශයට අමුණා තිබිය යුතුය.

**කපිතාන් තේමිය අබේවික්‍රම,**
**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ**
**ප්‍රධාන විධායක නිලධාරී.**

**2020 සැප්තැම්බර් මස 10 වෙනි දින**
**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය**
**අංක152/1,මිනුවන්ගොඩ පාර,**
**කටුනායක.**

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## පුරප්පාඩු

**කැලණිය විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**

### 01. කළමනාකරණ සහකාර (පොත් තබන්නා) III ශ්‍රේණිය තනතුර

**සුදුසුකම් :**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එකම වතාවක දී විෂයයන් හයකින් (06) සමත් විය යුතු අතර, අවම වශයෙන් විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිත විය යුතුය. එසේ සම්මාන සාමාර්ථ ලබා ගත් විෂයයන් අතරට සිංහල/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය හා ගණිතය යන විෂයයන් ඇතුළත් විය යුතුය.
2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එකම වතාවක දී සියලුම විෂයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

සටහන : **තනතුරට අදාළ විශේෂ සුදුසුකම්,**

i. ජාතික ගණකාධිකරණ තාක්‍ෂණික සහතිකය කාර්මික විද්‍යාලයකින් /කාර්මික තාක්ෂණ ආයතනයකින් ලබා තිබීම හෝ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ පිළිගත හැකි සහතිකය

හෝ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය වාණිජ අංශයෙන් සමත්වී තිබීම.

සටහන : **පහත සඳහන් අමතර සුදුසුකම් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.**

(අ) මාස හයකට නොඅඩු කාලයක් පිළිගත් ආයතනයක පරිගණක භාවිතය පිළිබඳ සුදුසුකමක් ලබා තිබීම

සහ

(ආ) පරිගණක භාවිත පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද

සටහන : (a) **ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුයි.**
(b) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට අඩු නොවියයුතු අතර, 30 ට නොවැඩි විය යුතුයි.
(c) මනා චරිතයකින් විය යුතුයි.

**තෝරා ගැනීම** : ලිඛිත පරික්ෂණයක් හා සම්මුඛ පරික්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය :**

U-MN1(III) රු. 30,725 –17X300 –35,825 (මාසික)

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (V) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

### 02. කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

(I) අ.පො.ස (සා/පෙළ) විභාගයේ

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක වරක දී සමත්ව තිබීම

සහ

(II) අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

සහ

ගබඩාකරණය පිළිබඳ එක් අවුරුදු පළපුරුද්දක් සහ/හෝ අ.පො.ස. (සා/පෙළ) විභාගයේ

වාණිජ්‍යය විෂය සමත්වීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ගණකාධිකරණ විෂය සමත් වීම.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ). පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ සුදුසුකම්

සහ

(ආ). පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

සටහන : (a) **ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුයි.**
(b) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට අඩු නොවියයුතු අතර, 30 ට නොවැඩි විය යුතුයි.
(c) මනා චරිතයකින් විය යුතුයි.

**වැටුප් ක්‍රමය :**

U-MN 1(III) රු. 30X725 –17X300 –35,825 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (V) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සටහන** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනය තීරණය කර ඇති පරිදි ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුයි.

### 03. කළමනාකරණ සහකාර (සරප්) III ශ්‍රේණිය තනතුර

**සුදුසුකම් :**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එකම වතාවක දී විෂයයන් හයකින් (06) සමත් විය යුතු අතර, අවම වශයෙන් විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිත විය යුතුය. එසේ සම්මාන සාමාර්ථ ලබා ගත් විෂයයන් අතරට සිංහල/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය හා ගණිතය යන විෂයයන් ඇතුළත් විය යුතුය.

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරකදී ගණකාධිකරණය ඇතුළුව සියලුම විෂයන් (සාමාන්‍ය පොදු පරීක්‍ෂණය හැර) සමත් වී තිබීම.

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

(අ) මාස හයකට නොඅඩු කාලයක් පිළිගත් ආයතනයක පරිගණක භාවිතය පිළිබඳ සුදුසුකමක් ලබා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද

සටහන : (a) ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුයි.
(b) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට අඩු නොවියයුතු අතර, 30 ට නොවැඩි විය යුතුයි.
(c) මනා චරිතයකින් විය යුතුයි.
(d) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනය තීරණය කර ඇති පරිදි ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුයි.

**වැටුප් ක්‍රමය :**

U-MN 1(III) රු. 30,725 –17X300 –35,825 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (V) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : ලිඛිත පරික්ෂණයක් හා සම්මුඛ පරික්ෂණයක් මගිනි.

### 04. පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

(I).(අ). ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය හෝ සමාන සුදුසුකම් සමඟ වර්ෂ තුනක පළපුරුද්ද (ජාතික තාක්ෂණ පිළිබඳව සහතික පාඨමාලාව හැදෑරීමේ කාලය තුළදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.

හෝ

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම හා රාජ්‍ය /පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරීක්ෂකවරයෙකු ලෙස වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්‍ෂණයක් මගිනි.

**වැටුප් ක්‍රමය :**

UMT1 (III) රු. 31,625 –7X300;10X355–37,275 (මාසික)

(කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතර රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

### 05. පරිපාලක (විදුලි) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

(I).(අ). ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය හෝ සමාන සුදුසුකම් සමඟ වර්ෂ තුනක පළපුරුද්ද (ජාතික තාක්ෂණ පිළිබඳව සහතික පාඨමාලාව හැදෑරීමේ කාලය තුළදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.

හෝ

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම හා රාජ්‍ය /පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරීක්ෂකවරයෙකු ලෙස වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්‍ෂණයක් මගිනි.

**වැටුප් ක්‍රමය :**

UMT1 (III) රු. 31,625 –7X300;10X355–37,275 (මාසික)

(කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ .මෙයට අමතර රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

### 06. පරිපාලක (භූමිදර්ශක) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

I. සිංහල /දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සහිතව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සා/පෙළ සමත් වීම

සහ

II. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන වසරක ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් තිබීම

**වයස** : වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්‍ෂණයක් මගිනි.

**වැටුප් ක්‍රමය :**

UMT1 (III) රු. 31,625 –7X300;10X355–37,275 (මාසික)

(කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය)

මෙයට අමතර රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

### 07. තනතුර : වැඩ අධිකාරි (සිවිල්) - II ශ්‍රේණිය

**සුදුසුකම් :**

I. (a) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) (සිවිල්) හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ සේවයේ වසර හතරක (04) පළපුරුද්දක් ලබා තිබීම.

සැ.යු: වසර හතරක පළපුරුද්ද සඳහා පාඨමාලාවට අදාළ පුහුණු කාලය ගණනය නොකෙරේ.

(b) ජාතික තාක්ෂණික සහතික පත්‍රය (NCT) (සිවිල්) හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ එම සුදුසුකම ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය :**

UMN 2(11) - 37,275 - 18X495 - 46,185 (මාසික)

(කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 (V) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය)

මෙයට අමතර රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

### 08. තනතුර : වඩු කාර්මික (II ශ්‍රේණිය) තනතුර

**සුදුසුකම් :**

I. කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය.

II. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණතාවක් ලබා සිටිය යුතුය.

(අ) ගොඩනැගිලි සහ ලීබඩු උපකරණ සකස් කිරිමේදී ඊට අදාළ විවිධ වර්ගයේ සම්බන්ධ (Joints) පිළිබඳ දැනුම සහ ඒවා සකස් කිරීමට ඇති හැකියාව.

(ආ) විවිධ වර්ගයේ මෙවලම් (Tool) හඳුනාගැනීමේ හැකියාවල සැලසුම් කියවීමේ හැකියාව සහ විවිධ වර්ගයේ ලී හඳුනාගැනීමේ හැකියාව.

(ඇ) අඟල් 1/32 දක්වා වූ පරිමාණයන් නිවැරදිව කියවීම සම්බන්ධයෙන් මනා දැනුමක් තිබීම.

III. වඩු කර්මාන්තය පිළිබඳ වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

සේවා පළපුරුද්දට අදාළ සේවා සහතිකවල පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත් අදාළ සේවා පළපුරුද්ද නොමැති සේ සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**වයස** : වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**සටහන** : හත්වෙනි ශ්‍රේණිය සමත් වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය :**

(U-PL 3 III) රු. 29,915 - 16X270 - 34,235 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : වෘත්තීය පරික්ෂණයක් හා සම්මුඛ පරික්ෂණයක් මගිනි.

### 09. තනතුර : පැළ තවාන්කරු - II ශ්‍රේණිය

**සුදුසුකම් :**

(1) කියවීමේ හා ලිවීමේ හැකියාව

(2) අතු මගින් ප්‍රචාරණය, "layering, in archings", රිකිලි බද්ධය, අංකුර බද්ධය සහ බඳුන්ගත කිරීම වැනි ක්‍රමවේද පිළිබඳව හා පැළ තවාන් කලමනාකරණය හා ශාක කප්පාදුව පිළිබඳ මනා දැනුමක් තිබීම.

(3) ගොවිපළෙහි හෝ ගෙවත්තෙහි වගා කරන විවිධ පැළ වර්ග හා බීජ වර්ග හඳුනා ගැනීමට හැකියාව තිබිය යුතුය.

(4) බෙදාහැරීම සඳහා පැළ ඇසුරුම්කරණය පිළිබඳ දැනුමක් තිබීම.

(5) පැළ තවාන්කරුවකු ලෙස වසර 02ක පමණ පළපුරුද්දක් තිබීම.

**වයස** : වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය :**

U-PL 2 (III) Rs. 28,025 - 16X270 - 32,345 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරාගැනීම** : යෝග්‍යතා පරික්ෂණයක් හා සම්මුඛ පරික්ෂණයක් මගින්

### 10. තාක්ෂණ නිලධාරී (ICT) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

(I) අ.පො.ස (උ/පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) එකම වතාවකදී විද්‍යා විෂය ධාරාවේ විද්‍යා විෂයයන්ගෙන් සමත් වීම, විෂය සංකලනය දෙපාර්තමේන්තුවේ නිර්දේශය පරිදි අදාළ පීඨය මගින් තීරණය කරනු ලැබේ.

සහ

(II) තොරතුරු සන්නිවේදනය සහ බහු මාධ්‍ය තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය හෝ සමාන ක්ෂේත්‍රයක තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණ /වෘත්තීය අභ්‍යාස ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරනු ලබන, ජාතික වෘත්තීය කුසලතා NVQ 5 මට්ටම හෝ නොඅඩු මට්ටමක නිපුණතා සහතිකයක් ලබා තිබීම.

ICT (තොරතුරු සන්නිවේදන තාක්ෂණ) ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සහිත අයහට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස** : අවුරුදු 18 ට අඩු නොවියයුතු අතර, 45 ට නොවැඩි විය යුතුයි.

**වැටුප් ක්‍රමය :**

UMT1 (III) - 31,625 –7X300; 10X355 - 37,275 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම** : ලිඛිත සහ/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය

ඉල්ලුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය. (www.kln.ac.lk) නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර 2020 සැප්තැම්බර් මස 28 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **සහකාර ලේඛකාධිකාරී / ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් හට වයස් සීමාව බල නොපාන අතර, ඔවුන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාල සතුය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අයදුම්පත් කිසිදු හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී**
**කැලණිය විශ්වවිද්‍යාලය.**
**2020.09.09**

www.adz.lk
it's what you want

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

## බදු දේපළ ප්‍රසම්පාදනය 2021

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත්**

## මස්කඩ / කඩ කාමර / සති පොළ / එළදාව

**යන දේපළ 2021 වර්ෂයට බදුදීම සඳහා සුදුසු අයදුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ**

- දේපළ පිළිබඳ උපලේඛනය සහ උප කාර්යාලවල හා බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතනවල දැන්වීම් පුවරුවල පළ කෙරේ.
- උපලේඛනයේ දක්වා ඇති පරිදි නියමිත ඇප මුදල් හා අයදුම්පත් ගාස්තු ගෙවා අප කාර්යාලයෙන් ලබාගන්නා ලද අයදුම්පත් මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.
- ලංසු අයදුම්පත් ලබා ගැනීමේදී අයදුම්කරුවන් සිය අනන්‍යතාවය තහවුරු කළ යුතුය.
- ලංසු අයදුම්පත රු. 500.00 ක ලංසු අයදුම්පත් ගාස්තුව ගෙවා සභා ප්‍රධාන කාර්යාලයෙන් ලබාගන්න.
- ලංසුපත් නිකුත් කිරීම හා ලංසු භාරගැනීම 2020.09.12 සිට 2020.09.29 දින ප.ව. 2.00 දක්වා හා ලංසු විවෘත කිරීම 2020.09.29 පස්වරු 2.30 ට වෙන්නප්පුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී සිදු කෙරේ.
- මුද්‍රා තබන ලද ලංසු **"ලේකම්, ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව"** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාර දෙන්න.
- මෙම ප්‍රසම්පාදනය ලංසු ලේඛන සමග ලබාදෙන කොන්දේසිවලට යටත් වේ.
- වැඩි විස්තර – **දුරකථන අංක** : **031-2255276 / 031-2255379**
  **ෆැක්ස්** : **031-2253249**


**ලේකම්, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.**

# වී සයිලෝ ගබඩා සංකීර්ණ භාවිතා කිරීම සඳහා මූලික යෝජනා සඳහා ආරාධනා කිරීම

## වී අලෙවි මණ්ඩලය (PMB)

හසලක, ඉඟිනියාගල, පොළොන්නරුව සහ ගල්ගමුව යන ස්ථානවල ඉදි කරන ලද කොන්ක්‍රීට් සයිලෝ සංකීර්ණ හතරක් මණ්ඩලය සතුව ඇත. මෙම සමහර සංකීර්ණවල වී ගබඩා කිරීම සහ සැකසීම් කටයුතු 1976/7 දී ආරම්භ කර වසර කිහිපයක් පවත්වා 1983/4 දී අතහැර දමන ලදී.

කොන්ක්‍රීට් වැඩ තවමත් හොඳ තත්ත්වයේ පවතින නමුත් වැසි ජලය කාන්දු වීම නැවත්වීම සඳහා ප්‍රතිකර්ම අවශ්‍යවේ. බොහෝ යාන්ත්‍රික කටයුතු දුර්වල තත්ත්වයේ හෝ නොපවතී. පුළුවන් අවශ්‍යතාවයක් සඳහා මෙම සයිලෝ සංකීර්ණය අලුත්වැඩියා කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා මණ්ඩලය උනන්දු වෙයි.



**හැකි භාවිතයන් පිළිබඳ මූලික අදහස්;**

01. වී ගබඩා කිරීම සහ ඇඹරීම : වී ගබඩා කිරීම සඳහා නව හෝ නැවත සකස් කරන ලද යාන්ත්‍රික සංවහන පද්ධති සහිත සයිලෝ භාවිතා කළ හැකිය. විකල්ප කිහිපයක් තිබේ.
    a. බර පාලම් සහිත විශාල මෝල්වලට තොග වශයෙන් ප්‍රවාහනය කිරීම.
    b කුඩා මෝල් වෙත ප්‍රවාහනය සඳහා ස්වයංක්‍රීය බර/ බෑග් සහිත
    C. අලුත් සහල් මෝලක් සහිත ගබඩා හා ඇඹරුම් සංකීර්ණ
02. බඩඉරිඟු සහ සෝයා බෝංචි මිනිස් පරිභෝජනය හෝ සත්ව ආහාර සඳහා ගබඩා කිරීම සහ සැකසීම මේ සඳහාද යාන්ත්‍රික සංවහන පද්ධති අවශ්‍ය වේ. වී සහ බඩ ඉරිඟු/ සෝයා බෝංචි වල භෞතික ගුණාංග අතර වෙනස්කම් හේතුවෙන් ගබඩා ධාරිතාව අඩු කළ යුතුය. සමහර හැකියාවන් නම්;
    a. තොග ප්‍රවාහනය සමඟ ගබඩා කිරීම.
    b. ස්වයංක්‍රීය කිරුම්/ බෑග් සහිත ගබඩා කිරීම
    c. ගබඩා කිරීම සහ සැකසීම
03. වෙනත් හැකියාවන්

    මෙහි සඳහන් කර නොමැති වෙනත් විභව භාවිතයන් සඳහා මණ්ඩලය විවෘතය.

සයිලෝ සංකීර්ණ පිළිබඳ වැඩිදුර තොරතුරු සම්බන්ධ කර ගැනීමෙන් ලබා ගත හැකිය.

යෝජනා 2020-10-01 දිනට ප්‍රථම යොමු කළ යුතු වේ.

**ජටාල් ඩී මාන්නම්පෙරුම, සභාපති, වී අලෙවි මණ්ඩලය.**
**දුරකථන : 077-2267175**
jatalm@live.com

# ලුහුඬු දැන්වීම්

## රථවාහන

**129**

**ටයර් සහ ටියුබ්**

සේවා

ටයර් ටියුබ් JCB බැකෝ ටයර් ගෙන්වන්නෝ - මෝටර් ග්‍රේඩර් වගකීමක් සහිත පිරවු ටයර් 1100x20 - 1000x20, 1000x20 ආර්පිඩැග් ටයර් අළුත් 12x5x18 සියලුම ක්‍රෙඩිට් කාඩ් භාර ගනිමු. 155, ක්‍රවුන් ටයර්, කොළඹ 14. 0773134060, 0112344524, 011-2449558. 18x4x26, 20x5x25 *053163*

## නාමය වෙනස් කිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 162/K, සපුමල් උයන, කැන්දලියද්ද පාලුව, ගණේමුල්ල යන ලිපිනයෙහි පදිංචි **වර්ධරාජා මංජුල තිරෝෂාන් ප්‍රසන්න රාජා** (ජාතික හැඳුනුම්පත් අංක 812704222V) යන නමින් හැඳින් වූ මා මෙතැන් පටන් **වින්සෙන්(Z)සෝ මංජුල තිරෝෂන් ප්‍රසන්න රොද්‍රිගස්** යනුවෙන් භාවිත කරන බව මෙයින් දන්වා සිටිමි.

## නම වෙනස් කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ වෙල්ල වීදියේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 23/6, දුම්රිය පටුමග, කොළඹ 02 ලිපිනයේ පදිංචි **ඉරේෂා කුමුදුනි ද සේරම්** වන මා විසින් මාගේ දරුවා වන **ෆාතිමා ශයිමා රයිස්ඩීන්** මෙතැන් පටන් **ශයිමා නවරත්න** යන නමින් හඳුන්වනු ලබන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**මෙයට,**
**අයි.කේ. ද සේරම්.**

# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## ටෙන්ඩර් දැන්වීම

## නිෂ්කාශණය නොවූ නැව් බඩු විකිණීම

**ටෙන්ඩර් අංක 437**

**ටෙන්ඩරය පවත්වන දිනය 23/09/2020**

කොළඹ වරායේ ගුදම් හා අංගනවල තැන්පත්ව ඇති පහත සඳහන් භාණ්ඩ මිලදී ගෙන ඉවත් කර ගැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

**ටෙන්ඩර් අංක 437**

| | |
|---|---|
| රෝද තුනේ බයිසිකලය | Empty LPG Cylinder |
| පොලිතින් ගෝනි | ස්වභාවික ගල් |
| ශීතකරණ | Flexi bag Aqua Wax |
| ක්‍රීඩා භාණ්ඩ | රසායනික ද්‍රව්‍ය |
| ඇහුරුම් ද්‍රව්‍ය (Packing Material) | රෙදි පිළි/ භාවිත කරන ලද ඇඳුම් |
| ටයිල්/ බිත්ති ටයිල් | බුමුතුරුණු (Carpet) |
| Marble Block | මුළුතැන්ගේ උපකරණ |
| Talc Ds/ Grad Lumps (Bulk) | ලී, ශෛලමය, යකඩ අත්කම් |
| Compaction Ground | Solar Power Plant |
| Aluminium Foil | ගෘහ උපකරණ |
| ගෘහ භාණ්ඩ | යකඩ ගෘහ භාණ්ඩ |
| රෙදි | විදුලි උපාංග |
| පාවිච්චි කරන ලද යන්ත්‍ර | මෝටර් බයිසිකල් අමතර කොටස් |
| වාහන අමතර කොටස් | ආහාර ද්‍රව්‍ය |
| | සහ වෙනත් වෙළඳ ද්‍රව්‍ය යනාදිය |

අදාළ ටෙන්ඩර් ලැයිස්තු ආපසු නොගෙවනු ලබන රු. 250/= ක මුදලක් සහ එකතු කළ අගය මත බදු ගෙවීමෙන් කොළඹ 01 ඕල්කට් මාවතේ අංක 11 හි පිහිටා ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා සැපයුම් කොට්ඨාසයේ විකුණුම් අංශයේ කාර්යාලයෙන් 14/09/2020 දින 10.00 පැයේ සිට 21/09/2020 දින 14.30 පැය දක්වා කාලය තුළ ලබාගත හැකිය.

වැඩි විස්තර සඳහා (www.slpa.lk) වෙබ් අඩවියට පිවිසෙන්න.

**ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්)**
**12/09/2020 දිනදී**
**සේවා සැපයුම් කොට්ඨාසය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**අංක 11, ඕල්කට් මාවත, කොළඹ 01.**

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## ටෙන්ඩර් සඳහා ඇරයුම

## හොරණ අපනයන සැකසුම් කලාපීය භූමියේ ගොඩ ගසා ඇති විශාල ප්‍රමාණයේ කළුගල් (Boulders) විකිණීම

01. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් හොරණ අපනයන සැකසුම් කලාපීය භූමියේ ලොට් 1 හා ලොට් 2 වශයෙන් ගොඩ ගසා ඇති විශාල ප්‍රමාණයේ කළුගල් (Boulders) විකිණීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් අයදුම්පත් කැඳවනු ලැබේ.

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ලොට් 1 හා ලොට් 2 හි ගොඩ ගසා ඇති විශාල ප්‍රමාණයේ කළුගල් (Boulders) | $5000m^3$ පමණ (දළ වශයෙන්) |

02. ජාතික තරගකාරී ටෙන්ඩර් ක්‍රියාවලිය (NCB) යටතේ ටෙන්ඩර් කැඳවනු ලැබේ.
03. ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන්නේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අසාධුගත නොකළ පුද්ගලයන් සහ පාර්ශ්වයන් පමණි.
04. අදාළ ටෙන්ඩර් ඉල්ලුම්පත් සහ විස්තර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, හොරණ අපනයන සැකසුම් කලාපය, බොරළුගොඩ, පෝරුවදණ්ඩ යන ලිපිනයේ ඇති කලාප කාර්යාලයෙන් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 08.30 ත් ප.ව. 03.00 ත් අතර කාලයේදී එක් අයදුම්පතකට ආපසු නොගෙවන රු. 1,000/- ක් සහ 8% වැට් මුදලක් ගෙවීමෙන් ටෙන්ඩර් අයදුම්පත් 2020.09.14 දින සිට 2020.09.28 දක්වා ලබාගත හැක.
05. ටෙන්ඩර් ඉල්ලුම්පත සහිත මුද්‍රා තැබූ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"විශාල ප්‍රමාණයේ කළුගල් විකිණීම සඳහා මිල ගණන්"** යන්න පැහැදිලිව සඳහන් කර සභාපති, ටෙන්ඩර් මණ්ඩලය ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කලාප) බාරේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, හොරණ අපනයන සැකසුම් කලාපය, බොරළුගෙඩ, පෝරුවදණ්ඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ඉහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම කළ යුතුය.
06. ටෙන්ඩර් අයදුම්පත් භාර ගැනීම 2020.09.29 දින පෙ.ව. 10.00 ට අවසන් වන අතර, එයින් අනතුරුව ටෙන්ඩර්පත් විවෘත කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ, හොරණ අපනයන සැකසුම් කලාපයේ, කලාප කාර්යාලයේදී සිදු කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් භාරගනු නොලැබේ. ටෙන්ඩර් අයදුම්පත් විවෘත කිරීම සඳහා ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන් විසින් බලය පැවරූ නියෝජිතයින්ට සහභාගි වීමට අවසර දෙනු ලැබේ.
07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර දුරකථන අංක 034-2269752 / 0777-286751 සහ ෆැක්ස් අංක 034-2255687 මගින් පෝරුවදණ්ඩ බොරළුගොඩ පිහිටි හොරණ අපනයන සැකසුම් කලාපයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙතින් ලබාගත හැක.
08. ටෙන්ඩරයේ වලංගුතාවය 2020.12.27 දක්වා විය යුතුය.
09. සියලුම ටෙන්ඩර්පත් සමග රු. 10,000/- ක වටිනාකමකට ඇප බැඳුම්කරයක් (Bid Security) ඉදිරිපත් කළ යුතුය. ඇපකරය 2021.01.25 දින දක්වා වලංගු විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.**

# ප්‍රසම්පාදන දැන්වීම

## ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## ඌව පළාත් සභාව

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් OFID අරමුදල් යටතේ ක්‍රියාත්මක පහත සඳහන් කර්මාන්ත ඉටුකිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය සහිත, සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2020.10.07 දින ප.ව. 2.30 දක්වා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | කර්මාන්තයේ නම | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | සිවිල් වැඩ වටිනාකම (රු. මි.) | අවශ්‍ය අවම ඉක්ටැඩ් ශ්‍රේණිය හා ක්ෂේත්‍රය | ලංසු සුරක්ෂණ මුදල (රු.) | ඉදිකිරීම් කාල පරාසය (දින ගණන) | ලංසු ලියවිලි ගාස්තු මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 01 | බ/කැප්පෙටිපොල මහා විද්‍යාලයේ තෙමහල් තාක්ෂණික පහසුකම් සහිත ගොඩනැගිල්ල ඉදිකිරීම | බණ්ඩාරවෙල | 47.31 | C5/ C4 | 475,000.00 | 360 | 6,000.00 |
| 02 | මො/ඔබ්බේගොඩ මහා විද්‍යාලයේ තෙමහල් තාක්ෂණික පහසුකම් සහිත ගොඩනැගිල්ල ඉදිකිරීම | මොණරාගල | 49.31 | C5/ C4 | 495,000.00 | 360 | 6,000.00 |

ජාතික ලංසු කැඳවීමේ ක්‍රමය මගින් ලංසු කැඳවන අතර,ඉහත කර්මාන්තයන්හි මුළු ඇස්තමේන්තු පිරිවැය රු.මි. 50 සීමාව ඉක්ම නොයෙන බැවින්, මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 4/2016 (ii) අනුව කොන්ත්‍රාත්කරුවන්ගේ පළාත් ප්‍රමුඛතාවය හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ශ්‍රේණියේ ප්‍රමුඛතාවය ලංසු ඇගයීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

02. ඉහත වගුවේ සඳහන් අවම සීඩා (CIDA) ලියාපදිංචිය සහිත හා අසාධු ලේඛන ගත නොවූ සාර්ථක, යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් ලංසු ප්‍රදානය සඳහා සුදුසුකම් ලබති.
03. ලංසු ඇගයීමේදී පහත සඳහන් සුදුසුකම් සලකා බලනු ලැබේ.
    i. පසුගිය වසර පහ තුළ ඉහත වගුවේ සඳහන් කර්මාන්තයකට සමාන කර්මාන්තයක් ඉටුකර තිබීම හෝ එම කර්මාන්ත වටිනාකමින් 60% කට වඩා හෝ වැඩි වටිනාකමකින් යුත් ඒ හා සමාන ගොඩනැගිල්ලක් ඉටුකර ඇති පළපුරුද්ද.
    ii. පසුගිය වසර පහ ඇතුළත එක් වසරකට රු: මි. 50 ක පිරිවැටුමක් පවත්වාගෙන තිබීම.
    iii. ලංසුකරුවන් දැනට ඉදිකිරීම් කටයුතු සිදු කරගෙන යන කර්මාන්තවල වටිනාකම හා එම කර්මාන්තවල භෞතික ප්‍රගතිය.
    iv. වැඩබිම සඳහා පූර්ණ හෝ අර්ධ කාලීනව සුදුසුකම් ලත් ඉංජිනේරුවරයෙකු හා කාර්මික නිලධාරියෙකු අනුයුක්ත කිරීම.
04. සිවිල් වැඩ වටිනාකම රු.මි.5.00 ට වැඩි කර්මාන්ත සඳහා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි විය යුතුය. (අංක 100, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10) ලියාපදිංචි සහතිකය ඇමිණිය යුතුය.
05. ප්‍රසම්පාදන ආකෘතිපත් **2020.09.14** දින සිට **2020.10.05** දින දක්වා **පෙ.ව. 9.00** සිට **ප.ව 3.00 දක්වා** කාර්යාල වේලාවන් තුළදී ඉහත වගුවේ සඳහන් පරිදි ඒ එක් එක් කර්මාන්තයට නියමිත ආපසු ගෙවන ලංසු ඇප තැන්පත් හා ලංසු ලියවිලි ගාස්තු මුදල් ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නමින් දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා ප්‍රසම්පාදන ආකෘති පත්‍ර ලබාගත හැකිය. ලංසු සුරක්ෂණය සඳහා වගුවේ සඳහන් මුදල හෝ ලංසු සුරක්ෂණ මුදල මෙන් දෙගුණයක වටිනාකමින් යුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත කළ වාණිජ බැංකුවකින් ලබාගත් දින 120 ක් වලංගු වූ බැංකු බැඳුම්කරයක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණ ගාස්තුව මුදලින් ගෙවන්නේ නම් **2020.10.05** දින **ප.ව 3.00** ට පෙර ගෙවිය යුතුය.
06. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත **2020.10.07 වන දින ප.ව. 2.30** ට පෙර ඉදිරිපත් කළ යුතු අතර, ලංසුපත්වල මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර, වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවර දෙක එක් ලිපි කවරයක බහා, ඉහළ වම් කෙළවරේ අදාළ කර්මාන්තයේ නම සඳහන් කර මුද්‍රා තබා, **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, වෙලගෙදර පාර, බදුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ යුතු අතර, පසුව ලැබෙන ලංසුපත් භාර ගනු නොලැබේ. අදාළ වැඩි විස්තර **055 – 2229635** දුරකතන අංකයෙන් ලබා ගත හැක.
07. අනුපිටපත, මුල් පිටපතේ සෑම පිටුවකම සහතික කරන ලද ඡායාස්ථ පිටපතක් විය යුතුය.
08. ලංසු වලංගු කාලය **2021.02.07** දින දක්වා විය යුතුයි.
09. පූර්ව ලංසු රැස්වීම **2020.09.30** දින **පෙ.ව 10.00** ට ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරයේදී පැවැත්වේ.
10. **2020.10.07** දින **ප.ව. 2.30** ට බදුල්ල, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු කාර්යාලයේදී ලංසු විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.
11. ලද ලංසු පත් අතරින් යෝග්‍ය ලංසු පත් පිළිගැනීම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති ලංසු පත් ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**ආර්.එම්.පී.රත්නායක,**
**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,**
**වෙලගෙදර පාර, බදුල්ල.**
**2020.09.12 දින**

සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

# සිවිල් ගුවන් සේවා අධිකාරිය

**196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම.**

පුද්ගලික ගුවන් මෙහෙයුම් (Private Operations), ගුවනේදී සිදුකරන කාර්යයන් (Aerial Work) සහ අභ්‍යන්තර කුලී මෙහෙයුම් මගින් (Charter Air Service) මගීන්, නැව් භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය රට තුළ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා පනත (Act No. 14 of 2010) හා ඊට අදාළ රෙගුලාසි හා කොන්දේසි වලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය සහ බලපත්‍රය ලබා ගැනීම සඳහා රත්මලාන, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගම (AURA AIRLINES (PVT) LTD) විසින් 2020 සැප්තැම්බර් මස 09 දතමින් ඉල්ලුම් පත්‍රයක් 2020 සැප්තැම්බර් මස 09 වනදින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ව්‍යාපාරික නාමය ලෙස අවුරා එයාර් ලයින්ස් (පුද්ගලික) සමාගම නමින් හඳුන්වන ආයතනය වෙළඳ නාමය වශයෙන් අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගම යන නම භාවිත කරයි. අයදුම්පතට අනුව අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගමේ (AURA AIRLINES (PVT) LTD) අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය.

**ටී.ඒ.සී.වී.තාම්බුගල මහතා**
**එස්.එම්.චාන්දනි මිය**

අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගමේ (AURA AIRLINES (PVT) LTD) යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම සහ කළමනාකාරීත්වය සඳහා ආර්.එම්.එච්. වී. රත්නායක මහතා නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නො. 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක, සිවිල් ගුවන් සේවා අධිකාරියේ 4 වන මහලේ පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර, ඕනෑම වැඩකරන දිනෙක කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂාකර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate) ඇතුළු අනෙකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම,සිවිල් ගුවන් සේවා පනත ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරුපද්‍රිත වූත් ආරක්ෂිත වූත් කාර්යක්ෂම වූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩපිළිවෙළ 2020 ඔක්තෝබර් මස 20 වන දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10 කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කර ගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසි වලට අනුකූලව මා වෙත සංදේශනය කළ හැකිය. අන්තර්ගත සියලු ප්‍රකාශන වල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය. එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර,එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශයට අමුණා තිබිය යුතුය.

**කපිතාන් තේමිය අබේවික්‍රම**
**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ**
**ප්‍රධාන විධායක නිලධාරී**

**2020 සැප්තැම්බර් මස 11 වෙනි දින**
**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය**
**අංක152/1**
**මිනුවන්ගොඩ පාර**
**කටුනායක.**

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## ප්‍රසම්පාදන දැන්වීම

පහත සඳහන් ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කැඳවීමේ දැන්වීම 2020.09.12 වන සෙනසුරාදා සහ 2020.09.14 වන සඳුදා දිනයන්හි (Daily News) පුවත්පතේ පළකරනු ඇත.

1) **ASPHALT CONCRETE SURFACING ALONG THE PERIMETER ROAD OF WAGAWATTA INDUSTRIAL ZONE (CONTRACT NO. BOI/TS/WIS/2020/33.01.011)**
2) **SUPPLY AND INSTALLATION OF SAND FILTERS FOR EXISTING WASTEWATER TREATMENT PLANT AT HORANA EXPORT PROCESSING ZONE (CONTRACT NO. BOI/TS/HEPZ/2020/08/03.024)**

ඉහත ප්‍රසම්පාදනය සඳහා අදාළ ටෙන්ඩර්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කර ඇති අතර, ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන් හට 2020.09.12 වන සෙනසුරාදා සහ 2020.09.14 වන සඳුදා දිනයන්හි (Daily News) පුවත්පතේ අදාළ දැන්වීම අනුව කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමු.

**සභාපති,**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**







# සීමාසහිත ගලගෙදර විවිධ සේවා සමුපකාර සමිතිය - ගලගෙදර

## තනතුරු ඇබෑර්තු

මෙහි පහත සඳහන් තනතුරු වන සාමාන්‍යාධිකාරී I & II තනතුරු සඳහා මධ්‍යම පළාත තුළ පදිංචිකරුවන්ගෙන් පමණක් හා සහකාර සාමාන්‍යාධිකාරී මුදල් II & I තනතුර සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළ පදිංචි අයදුම්කරුවන්ගෙන් පමණක් 2020.10.10 දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ. සමිති කාර්යාලයෙන් පමණක් නිකුත් කරන අයදුම්පත් මගින් පමණක් ඉල්ලුම් කළ යුතුය.

තනතුරට අදාළ සුදුසුකම් හා උපදෙස් පත්‍රිකාවක් සහ අයදුම්පතක් රු. 100/- ක් ගෙවා ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකිය.

**සාමාන්‍යාධිකාරී I & II**

**වැටුප් පරිමාණ අංකය :** S.U.M.L - 01 : 01
**වැටුප් පරිමාණය :** 25,400 - 500 x 10 - 600 x 10 - 750 x 10 = 43,900/-
(මීට අමතරව සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ)
**වයස් සීමාව :** 18 – 45

**සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) II & I**

**වැටුප් පරිමාණ අංකය :** S.E.M.L - 02 : 01
**වැටුප් පරිමාණය :** 22,000 - 470 x 10 - 570 x 10 - 720 x 10 = 39,600/-
(මීට අමතරව සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ)
**වයස් සීමාව :** 18 – 45

(දැනට සමුපකාර සේවයේ යෙදී සිටින සේවකයන්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ)

**සභාපති,**
**සී/ස ගලගෙදර වි.සේ.ස. සමිතිය,**
**ගලගෙදර.**
**දුරකථන අංකය : 081-2461293**
**2020.09.07**

# බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසි කිරීම

සී/ස වත්තේගම විවිධ සේවා සමුපකාර සමිතියේ පහත සඳහන් ග්‍රාමීය බැංකු ශාඛා වෙත 2019.06.30 වන දිනද ඇතුළුව එම දින දක්වා උකස් කරන ලද එහෙත්, 2020.10.10 වන දින දක්වා බේරා නොගත් රන් භාණ්ඩ 2020.10.10 දින පෙ.ව.9.30 ට සී/ස වත්තේගම විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. **වත්තේගම ග්‍රාමීය බැංකුව**
2. **හුළු ගඟ ග්‍රාමීය බැංකුව**
3. **කහල්ල ග්‍රාමීය බැංකුව**
4. **අළුත්ගම ග්‍රාමීය බැංකුව**
5. **අඹතැන්න ග්‍රාමීය බැංකුව**
6. **උඩතලවින්න ග්‍රාමීය බැංකුව**
7. **මඩුල්කැලේ ග්‍රාමීය බැංකුව**
8. **කැලෑබොක්ක ග්‍රාමීය බැංකුව**
9. **මඩවල ග්‍රාමීය බැංකුව**
10. **පන්විල ග්‍රාමීය බැංකුව**
11. **කුඩුගල ග්‍රාමීය බැංකුව**

**මෙයට,**
**සාමාන්‍යාධිකාරී ,**
**සී/ස වත්තේගම වි.සේ.ස. සමිතිය,**
**වත්තේගම.**

වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය

# හලාවත වැවිලි සමාගම

## වියළි කජු ඇට සහ පොල් ගස් අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම

| වත්ත | අලෙවිකරන | | ප්‍රසම්පාදනය විවෘත කරන | | |
|---|---|---|---|---|---|
| | ද්‍රව්‍ය | ප්‍රමාණය | දිනය | වේලාව | ස්ථානය |
| තම්බපණ්ණි | වියළි කජු ඇට (කිලෝ ග්‍රෑම්) | 10,000 | 2020.09.16 | පෙ.ව. 10.30 | හලාවත වැවිලි සමාගම, අංක 165, පුත්තලම් පාර, හලාවත. |
| මංගලඑළිය | | 10,000 | | | |
| තම්බපණ්ණි | පොල් ගස් (කණාටු / මැරුණු) | 168 | 2020.09.18 | පෙ.ව. 10.30 | තම්බපණ්ණි වතු කොට්ඨාසය, තම්බපණ්ණි වත්ත, පුත්තලම. |

01. අදාළ ප්‍රසම්පාදනපත් රුපියල් 500/- ක ගාස්තුවක් ගෙවා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සහ ප්‍රසම්පාදනපත් විවෘත කරන දිනයේ පෙ.ව. 10.15 දක්වා ඉහත සඳහන් ස්ථානවලින් ලබාගත හැක.
02. වැඩි විස්තර සඳහා දුරකථන අංක 032 5768398 මංගලඑළිය සහ 032 5741263 තම්බපණ්ණි යන වතු අධිකාරීවරුන් අමතන්න.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**හලාවත වැවිලි සමාගම,**
**165, පුත්තලම් පාර, හලාවත.**

# ඇටර්නි බලපත්‍ර අවලංගු කිරීම

නුගේගොඩ, කොහුවල, විජයමංගලාරාම පාර, අංක 30/1, දරන ස්ථානයේ පදිංචි **උදුගොඩගේ දෙන් අරුණ ප්‍රමේෂ් පෙරේරා** (ජා. හැ. අංකය 730061501V) වන මම ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වගනම්,

මා විසින් මාගේ නීත්‍යනුකූල ඇටර්නි බලකරු වශයෙන් කොළඹ 8, ඇල්විටිගල මහල් නිවාස, අංක එල් 2/3 දරන ස්ථානයේ පදිංචි උදුගොඩගේ දෝන සර්ධා ප්‍රභාලි ගුණරත්න (ජා.හැ.අංකය 635072105V) යන අය පත් කරමින් දෙන ලද අංක 3180 සහ 2006.02.25 දින දරන කොළඹ පදිංචි ධම්මික ඩී. යාපා ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද ලිඛිත බලධාරිකම් සහ ඇටර්නි බලපත්‍ර පොතේ 324 කණ්ඩයේ 35 පත්‍රිරුවේ 3748 පොත් අංකය යටතේ 2006.03.24 දතම යටතේ ලියාපදිංචිව ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවටත් මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවය.

**දිනය : 2020.09.04** **උදුගොඩගේ දොන් අරුණ ප්‍රමේෂ් පෙරේරා**

# මහනුවර මහා නගර සභාව - ටෙන්ඩර් දැන්වීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් මහනුවර මහා නගර සභාව සතු පහත කඩ කාමරවල අයිතිය බදුදීම සඳහා 2020.10.02 දින පෙ.ව. 10.00 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් මවිසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පෝරම සතියේ වැඩකරන දිනවල කාර්යාල වේලාව තුළදී 2020.09.30 දින ප.ව. 2.45 දක්වා නිකුත් කරනු ලබන අතර, 2019.10.02 දින පෙ.ව. 10.00 ට විවෘත කරනු ලැබේ.

වැඩි විස්තර මහනුවර නාගරික ගණකාධිකාරී (ආදායම) වෙතින් කාර්යාල වේලාවන් තුළදී පැමිණ හෝ 081-2227395 දුරකථන අංකයෙන් ලබාගත හැකිය.

## උපලේඛනය

| අනු අංකය | වෙළඳ සංකීර්ණය | කඩ කාමරය | වෙළඳාම | ටෙන්ඩර් කාලය | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තුව රු. ශත | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත | අවම ලංසුව රු. ශත | කඩ කුලිය රු. ශත |
|---|---|---|---|---|---|---|---|---|
| 01. | මධ්‍යම වෙළඳ පොළ | 158 | ගව මස් | අවුරුදු 02 (2020.12.01 - 2022.11.31) | 1,090.00 | 100,000.00 | 700,000.00 | 5,000.00 |
| 02 | | 169 | ගව මස් | අවුරුදු 02 (2020.12.01 - 2022.11.31) | 1,090.00 | 100,000.00 | 400,000.00 | 5,000.00 |
| 03. | | 129 | ගව මස් | අවුරුදු 02 (2020.12.01 - 2022.11.31) | 1,090.00 | 100,000.00 | 400,000.00 | 5,000.00 |
| 04. | සංඝරාජ මාවත | 2-H | ආපන ශාලාව සහ ග්‍රොසරිය | අවුරුදු 02 (2020.10.15 - 2022.10.14) | 1,090.00 | 60,000.00 | 731,000.00 | 26,000.00 |
| 05. | ඩී.එස්. සේනානායක මහජන පුස්තකාල ආපන ශාලාව | | ආපන ශාලාව | අවුරුදු 02 (2020.10.02 - 2022.10.01) | 1,090.00 | 50,000.00 | 16,500.00 (මාසික) | 0.00 |

❖ පිළිගනු ලබන ටෙන්ඩර් මුදලට අමතරව රජයට ගෙවිය යුතු බදු මුදල් එකතු කර අය කරනු ලැබේ. කඩ කුලිය සංශෝධනය වීමට ද ඉඩ ඇත.

❖ අනු අංක 01 සිට 04 සඳහා - සභාව විසින් පිළිගනු ලබන ටෙන්ඩර් අයදුම්පතේ සඳහන් මුදල එකවර ගෙවීමට ඔබ අපොහොසත් වන්නේ නම්, ටෙන්ඩර් මුදලින් 55% ක මුදල පළමු වාරිකය වශයෙන් ගෙවා ගිවිසුම් අත්සන් කළ යුතු අතර, ඉතිරි 45% ක මුදල ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව වාරික 03 කින් මාස 06 ක් ඇතුළත ගෙවා නිමකළ යුතුය.

❖ ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා මහනුවර මහ නගර සභාවේ සරප් අංශයට මුදල් ගෙවන ලද ලදුපත හෝ නැවත ඉල්ලූ විට ගෙවන අවලංගු කළ නොහැකි ඇපකරයක් මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් නමින් ලබාගෙන එම ලියවිල්ල හෝ ටෙන්ඩර් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**2020.09.10 දින,**
**මහනුවර මහා නගර සභාවේදීය.**

**චන්දන තෙන්නකෝන්,**
**නාගරික කොමසාරිස්.**

Uva Wellassa University

## ජාතික සංවර්ධනයේ සාඩම්බර දායකයෙකු වන්න

**2020/2021 නව අධ්‍යයන වර්ෂය ආරම්භ කිරීම**
**2018/ 2019 ශිෂ්‍ය කණ්ඩායම**
**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**

2020/2021 නව අධ්‍යයන වර්ෂය 2020 සැප්තැම්බර් මස 16 වන දින ආරම්භ වන අතර, 2018/2019 ශිෂ්‍ය කණ්ඩායමේ නවක සිසුන් 2020 සැප්තැම්බර් මස 15 වන දින පෙ.ව. 08.30ට විශ්වවිද්‍යාලය වෙත වාර්තා කරන මෙන් දන්වා සිටී. මේ වන විට කැඳවීම් ලිපිය විද්‍යුත් තැපැලෙන් සහ ලියාපදිංචි තැපැලෙන් යවා ඇත.

**ලේඛකාධිකාරී**
**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,**
**2020.09.08**

2020 සැප්තැම්බර් 12 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
සදාකාලික පත්තර තාරුණ්‍යය

# යොවුන් ජනතා

2020 සැප්තැම්බර් 12 සෙනසුරාදා

තරුණ අකුරු
හුස්ම ගන්න
අපේ
නවාතැන් පොළ



# ගුරු පුද හරසර

















'ටයි මහත්මයා', 'ජෝ මහත්මයා' වැනි කලා ලොවේ පතාක යෝධයන් අතර ධර්මසිරි ගමගේ මහතාටද වෙන් වන්නේ සුවිශේෂ ස්ථානයකි.

'දැනහැඳුනුම්කම්, හිතවත්කම් ඇති අගනුවරට නුදුරු වරප්‍රසාද ලත් පිරිස වෙනුවෙන් විවර වූ පත්තර කලාවේ දෙරටු ඇත පිටිසර පැල්කොටයට ද එක සේ විවර කළේ ඔහුය. එසේම, ඒ දක්ෂයන්ගේ ආර්ථික අගහිඟකම් දුටු තැනදී තමන්ගේ කුලී නිවෙසේ නවාතැන් දී ශිල්ප දී ඔවුන් කලාවේ ඉහළ නඟිනු දැක, කාටත් නොපෙනෙන්නට රහසේ සතුටු කඳුළු වැගුරුවේ ඔහුය.

ඒ ධර්මසිරි ගමගේ නමැති පුවත්පත් කලාවේදියාය.

අදටත් චාරිකා සටහන් කලාව ද තිරකතා කලාව ද හදාරන්නන්ට ඔහු අත්පොතකි.

ඒ, ධර්මසිරි ගමගේ නමැති සොඳුරු සංචාරකයාය. පණ්ඩිත් අමරදේවයන්ට 'සිහින නෙළුම් මල ජීවිත පොකුණේ' සහ 'සංසාර ගමනේ තණ්හා ආශා' ද, විශාරද නන්ද මාලිනියට 'අම්මාවරුනේ' ද, හරුන් ලන්ත්‍රාට 'සුළං කුරුල්ලෝ' ද රචනාකොට ගීත රචනයේ වැටකොටු සිටුවාගෙන රටට පණ්ඩිතමානය පෙන්වන්නට ඔහුට ඕනෑ තරම් ඉඩ තිබිණි. එහෙත් සැමට එක සේ පැතිරූ ඒ දයා සිත කිසි දිනෙක ලාභ ප්‍රයෝජන, උඩඟුකම් ආදී පටු සීමාවල කොටු නොවීය. ඔහු එච්. ආර්. ජෝතිපාලට 'ගෙදර හිටිය රෝස කැකුළ රෝසා...' ලියා පළ කළේ ඒ මානව හිතවාදීත්වයයි...

ඒ ධර්මසිරි ගමගේ නමැති ගීත රචකයාය.

එවන් ගති පැවතුම් ඇති ඔහු ජීවිත චාරිකාවෙන් වැඩිමනත් කාලයක් ගෙවා දැමූයේ 'බේරේ ගෙදර' හෙවත් ලේක්හවුසියේය. ඒ සෙනෙහෙ සිත, ආදරණීය ගමගේ මහත්මයා මුලින්ම රටටම පෑවේද යොවුන් ජනතා පුවත්පතෙන්ය.

කොහොමටත් 'යොවුන් ජනතා' වට සැප්තැම්බරය, එසේත් නැතිනම් මේ සාහිත්‍ය මාසය සුවිශේෂිය. ධර්මසිරි ගමගේ 'පහන් වැට' නමින් සංවිධානගත වූ රට වටෙන්ම කොළඹට එක්රොක් වූ යෞවන යෞවනියන් 500කට හාපුරා කියා කොළඹ පදනම් ආයතනයේදී සාහිත්‍ය කලා වැඩමුළුවක් පැවැත්වූයේ ද මේ ගෙවෙන සැප්තැම්බරයකදීය. නිර්මාණ උයනේ අමරණීය වී කයින් ඔහු අපෙන් වෙන්වූයේ ද නවත් සැප්තැම්බර් 19 වැනි දිනෙක බව ද සැබෑය.

එහෙත් අමරණීය ඔහු සතු වූ ලොකුම සම්පත දයාබරිතව ඉදිරි මඟ පෙන්වූ ආධුනිකයන්ය. අද වන විට එවකට තරුණයන් වූ 'පහන් වැටේ' ඇත්තන් හුඟ දෙනෙක් අද රටේ නමගිය කලාකරුවෝය. ඉදින්, අදින් මේ දෙරටු හැරෙන්නේ ඔහු පැතූ ලෝකයට අලුත් පරම්පරාවට මඟ කියන්නට දරන නව යුගයේ වෑයමය.




මේ අවකාශය අලුතින් සිතන, අලුතින් සිහින දකින, අලුත් ඔබටයි. මෙවර යොවුන් ජනතා නවක ලේඛක ලේඛිකාවන් රැසකට අකුරු නවාතැන් පළක් සපයයි. එන්න. අපි අලුතින් හිතමු. අලුතින් ලියමු.

yovunjanatha@lakehouse.lk

"යොවුන් ජනතා"
දිනමිණ
ලේක් හවුස්
අංක 35
ඩී.ආර්. විජයවර්ධන මාවත
කොළඹ

# ඔබේ කවුළුව බොර කරන්න

කෙනෙකුගෙ වරදක්, අඩුපාඩුවක් දැක්කොත් ඔබ මොකද කරන්නෙ? ඔබේ තියෙන අඩුපාඩු, වැරදි මොනවද? නිකමට හරි ඔබ ඒ ගැන හිතලා තියෙනවද? අපි අපේ වැරදි අඩු පාඩුවක් දකින්න කැමති නෑ වගේම අපේ වරදක් අඩු පාඩුවක් තව කෙනෙක් පෙන්නලා දුන්නොත් ඒක පිළිගන්න තරම් නිහතමානී බවකුත් බොහෝවිට අපි ගාව නෑ. අපේ අඩුපාඩු වැරදි දකින්න අපි අකැමැති වුණාට තව කෙනෙකුගෙ වරදක් අඩුපාඩුවක් දකින්න, ඒ ගැන කතාබහ කරන්න, විවේචනය කරන්න නම් අපි හරි කැමතියි. අපි ගාව අඩුපාඩු වැරදි කන්දක් ගොඩ ගහගෙන තව කෙනෙක්ගෙ තියෙන බොහොම පුංචි වරදක් අඩුපාඩුවක් මහා විශාල වරදක් වගේ විවේචනය කරන්න, පහර ගහන්න අපිට ඉතා හොඳට පුළුවන්.

"අනුන්ගෙ ඇහේ තියෙන පොල් කෙන්ද හොයන්න කලින් තමන්ගෙ ඇහේ තියෙන පොල් පරාලය ගැන හොයලා ඉන්න" අපේ වැඩිහිටියන් අපිට කියාදීපු පාඩමක් තියෙනවා. මෙයින් කියන්නෙ අනුන්ගෙ පුංචි පුංචි වැරදි හොයන්න කලින් තමන්ගෙ තියෙන බරපතළ වැරදි අඩුපාඩු හදාගෙන ඉන්න කියන එක. අපේ වැරදි දකින්නෙ නැතිව අනුන්ගෙ වැරදි දකින්න ගියත්, ඒ වැරදි නිවැරදි කරන්න ගියත් සිදුවෙන්නෙ අපි අපහසුතාවට පත් වීම. අපිම වැරදි කාරයො වීම.

නගරයෙ ආයතනයක සේවය කල, අලුත විවාහ වුනු තරුණ යුවළක් නගරය ආසන්නයෙ ප්‍රදේශයක නිවසක් කුලියට ගෙන පදිංචියට පැමිණියා. මේ දෙදෙනාටම ඉතා පහසුවෙන් තම කාර්යාලයට යෑමට හැකි වීමත්, දරාගත හැකි මුදලකට මේ නිවස ලැබීමත් නිසා නගරයට තරමක් දුරින් පිහිටි මේ නිවස මේ දෙදෙනා තෝරාගෙන තිබුණා. මේ නිවෙසේ පදිංචියට පැමිණි පසු එළඹෙන පළමු සති අන්තය උදා වුණා. සති අන්තය නිසා තරමක් ප්‍රමාද වෙලා අවදි වුණ මේ යුවළ උදෑසන තේ පානය සඳහා සූදානම් වුණා.

තේ පානය කරන අතරේ මේ තරුණ බිරිය දුටුවෙ අසල්වැසි කාන්තාව රෙදි සෝදා වනමින් සිටින ආකාරය. මේ යුවළ තේපානය කරමින් සිටි ස්ථානයේ ඇති ජනේලයෙ වීදුරුව අතරින් අසල් වැසි නිවසෙ මැදි වයයේ කාන්තාව සේදූ රෙදි වැලේ වනන අයුරු බොහොම පැහැදිලිව පෙනෙනවා.

"මෙච්චර වයසට ගිහිල්ලත් මේ ගෑනු කෙනාට හරියට රෙද්දක් හෝද ගන්න බැරි හැටි. අර ඉස්කෝලෙ ගවුම මැටිම මැටි පාටයි. ඔය ගවුම ඇඳගෙන ඒ ළමයා කොහොම පාරෙ යනවද මන්දා"

"ඒයි බලන්න කෝ අර ගෑනු කෙනා රෙදි හෝදලා තියෙන හැටි. අර ඉස්කෝලෙ ඇඳුම් .ඉස්සර අපි කොච්චර මඩ නාගෙන ආවත් අපේ අම්මා කිරි සුදට ඇඳුම් හෝදනවා. මේ ගෑණු කෙනා නම් හරිම කම්මැළි ගෑනු කෙනෙක්"

ඇය තමන්ගෙ ස්වාමියටද අසල් වැසි කාන්තාව පෙන්වමින් සිනාසුනා. හිස ඔසවා ඒ දෙස බැලු තරුණ සැමියා කිසිත් නොකියා නැවතත් තේ පානය කරන්න පටන් ගත්තා.

එතැනින් පසුව බොහෝ සති අන්ත වලදි අසල් වැසි කාන්තාව, ඇගේ සමච්චලයට ලක් වුණා. අසල්වැසි කාන්තාව රෙදි සේදීමට නොදන්නා බවත් ඇය සෝදා වැනීමට ගෙනවිත් තිබෙන රෙදිවල කුණු පවතින බව තම සැමියාට පවසමින් අසල්වැසි කාන්තාව අවමානයට ලක් කළ ඇය ඇගේත්, ඇයගේ මවගෙත් රෙදි සේදීමේ දක්ෂතාව සැමියා ඉදිරියේ වර්ණනා කිරීමටද අමතක කළේ නෑ.

"මට එක වෙලාවකට හිතෙනවා අනේ ඒ ගෑනු කෙනෙට රෙදි හෝදන හැටි කියා දෙන්නත්. ඒත් අපි මොකටද අනුන්ගෙ රෙදි හොයන්නෙ යන්නෙ නේද? මෙච්චර වයසට ගිහිල්ලත් හරියට රෙද්දක් හෝද ගන්න බැරි කම්මැළි කම නිසා තමයි, නැත්නම් වෙන මොකද?"

මේ තරුණ සැමියත් තම බිරියගෙ වර්ණනාව අසා සිටියා මිස ඒ ගැන අදහස් පළ කළේ නෑ. කාලය ගෙවී ගිහින් ඔවුන් නිවෙසට පැමිණ හය මාසයක් පමණ ගත වුණා.

එක් දිනක මේ යුවළ සාලයට වෙලා උදෑසන තේ පානය කරමින් සිටියදි අසල් වැසි නිවෙසේ කාන්තාව සේදූ රෙදි ගෙනැවිත් රෙදි වැලේ දැමීමට පටන් ගත්තා. දුටු දෙය මේ තරුණ බිරිඳට එක් වරම අදහා ගන්න බැරි වුණා. ඇය සෝදා වැනූ රෙදි සුදු පැහැයෙන් බබළනවා. තමන්ට තියා තමන්ගෙ මවටත් මේ තරම් හොඳට රෙදි සේදීම කළ නොහැකි බව තේරුම් යන්න ඇයට වැඩි වේලාවක් ගියේ නෑ.



"අද නම් මේ ගෑනු කෙනාට රෙදි හෝදන හැටි කවුරු හරි කියා දීලා. එහෙම නැත්නම් අලුත් සබන් ජාතියක් වත් ඇවිල්ලද දන්නෙ නෑ. රෙදි සෝදන යන්ත්‍රයෙන් සේදුවත් මේ තරම් හොඳට සෝදන්න බෑ."

මේ වෙනස ඇයට මහා ප්‍රෙහේලිකාවක්. තමන්ගෙ මවටත් වඩා අපූරුවට රෙදි සෝදා තිබෙන අයුරු දුටුවිට ඇගේ සිතට සියුම් ඊර්ෂ්‍යාවක්ද මෝදු වුණා.

"අර බලන්න කෝ අනේ අද නං මාර පුදුමයක් වෙලා තියෙන්නෙ". අසල්වැසි කාන්තාව සේදු රෙදි වනන අයුරු ඇය තම ස්වාමියාටද පෙන්නුවා.

"ඇයි මොකද වෙලා තියෙන්නෙ?" ඒ ගැන එතරම් සැලකිලිමත් නොවුණු සැමියා බලමින් සිටි පුවත් පතෙන් හිස ඉවතට නොගෙනම විමසා හිටියා.

"මාර වැඩක් අනේ වෙලා තියෙන්නෙ. අද නම් අරයා හොඳට රෙදි ටික හෝදලා තියෙනවා. කොහෙන්ද දන්නෑ ඔච්චර හොඳට හෝදන්න ඉගෙන ගත්තෙ. මං නං හිතන්නෙ එයාට අලුත් සබන් ජාතියක් හරි හෝදන කුඩු ජාතියක් හරි හම්බ වෙලා ඇති."

"එක්කො රෙදි නැන්දගෙ ඇපිල්ලීමේ පන්තියට වත් ගියාද දන්නෑ"

එසේ කියමින් ඇය කොක් හඬලා සිනාසුණා. "අනේ කමක් නෑ, කොහොම හරි දැන්වත් ඒ ගෙදර ඉන්න ළමයින්ට ලැජ්ජා නොවී ඇඳුමක් ඇඳන් ඉස්කෝලෙ යන්න පුළුවන් වෙයි"

ඇ කෙතරම් ඒ ගැන අවධානය යොමු කළත් සැමියා ඒ ගැන තැකීමක් කලේ නෑ. ඔහු පුවත්පත කියවීම දිගටම සිදු කළා . සැමියගෙ නිහඬතාව ඇය තෘප්තියට පත් කළේ නෑ.

"ඒයි මේ පොඩ්ඩක් බලන්න කෝ අනේ." ඇය සැමියාගේ උරහිසින් අදිමින් එම දසුන ඔහුට පෙන්වීමට උත්සාහ කළා.

"ආ ... ඒකද? මම අද අපේ ජනෙල් වීදුරු, ටිකක් පිහලා දැම්මා ඒකයි ඔය."

තරුණ සැමියා පුවත්පත දෙස බලාගෙනම ඇයට පැවසුවා.

අපි හැමෝම අපේ ජීවිතයෙ කිලිටි වෙච්ච, දූවිලි බැඳිච්ච ජනේල අතරින් අපි අනුන්ගෙ ජීවිතෙවල බැඳුණු කුණු හොයන්න යනවා. ඒවා පිසදමන්න හදනවා. අපි බලන්නෙ දූවිලි බැඳුණු වීදුරුවකින් කියන එක අපට නිකමටවත් සිහිවෙන්නෙ නෑ. ඒ නිසා අපේම කුණු අපිට අනුන්ගෙ වගේ පේනවා. අපි දිගින් දිගටම අනුන්ගෙ කුණු දකිනවා වැරදි හොයනවා. කවුරු හරි වීදුරුව පිසදාපු දවසට අපේ වැරදි, අපේ කුණු අපිට පේන්න ගන්නවා. ඒ වෙද්දි අපි බොහොම ප්‍රමාදයි. කාගෙ කාගෙත් කිල්ලෝටවල හුනු ටික ටික හරි තියෙනවා. ඒ නිසා අපි අපේ වැරදි මුලින් හොයාගෙන හදා ගනිමු. අපේ ජනෙල්වල වීදුරු පිසදා ගනිමු. එවිට අපට පැහැදිලිව පෙනෙයි. එදාට අපට පුළුවන් අනුන්ගෙ කුණුත් හෝදන්න

**මාර වැඩක් අනේ වෙලා තියෙන්නෙ. අද නම් අරයා හොඳට රෙදි ටික හෝදලා තියෙනවා. කොහෙන්ද දන්නෑ ඔච්චර හොඳට හෝදන්න ඉගෙන ගත්තෙ. මං නං හිතන්නෙ එයාට අලුත් සබන් ජාතියක් හරි හෝදන කුඩු ජාතියක් හරි හම්බ වෙලා ඇති.**

අසිරු වේදිත කරුණාරත්න















# මිනිසුන් පාට කරන සිත්තරා

"මුහුණ හදවතේ කැඩපතක්..." මේ සමහරු අදහන දෙයක්. ජීවිතයේ සමඟ ගැටී ගැටී හෙම්බත් වූ කෙනකුගේ මුහුණ එක් විදියක්. උපේක්ෂාවෙන් මහජන සුබසිද්ධිය පිණිසම කැපවූ කෙනකුගේ විදිය ඊට තරමක් වෙනස්. ඊයම් බරු මෙන් ජන හදවත් තුළට කිඳා බැස තිබෙන කප්පරක් ඒ ඒ හැඩ තල, ඉරියව්, මන්දස්මිත, දෑස් කියන කතා පවා ලස්සන හදවත් ඇත්තන් තමන්ගේ සිත් තුළ රැකගන්නේ මුතු මැණික් තරම් පරෙස්සමට.

එකම කෙනකුගේ වත මඬලින් විවිධ විචිත්‍රතා දකින්නට තරම් සියුම් හැකියාවක් කලාකරුවා සතුයි. ඊට ජීවමාන උවම් සිත්තම් මෙන්ම සිනමා පටවලින් ද සොයා ගැනීම දුෂ්කර නැහැ.

මේ හදවත් සහ හැඟීම් යා කෙරෙන ඉසව්වක්. ඒ විජිතය අරා සිටින්නේ යෞවනයෙක්. ඔව්, ඔහු සිත්තරෙක්. ඒත් වෙනස්. ආකාසය තරම් සද්දයක ඒ අවකාශය අපේ මේ අමුත්තා, එහෙම නැතිනම් අද අපේ කතානායකයා ජය ගත්තෙ සයිබර් අවකාශයෙන්.

## Digital painting - රවිඳු

එහෙමයි අද කවුරුත් කුරුකුලසූරිය රවිඳු ප්‍රනාන්දුව හඳුනන්නේ. මුහුණු පොතින් ඔහු වරින් වර පාට පාටින් අපූරු මනස් රූප අපේ හිත්වල එල්ලන්නේ පාට පාටින්. හැමදාමත් අපේ සිත් තුටු කරනා රවිඳුගේ සිත කියවන්නයි අපේ මේ සූදානම. රැකියාවෙන් විවේකයක් ලැබුණු හැම වෙලාවෙම චිත්‍ර ඇන්දා. හිතවතුන්ට, මිතුරු මිතුරියන්ට මං මගේ ඩිජිටල් පේන්ටින් මුලින්ම යැව්වේ ඒ අයව පුදුම කරවන්න නැතිනම් සතුටු කරවන්න. ඒත් මාව මේ අංශයෙන් ඉදිරියට ගෙනාවේ පසුගිය ඇඳිරි නීති සමය. කොරෝනා බියෙන් ගෙදරටත්, ගෙයි කාමරයටත් මුලුගැන්විච්ච මගේ හිත බල කළේ මුහුණුවල ඉරියව්, හැඩතල කියවන්න.

ඉතින් මුලින් ඒක ලෙහෙසි වුණේ නැහැ. එක පේන්ට් එකක් ඉවර කරන්න පැය 15ක් ගත වූ අත්දැකීම් පවා තියෙනවා. ඒ ඒ පුද්ගලයන්ගේ හැඩහුරුකම් අනුව ඒ මුහුණු ඩිජිටල් තිරේ සිත්තම් කරගන්නට ගෙවෙන වේලාව වෙනස් වෙනවා. කොහොම වුණත් දැනට 60 දෙනකුගේ විතර මුහුණු සිත්තම් කරගන්න ඉඩ ලැබීම මට සතුටක්.

මේ මගේ වෘත්තිය නෙවෙයි. පරිගණක මෘදුකාංග ඉංජිනේරුවකු විදිහටයි මං සේවය කරන්නේ. මේක වෙනම වැඩක් කියලා මට හිතෙනවා. වෙන වෙන පාට එකට එකම ඉසව්වක වෙනස් වෙනස් විදියට මිශ්‍ර වෙමින් තමයි මේ වැඩේ කෙරෙන්නේ. ඒ දීප්තියට හුඟ දෙනෙක් කැමැත්තක් දක්වන බව ලැබෙන ප්‍රතිචාරවලින් මට දැනෙනවා. මට ඒ ප්‍රතිචාරවලට වඩා දැනෙන වෙනත් දෙයක් නැහැ. ඒ අමුත්තට මං ආසයි..."

ඒ තමයි රවිඳු. කෙනෙකුගේ සිත් කියවා ඒවා සිතුවමට නගනා රවිඳු හිරංග ප්‍රනාන්දුගේ සිත එතරම්ම නිසංසල නිසා වෙන්නැති නේද? එයාගේ Digital Painting මෙච්චරම හැඩ.

රවිඳු හිරංග ප්‍රනාන්දු

**සනුජ ජයවික්‍රම**

# රැල්ලට ඉකිබිඳින මිනිස්සු

ජීවිතේ සතුට,දුක කියන හැඟීම් මැද අපට හුඟක් හුරුපුරුදු දුකක් නැතත් බොරුවට දුක් විදින එක..ඒ ඇයි කියන්න හේතුවක් මං දන්නේ නෑ..නමුත් අපි ගොඩක් වෙලාවට කරේ අහේතුත් හේතු කරගෙන ජීවිතේ විඳින්න තියෙන එක තත්පරෙත් ඉකි බිඳ බිඳ විදවපු එක..ජීවිතේ ලැබුණු දේවල් වලින් සතුටු නොවී නොලැබුනු දේවල් වෙනුවෙන් හුල්ලන එක ..ඇත්තටම ඇයි අපේ ජීවිතේ ඒ තැනට වැටුණේ ?

මේ ලෝකේ හැම පුද්ගලයෙක්ට එක වගේ ජීවිතයක් උරුම වෙන්නේ නෑ..එක වගේ ජීවිතයක් උරුම වුණා නම් මේ ලෝකේ කිසිම විවිධත්වයක් දකින්න ලැබෙන්නෙත් නෑ.. ඇත්ත ඒකයි ..දුක,සතුට කියන්නේ හදවත එනයන තවත් එක හැඟීමක් මිස මුළු ජීවිතේම නෙමෙයි .. අපිට ලැබෙන අත්දැකීම් මත ,එදිනෙදා ජීවිතේ වෙන සමහරක් සිද්ධීන් මත , ජීවිතේ හමුවෙන මිනිස්සු මත ,අපි විසින් කරන කියන දේවල් මත ..

දුක,සතුට කියන හැඟීම් හදවත තුළ උපද්දවනවා..

ඒත් ජීවිතේ යම් යම් නොලැබීම් මත, හැරයෑම් මත අපි ජීවිතේ සතුට කියන හැඟීමට නැවතීමේ තිත තියලා දුක කියන හැඟීමට ළං වෙනවා..සමහරක් විට මුළු ජීවිත කාලය පුරා අපි විදවනවා..කඳුළු එක්ක ගනුදෙනු කරනවා..සමහරක් විට ජීවිතේ ඒ නොලැබුනු දේවල් වලට වඩා හොද දේවල් ලැබුණත්, ඒ දේවල් අහිමි වී ගියේ අපේම හොඳට වුණත් ඒ ඇත්ත වසන් කරලා අපි හැමදාම ජීවත් වෙන්නේ ඒ අන්ධකාරයෙන් පිරුනු,ඉකිබිඳින හදවතක් එක්ක. අතීතේ වැළලී ගිය කඳුළු මතක එක්ක. හුදකලා වී පාළු වී ගිය , අසාර්ථක ජීවිතයක්...

නමුත් ඇත්තටම අපි සිටිය යුතුතේ එසේද ?උඹට මට විතරක් නෙමෙයි මේ ලෝකේ හැම පුද්ගලයෙකුටම නොලැබීම්, අහිමිවීම් කියන දේවල් පොදුයි. නමුත් ඔවුන් ඒ ගැනම හිත හිත මුළු ජීවිතේ ම එකතැනකට හිර කරන්නේ නෑ. කඳුළු අස්සෙන් හිනාවෙනවා. ජීවිතේ ලැබුණු දේවල්වලින් තෘප්තිමත් වෙනවා. එහෙමත් නැත්තම් අහිමි වුණු දේවල්වලටත් වඩා හොද දේවල් තමන්ගේ වෙන තැනට වෙනකම් ජීවිතේ සටන් කරනවා..මහන්සි වෙනවා..ඒ වෙනුවෙන් ජීවිතේ කැප කරනවා.. තව තවත් හිත ශක්තිමත් කරගෙන ජීවිතේ සතුට කරා රැගෙන යනවා..

ඉතිං ඇත්තටම එසේ කරන්නට නම් මුලින් උඹ ජීවිතේ තේරුම් ගත යුතුයි..ජීවිතේ කිසිම දෙයක් නොලැබුනු මිනිස්සු පවා හරි අපුරුවට පුංචි පුංචි දේවල්වලින් ජීවිතේ විදිනකොට අපි ජීවිතේ ගොඩක් දේවල් ලැබිලත් පැත්තකට වෙලා හූල්ල හුල්ල ඉන්නවා ..ඒත් ජීවත් වෙනවා කියන්නේ ඒකට නෙමෙයි.. අතපය නැති මිනිස්සු පවා ජීවිතේ හොයාගෙන දිනනකොට, සියල්ල සර්වසම්පූර්ණ වුණු අපි එකතැනකට මුළු ජීවිතේ හිර කරලා හැමදාම දුකින් ඉන්නවා..ඇත්තටම එතැන හිතන්න ගොඩක් දේවල් ඉතිරි වෙලා තියෙනවා නේද..ඔයාගේ ජීවිතේ අයිතී ඔයාට..ඔයාගේ ජීවිතේ වටිනාමක දැනෙන්න ඕන ඔයාට.. මේ ගෙවන තත්පරයක් පවා ඇති නිවැරැදි අවබෝධයෙන් ජීවිතේ වෙනස් කරන්න..

කවදාවත් අහේතුත් හේතු කරගෙන රැල්ලට ඉකිබිඳින්න යන්න එපා ..ජීවිතේ අහිමිවීම් මැදින් ජීවිතේ නොලැබීම් මැද වුණත් ජීවිතේ විදින්න පුරුදු වෙන්න..කඳුළු වෙනුවට හැම තත්පරයකම හිනාවෙන්න..හැමදාම ඔයාගේ ජීවිත අහසේ අමාවක රාත්‍රීන් පමණක් උදා වෙන්නේ නෑ..

මතක තියාගන්න ..ජීවිතේ කියන්නේ හැම තත්පරයකම නොවිදා විදින එක..හැම දවසකම අළුතින් ජීවිතේ දකින එක ..ඇත්තටම ඔයා එහෙම හිතුවොත් පුළුවන් වේවී,මේ ලෝකේ මොන දේ වුණත් ඔයා ඔයාම වෙලා කදුළු මැදින් ජීවිතේ දිනපු අපුරු පුද්ගලයන් අතරට ඔයාගේ නමත් රැගෙන යන්න.. එපමණයි !

**නිරොක්ෂි ජෑන්ස්**

## පැංචියේ

කාසි කොළවලට පමණක්
සිහින විකිණෙනා
හීන පොදි කුමට පැංචියේ
පාට නොමැකෙනා
වීදි කොනට ජීවිතයේ
පාර නොපෙනෙනා
හීන හොයාපන් සිල්ලරවලට
නොවටිනා

වේල දෙවේලට පාරට
කාලේ දියවෙනා
ඉරත් සඳක් නුඹෙ ලොකේට
කුමට පායනා
හීල හොයාගෙන හිමිදිරි
හීත පොරවනා
කිමද දෙවිවරුන් නුඹගෙන්
දෑස හංගනා

ළිපක් ඇති නමුත් ගෙපැලට
දුමක් නොනැගෙනා
පියෙක් ඇති නමුත්
දෑසට තාම නොගැටෙනා
මවත් කළුවරේ ඉඳි හිට
සිහිනේ දැවටෙනා
හෙටක් ඇතිද පැංචියේ
ඔය හීන ඉටුවෙනා

**තුෂාරි. සේ. නාලිකා**



## වියපත්

ගස
මිදුලට හළ
පත් අහුලන
මැහැල්ලක්

**එන්.ඩබ්.පී. ලාල්**

## සීමා

පුතෙක්,
නිල් පාට
දුවෙක්,
රෝස පාට
කොල්ලෙක්,
කමක් නෑ ඕන දෙයක්
කෙල්ලෙක්,
අපෝ! එපා කිසි දෙයක්
පිරිමියෙක්,
තව පාරක් පුළුවන්
ගැහැනියක්,
ආයේ බෑ

**සිත්මි නිමිතරා**



## පුදන සෙනෙහස

ඉරකට වුණත්
සිහිලක් ගේන
සෙනෙහස දැනෙන
දෙනෙතක් නැතිද...

සඳකට වුණත්
මැදියම් රෑක
කඳුළක් ගේන
තනියක් නැතිද...

ගඟකට වුණත්
සැඩ වුණත් දාක
රළු විය නොහෙන
ඉවුරක් නැතිද...

ගසකට වුණත්
මල් නැති දාක
සෙනෙහස පුදන
පොලොවක් නැතිද...

**නිපුණි සුබසිංහ**

## දිසාපාමොක් ඇදුරුතුමාගෙන් වැදි නායකට....

එදා අත ගෙන කුමරු මනමේ
දෙපා වැඳ පිටවුණා අරණේ...
නුඹ මැදට පැන කරපු කරුමේ
පියකු ලෙස හදවතින් තැවුණේ...

කඩුව ඉල්ලුවෙ ගෙල සිඳින්නට
වැටුණු මිනිසකු පණ නසන්නට
කියන් ඇය කළ වරද නුඹ හට
වනය තුළ ඇය තනි කරන්නට...

කියන්නට ඇති වචන ගලපා
කඩුව දුන් බව ඔහුව වලකා
වැදි රැළක් ලඟ බියව කම්පා
ඇය ගියේ නැහැ හිමිට පිටුපා...

ගැහැනු හිත් පැතූ රැකවරණය
ආශාව ළඟ ඇය අසරණය
පෙමක් නැති නුඹ පැතූ රමණය
මගේ කැකුළට උරුම මරණය...

කෙරුවාට රජකම් ඇතුළෙ
තුරු වදුලූ...
කල කම්වලට දඬුවම්
වළකන්න බැහැලූ...
දුවෙකුට බැඳුණු ආදරය
ඇතුලෙ ඇටමිදුළු...
නුඹ හෙළුවෙ ආදර පියෙකු ගේ
ඇසේ කඳුළු...

**පුෂ්පශාන්ත සමරනායක**
**මොරටුව**




## වැලීසියෝගේ ශාපය

ගිනියම්ව දිය වී
ලාවා ගැලුවාට
විසුවියස් යමහලෙත්
කතාවක් තිබුණා

තරුණයෙක් හිටියා
වැලීසියෝ ගිල්මා
තරුණියක් හිටියා
ලියෝමා එල්සා

ගින්දරයි පුලුනුයි
ළංකළාම මොන කතාද
අපුරුවට මේ ප්‍රේමය
ඇවිළුණා !!

ඒත් ජරා ධනවාදය
එතනත් හරස් වුණා
ෆෙලාතෝ මිගේලා
සිටුවරයා (දුෂ්ටයා)

බලහත්කාරයෙන්
එල්සා..........!!

වැලීසියෝ ශාප කලා
මිනිස් සංහතියටම

ඉතින් පොම්පෙයි නගරයම
අළු වුණා.

**රුවන් නමින්ද**

## මාර දූතයාගේ හිත උණු වෙලා

ඩියුටි කට් කළේ නෑ කවද හරි කරනවා
ඉඳ හිටක ඒක ගැන මම සොයා බලනවා
ජීවිතේ හැමදාම උඹ නොමැරි මැරෙනවා
ඒ නිසා මම ටිකක් ඩියුටි මඟ හරිනවා

සංසාර ගමන තුළ උගෙ වැරදි තයෙනවා
ඒත් උඹ හොඳටෝම ඒකෙ පවු ගෙවනවා
තවත් දඬුවමක් නැති තරම් යැයි හැඟෙනවා
ටිකක් තව ඉවසමුද මටත් දුක හිතෙනවා

නහර වැල් පෑදිච්ච ගත සවිය පිහිටුවා
දරු පැටව් පස් දෙනෙක් තනියෙන්ම රකිනවා
ළඟටවත් යන්න බෑ හිත එඩිය උතුරුවා
දරු දුකට මා වුණත් පරාජය කරනවා

මම නුඹේ අතවැසි තමයි මාර සෙනෙවියනි
නැවතුණේ මරන්නට දෙයක් උගෙ නැති බැවිනි
අට අනුවක් රෝග වී ගියත් බෝ නොවුනි
දරු දුකට ඒ ඔළුව ඉස්සෙනවමයි රජුනි

**තුෂාරි දිල්ක්ෂි වීරසිංහ**
**උකුවෙල, මාතලේ**

## සිනා සෙන ඇස්

සුදුපාට සළු පැලඳි
තුරු ලතා මත
තෙත හාදු වැස්සක්

දුම් දමන කෝපි බඳුනක
තිත්ත රස සමග
පොර බදන සිතුවිලිම අහුරක්

ඔබ ඇවිත්
නෑ විත්
සිනාසෙන ඇස් නටවන
කතා කියවන මොහොතක්

දින ගණනක අපුල වෙන්වීමකින් පසුව
නැවත අප හමුවන දවසක් කියන්නෙම
ආදරේ උතුරන බීර රස වැස්සක්

**රෝහිණී ජයන්ති ලියනගේ**

## නොනිමෙන අලුත්

ගිනි දහවල මැදත්,
රෑ තුන් යාමෙදිත්
මා දරාගත් වෙහෙස
එක පයින් කාසි කොට
නිවාලන්නෙ ද,
ඔබෙන් ලැබූ අතෘප්තිය?

එකවර ම ඔබේ සැනසුම
පැමිණේ ද මා අසල

නොනිමවෙන "අලුත්"
ගත පැළඳි නමුදුගෙන
ඔබ තවත් දේ කියනු
ඇත නිසැක.

නාස්තිය කුමට මට
බැර කරන් නුඹෙ වදන්!!

**බිනූ දිලාරා ගමගේ**



# සාම්ප්‍රදායට අභියෝග කළ මන්දනා



ඉන්දියාවේ රාජස්තාන හා ගුජරාට් පළාත්වලට ආවේණික සාම්ප්‍රදායික මර්වාරි කුලයේ ගැහැනුන්ට අයිති රාජකාරිය වන්නේ සැමියාගේ ආවතේව අකුරටම ඉටු කිරීමය. ඔවුහු සෙසු සම්ප්‍රදායික ගැහැනුන් මෙන්ම මුළුතැන්ගෙට කොටු වූ පිරිසකි. සිය සැමියාගේ ඕනෑ එපාකම් නොපිරිහෙළා ඉටු කරන අතරතුර, දරුවන්ගේ වැඩ මෙන්ම එදිනෙදා ගෙදර දොරේ වැඩ කටයුතු සිදු කිරිමත් මර්වාරි ගැහැනුන්ට අයිති රාජකාරියකි. ඒ හැර බාහිර වැඩවලට ඔවුන්ට කිසිම නිදහසක් නැත.

ස්මෘති මන්දානා බිඳ දැමුවේ ඒ සම්ප්‍රදාය ය. ඇය මේ සම්ප්‍රදාය බිඳ දමා පවුලේ ආරක්ෂකයකුගෙන් තොරව ලොව පුරාම කරක් ගසමින් සති ගණන් නිවෙසින් පිටව සිටින්නීය. ඒ මදිවට පිට පිරිමින් සමග නිදහසේ හැසිරෙන්නට ද වූවාය.

ඒවා තම කුලයට කොහෙත්ම ගැළපෙන්නේ නැති බව කියමින් මර්වාරි ගැහැනු තැන් තැන්වල කසුකුසු ගාමින් සිටිති. පිට පිරිමින්ට නොපෙනෙන ලෙස සෙසු මර්වාරි කෙල්ලන් ද , ගැහැනුන් ද මුළුතැන්ගෙට කොටු කළ ජීවිත ගෙවා දමද්දී මන්දානා ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලොව ජය ගත්තාය.

ඇය දැන් ඉන්දීය කාන්තා ක්‍රිකට් පිලට නැතුවම බැරි ක්‍රීඩිකාවකි. 24 හැවිරිදි මේ රූමත් මර්වාරි කෙල්ල ලෝක කාන්තා ක්‍රිකට් පිටියේ නොම්මර එකේ පිතිකාරිනියකි.

ඇය ක්‍රීඩාවට යොමු වීම නිසා ඇගේ ඥාතිහු මාපියන්ට නොසෑහෙන සේ දොස් පවරති. මෙවැනි කෙල්ලකට මනාලයකු සොයා ගැනීම අසීරු වනු ඇතැයි ද කියති. එහෙත් මන්දානා ඒවා කනකට ගන්නේ නැත. ඇරත් ඇයගේ මාපියන් පවා ඇයගේ මේ ක්‍රීඩා දස්කම්වලට උඩගෙඩි දෙන නිසා මන්දානාට පිට අයගෙන් කොහෙත්ම වැඩක් නැත.

සැබැවින්ම මන්දානාගේ ක්‍රිකට් ජීවිතය ඔප මට්ටම් වූයේ ද ඇගේ මාපියන්ගේ දිරියෙනි. ඔවුහු සිය එකම දියණිය ක්‍රිකට් ක්‍රීඩාවේ නිරතවීම ගැන පසුවන්නේ අප්‍රමාණ වූ ආඩම්බරයෙන් යුතුවය.

'හැම දෙයක්ම අපිට ඉබේ ලැබෙන්නේ නෑ. සමහර දේවල් ලබා ගන්න සෑහෙන්න සටන් කරන්න සිද්ධ වෙනවා.'

ස්මෘති මන්දානා එසේ කියන්නේ ක්‍රිකට් ජීවිතයේ බොහෝ දේවල් අත්පත් කර ගැනීමට ඇය සිදුකළ කැපවීම් සහ සිය ඥාතීන්ගේ ඇනුම්පද ගැන සඳහන් කරමිනි.

ඇය එසේ කීවේ 2018 වසරේ විස්සයි20 කාන්තා ලෝක කුසලාන තරගාවලියේදි ලොව වේගවත්ම අර්ධ ශතකයේ සම වාර්තාවට හිමිකම් කීමෙන් පසුවය. මේ හැඩකාර කෙල්ල මහාරෂ්ට්‍ර ප්‍රාන්තයේ අවුරුදු 15න් පහළ කාන්තා කණ්ඩායමට එක් වෙද්දී ඇගේ වයස අවුරුදු 9කි.

වමතින් පිත්ත හසුරුවන ස්මෘතිගේ දස්කම් නිසා වැඩි කාලයක් යෑමට පෙර එම ප්‍රාන්තයේ අවුරුදු 19න් පහළ කාන්තා කණ්ඩායමේ නිත්‍ය සාමාජිකාවකට බවට ද පත් වූවාය. ඒ වෙද්දී ඇගේ වයස අවුරුදු 11ක් විය.

ඊට වසර කිහිපයකට පසු 2013 දී ඇය ඉන්දීය දේශීය කාන්තා එක්දින තරග බිමට පිවිස ද්විත්ව ශතකයක් රැස් කරමින් එවැනි දස්කමක් පෑ පළමු ක්‍රීඩිකාව බවට පත් වූවාය. ඊළඟ වසරේදිම ඇයට ජාතික කණ්ඩායමේ දොරටුව විවර විය.



මන්දානාට ඇත්තේ සාමාන්‍ය මර්වාරි කෙල්ලකට වඩා වෙනස් ආකල්පය. මල්වර වී වැඩි කාලයක් යෑමට මත්තෙන් වැඩිහිටියන්ගේ බලපෑම මත මර්වාරි කෙල්ලන්  අඩු වයසින්ම මනාලියන් වෙද්දී මන්දානා ක්‍රිකට් පිත්ත තුරුලු කර ගත්තාය.





මන්දානාට ඇත්තේ සාමාන්‍ය මර්වාරි කෙල්ලකට වඩා වෙනස් ආකල්පය. මල්වර වී වැඩි කාලයක් යෑමට මත්තෙන් වැඩිහිටියන්ගේ බලපෑම මත මර්වාරි කෙල්ලන්  අඩු වයසින්ම මනාලියන් වෙද්දී මන්දානා ක්‍රිකට් පිත්ත තුරුලු කර ගත්තාය. ඇයට ලොකු සිහින නැත. තිබුණත් ඒවා ඇත්තේ ක්‍රීඩාවට වඩා පහළින්ය. සෙසු මර්වාරි කෙල්ලන් මෙන් කඩවසම් තරුණයකුගේ ආදර උණුසුම, විවාහය වැනි කාරණාවලට ඇය මුල් තැන දෙන්නේම නැත.







ඇගේ ජීවිතයේ ප්‍රමුඛත්වය ක්‍රිකට් ක්‍රීඩාවටය. දෙවැනුව ඇගේ මව්පියන්ට සහ සෙවණැල්ලක් සේ ළඟින් සිටින වැඩිමල් සොයුරාටය.

මන්දානාගේ ක්‍රිකට් ජීවිතයේ වීරයා සංගක්කාරය. ඕ සංගා මෙන්ම ඉතා අලංකාරව කවර් ඩ්‍රයිව් පහර එල්ල කරන්නීය. ඉන්දීය පිලේ නායක විරාත් කෝලි ද ඇයගේ ක්‍රිකට් ජීවිතයේ වීරයෙකි.  කෝලි මෙන්ම නොම්මර 18 ක්‍රිකට් ජර්සිය හැඳ ක්‍රීඩාවේ නිරත වන්නීය. කෝලි මෙන්ම  ඉන්දියාවට තරග දිනා දීම ඇගේ එකම බලාපොරොත්තුවය.

මර්වාරි කුලයේ ඇගේ සම වයසේ කෙල්ලෝ දැන් ගැහැනු ය. ඇය සමග කුඩා වියේදී කෙළි සෙල්ලම් කළ බොහෝ මර්වාරි කෙල්ලෝ දැන් දරුවන් නළවති; සැමියාට ආහාරපාන පිළියෙළ කර දෙති.

එහෙත් මන්දානා තවමත් ක්‍රිකට් පිත්ත අතැතිව ලොව පුරා විවිධ රටවල සංචාරය කරමින් හිතේ හැටියට තාරුණ්‍යය නිදහසේ භුක්ති විඳින්නීය; ලකුණු රැස් කරන්නීය.

'සිහින හඹා යන්න. ඒවා සැබෑ වෙද්දී දැනෙන සතුට අත් විඳින්න.'

ස්මෘති මන්දානා මර්වාරි කෙල්ලන්ට කියා දෙන්නේ අපූරු පණිවිඩයකි.

**කැළුම් රොෂාන්ත**



2020 සැප්තැම්බර් 12 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.